# දරිද්‍රතාව හඬායයි




කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

# දරිද්‍රතාව හඹායයි

MRS : K. SEETHA N. GOONETILLEKE
DIRECTOR
Parents Memorial Scholarship Foundation
392/2, Perera Mawatha,
Kotuwegoda - Rajagiriya.
Tel: 0112877950

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

© අයිතිය සම්පාදක සතුයි.

**ප්‍රථම මුද්‍රණය - 2009**

ISBN 978 955 50082 2 8

**සම්පාදකගේ වෙනත් පොත්**

- මා පිය ගුණ සමර - මුද්‍රණය 2006
  (බුද්ධ වර්ෂ 2550 - සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන්)
- සාධු දැක්ම - මුද්‍රණය 2007
  (The Excellent view)

**මුද්‍රණය :**

හර්ෂණ ප්‍රින්ටර්ස්,
222/7, පළමු පටුමග,
කලපළුවාව,
රාජගිරිය.

# පිදුම



සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පාරමී දම් පුරමින්, නියත විවරණ ලබා ගනිමින්,
බුද්ධ රාජ්‍යයේ කිරුළු පැළඳීමේ ඒකායන අධිෂ්ඨානයෙන් යුතුව,
සියලු රජ සැප සම්පත් අත හැර දා වනගතව,
පුරා සය වසරක් අත්තකිලමථානු යෝගයෙන් වීර්යය වඩවා ගනිමින්
ආර්ය පර්යේෂණයක නිරත වූ සිද්ධාර්ථ ගෞතම බෝසතාණෝ
මැදුම් පිළිවෙතට පිවිස,
ස්ව ශක්තියෙන් පහළ කොට ගත් මහා ප්‍රඥාවෙන් යුතුව,
මීට වසර 2597 කට පෙරදී දඹදිව් තලයේ බුද්ධගයාවේ දී
උත්තරීතර සම්මා සම්බුදු පදවියට පත් වීමෙන් අනතුරුව .. .. .. .. .. ..

සංසාර සාගරයේ අතරමංවී දුක් විඳිනා ලෝ සතුන් කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව,
තමන් වහන්සේ විසින් අවබෝධ කරගත්,
පරම රමණීය අමෘත මහා නිර්වාන සුවය සාක්ෂාත් කරන්නා වූ,
නිර්මල ශ්‍රී සද්ධර්මය ඉතාමත් පැහැදිලිව දේශනා කර වදාරා .. .. .. ..

එම ශ්‍රී සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස සැරියුත් මුගලන් හිමියන් ප්‍රමුඛ මහා සංඝ රත්නය බිහි කළ,
තුන්ලෝකාග්‍ර වූ අසම සම වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී නාමයට
**මාගේ මෙම වෑයම පුෂ්පෝපහාරයක්ම වේවා** !!!

ඔබ වහන්සේ නොවන්නට අදත් අපි භව අඳුරේ ගමන් කරන්නෝ වෙමු,
බුද්ධ රත්නය,
ධම්ම රත්නය,
සංඝ රත්නය,
නම් වූ අති උතුම් රත්නත්‍රය හැර උපන් සත්වයාට අන් සරණක් නැත්තේම ය.

**මාගේ ස්වාමී වූ, ත්‍රෛ ලෝක නාථ, ලොව්තුරු ගෞතම බුදු පියාණෙනි** !

ගෞරව භක්ත්‍යාදරය පෙරදැරිව, ශීර්ෂප්‍රණාමයෙන් යුතුව,
බුද්ධාලම්බන ප්‍රීතියෙන්

**ඔබ වහන්සේට මෙම පොත පුදමි.**

## පසුපිට ඡායාරූපය

ඉන්දියාවේ, දඹදිව බුද්ධගයා විහාරය තුළ වූ වජ්‍රාසනය මත නිර්මිත, පුරා වසර 2552 ක් මුළුල්ලේ සකල ලෝක වාසීන්ගේ උතුම් පූජනීයත්වයට පාත්‍රවන, මාගේ ස්වාමී වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ භූමි ස්පර්ශ මුද්‍රාවෙන් යුතු බුදු පිළිමවහන්සේ **(2008 - 02 - 03 දින කතුවරිය සිය කැමරාවට හසුකරගත් ඡායාරූපයකි)**



# පෙරවදන

ප්‍රවීණ ඉංග්‍රීසි ආචාර්යවරියක්, සමාජ සේවිකාවක් මෙන්ම ගත් කතුවරියක් වූ කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මහත්මිය විසින් රචිත "**දරිද්‍රතාව හඹායයි**" නම් වූ කෘතිය සඳහා පෙරවදනක් සැපයීමට ලැබූ ආරාධනාව සතුටින් පිළිගතිමි. ලෝකයේ වෙනත් රටවල මෙන්ම ලංකාවේ ද බොහෝ පිරිසක් දරිද්‍රතාවෙන් හෙවත් දිළිඳු බවෙන් පීඩිතව සිටිති. සීතා ගුණතිලක මහත්මිය විසින් මෙම කරුණ දෙස සාම්ප්‍රදායිකව නොබලා බෞද්ධ දර්ශනය ද පදනම් කරගෙන ගැටළුවට හේතුවත්, ගැටළුව නිසා ඇති වූ ඵලයත් මැනවින් විග්‍රහ කෙරේ. හේතුව, ගැටළුව හා ඵලය නම් වූ අවස්ථාවන් ඔස්සේ ව්‍යාප්ත වන දරිද්‍රතාව පිටුදැක අධ්‍යාත්මික වූත්, ලෞකික වූත් සඵලත්වයක් ලබා ගන්නා ආකාරය අත්දැකීමෙන් හා ප්‍රායෝගික ලෙස කරුණු උපුටා දක්වමින් මෙම කෘතිය රචනා කොට ඇත.

තථාගත භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙතට පැමිණි තෝදෙය්‍ය බ්‍රාහ්මණ පුත් සුභ මානවක තෙමේ, සත්වයාගේ හීන ප්‍රණීත හෙවත් උස් පහත් අවස්ථා හතක් දක්වා එසේ වීමට හේතු මොනවාදැයි විමසීය. (චූල කම්ම විභංග සූත්‍රය මජ්ඣිම නිකාය) භාග්‍යවතුන් වහන්සේගේ පිළිතුර වූයේ "කම්මං සත්තේ විභජති යදිදං හීනප්පණීතතාය" යනුවෙනි. එනම් කර්මය විසින් සත්වයා උස් පහත් භේදයට පත්කරන බවය. මෙහිදී පැහැදිලි වන කරුණක් වන්නේ පාප කර්ම කිරීමෙන් පුද්ගලයා පහත් ස්වභාවයට පත්වන බවත්, පුණ්‍ය කර්ම සිදුකිරීමෙන් උසස් භාවයට පත්වන බවත් ය. මෙහි මතුවන ගැඹුරු බෞද්ධ දාර්ශනික අදහස නම් කර්මය විසින් ස්වභාවයෙන්ම පුද්ගලයා යටපත් නොකොට ඇති අතර, පුද්ගලයා විසින්ම සිදුකරන පාප හා පුණ්‍ය ක්‍රියා අනුව කර්මයට යටත් වීමක් සිදු වන බවය. මේ නිසා පාප ක්‍රියා සිදු කිරීමෙන් පහත් ස්වභාවයට පත් වූ අයෙකුට නුවණින් මෙනෙහි කොට පුණ්‍ය ක්‍රියා සිදු කිරීමෙන්, මෙලොවදී මෙන්ම පරලොවදී ද උසස් පුද්ගලයෙකු බවට පත්විය හැකිය. සුභ මානවකයා විසින් භාග්‍යවතුන් වහන්සේගෙන් විමසන ලද ප්‍රශ්න හතෙහි පස්වන ප්‍රශ්නය වූයේ අල්පභෝග ලැබීමට හා මහාභෝග ලැබීමට හේතු කවරේද යන්නය. එනම් ආර්ථිකමය වශයෙන් දිළිඳු වීමට සහ සමෘද්ධ වීමට හේතු වූ කරුණුය. දන්දීම, පරිත්‍යාගය, නිර්ලෝභී බවෙහි අනුසස් ලෙස සමෘද්ධිය ද, එසේ නොකිරීම දරිද්‍රතාව බව ද දක්වා ඇත.

මේ බව හඳුනාගත් නුවණැති පුද්ගලයා පූර්ව කර්මයන්ට ඉඩ දී දුක් විඳිනවා වෙනුවට, මෙලොව ජීවිතය ආර්ථිකමය වශයෙන් උසස් ස්වභාවයට පත් වීමට කරුණු හතරක් ඔස්සේ කටයුතු කරයි. එනම් උට්ඨාන සම්පදා (උත්සාහය), ආරක්ඛ සම්පදා (ධනය ආරක්ෂාකර ගැනීම), කල්‍යාණ මිත්තතා(කල්‍යාණ මිත්‍ර ආශ්‍රය), සමජීවිකතා (ආදායම හා වියදම දැන කටයුතු කිරීම), මේ බව අංගුත්තර නිකායේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි මැනවින් පෙන්වා දී ඇත.

මෙම ග්‍රන්ථයෙහි කතුවරිය වූ **කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මහත්මිය** විසින් තම ජීවිතයෙහි ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ සමාජ සේවාවන් රැසක් ඇසුරු කරගෙන මෙම අගනා කෘතිය රචනා කොට ඇත. ශ්‍රී ලංකාවේ වෙසෙන ආර්ථික අපහසුකම් ඇති, එනමුත් අධ්‍යාපනයෙහි දක්ෂ දරුවන්ට උපකාර කිරීමේ අභිලාෂයෙන් **1998** වර්ෂයේදී අප විසින් ආරම්භ කරන ලද ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමෙහි **ශ්‍රී ලංකාවේ සම්බන්ධීකරණ ලේකම්වරිය** ලෙසින් පුරා වර්ෂ ගණනාවක් කරන ලද අනගි සේවය හා එමගින් ලබන ලද නොකැළැල් චිත්ත පාරිශුද්ධිය ද, පුණ්‍ය මහිමය ද, මෙම කෘතියට තේමාව බවට පත්ව ඇත. මෙයට පෙර රචනා කරන ලද "**මා පිය ගුණ සමර**", "**සාධු දැක්ම - The Excellent View** " කෘති මෙන්ම, මෙම අගනා කෘතිය ද සමාජ මෙහෙවරකට මහත්සේ දායකවනු ඇතැයි මම විශ්වාස කරමි.

උතුම් තුණුරුවන් සතු මහ ගුණ බෙලෙන් සැමට මහත් වූ සැනසිල්ලක්ම වේවා !!!

මෙයට,
සිරි සදහම් මගෙහි
**ආචාර්ය පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ**

## සම්පාදකගෙන් .. .. .. ..

පරාර්ථ සේවයෙන් ලැබෙන්නා වූ වටිනාම ප්‍රතිලාභය **සතුට** යි. කාලයේ උපරිම ඵල නෙළා ගනිමින් අර්ථවත් දිවි පෙවෙතක් ගෙන යනවිට ලද හැකි මෙම ප්‍රතිලාභය ඒ සඳහා වන කැපවීමට ම සාපේක්ෂ වනු ඇත. ජීවිතය තුලින් එම සතුට අත් වින්දෙමි. එවන් සතුටක් ලබා ගත හැකි ආකාරය යමෙකුගේ ප්‍රඥාවට ගෝචර වූයේ නම්, එහි විපුල ඵල නොලබන්නෝ කවරහු ද? බාල තරුණ මහළු ජාති ආගම් ආදී කිසිදු භේදයකින් තොරව, කුසට නිසි අහරක් තබා හිසට වහලක් පවා නොමැතිව කුප්පි ලාම්පුවේ එළියෙන් ජීවිතාලෝකය ලැබීමට වෙර දරන දිරිය දනන් නිසි ලෙස හඳුනා ගැනීමට නම් ඔවුන්ගේ ඒ කටුක දිවි මග මාංශමය නෙතට ගෝචර විය යුතුමය. එම උදාර අරමුණ පෙරදැරිව හැකි සෑම අවස්ථාවකදීම දරිද්‍රතාව **හඹායමින්** පරහට පිහිට වීමේදී, දුක් පීඩා සම්බාධක කොතෙක් පැන නැගුණ ද, අවසාන ඵලය ලෙසින් සිත්හි සතුට රඳාපවතියි. මෙය රුපියල් සත හඹායාමෙන් කිසි දිනෙක ළඟා කර ගත නොහැකි අන්දමේ හදවත් සනසන, සිසිලස උතුරා හැලෙන මාහැඟි සතුටකි. එම සතුටෙහි වටිනාකම මුදලින් තක්සේරු කල නොහැක. එය මැණිය හැකි උපකරණයක් ද ලොව නැත. එසේ තිබුණේ වී නම් එය, මුහුණ දුන්නා වූ අභියෝග වල සංකීර්ණත්වයට සහ බරපතලතාවට සාපේක්ෂව පාඨාංක දක්වනු නොඅනුමානය. විවිධ ආකල්පයන් ඇති සමාජගත සත්වයා හමුවේ යහපත් අරමුණක් ක්‍රියාවට නැංවීම විශාල අභියෝගයකි. පැන නගින්නා වූ සම්බාධක අපමණය. එහෙත් අධිෂ්ඨාන පූර්වකව තම ඉලක්කය කරා ගමන් කරන්නෙකු ලබන්නා වූ අවසාන ඵලය පාරිශුද්ධ වූ **චිත්ත සන්තුෂ්ඨියයි**.

බුද්ධ චරිතය තුලින්ම මෙහි සත්‍යතාව ලොවට හෙළි වී හමාරය. සකල ලෝක සත්වයා සංසාර සාගරයෙන් එතෙර කරවීමේ පරම පවිත්‍ර අභිලාශයෙන්, ඔවුන් කෙරෙහි පතළ වූ මහා කරුණාගුණයෙන් යුතුව, අධිෂ්ඨාන පූර්වකව අභියෝග හමුවේ නොසැළී, අසීමිත දුක් සමුදාවක් විඳ දරා ගනිමින් අති උතුම් සම්බුදු පදවිය ලබා, **අනේක ජාති සංසාරං .. .. .. යන ගාථා පාඨයෙන්** උදම් ඇනූ අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ හදවත තුලින් උතුරා හැලෙන්නට වූ ඒ **ප්‍රීති ප්‍රමෝදය**, අද පවා දඹදිව බුද්ධගයා විහාරයේ වජ්‍රාසනය මත නිර්මිත අසම සම බුද්ධ ප්‍රතිමාව තුලින් විරාජමාන වන අයුරු, දැකීමෙන් පවා හදවතක් නිවී සැනසී යයි.

බොහෝ දෙනෙක් කඳුළු සලන්නේ බොහෝවිට දුක් වේදනාවන්ගෙන් හදවත් පීඩාවට පත් වන විටයි. එහෙත් යමෙකුට චිත්ත සන්තානයේ පහළවන කුසල චේතනාවක් වෙනුවෙන් කඳුළු සැලෙන්නේ නම් එය මෙලොව පරලොව දෙකෙහිදීම යහපත උදාකරලීමට සමත් නිර්මලත්වය සංකලනය වූ ශ්‍රේෂ්ඨ කඳුළු බිඳුවකි. එතුල ඇත්තේ හදවත් නිවී පහන් වී යන අමා සිසිලකි. දරිද්‍රතාවේ සෝ සුසුම් මැද අනාගත ලොවේ පූදින්නට වෙර දරන මල් කැකුළකට දිය බිඳක් ඉසීමෙන් දුක් කඳුලකට සැනසුම් සුවයක් ලබාදිය හැකි මාවතකට මා ප්‍රවිෂ්ඨ වූයේ මීට වසර

දහයකට පමණ පෙරදී අනපේක්ෂිතව මය. එවන් වූ මාවතක් ඔස්සේ දිගු කාලීන සාර්ථක ගමනක් යාමට මා ලද ශක්තිය වූයේ, **නිවැරදි මාර්ගෝපදේශකත්වය හා කල්‍යාණ මිත්‍ර ඇසුර** මත පදනම් වූ **අධිෂ්ඨානය, වීර්යය සහ කැපවීමයි**. අධ්‍යාපනයෙහි දක්ෂ එහෙත් දරිද්‍රතාවෙන් පෙළෙන ලක් මෑණියන්ගේ දූ පුතුන් **හඹායමින්** අරඹනු ලැබූ මෙම පරාර්ථ සේවය අද විවිධ ක්ෂේත්‍රයන් හමුවේ ව්‍යාප්ත වී ඇති අතර, සිදු කරනු ලබන **පසුවිපරම** ඔස්සේ එම ව්‍යාපෘතීන් මගින් ලද ඵලදායීතාව දෘශ්‍යමාන වන්නේ නෙතගට සතුටු කඳුළු එක් කරවමිනි.

දරිද්‍රතාවෙන් පෙළෙන වීරිය සිසු දරුවෝ, අධ්‍යාපනික ශිෂ්‍යත්ව තුළින් මූල්‍යමය සහනයක් පමණක් ලබන්නේ නම්, **අධ්‍යාත්මික සංවර්ධනයක් සහ ගුණ දම් පරිපෝෂණයක්** ලබා දීමට ඇති මාහැඟි අවස්ථාවක් ගිලිහී යනු ඇත. එම අවස්ථාව ද ඵලදායි ලෙසින් යොදා ගැනීම නිසා ලබා ඇති සාර්ථකත්වය සිසු දරුවන්ගේම ආකල්ප තුලින් එළි දැක්වෙන විට නෙතගින් රූරා හැලෙන කඳුළු බිඳු නිරතුරුවම හදවත සනසාලයි. වඩ වඩාත් පරාර්ථ සේවයටම කැප වෙමින් ව්‍යාපෘති ගණනාවක් සාර්ථක ලෙස දියත් කිරීමට මා පන්නරය ලැබුවේ ද, දරිද්‍රතාව අභිභවා ජයටැඹ කරා පා නගන සිසු දරුවන්ගේ හදවත් තුළින්ම පැන නැගී තෙලිතුඩින් කඩදාසි මත පතිත වී තිබූ අව්‍යාජ සංකල්පනා, මාංශමය නෙතින් දැක මනෝමය නෙතින් තුලනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

යහපත් වූ ඵලදායී අරමුණක් සිත්හි ධාරණය කරගෙන බාධක අභිභවා අධිෂ්ඨාන පූර්වක කටයුතු කිරීමේදී දිනෙන් දිනම සිතට පමණක් නොව බාහිර වශයෙන් හිසට ද අසාමාන්‍ය සිසිල් සුවයක පහස දැනෙන්නට විණි. බුදුපියාණන් සහ ශ්‍රී සද්ධර්මයම ගුරු කොට සලකමින් සංඝ රත්නයේ ද ආශිර්වාද හමුවේ එම සිසිල් පහස තුලින් තව දුරටත් සිත දියුණු කරගැනීම සඳහා පරෝපකාරය මාහැඟි භූමිකාවක් නිර්මාණය කර දෙන බව මාගේ විශ්වාසයයි.

අනාගත ලොව බැබලවීම සඳහා සාරධර්මයන්ගෙන් පරිපෝෂිත ගුණ ගරුක දරුවන් පිරිසක් බිහිකරලීමේ උදාර චේතනාවෙන් දීප ව්‍යාප්තව දියත් කරනු ලබන පරාර්ථ සේවා ව්‍යාපෘතින්හි සාර්ථක ගමන් මගකට පාදක වූ කරුණු රැසක් එළිදැක්වෙන මෙම **දරිද්‍රතාව හඹායයි** නම් වූ ග්‍රන්ථය, පාඨක ඔබ සැමගේ පහන් සංවේගය පිණිස වනු දැක්ම මාගේ අභිලාෂයයි.

දරිද්‍රතාව වැනි අභියෝග අභිභවා ජීවිතය ජයගන්නා ආකාරය ප්‍රායෝගිකව එළිදැක්වෙන මෙම ග්‍රන්ථය, ඒ සඳහා අඩියරෙන් අඩියර මග පෙන්වයි. මව සහ පියා යනු කුසල් රැස්කර ගැනීමට අප සමීපයේම ඇති පින් කෙතකි. ඔවුන් ජීවතුන් අතර නොමැති වුවද අප්‍රමාණ කුසල් සම්භාරයක් උපදවා ගත හැකි තෝතැන්නකි. එය ප්‍රඥාවට ගෝචර වූයෙන්, යහ ගුණ කැමති සමාජයකට තිළිණ කිරීම සඳහා, විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව; මා පියාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ චරිතාපදානය - **මා පිය ගුණ සමර** - තුලින් එළිදක්වා සියලුම ශිෂ්‍යත්වලාභීන් වෙත **තිළිණ** කිරීමෙන් සාරධර්ම සම්පිණ්ඩණයක්, ආදර්ශය තුළින්ම සිසු හදවත් තුල පතිත කරවීමට ගත් උත්සාහය ද මල් ඵල ගැණිනි.

ශ්‍රී සද්ධර්මය අමිල සම්පතකි. එහි ඵල නෙලා ගැනීමට පාලි පාඨයන්හි අර්ථ රසය උකහා ගත යුතුමය. මව් පිය නමැදීමේදී පවා එම අර්ථ රසය හදවත් තුළ පතිත වන්නේ නම් එතුළින් ලැබෙන්නා වූ ආශිර්වාද වඩාත් ප්‍රබලවනු ඇත. දෛනික ජීවිතයේ භාවිතා කරන සරල ගාථා පාඨයන්ගේ යථාවබෝධය **සිංහල** හා **ඉංග්‍රීසි** ද්විභාෂාවන්ගෙන් එළි දැක්වීමේ ඵලදායීතාව **සාධු දැක්ම** - "The Excellent View" ග්‍රන්ථය තුළින් අත් දුටුවෙමි. එම ග්‍රන්ථ සඳහා ලැබුණා වූ ප්‍රශංසාත්මක ප්‍රතිචාරයන් ද, පොදු සමාජයීය යහපත වෙනුවෙන් දියත් කරනු ලැබූ ව්‍යාපෘති ගණනාවක් තුළින් ලද අත්දැකීම් සම්භාරය ද, ඒකරාශී වීම නිසා මෙම **දරිද්‍රතාව හඹායයි** ග්‍රන්ථය සමාජයට වඩාත් ඵලදායී ලෙසින් එළි දැක්වීමට මා ලද පන්නරය ජීවිත ජයග්‍රහණයක් සේ දකිමි.

මා පිය ගුණ සිහි කිරීමේ අගය, වැඩිහිටියනට සැලකීම, සත් පුරුෂ ඇසුර, පරෝපකාරය වැනි සාරධර්ම තම ජීවිතය තුල දෛනිකව පුරුදු පුහුණු කරවමින් ශ්‍රී සද්ධර්මය ම තම ජීවිතයට ආලෝකයක් කරගන්නා විට, ජීවිත ජයග්‍රහණය සඳහා අවශ්‍ය පසුබිම, විශ්මිත විශ්වීය බලවේගයන් මතින් සකස් වෙන ආකාරය අත්දැකීමට මෙම ග්‍රන්ථය යම් පමණක හෝ උදාර දායකත්වයක් ලබා දෙන බව මාගේ විශ්වාසයයි. අවසාන පරිච්ඡේදය තුළින් ඔබ අප කවුරුත් **යා යුතු මග** උදාහරණ සහිතව සත්‍ය සිද්ධීන් මගින් පැහැදිලි කෙරෙන අතර, **නිරාමිස ප්‍රීතියෙන් ඔබ්බට** වූ ආලෝකයක් කරා පාඨක අවධානය පද්‍යයෙන් ගෙන යාමට මා ලැබුවා වූ ශක්තිය කෙසේ මා වෙත උරුම වූයේ දැයි මම නොදනිමි.

මෙවන් වූ ශ්‍රේෂ්ඨ මාවතකට අවතීර්ණ වීම සඳහා මූලික පසුබිම සකස් කර දෙමින් සියලු අදියරයන්හිදී අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරමින්, මෙම ග්‍රන්ථයට මාහැඟි අරුත්බර පෙරවදනක් සකස්කර දීමට කාරුණික වූ **ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමේ පුරෝගාමී සහ මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ ගරු අනුශාසක ධුරංධර**, මීට වසර දහ හතරකට පමණ පෙරදී **කොළඹ - 7 ඩී.එස්. සේනානායක විද්‍යාලයයේ** දී අප හා එකම ආචාර්ය මණ්ඩලයේ සේවය කරමින් සිට, අන්තර්ජාතික ප්‍රජාවගේ සදහම් පිපාසය සංසිඳුවීමේ අරමුණෙන් එතෙර වැඩමකල **අති පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේට** පළමු කොටම මාගේ භක්ති පූර්වක කෘතඥතාව පුද කරමි.

මුද්‍රණ දෝෂ සොයා නිවැරදි කරගැනීම සඳහා ඉතා සැලකිල්ලෙන් යුතුව තම කාලය හා ශ්‍රමය මහත් සේ කැප කළ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ ධර්ම ආචාර්ය ශාස්ත්‍රවේදී **පූජ්‍ය තල්පත්වැවේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේට** මාගේ ගෞරව පූර්වක ස්තූතිය පුද කරමි.

මෙම ග්‍රන්ථයේ ඇතැම් ස්ථානයන්හි දුටු අක්ෂර වින්‍යාස සහ භාෂාමය රීති පවා ඉතා නිහතමානීව පහදා දෙමින්, කාර්ය බහුල වෘත්තීමය පසුබිමක සිටියදී ම මෙම ග්‍රන්ථයට අගනා පසුවදනක් සකස් කර දීමට කාරුණික වූ, **තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් එස්. විරිතමුල්ල මැතිතුමාට** ද මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

පිටකවරය ඉතාමත් අලංකාර ලෙස සකසා දුන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පී ප්‍රියන්ත මිරිහාගල්ල මහතාට සහ සෝදුපත් පරීක්ෂා කිරීම සඳහා මහත් සේ කැප වූ එම දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික යතුරු ලේඛක එම්. එච්. කේ. ජයතිස්ස මහතාටත්, මුද්‍රණ කටයුතු ඉතාමත් ක්‍රමවත්ව, කලට වේලාවට ඉටු කර දුන් හර්ෂණ ප්‍රින්ටර්ස්හි අධිපති සුදත් වීරසිංහ මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදීතාව ඉතසිතින් පුද කරමි.

කාර්ය බහුල අවස්ථාවලදී ලිපි ලේඛණ කටයුතු සඳහා සහාය දුන් රුවනි, ආශා, මධුෂා සහ නයෝමී යන ශිෂ්‍ය දියණියන්ට ද එම කුසල කර්මයේ බලයෙන් යහපත් අනාගතයක් උදා වේවා! යි පතමි.

මාගේ සමාජ සේවා සහ ලේඛන කටයුතු සඳහා ප්‍රමාණවත් නිදහසක් සහ පහසුකම් ද ලබා දෙන අතරතුරදීම, දෛනික ගෘහමය කටයුතු හමුවේ ඉතා උපේක්ෂාවෙන් කටයුතු කරමින්, මෙම ග්‍රන්ථය පාඨක ඔබ අතට පත් කරනා තුරුම මා වෙත අනුපමේය සහායක් දැක් වූ මාගේ ආදරණීය ස්වාමිපුරුෂයාණන් වූ නිමල් ගුණතිලක මහතාටත්, මෙම ප්‍රජා සත්කාරයන්හි ව්‍යාප්තිය උදෙසා, හිතමිතුරන්ගේ අනුග්‍රාහකයත්වය ද ලබා දෙමින්, තාක්ෂණික සහාය සඳහා කාර්යාලයීය උපකරණ ද පරිත්‍යාග කරමින් නන් අයුරින් දායක වන අප දෙටුපුත් සදේව ගුණතිලක මහතාට සහ එම ලේලි දියණියටත්, ක්‍රිෂාන් කණිටු පුතුටත් මාගේ ස්තුතිය පිරිනමමි.

**දරිද්‍රතාව භයායයි** තුලින් විහිදී යන පරෝපකාරයේ ගුණ සුවඳෙහි සිසිල් පහස ලබන ඔබ සැමට ද මාගේ ස්තුතිය පිරි නැමේ.

මෙයට,
දහම් ලැදි,
**කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක**

392/2, පෙරේරා මාවත,
කොටුවේගොඩ,
රාජගිරිය.
දුරකථන :- 0112 877950

# පුණ්‍යානුමෝදනාව

- අප ආරක්ෂා කරන ලෝක පාලන සියලුම සම්‍යක් දෘෂ්ටික දෙව් දේවතාවුනි,
- මිනිස් ලොව උපත ලැබීමට මට වරප්‍රසාදය ලබා දී, සෙනෙහසින් හදා වඩා නැණ නුවණ පෑදූ මාගේ ආදරණීය මෑණියන් වූ විදුහල්පතිනි ලෝරා පෙරේරා හෙට්ටිආරච්චි මැතිණියනි, ආදරණීය පියාණන් වූ විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව මැතිතුමනි,
- විවිධ ක්ෂේත්‍රයන්හි දැනුම් සම්භාරයක් මාවෙත ලබා දෙමින් අධ්‍යාපනය ලබා දී ජන්මාන්තර ගත වී සිටින සියලුම ගුරු මෑණිවරුනි, පියවරුනි.
- මිය ගිය සියලු නෑ හිත මිතුරනි,
- දඹදිව වැඳ පුදා ගැනීම සඳහා, අප්‍රතිහත ධෛර්යයකින් හා කැපවීමකින් යුතුව ක්‍රියාකර අපට ඉඩ සලසා තැබූ ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමනි.
- උවැසියන්ගේ හදවත්හි බුද්ධාලම්බන ප්‍රීතිය සුරැකෙන අයුරින් මනා සංවිධානයකින් යුතුව දඹදිව වන්දනා චාරිකා මෙහෙයවමින් නිසි මාර්ගෝපදේශකත්වයක් ලබා දෙන නුගේගොඩ ලෝටස් සංචාරක පුද්ගලික සමාගමේ අධිපති, හර්බට් විජේතුංග මැතිතුමාගේ ආදරණීය දෙමාපියනි, එම සමාගමේ අධ්‍යක්ෂිකා ෂර්මිලා විජේතුංග මැතිනියන්ගේ ආදරණීය පියාණෙනි,
- දරිද්‍රතාව හඹායමින් විවිධ ක්ෂේත්‍රයන් හරහා ව්‍යාප්ත වෙමින් වසර දහයකටත් අධික කාලයක් පුරා දීප ව්‍යාප්තව සිදු කරනු ලබන මෙම පරාර්ථ සේවාවන් පිළිබඳව, වාර්ෂිකව ඉල්ලුම්පත් කැඳවීමේ පටන් පොදුවේ මහ ජනතාව දැනුවත් කරන සෑම අදියරයකදීම ඒ සඳහා මාහැඟි කැපවීමකින් යුතුව කටයුතු කරන ලියනාරච්චි පවුලේ සහෝදර සහෝදරියන්ගේ ආදරණීය මෑණියන් වූ ලීලාවතී ලියනාරච්චි මැතිනියනි,
- විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව අනුස්මරණ ශිෂ්‍යත්ව ක්‍රමය ඔස්සේ ස්ථාපිතව, ව්‍යාප්ත වී ගෙන යන **මා පිය අනුස්මරණ අධ්‍යාපනික ශිෂ්‍යත්ව** සඳහා කාලීනව ඉල්ලුම්පත් යොමු කිරීම පිණිස දරිද්‍රතාවෙන් පීඩිත දක්ෂ සිසුන් වාර්ෂිකව දැනුවත් කරවමින්, තම වෘත්තීමය ක්ෂේත්‍රය හරහා මෙම සත් ක්‍රියාවට දායක වන අධ්‍යාපන අධ්‍යක්ෂවරු, විදුහල්පතිවරු ඇතුළු සියලුම සත්පුරුෂයින්ගේ නමින් ජන්මාන්තරගත වී ඇති දයාබර දෙමාපියනි,

මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමෙන් සහ මුද්‍රණය කරවා බෙදාහැරීමෙන් පහළවන උතුම් ධර්ම දානමය කුසලය තුලින් **රැස්කර ගන්නා වූ සියලුම පින් ඔබ සැමට අනුමෝදන් කරමි.**

## පටුන පිටුව


1. අභියෝගාත්මක දරිද්‍රතාව 01-03
2. අධිෂ්ඨානය සහ වීර්යය 04-10
3. දෙමාපිය ආශීර්වාදයේ බල මහිම 11-20
4. වැඩිහිටියන් සැලකීම 21-24
5. කළණ මිතුරු සම්පත්තිය 25-31
6. විරිය වඩන දිරිය සිසුන් 32-37
7. බෞද්ධ නායකත්වය 38-42
8. ශිෂ්‍යත්ව ක්‍රියාදාමය සහ සිසු ආකල්ප 43-82
9. පරෝපකාරය 83-102
10. සහන සේවාවන්හි ව්‍යාප්තිය 103-146
    - ▶ දිළිඳු පවුල්වලට ද්‍රව්‍යමය ආධාර 104-105
    - ▶ දුෂ්කර පාසල්වලට පුස්තකාල පොත් 106-112
    - ▶ විශේෂ පරිත්‍යාග - මුදල් ඇනවුම් 113-117
    - ▶ රචනා තරඟ 118-118
    - ▶ ග්‍රන්ථකරණය 118-123
    - ▶ ආබාධිත සරණ සේවය 124-127
    - ▶ මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව 128-146
11. මහණ දම් - යා යුතු මග 147-152
12. නිරාමිස ප්‍රීතියෙන් ඔබ්බට (පද්‍යයෙන්) 153

# 1

# අභියෝගාත්මක දරිද්‍රතාව

උපන් සත්වයාගේ ජීවන ගමන පිළිබඳවත්, සංසාර චක්‍රය පිළිබඳවත්, මනාව තතු හෙළි කෙරෙන බුද්ධ ධර්මයට අනුව සත්වයාගේ උත්පත්තිය කුසල අකුසල කර්මයන් මතම සිදුවනු ලබයි. දීර්ඝ සංසාර ගමනක යෙදෙමින් සිටින අප විසින්ම චේතනා පහලකොට සිදුකරගනු ලැබූ කර්මයන් මතම ඇතැම් භවයන්හිදී බිත්තරයක් තුල ද, විටෙක මව් කුසයක් තුල ද, එසේත් නැතිනම් ඕපපාතිකව ද, එක් කෝටි හතලිස් අට දහසකට අධික (10048600) විවිධාකාර භවයන්හි උත්පත්තිය ලබන අප මේ යන්නා වූ ගමන ඉතාමත් අනුවේදනීයයි. නිරෝගී, අංග සම්පූර්ණ, වාසනාවන්ත මිනිස් භවයක් ලැබීම, කණ කැස්බෑවා විය සිදුරෙන් අහස දකින්නාක් මෙන් ඉතාමත් අපහසුවෙන් ලබන්නා වූ දුර්ලභ ගණයේ අවස්ථාවකි. නිර්මල වූත් අකාලික වූත් ශ්‍රී සද්ධර්මය ජීවමානව පවතින, ගෞතම බුද්ධ ශාසනය ලොව බැබලෙන මෙවන් බුද්ධෝත්පාද කාලයක මනුෂ්‍යත්වයක් ලැබීම වඩාත් අසීරු කරුණකි.

"**දුල්ලභඤ්ච මනුස්සත්තං - බුද්ධුප්පාදොච දුල්ලභං**" යනුවෙන් දේශනා කර ඇත්තේ එහෙයිනි.

**කිච්ඡො මනුස්සපටිලාභො - කිච්ඡං මච්චාන ජීවිතං**
**කිච්ඡං සද්ධම්ම සවණං - කිච්ඡො බුද්ධානං උප්පාදො**

(ධම්ම පදය - බුද්ධ වග්ග)

**It is hard to be born as a human being. The life of mortal is also hard. The opportunity of listening to Dhamma does not come easily. The birth of the Buddha is rare.**

මිනිසත් බව ලැබීම ඉතා අපහසු බවත්, මිනිසුන්ගේ දිවි පැවැත්ම අපහසු බවත්, ධර්මය ඇසීමේ අවස්ථාව පහසුවෙන් නොලැබෙන බවත්, බුදුවරයින්ගේ ඉපදීම ඉතාම දුලබ බවත් මෙයින් පැහැදිලි ය.

මෙවන් ගාථා ධර්මයන්හි සත්‍යාර්ථය කුමන භාෂා මාධ්‍යයකින් හෝ හදවතට ළඟා කර ගත යුතුමය.

කෙසේ හෝ අප කවුරුත් සංසාරභවයන් පුරාම එක් රැස් කරගත් මහාර්ඝ පුණ්‍ය සම්භාරයන් ගේ කුසල කර්මයේ හේතුවෙන් අද උත්තරීතර මිනිසත් භවයකට උරුම කම් කීමට භාග්‍ය සම්පන්නව සිටීම කෙතරම් ශ්‍රේෂ්ඨ ද? එසේ ලැබුවා වූ මනුෂ්‍යත්වයේ උපරිම ඵල ලබා ගැනීමට නම් උට්ඨාන වීර්යයයෙන් යුතුව යහපත් කාර්යයන්හි නිරත විය යුතුමය.

වීදාගම මෛත්‍රිය හිමිපාණන් විසින් ලෝක සත්වයින්ගේ යහපත පිණිස රචිත ලෝ වැඩ සඟරාවෙහි පෙන්වා දී ඇත්තේ ද, සසර දුක දුරලීම සඳහා මනුෂ්‍යත්වයක් ලැබීමත් එය බුද්ධෝත්පාද කාලයක වීමත් යන කරුණු දෙක මාහැඟි භූමිකාවක් නිර්මාණය කර දී ඇති බවත් වීර්යය වඩවමින් එය සාර්ථකත්වය කරා යොමු කර ගත යුතු බවත් ය.

**කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ**
**දුකකිනි මිනිසත් බව ලැබගන්නේ**
**මෙදෙකිනි මෙසසර දුක් දුරලන්නේ**
**සුදනෙනි කිමැ විරිය නොකරන්නේ**

(ලෝ වැඩ සඟරාව)

The birth of a Buddha is rare indeed. It is hard to get a birth as a human.
It is with the help of these two that one makes an end of this Sansaric suffering, Good men ! Why don't you put forth your best efferts ?

ඇතැමුන් උත්තරීතර මනුෂ්‍ය ආත්මයක් ලැබුව ද, කර්මානුරූපව අංග විකලත්වයකට හෝ දුබල ආර්ථික හා මානසික තත්වයනට ගොදුරු වී සිටිනු දැකිය හැකිය. කායික සම්පත් ඌනත්වයනට ගොදුරුව දැඩි මානසික පීඩාවකින් යුතුව දිවි ගෙවන්නන් මෙන්ම ආර්ථික හා සමාජයීය වශයෙන් අසමතුලිත වාතාවරණයක දිවි ගෙවන්නෝ ද මේ අතර වෙති. දරිද්‍රතාව යනු ආර්ථිකය හා සම්බන්ධ සම්පත් ඌනතාවයි, මෙහි තීව්‍ර අවධිය කුසගින්නයි, මිනිසා මනසින් උසස් ය, දරිද්‍රතාවේ උච්චස්ථානය දක්වා අලසව සිටිය යුතු නැත. **දරිද්‍රතාව යනු ජයගත නොහැකි අභියෝගයක් නොවේ.** ජයග්‍රහණය ස්වෝත්සාහය මතම රඳාපවතිනු ඇත.

නොලද සම්පත් පිළිබඳව සිතමින් කම්පිතව සිටීමෙන් හෝ අන් අයගේ සම්පත් දෙස ව්‍යාපාදයෙන් යුතුව එනම් ඊර්ෂ්‍යා සහගතව බැලීමෙන් කිසිදිනක මෙම ජයග්‍රහණය කරා ළඟා විය නොහැක. ලද සම්පත් දෙස සුභවාදීව, උපේක්ෂා සහගතව, සැනසීමෙන් යුතුව මනස යොමු කර ජීවිත ජයග්‍රහණය සඳහා මූලික පියවර තැබිය යුතු යි. උපතින්ම පාද අහිමි වූවකු දෑතේ සවිය හදවතට ගෙන තම කුසලතාවන් ඔප් නංවා ගනිමින් ජීවිත ජයග්‍රහණය ලබා ඇති අවස්ථා මෙන්ම, දෑත් අහිමි වුවද පාදයේ ඇඟිලි අතර පන්හිද රඳවා ගනිමින් නිර්මාණ ශක්තිය ඔප් නංවා ගත් උද්යෝගීමත් තරුණ ජීවිත පිළිබඳව ද වත්මන් සමාජය තුළින්ම දැනුවත් විය හැකිය. කුමන ඌනතාවක් පැවතියද ලැබුණා වූ මනුෂ්‍යත්වය ඉතා ශ්‍රේෂ්ඨය. අමිල වූ දායාදයක් උපතින්ම උරුම වී ඇත. එනම් උසස් වූ මනසයි, එහි

ශ්‍රේෂ්ඨත්වය අගය කල යුතුමය. එම ශ්‍රේෂ්ඨත්වය හදවතට ගෙන ජීවන ගැටළු නිරාකරණය කරගනිමින් පියවරෙන් පියවර ඉදිරියට යාමට වීර්ය කල යුතුමය. එම ගමන් මාවතෙහි කටු පඳුරු ගල් බොරළු තිබුණ ද, ස්වභාව ධර්මය කෙරෙහි ද්වේෂ සහගත සිතක් ඇතිකර ගත යුතු නොවේ. තමා සතු ගුණ දහම් නමැති මෙවලම් මගින්, තමන් ගමන් ගන්නා මාර්ගය එළි පෙහෙළි කර ගනිමින්, තබන තබන පියවරක් පාසා වැඩි වැඩියෙන් යහ ගුණ තම ජීවිතයට එකතු කර ගන්නේ නම් ජීවනගමන සාර්ථක ලෙස නිමා කර ගැනීමට හැකි වනු නියතය.

උපන් සත්වයෙකුට උපතින්ම දුක උරුමව ඇත. එය සදාතනික ධර්මතාවකි. එසේ නම් මෙම සංසාර ගමන අවසන් කර ගත යුතුමය. ලෝවැඩ සඟරාවෙන් උපුටා ගත් ඉහත සඳහන් කාව්‍යමය සංකල්පයේ අවසාන පදයෙන් සුදනෙනි, වීර්ය නොකරන්නේ ඇයි? යනුවෙන් අසා ඇති ප්‍රශ්නය තමා වෙතම යොමු කරගෙන විසඳුම් සෙවිය යුතු නොවේ ද? කුමන ආකාරයේ පීඩිත වාතාවරණයක වුවද, පෙර පින් බලයෙන් ලද **මනුෂ්‍ය භවයේ ශ්‍රේෂ්ඨත්වය** රැක ගැනීම මාහැඟි වගකීමකි. උසස් වූ මනසක් ඇති සත්වයා ලෙසින් සැලකෙන මිනිසා වෙත **දරිද්‍රතාව** හෝ වෙනත් කුමන ආකාරයේ අභියෝග එල්ල වුවද, සම්බුදු සදහම් මග දකින්නෙකුට, එම අභියෝග සියල්ල ජීවිතයට වෙස් වළාගෙන පැමිණ ඇති ආශිර්වාද බවට පත්කර ගත හැක. බුදු දහම **ජීවන මාර්ගයකි**. මනුෂ්‍ය ආත්මභාවයක් ලද ඕනෑම අයෙකුට මෙම මාර්ගයට අවතීර්ණ විය හැකි ය. ඒ සඳහා කිසිදු බලපත්‍රයක් අවශ්‍ය නොවේ. **ඇති - හැකි, නැති - බැරි** සෑම අයෙකුටම මෙම මාර්ගය එක ලෙස විවෘතව පවතී. ජාති ආගම් කුල භේද කිසිවක් බලනොපායි. අවශ්‍ය වන්නේ **අධිෂ්ඨානය සහ උත්සාහය පමණි.**

# 2

## අධිෂ්ඨානය සහ වීර්යය

මීට වසර දෙදහස් හයසියයකට පමණ පෙරදී, සියලු උපභෝග, පරිභෝග ලෞකික සම්පත් වලින් අනූන ශාක්‍ය වංශික රාජ සම්පත් මෙන්ම සුද්ධෝදන රජතුමාගෙන් පසු උරුම වන්නට තිබූ රාජාභිෂේකය, සක්විති පදවිය පවා අතහැර දැමූ සිදුහත් තවුසාණෝ, සකල ලෝක වාසීන්ගේ සුබ විහරණය පිණිස තම අභිමතාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා, විමුක්ති මාර්ගය සොයා ගැනීමේ පරම චේතනාවෙන් සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කල ආකාරය බෞද්ධ ග්‍රන්ථ තුළින් මනාසේ පිලිබිඹු කෙරෙයි. එවන් දීර්ඝ කාලීන අති දුෂ්කර යුගයක් ගත කළ, වෙනත් කිසිදු මනුෂ්‍යයෙකු පිළිබඳව ඉතිහාසයේ සඳහන්ව නැත. උපන් සත්වයනට දුක උරුම බව අවබෝධ කර ගත් සිදුහත් තවුසාණෝ යොදුන් ගණනින් දෙපයින් ගමන් කොට වනගතව, වර්තමානයේ දී **දුර්කේෂ්වරී කන්ද** නමින් හඳුන්වනු ලබන කඳු බෑවුමෙහි පිහිටි ගල් ගුහාවක් තුල සය අවුරුද්දක් පුරා ගත කරනු ලැබූ අති දුෂ්කර ජීවිතය කෙතරම් කටුක ද? අද පවා එම කඳු ගැටය තරණය කරන බැතිමතෙකුට සිද්ධාර්ථ තාපසයාණෝ සය අවුරුද්දක් ගත කළ එම ගල් ලෙන තුල ඇති, දුෂ්කර ක්‍රියාව නිරූපිත ප්‍රතිමාව දෙනෙතින් දැක බලා දෝතින් වැඳ පුදා ගත හැකි වන අතර එහි යථාර්ථය මනාසේ අවබෝධ වනු ඇත.

දුක ඇති වීමට හේතුව, දුක නැති කිරීම සහ දුක නැතිකිරීම සඳහා වූ මාර්ගය අවබෝධ කර ගැනීමෙහි ලා සත්‍ය ගවේෂණය කරමින් ආර්ය පර්යේෂණයක යෙදුනු සිදුහත් තවුසාණෝ වීර්ය වඩවමින්, භාවනා යෝගීව දීර්ඝ කාලීනව ගත කරනු ලැබූ ඒ දුෂ්කර ජීවිතයේ කටුක අත් දැකීම් සම්භාරය මිනිස් හදවත් කම්පා කරවන සුළුය. මිනිසත් බව ලැබූ කිසිවකු එවන් දුකක් විඳි පුවතක් පිළිබඳව ඉතිහාසයේ කිසිම තැනක සඳහන් වී නැත. ස්වභාව ධර්මයට අනුව පරිසරයෙන් ලද ශාකමය වූ ආහාරයක්, පලතුරු ගෙඩියක් වැනි දෙයක් හෝ යමෙකු විසින් පුදනු ලැබූ යමක් පමණක් ආහාර වශයෙන් ගනිමින් තම සිරුර ස්වල්ප වශයෙන් පෝෂණය කරගනිමින් ඉතාමත් දුර්වල තත්වයකට පත් වන තුරුම **අධිෂ්ඨාන පූර්වකව වීර්ය වඩවා ගත්** ශ්‍රේෂ්ඨ සිදුහත් තවුසාණෝ සිය අප්‍රතිහත උත්සාහය අත හැරියේ

නැත. මෙම අදියරේදී තම සිත සමඟ මහා සටනක යෙදුන ආකාරය මහා සච්චක සූත්‍රයේ පැහැදිලි වේ. විමුක්ති මාර්ගය අවබෝධ කරගෙන ලෝසතුන් සංසාර සාගරයෙන් එතෙර කරවීමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව සය වසරක් පුරා ගත කරනු ලැබූ, කටුක අත්දැකීම් වලින් අනූන එම දුෂ්කර ජීවන රටාවට සම කළ හැකි අන්දමේ දුක්ඛිත ජීවිතයක් මෙලොව උපන් කිසිම මිනිසකු විසින් අත්විඳ නොමැති බවත්, වර්තමානයේ **දරිද්‍රතාවෙන්** පෙළෙන කිසිවකු හෝ අත් නොවිඳින බවත් ඉතා පැහැදිලිය.

**ඉන්දියාවේ දුර්ගේෂ්වරි කන්දේ පිහිටි, සිදුහත් තවුසාණන්ගේ දුෂ්කර ක්‍රියාව නිර්මිත ගල් ගුහාව**
(2008/02/08 දින කතුවරියගේ කැමරා ඇසින්)

කුමන අභියෝගයක් තම ජීවිතයට එල්ල වූවද, ලැබුවා වූ මනුෂ්‍ය ආත්මයේ නාමයෙන්, එය ජයගැනීමට නම් අවශ්‍ය වන්නේ **අධිෂ්ඨානය සහ උට්ඨාන වීර්යයයි.** අවසානයේදී සිදුහත් තවුසාණෝ ශරීරයට අධික ලෙස පීඩා දෙන එම අත්තකිලමථානුයෝගය ද, තම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අත්හළ යුතු බව නුවණින් අවබෝධ කොට ගෙන, මැදුම් පිළිවෙත අනුගමනය කිරීමේ අදහසින් ඉන්දියාවේ ගයා ප්‍රදේශය බලා ගමන් කරන්නට විය. පා ගමනින්ම යන අතරතුර දී නේරංජනා ගඟට මදක් ඔබ්බෙහි වූ සේනානිගම නමැති සුන්දර ගම්මානයේ විශාල නුග ගසක් යට වෙහෙස නිවීමට නතර වූ බවත්, එහිදී සුජාතා දේවියගේ කිරි පිඬු දානයෙන් පිදුම් ලද බවත්, බෞද්ධ ඉතිහාසයේ සඳහන් ය. බුද්ධත්වයට පත්වීමේ අධිෂ්ඨානය හදතුල එසේම විය. කිරි පිඬු වැළඳීමෙන් අනතුරුව පාත්‍රය නේරංජනා ගඟේ පා කර හැරියේ තම අදිටන ඉටුවේ නම් එම පාත්‍රය ගඟේ

උඩුගම්බලා යේවා ! යි සිතමිනි. නේරංජනා ගඟේ මඳ දුරක් උඩුගම් බලා පාවී එම පාත්‍රය ගිලී ගිය බවට ඉතිහාසය සාක්ෂි දරයි. වඩාත් ස්ථාවර වූ අධිෂ්ඨානයෙන් යුතුව පා ගමන් ඇරඹූ කල, අනතුරුව හමු වී ඇත්තේ සොත්ථිය බමුණාය. ඔහු විසින් පුදනු ලැබූ කුස තණ අට මිටට අමතර කිසිදු භෞතිකමය සම්පතක් නොලද සිදුහත් තවුසාණන් ඇසතු බෝරුක මුලට පැමිණ, බෝරුක මුල එම කුස තණ අතුරා, භාවනා යෝගීව මැදුම් පිළිවෙත අනුගමනය කරන්නට විය. බුද්ධත්වයට පත් වී විනා එම ස්ථානයෙන් නොනැගිටින බවට **ස්ථිර අධිෂ්ඨානයක්** ඇති කර ගනිමින්, තමන් වහන්සේ විසින්ම අවබෝධ කරගත් ධර්මය ම ගුරු කොට සලකමින්, ප්‍රඥාව වඩවාගනිමින් ධ්‍යාන උපදවා ගැනීමට ගත්තා වූ **වීර්යය** පිළිබඳව බෞද්ධ ඉතිහාසය මනා ලෙස තතු හෙළි කරයි.

පුබ්බේනිවාසානුස්මෘති ඥානය පහළ වීමෙන් අනතුරුව, සය අවුරුද්දක දීර්ඝ කාලීන දුෂ්කර සමයක් ගත කිරීමට පාදක වූ කරුණු සොයා බැලූ උන් වහන්සේ, ඒ සඳහා පෙර භවයකදී සිදු කර ඇති එක්තරා කර්ම ඵලයක් හේතු වී ඇති බව අවබෝධ කොට ගත් සේක. **පුබ්බකම්ම පුලෝතික අපදානයේ** පෙන්වා දී ඇති අන්දමට පෙර ආත්ම භවයකදී ජෝතිපාල මානවකව ඉපිද, ඝටීකාර බමුණා සමඟ එක්ව කාශ්‍යප බුදුරජාණන් වහන්සේට දොස් නගා ඇති බැවින් එම පාපකර්මයේ හේතුවෙන් **පුරා සය අවුරුද්දක්** දුෂ්කර ක්‍රියා කිරීමට සිදු වූ බව සඳහන් වේ.

පෙර ආත්මභවයන්හි සිදු කරගනු ලැබූ කුසලාකුසල කර්මයනට අනුව ද, මෙම ආත්මභවයේ ජීවන ගමන සැපවත් හෝ කටුක විය හැකිය. සිදුහත් තවුසාණන්ට ද, එය එසේම විය. සය අවුරුද්දක් පුරා විඳි දුක් අපමණය. ලද ඉරණම කුමක් වුවද, කිසිවකුට එය ප්‍රතික්ෂේප කල නොහැක. ලැබුවා වූ මනුෂ්‍ය භවයකට, කර්මානුරූපීව ඉන්ද්‍රිය විකෘතිභාවයක් වැනි ශාරීරික ඌනතාවක් හෝ **දරිද්‍රතාව වැනි සම්පත් ඌනතාවක්** හෝ ඇති වුවද, කළ යුත්තේ ඒ සියල්ල කර්මයටම භාර කොට උකටලීව සිටීම නොව, මිනිස් භවයේ ශ්‍රේෂ්ඨතම උරුමයෙන් ලද ප්‍රකෘති මනස මෙහෙයවා එම අභියෝග හමුවේ ම ජීවිතය සාර්ථක කරගැනීමට අධිෂ්ඨාන පූර්වකව වීර්යය වඩවා ගැනීමයි. සිදුහත් චරිතය තුලින් ලද හැකි ශ්‍රේෂ්ඨතම ආදර්ශය එයයි.

මීට වසර දෙදහස් පන්සිය ගණනකට පෙර අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෝලිය දනව්වේදී, මෙලොව දියුණුව පිණිස හේතුවන කරුණු විමසා සිටි දීඝජාණු කෝලිය පුත්‍ර තෙම අරභයා දේශනා කර වදාළ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ද, මූලික කරුණ ලෙසට පෙන්වා දී ඇත්තේ **වීර්ය හෙවත් උත්සාහ සම්පත්තියයි.**

**දඹදිව බුද්ධගයාවේ - බුදුරජාණන් වහන්සේ බුද්ධ රාජ්‍යයේ කිරුළු පැළඳූ බෝමුල පිහිටි වජ්‍රාසනය** (2008/02/03 දින කතුවරියගේ කැමරා ඇසින්)

යමෙකු අභියෝග මධ්‍යයේම උත්සාහයෙන් ලබාගන්නා වූ **ජීවිත සාර්ථකත්වය** වඩාත් ශ්‍රේෂ්ඨය. බාධක අභිභවමින් තමා ආ නිවැරදි මග දෙස ආපසු හැරී බලන විට ඇති වන්නේ ආත්මාලම්බන ප්‍රීතියකි. නිරාමිස සතුටකි. තමා ආ මග නිවැරදි බව දැනෙන විට වත්මන් ගමන් මග වඩාත් පැහැදිලි වූ දර්ශනයක් ඔස්සේ යොමු වනු ඇත. ශ්‍රී සද්ධර්මය පිළිබඳව කිසිදු සැකයකින් තොරව ශ්‍රද්ධා සම්පන්නව, කැපවීමකින් යුතුව, නොපසුබස්නා වීර්යයෙන් කටයුතු කරන්නෙකුට මිනිස් භවය තුල ලද නොහැකි ජයග්‍රහණයක් නොමැති බව සිදුහත් චරිතය තුලින්ම මනාසේ විනිවිද දැකිය හැකි අතර, එමගින් වත්මන් සමාජගත මිනිසාට ලද හැකි ආදර්ශ අපමණය. බුදු මුවගින් නික්මුණු සෑම වදනක් ම සත්‍යයෙන් පරිපෝෂිතය. එදා මෙන්ම අදටත් අද මෙන්ම අනාගතයටත් එකසේ බලපාන අතර අකාලික වූ එම ශ්‍රී සද්ධර්මයේ සත්‍යතාව බිඳහෙලීමට සමත් කිසිදු විද්‍යාඥයෙකු මේ දක්වා ලොව පහළ වී නැත.

**උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්මකාරිනො**
**සඤ්ඤතස්සච ධම්මජීවිනො- අප්පමත්තස්ස යසොභිවඩ්ඪති..**

(ධම්මපදය - අප්‍රමාද වග්ග)

**One who makes every effort to achieve his restrained goal mindfully, righteously, alertly, & morally, being ethically characterized in self, will be blessed with increasing recognition & spreading fame swiftly.**

ධම්ම පදයේ අප්‍රමාද වර්ගයේ එන මෙම ගාථා පාඨයෙන්ද පැහැදිලි වනුයේ නැගී සිටියා වූ උට්ඨාන වීර්යය ඇති, **තමා ගැන තමාටම දැනෙන සිහිය ඇති,** නිදොස් දේ කරන, විමසා බලා කටයුතු කරන, තැන්පත් **දැහැමි දිවි පැවතුම් වලින්** ස්වයං පාලනයක් ඇති කරගත් යහපත් පුද්ගලයාගේ කීර්තිය මනාව වැඩෙන බවයි.

මෙවන් කීර්තිමත් ජීවිතයකට හිමිකම් කීමට අවශ්‍ය වන මූලික පදනම වන්නේ **උත්සාහය සහ වීර්යයි**. දැහැමි දිවි පැවතුම් පාදක කර ගනිමින් ඇති කරගන්නා වූ **ස්වයං පාලනය** යහපත් අරමුණක් සාක්ෂාත් කරගැනීම සඳහා ගන්නා වූ උත්සාහයට නිසි පරිදි ශක්තිමත් මුලාරම්භය සකසයි. එම අඩිතාලම මත අප්‍රමාදව තම ජීවිතයට යහගුණ ආරෝපණය කර ගත හැකි නම් වාසනාවන්ත අනාගතයකට මග පෑදෙන අතර, එය මෙලොව පරලොව දෙකෙහිම යහපත පිණිස ම හේතුවනු ඇත. පංචේන්ද්‍රියයන් පිනවීම සඳහා තිබූ ලෞකික සැප සම්පත් සියල්ල අතහැරදමා සත්‍ය ගවේෂණය සඳහා ඊට සුදුසු නිහඬ හුදෙකලා පරිසරයකට වී වීර්යය වැඩීමට බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨානය තුල තිබුණා වූ අධ්‍යාත්මික බලය කොතරම් ප්‍රබල ද? විශ්මිත ද?

**භෞතික සම්පත් හඹා යා යුතු නැත. නොලද සම්පත් ගැන සිතමින් වටිනා මිනිස් ජීවිත හමුවේ අකර්මණ්‍යව පසුතැවෙමින් සිටිය යුතු ද නැත. එය ලැබුවා වූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යත්වයට මහත් වූ නිගාවක් බව නුවණින් දැකිය යුතුය. බුද්ධියට මුල්තැන දෙන බුදුමගට අවතීර්ණව උත්සාහයෙන් අධිෂ්ඨානශීලීව කටයුතු කරන විට තමා ඉදිරියේ ඇති අභියෝග සියල්ල තම ජීවිතයට ආශීර්වාදයක්ම වන විශ්මයජනක ආකාරය තමාට ම දෘශ්‍යමාන වනු ඇත. අධිෂ්ඨාන ශක්තියේ ඇත්තේ සීමාරහිත බලයකි. එය ප්‍රඥාවට සාපේක්ෂව අත්දකිනු විනා විද්‍යාත්මක ගවේෂණ මගින් නිරීක්ෂණය කළ හැක්කක් නොවේ.**

කුමන අභියෝගයක් හමුවේ වුවද, ජීවිත ජයග්‍රහණය ලැබීමට නම් ළඟා විය යුත්තේ **ශ්‍රී සද්ධර්මයටයි**. ඒ සඳහා යොදුන් ගණනින් මග ගෙවා විඩාපත් විය යුතු නැත. වටිනා ඇඳුම් පැළඳුම් අවශ්‍ය නැත. මිල මුදල් හව භෝග සම්පත් අවශ්‍ය නැත. පවත්නා භෞතික ඌනතාවන් පිළිබඳව කම්පා විය යුතු ද නැත. ශක්තිමක් මානසිකත්වයක් ගොඩ නගාගෙන යා යුතු මගට ප්‍රවිෂ්ඨ වන ශ්‍රද්ධා සම්පන්න ප්‍රඥාවන්තයෙකුගේ චින්තන ශක්තියට එරෙහිව පැන නැගිය හැකි කිසිදු බාධකයක් නොවන්නේමය. කායික අබල දුබලකම් හා **දරිද්‍රතාව** ආදී දේ වීර්යය හමුවේ පසුබසින ආකාරය මෙම සදහම් මගට පිළිපන් කෙනෙකුට මනාසේ අත් දැකිය හැකි සත්‍යයකි. සත්‍ය තුල ගැබ්ව ඇති බලය ද සත්‍යයක්ම විනා මිථ්‍යාවක් නොවේ. මෙම සත්‍යය ඇති සැටියෙන්ම සුභවාදීව දකින්නෙකු කරා ආශිර්වාද සහ ආනිශංස ගලා එන්නා මෙන්ම, මෙම සත්‍යය ආවරණය කරමින් අසත්‍ය ලෙසින් දකින අසුභවාදීන් කරා එහි ආදීනව පසු පසම ලුහුබඳින ආකාරය, දෛනික ජීවිත දෙස අවදියෙන් සිටින්නෙකුට අවබෝධ කර ගැනීම අසීරු නොවනු ඇත.

ශ්‍රී සද්ධර්මයට තමා තුලට ඇතුළු වීමට ඉඩ හරින විට ලෝභ, ද්වේෂ, මෝහ නමැති අකුසල් මුල්, ටික ටික සිඳී යන ආකාරය දැකිය හැකිය. කිසිම සැකයකින් අවිශ්වාසයකින් කුතුහලයකින් තොරව අපව වෙනස් කිරීමට අවශ්‍ය අවකාශය සකස්කර, ඒ සඳහා ඉඩ හරින්න අපටම පුළුවනි. ජීවිතයට ආලෝකයක් නැවුම් බවක් නව ජීවයක් ඇතිවන්නේ එවිටයි. එහෙත් බහුතරයකගේ වෑයම වන්නේ පෘථග්ජන ස්වභාවය නිසා මමත්වය කියන සීමාව, සක්කාය දිට්ඨියෙන් යුතුව අගුළු ලා ආරක්‍ෂා කරගැනීමයි. සද්ධර්මයට ඇතුළු වීමට ඒ දොර විවෘතව තැබිය යුතුයි. පවත්නා වාතාවරණයේ කොතෙක් බාධක තිබුණ ද, නිවී සැනසිල්ලේ ශ්‍රී සද්ධර්මය පිළිබඳව සිතීමට, කරුණු අවබෝධ කරගැනීමට නිරන්තරයෙන්ම උත්සාහ ගන්නා විට එම **උත්සාහය හමුවේ දරිද්‍රතාව පලායයි. ශ්‍රද්ධා ධනයෙන් පිරී ඉතිරී යයි.**

පෙර කල ඉතාම දුප්පත් මිනිසෙකු වාසය කළේය. අතේ තුට්ටුවක්වත් නැති ඔහු නිරතුරුවම **වයෝ වෘද්ධ, ගුණ වෘද්ධ, ඥාන වෘද්ධ** අය සමග පිළිසඳරයෙහි රුචිකත්වයක් දැක්විය. දිනක් සිටුවරයෙක් මහ මග ගමන් කරනු දුටු මොහු ඉතා යටහත් පහත් ලෙසින් ඔහු වෙත සමීපව ටික දුරක් පසු මග යන්නට විය. පාර අද්දර සුනඛයෙකුගේ ග්‍රහණයට හසුවී දිවිගලවා ගැනීමට දඟලන මීයෙකු විය. මොවුන් ළඟා වනවාත් සමග සුනඛයා පලා ගිය ද, මීයාගේ ප්‍රාණය නිරුද්ධ වී තිබුණි. මෙම **මළ මී කුණ** දෙස හොඳින් නෙත් යොමු කල සිටුවරයා, **උත්සාහවන්තයෙකුට හැදෙන්න මේ මී කුණත් ප්‍රමාණවත්** යැයි කීවේය. පසු පස ගමන් කල දුප්පත් මිනිසා මේ කතාව අසා සිතට ගෙන ආපසු ගමනේදී, ඒ මී කුණ රැගෙන ගොස්, ආදරයෙන් බළලෙකු ඇති දැඩි කරන තැනකට විකුණා **තුට්ටුවක්** ලබා ගත්තේය. තුට්ටුව යනු එදා භාවිතයේ පැවති මුදල්හි අවම වටිනාකමින් යුත් කාසියයි. ඒ තුට්ටුව දී පැණි ටිකක් මිලයට ගත් ඔහු දිය බඳුනකුත් රැගෙන ගොස්, වනය අද්දරට වී සිටියේය. වනයේ දර කඩා ගෙන පිපාසිතව, විඩාපත්ව එන ජනතාවට පිහිටක් වීමට හැකි ස්ථාවරයක ඔහු සිටින බව ඔහුට අවබෝධ විය. එහි රැඳී සිටි ඔහු, වෙහෙසට පත්ව එන සැමට, පැණි බිඳක් දිව ගා පැන් ටිකක් බීමට දී, එක් අයෙකුගෙන් **සතය බැගින් සත 500 ක් (රුපියල් 5/= ක්)** එදිනම සොයා ගත්තේය. සතයක් වැය වුවද ඔවුනට මෙම දිය බිඳ අමෘතයක් බඳු විය. එබැවින් එය අසාධාරණ ඉපයීමක් නොවන බව සිත්හි ධාරණය කර ගත් ඔහු එතැන් සිට ඒ සුළු මුදලෙන් වෙළඳ ව්‍යාපාරයක් අරඹා, දිනෙන් දින ක්‍රමයෙන් දියුණු වී මාස හතරකදී සාරලක්‍ෂයක් ධනය ඉපයූ මහ ධනවතෙකු විය.

**නැත්තන්ට, ඇති වූ විට හැදෙන උමතු රෝගය මොහුට නොවැළඳිනි.** නැටුම්, ගැයුම්, වැයුම් ආදියට හෝ දූෂණ ක්‍රියා මාර්ගයන්ට අවතීර්ණ නොවූ ඔහු දිනපතා **දානයෙන්, ප්‍රිය වචනයෙන්, අර්ථ චර්යාවෙන් හා සමානාත්මතාවෙන්** යුතුව කවරෙකුට හෝ පිහිට වෙමින් සිහි නුවණින් කටයුතු කර විශාල ධන සම්භාරයක් රැස්කර ගත්හ.

**දිනක් ඔහු, බොහෝ දෙනෙකුට අමතක වන "මුල" සිහිකරන්නට විය.** මා මෙතරම් ධනස්කන්ධයක් සපයාගත්තේ එදා අර සිටාණන්ගේ බස, සිතට ගත්

නිසා නොවේදැයි සලකා, **සත්පුරුෂ ධර්මය සිහි කොට කෘත ගුණ සලකනු වස්, සපයාගත් ධනයෙන් අඩක් ගෙන ගොස්, ගුරු පඬුරු වශයෙන් පූජා කළේය.** තොරතුරු විචාල සිටාණන්, ධනය රැකගෙන දියුණු වන මෙම සත්පුරුෂ උත්සාහවන්ත තරුණයා කෙරෙහි පැහැදී, **සතලිස් කෙළක් වස්තුවත් සමඟින් තමන්ගේ එකම දියණිය ද සරණ පාවා දුන්හ.**

සද්ධා, ශීල, හිරි, ඕතප්ප, සුත, චාග, පඤ්ඤා යන **සප්තාර්ය ධනයෙන්** පිරිපුන් පුද්ගලයා දුප්පතෙකු නොවන බව හා එම ජීවිතය හිස් එකක් නොවන බව පෙර ආර්යයෝ පවසා ඇති සත්‍ය වූ ධර්මතාවකි. **අභියෝග ජයගැනීමට ඇති එකම මග යහපත් දිවි පැවැත්මයි.** ත්‍රිවිධ රත්නය සහ කර්ම ඵල විශ්වාස කරන, පංචශීලය රකින, පාපය පිළිකුල් කරන ධර්ම රුචිකත්වයෙන් නුවණ වඩවාලන පුද්ගලයා දුප්පත් නොවන බවත්, එම ජීවිත හරවත් බවත් ධර්මයේ පෙන්වා දෙයි.

**මිනිස් භවය සමඟ ස්වභාවයෙන්ම උරුම වී ඇති උසස් මනස නම් වූ බීජාංකුරයට නිගා නොවන සේ එය හදවත තුළ රෝපණය කර යහගුණ මගින් පෝෂණය කරන්නේ නම් අභියෝග ජයගැනීමට එයම පාදක වනු ඇත. මෙය රෝපණය කළ යුත්තේ නිවහනේදීමය. එදිනෙදා ගුණ දහම් මගින් පෝෂණය කෙරෙන විට පෝෂණයට සාපේක්ෂව දළු ලන ආකාරය මොහොතක් පාසා විද්‍යමාන වන අතර ඒ සමගම හදවතට දැනෙනුයේ මහත් වූ සැනසීමකි. එම සැනසීම තුළින් උතුරා හැලෙන පෝෂණ කාරකයන් ජීවන ගමනේ සශ්‍රීකත්වය සඳහා ලබාදෙන්නේ සෑපු බලපෑමකි.**

3

# දෙමාපිය ආශිර්වාදයේ බල මහිම

**මව් පිය ගුණ හදවතට එකඟව දැකිය හැකි වීම ජීවිත ජයග්‍රහණයේ පළමු පියවරයි.** එය තේරුම් ගැනීමට කිසිදු භෞතික සම්පතක් අවශ්‍ය නොවේ. දස මසක් කුස තුල හොවාගෙන ආරක්ෂා කරමින් අප මෙලොවට බිහි කර පෝෂණය කරමින් හදා වඩා ගත් මෑණියන්ට එම ශ්‍රේෂ්ඨත්වය හදවතින්ම දකිමින් නිරතුරුවම වැඳුම් පිදුම් කළ යුතුමය. එසේ කරන වාරයක් පාසාම ලැබෙන්නා වූ ආනිශංස මගින් වඩාත් තීව්‍ර වූ ආශිර්වාද නියත වශයෙන්ම පැමිණෙන්නේ තමා වෙතමය. ත්‍රිවිධ රත්නය කෙරෙහි අචල විශ්වාසයකින් යුතුව දෛනිකව තෙරුවන් සරණ යන්නෙකුට එමගින් ලැබෙන්නා වූ ආශිර්වාදය සහ ආරක්ෂාව මත දෙමාපිය ආශිර්වාදය ද පතිතවීමෙන් ඉතා දෘඪ වූ බලයක් තම යහපත් අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා ලැබෙනු ඇත. බුදුරජාණන්වහන්සේ ද පෙර භවයකදී සිය මෑණියන්ගෙන් ලබාගත්තා වූ නියත විවරණ, තමන්වහන්සේට සම්මා සම්බුද්ධත්වයට පත්වීමට මහත් සේ ඉවහල් වූ බව ජාතක කථාවලින් පිළිබිඹු කෙරෙයි.

**මාතුපෝෂක ජාතක කථාවේ** සඳහන් පරිදි මෑණියන්ට නොඅඩුව උපස්ථාන කිරීමේ අරමුණෙන්, අප මහා බෝසතාණෝ සුදු ඇත් රජෙකුව ඉපිද සිටි භවයක දී, රජකම පවා වෙනත් ඇතෙකුට පවරා රජකමෙන් ඉවත් වූ ආකාරය මොනතරම් ආදර්ශවත් ද? එදා මවට ආහාර සොයමින් ගිය අප මහා බෝසතාණෝ අතරමංවී සිටි වැද්දෙකුට පිහිටවීමෙන් අනතුරුව එම අකෘතඥ වැද්දා, බරණැස් රජුගෙන් වස්තුව ලබා ගැනීමේ දුෂ්ඨ අරමුණෙන්, ඇත් රාජයාණන් බරණැස් රජුට ලබා දීමේ පුවතක් අටුවාටීකාවන්හි සඳහන් වේ. මෑණියන් පෝෂණය කිරීමේ අරමුණෙන් සත්ව ලෝකයේ රජකම පවා අත්හැර දැමූ අප මහ බෝසතාණෝ බරණැස් රජු විසින් සපයා දුන් රාජ භෝජන සහ රාජ සම්පත් සියල්ල ප්‍රතික්ෂේප කරමින්, කුසගින්නේ සිටින සිය අන්ධ මෑණියන් ගැන සිතමින් නිරාහාරව සිටින්නට වූ බවත් අවසානයේදී රජු විසින් මේ ඇත් රාජයාණන් හිමාල වනයටම මුදා හැර ඇති බවත් එහි සඳහන්ය. තිරිසන් සතෙකු තුල පැවති මේ උතුම් මව් ගුණ අද සමාජයට ලබා දී ඇත්තේ ශ්‍රේෂ්ඨ ආදර්ශයකි.

බුද්ධත්වයට පත් වීමෙන් පසු තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සිය මෑණියන් වූ මහාමායා දේවිය ඉපිද සිටි ස්ථානය දිවැසින් බලා තව්තිසා දෙව්ලොවට වැඩම කර සිය මෑණියන්ට දම් දෙසා සෝවාන් ඵලයෙහි පිහිට වූ සේක. පියරජුගේ අවසාන මොහොතේදී ද පා ගමනින්ම එහි වැඩමකල බුදුරජාණන් වහන්සේ, තබන තබන පියවරක් පාසා අසාධ්‍ය තත්වයෙන් පසුවන පිය රජතුමාට සෙත් ප්‍රාර්ථනා කල බවත්, අවසානයේ දී තමන් වහන්සේ ගේ ශ්‍රී හස්තයෙන්ම දෙපා පිරිමදිමින් දහම් දෙසා සෝවාන් ඵලයෙහි පිහිට වූ බවත් බෞද්ධ ඉතිහාසයේ සඳහන් වෙයි. අද සමාජයේ මවකගේ පියෙකුගේ අගය වටහා ගැනීමට තරම්වත් නැණ - නුවණ පාදා ගැනීමට නොහැක්කෝ කර්මානුරූපව මිනිස් භවයක් ලැබුව ද, මහා අවාසනාවන්තයෝ වෙති.

ඒ මන්දයත් දෙමාපියන්ගේ ආශීර්වාද මතම ජීවිතයේ සියලු ජයග්‍රහණ විජයග්‍රහණ රඳා පවතින බැවිනි. දිවා රෑ දරුවන්ගේ යහපතම ප්‍රාර්ථනා කරන මෑණියන්හට පියාණන්හට සවන්දෙන, සලකන, පෝෂණය කරන දරුවන් මෙලොව නුවණැත්තන්ගේ පැසසුමට නිරතුරුවම භාජනය වන අතර, මෙලොව ද වාසනාවන්ත ජීවිත ගත කර, පරලොව ද ඒකාන්ත වශයෙන්ම සුගතිගාමීවනු ඇත. **දෙමාපිය සිත් නොරිදවා ජීවන ගමනේ ඉදිරියට යාමට තරම්වත් ඥාන ශක්තියක් නොමැත්තේ නම් එය මහා අභාග්‍යයකි.**

සමාජයේ කුඩාම ඒකකය වූ පවුල තුලදීම, දෙමාපියන්ගේ වැඩිහිටියන්ගේ අදහස්වලට ගරු කිරීමට නම්‍යශීලී වීමට පුරුදු පුහුණු විය යුතුය. තමා දන්නේ, දැනගත යුතු දේ වලින් අල්පයක් බව පිළිගත යුතුමය. **අපි දන්නා දේට වඩා නොදන්නා දේ බොහෝය.** නොදන්නා බව දන්නා පුද්ගලයා පණ්ඩිතයෙකු වන බව පඬිවරුන්ගේ මතයයි. බොහෝවිට **තරුණ දරුවන්** අම්මා ප්‍රකාශ කරන දේ බොරු ලෙස දකී. වැරදි ලෙස දකී. තාත්තාගේ අවවාද යල්පැනපු ඒවා සේ දකී. ඇතැම් අවස්ථා වලදී එය බොරු බවට, වැරදි බවට, නිෂ්ඵල බවට, තමාගේ දැනුම් කුටුම්බිය තුල ඇති වදන් ගෙන හැර පාමින් හඬනගයි. ශාරීරිකව උස් මහත් වූ පමණින් උඩඟු බවින් මුලා වී, අත්තනෝමතික ලෙස ව්‍යවහාරයේ පවතින වදන් මගින් දෙමාපියන් මෙසේ පීඩාවට පත් කරමින් අවසානයේ දී තමා ම විනාශ වී යයි.

බාල තරුණ මැදිවියේ පසුවන කවරෙකු වුවද, තමාගේ පටු වූත් රළු **පරුෂ** වූත් **අසභ්‍ය** වූත් වාග් පථය එළි දැක්වීමට පෙර අන්‍යයන්ගේ මතයට හොඳින් සවන් දී, **එහි ද ඇත්තක් තිබිය හැකිය .. .. යන සංකල්පය මත බුද්ධිමය නෙත විවර කර බලන්නේ නම්** යමක යථා ස්වභාවය අවබෝධ වනවා මෙන්ම අනවශ්‍ය ආරවුල්වලින් තොර සාමකාමී දිවිපෙවෙතක් ගෙන යා හැකිය. අප තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන් දේශනා කර වදාළ යහපත් දිවිපෙවෙතක් සඳහා අනුගමනය කළ යුතු මැදුම් පිළිවෙතෙහි පළමුවන පියවර වූ **සම්මා දිට්ඨිය,** නිවැරදි දැක්ම ආයාසයෙන් හෝ අප විසින් බුද්ධිමය නෙත විවර කර ලබා ගත යුතුමය. **ඉවසීම** මෙහිලා මහත් සේ ඉවහල් වන අතර

මානයේ කඩතුරාව බිඳලමින් උඩඟු බවින් තොරව නිහතමානීව, දෙමාපියන්ගේ සිත් නොරිදවා සාමකාමීව ධාර්මික දිවිපෙවෙතක් ගෙන යාමට එදිනෙදා උත්සාහ ගන්නේ නම් ලෞකික ජීවිතයේ සාර්ථකත්වයට එයම හේතු වනු ඇත.

මෙය ජීවිතයට පුරුදු පුහුණු කර ගැනීමට අපොහොසත් වන්නා **මෝහයෙන්** මුලා වී සමාජයට පිවිසෙයි. ඔහු තමා නොදන්නා බව නොදනී. පොත පත දැනුමෙන් පමණක් ජීවිතය දිනාගත නොහැකියි. අල්ප දැනුමක් ලබා ඇති මෙවන් පුද්ගලයා අන්‍යයන්ගේ මතයකට කිසිසේත් සවන් නොදෙයි. තමා දන්නා බවත් තම මතයම නිවැරදි බවත් ප්‍රකාශ කරයි. මොවුන් සමාජයේ විවිධ තලයන්හිදී දැකිය හැකියි. අන්‍යයන්ගේ අදහස බොරු බවටත් තම අදහස **පමණක්** සත්‍ය බවටත් බාහිර ලෝකයා ඉදිරියේ තහවුරු කිරීමට හඬ නගන මොවුන් නිරන්තර වෑයමක යෙදෙන්නේ **තමා ජගතා මෙන්ම උගතා බව** එළි දැක්වීමටය. **අන්ධ භාවය** නිසාම තමා සිටින්නේ **කොතන ද?** කථා කරන්නේ **කාටද?** අවම වශයෙන් තමා **වස්ත්‍රාවරණයෙන් ද?** යන්න පවා නොදනී. තමා **දන්නා** පුද්ගලයා බව බාහිර ලෝකයාට තහවුරු කිරීම සඳහා මොවුන් දරන්නේ සුළු පටු වෑයමක් නොවේ. උස් හඬින් යුතුව එළි දැක්වීමට පටු වාග් පථයක් පමණක් මොවුන් සතුව ඇත. "මොලේ කලඳක් නෑ .. .. කට ඇරියොත් කියන්නේ බොරු .. .. පණ්ඩිතකම නම් තියෙනවා .. .." ආදී ප්‍රකාශ මගින් පමණක් නොව ඇතැම් අවස්ථා වල දී **බුරුවා ගොනා හරකා** වැනි වදන් වලින් පවා අනෙකා ප්‍රසිද්ධියේ හෙළා දකින්නේ එමගින් හෝ තමාට ශ්‍රේෂ්ඨත්වයක් ලැබේ යැයි සිතමිනි. එහෙත් ව්‍යවහාර ලෝකයේ බුද්ධිමතුන් **පිස්සෙක්ද කොහෙද** .. .. යනුවෙන් ප්‍රතිචාර දක්වන්නේ ඔහුගේ හිස් බව වදන් දෙකකින් ලොවට ගෙනහැරපාමිනි.

මෙවැන්නන්ට සිදුවන්නේ ඇතා පරීක්ෂා කිරීමට ගිය අන්ධයිනට වූ දෙයමය. **අන්ධ බව කායික ආබාධයක් වුවද මානසික ආබාධයක් වුවද ප්‍රතිඵලය එකමය.** ඇතාගේ පාද පමණක් අතගා පරීක්ෂා කල අන්ධයා, ඇතාගේ කණ පමණක් අතගාමින් පරීක්ෂා කල අන්ධයාගේ මතය කිසිසේත් පිළිනොගනී. ඔහු තමාගේ මතයේම දැඩිව එල්බ සිටී. ඇතා ගසක් වැනිය කියන අන්ධයා ඇතා කුල්ලක් වැනිය කියන්නාගේ මතය පිළි නොගනී. දෙවන අන්ධයා බොරු කාරයෙක් බවත්, කට ඇරියොත් කියන්නේ බොරුම බවත් සිතන ඔහු එම අදහස් ප්‍රතික්ෂේප කරයි. දරුණු වාග් මාලාවකි. මෝහයෙන් මානයෙන් හා ද්වේශයෙන් යුතුව තමාගේ මතයම ප්‍රකාශ කරන ඔහුගේ වාචික සංවරය මේ වන විට බිඳී හමාරය. අනතුරුව ක්‍රෝධය සමගින් කායික අසංවරතාවට පත්වන ඔහු අනිත් අන්ධයාට පහරදෙයි. අන්ධයින් පස් දෙනෙකු ඇතා පරීක්ෂා කල බවත්, ඔවුන් අතින් ස්පර්ශ කරමින් පරීක්ෂා කර බලා ඇත්තේ ඇතාගේ එක් කොටසක් පමණක් බවත් අටුවාටීකාවන්හි කියවේ. මේ අනුව අවසානයේදී විශාල ගැටුමකි. ඔවුන් අන්ධ බැවින් පහර වදින්නේ කාටද කුමන තැනකටදැයි නොදනී. විශාල අරගලයකි. අවසානයේදී ඔවුනොවුන්ම විනාශ වී යයි. ඇතාගේ යථා ස්වරූපය අවබෝධ වන විට සියල්ල සිදු වී හමාරය. ඉතිරිව ඇත්තේ පසුතැවීම පමණි.

එක් එක් පුද්ගලයාගේ බුද්ධිය මෝහාන්ධාකාර පටලයකින් ආවරණය වී ඇත. එහි ඝනත්වය විවිධය. දෙමාපියන් ඉදිරියේ පවා ඇතැම් දරුවන් එය විදහා දක්වන්නේ නම් එය කෙතරම් දීන හැසිරීම් රටාවක් ද? නවීකරණයෙන් වල්මත් වී අධ්‍යාත්මික පරිහානිය කරා වේගයෙන් දිවෙන එවන් දරුවන් තම තමාගේ පාපකාරී දුර්ගුණයන් හෙළි දක්වමින් සිදු කරගනු ලබන්නේ ලැබුවා වූ මනුෂ්‍යත්වයට පවා මහත් වූ අගෞරවයකි. බුදු දහමේ පෙන්වා දෙන ආකාරයට, මහ පොළව සේ සියලු තාඩන පීඩන විඳ දරාගනිමින් දරුවන්ගේ යහපත උදෙසා උතුරායන සෙනෙහසින් නිබඳව ආශීර්වාද කරන දෙමාපියන්ගේ සිත් වලට කුමන පසුබිමකදී හෝ වේදනා දීම විශාල පාපයකි. අවස්ථාවාදීව කුමන කල්පිතයන් ගොඩ නගා ගත්තද, එවන් පාප කර්මයන්ගේ ආදීනව අනපේක්ෂිතව ඔවුන් කරා ම පැමිණීම වැලැක්විය නොහැක්කේමය. ස්වභාව ධර්මයේ මිණුම් දණ්ඩ සර්ව සාධාරණය, එයට එරෙහි විය හැක්කෙක් නැත.

කුඩා කළ සිටම දෙමාපියනට වැඩිහිටියනට සවන් දිය යුතුයි. ඔවුන්ගේ අවවාද අනුශාසනා මග පෙන්වීම් වලට ඉවසිලිමත්ව යහපත් සේ ප්‍රතිචාර දැක්විය යුතුයි. මිනිසත් බවක් ලබා මෙලොව එළිය දැකීමේ වරප්‍රසාදය ලබා දී, තමන්ට වඩා ශ්‍රේෂ්ඨත්වයෙන් දරුවන් තැබීමට, උසස් අධ්‍යාපනයක් ලබා දීමට මව් පියන් දරන්නේ මහත් වූ වෑයමකි. ආර්ථික සමාජයීය හා අධ්‍යාපනික ක්ෂේත්‍රයන්හි ඉහළින් දරුවන් තැබීමට දෙමාපියන් ඇප කැප වී කටයුතු කරන්නේ තම දිවි පරදුවට තබමිනි. මා පිය දහඩිය කඳුළැලි මතින්ම ඉදිරියට ආ කිසියම් දරුවකු දෙමාපියනට අකෘතඥ වන්නේ නම්, සෙනෙහසේ නාමයෙන් මාපිය හදවත් තුලින් උතුරා හැලෙන ආශීර්වාද ලබාගැනීමට ඔවුන් සුදුස්සන් නොවනු ඇත. තමා වෙත දෙමාපියන්ගෙන් කුමන දෙයක් නොලැබුණ ද යථාර්ථය තේරුම් ගත යුතුමය. **පංච මහා භූතයන්ගේ එකතුවෙන් මෙලොව එළිය දැකීම පිණිස මිනිස් කුසකට සපැමිණයේ වුවද, එම වරප්‍රසාදය පවා සිත් පිත් නොමැතිව උල්ලංඝනය කරදමන දූෂිත සමාජයක, එම වරප්‍රසාදය ඔබ වෙනුවෙන් ආරක්ෂා කර දීමට නැඹුරු වූ දෙමාපියනට මුළු හදින්ම ජීවිතාන්තය දක්වාම වැඳුම් පිදුම් කල ද ප්‍රමාණවත් නොවනු ඇත.**

අනාරාධිතව මොලොවට බිහි වූ ඔබට, පෝෂණය ලබා දෙමින් ආත්ම ශක්තියකින් යුතුව දෙපයින් නැගී සිටීමට අත හිත දුන් දෙමාපියන්ගේ දැනුම අවතක්සේරු කරමින් ඇතැම් අවස්ථාවලදී දෙමාපියන්ගේ සිත් වලට වේදනා ගෙන දෙන, තාක්ෂණික නවීකරණයට ගොදුරු වූ උඩගු දරුවන් ද, දෙමාපියන්ගේ දුබල හැකියාවන් හෙළා දකිමින් ආරූඪ කර ගත් ශ්‍රේෂ්ඨත්වයකින් විරාජමාන වීමට උත්සාහ කරන අවාසනාවන්ත දරුවන් ද, දෙමාපිය වැඩිහිටියන් ඉදිරියේ කථාබහ කිරීමේදී අත පය අමනෝඥ ලෙස විහිදවන අවිනීත දරුවන් ද වත්මන් සමාජයේ විරල නැත. ඔවුන් මේ සමාජ රැල්ල ඔස්සේ දුවන්නේ කොයිබට ද? මොහොතක් සිතන්න.දැනුමෙන් පරතෙරටම පත්වූ තුන් ලෝකයම විද්‍යමාන වූ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ - **විජ්ජාචරණ සම්පන්න ගුණය** - (Knowledge &

conduct) සීල සමාධි ගුණ දම් මත පදනම් වූ ප්‍රඥාව, දැනුම කෙතරම් ප්‍රභාස්වරද? ආදර්ශවත්ද?

බුද්ධිමය වර්ධනය ඇතිවිය යුත්තේ, ගුණ දහමින් සපිරි හැදියාවක් (චරණ) පාදකවය. එසේ නොවන්නේ නම් එය පරිපූර්ණ බුද්ධි වර්ධනයක් නොවේ. මඳ දැනුම විනාශයට මුලයි යන ආප්තෝපදේශය සනාථ කරමින් ඔවුන් ඇදී යන්නේ විනාශ මුඛය කරාය. නූතනත්වයට සහ නවීකරණයට පාත්‍ර වන්නෝ, **අනතිමානීගුණය** තම ජීවිත තුල අප්‍රමාදීව පුරුදු පුහුණු කරගත යුතුමය. දැනුම සහ හැදියාව සමගින් දෙමාපියන් කෙරෙහි හද බැඳි ලැදියාවක් උපන්නේ නම් ඔවුන් මෙලොව පරලොව දෙකෙහිම ජය ගන්නෝ වෙයි.

දෙමාපිය ආශිර්වාදයේ පූර්ණ බලය ලැබීමට නම් කුසල් සිත් උපදවාගෙන උඩඟුකම දුරලා මා පිය නැමදීම දෛනික ජීවිතයේ ප්‍රධාන කාර්යයක් සේ දැකිය යුතුමය. අර්ථාවබෝධයකින් **තොරව** මවට පියාට වඳින ගාථාවන් උච්චාරණය කිරීමද ලැබුවා වූ උසස් මනුෂ්‍යත්වයට ප්‍රමාණවත් නොවන්නේමය. දෙමාපියන්ගේ ශ්‍රේෂ්ඨ ආශිර්වාද තමා වෙත සෘජුවම ගලා ඒමේ ප්‍රවණතාව ගාථාවන් තුලින් ලබන්නා වූ අර්ථාවබෝධයටම සාපේක්ෂ වන හෙයින් කුමන භාෂාවක් තුලින් හෝ උච්චාරණය කරන ගාථා ධර්මයන්ගේ අදහස සරලව උකහා ගත යුතුමය. එතුලින් මව් පිය ශ්‍රේෂ්ඨත්වය හදවතෙහි ධාරණය වනු ඇත. අප දෙමාපියන් මුතුන් මිත්තන් විසින් ජාතියක් වශයෙන් බෞද්ධ සංස්කෘතිය රැකගනිමින් අනාදිමත් කාලයක සිට රැකගෙන ආ, මෙම සුවිශේෂී බලයක් ගැබ්ව ඇති ශ්‍රේෂ්ඨ ධර්මතාවන් අර්ථාවබෝධයකින් යුතුව ඉදිරි පරම්පරාවට දායාද කිරීම වත්මන් වැඩිහිටි පරපුරේ යුතුකම මෙන්ම වගකීමකි.

**දස මාසේ උරේ කත්වා - පෝසෙසි වුද්දි කාරනං**
**ආයු දීඝං වස්ස සතං - මාතු පාදං නමා මහං**

මෙහි අදහස සරල ඉංග්‍රීසි බසින් සහ සිංහල බසින් මෙලෙස දැක්විය හැකිය. සැබෑ අර්ථය නිසි ලෙස දකිමින් එහි ශ්‍රේෂ්ඨත්වය හදවතට ගැනීම තම බුද්ධියට මහත් වූ ගෞරවයකි.

**I worship the feet of my mother, wishing a long life of hundred years for protecting me within the womb for ten months and for bringing me up well.**

දස මසක් කුස තුළ හොවාගෙන මා ආරක්ෂා කරමින් පෝෂණය කලා වූ මාගේ මෑණියනි, සියක් වසරක් ආයු සම්පත්තිය ප්‍රාර්ථනා කරමින්, මම ඔබගේ දෙපා නමදිමි.

**වුද්ධිකාරෝ අලිංගිත්වා - චුම්බිත්වා පිය පුත්තකං**
**රාජ මජ්ඣං සුපතිට්ඨං - පීතු පාදං නමා මහං**

**I worship the feet of my father, who kissed & cuddled me and also placed me among kings with my welfare at heart.**

මාගේ යහපතම හදේ රැවාගෙන, පිය සෙනෙහසින් සිප වැළඳ ගනිමින් - මා ශ්‍රේෂ්ඨයින් අතර තැබුවා වූ පියාණෙනි, මම ඔබගේ දෙපා නමදිමි.

**(පසඟ පිහිටුවා දෙමාපියන් නමැද ආශීර්වාද ලබා ගන්නා පින්වත් දරුවෝ)**

මෙම ගාථා පාඨයන් පිළිබඳව යථාවබෝධයක් ඉතා සරලව කුමන හෝ භාෂා මාධ්‍යයකින්, ගද්‍ය හෝ පද්‍ය පාඨ මගින් හදවතට ළඟා කර ගත හැක. සරල පබැඳුම් මගින් හෝ කුඩා කල සිටම දරුවන්ගේ හදවතට දැනෙන සේ මෙම ශ්‍රේෂ්ඨ ගාථා පාඨයන්ගේ අදහස් පහදා දීම කාලෝචිත වැයමකි.

I Worship daily .. .. .. Never forget
To my Darling Mother .. .. dear
Kneeling down before **her** feet
Keeping palms close together

I wish her - A Long life
To live with us for Hundred years
For Protecting me within her womb
And .... brought me up giving cheers

....................

I Worship daily .. .. .. Never forget
To my Darling Fother .. .. dear
Kneeling down before **his** feet
Keeping palms close together

He Kissed and cuddled me .. so smart
To please me thousand times
My welfare is at his heart
To make my life shines

මෙය ඉතා සරල මෙන්ම මතකයේ රඳවා ගැනීමද පහසු ය. මා පිය නමැදීමේදී මෙම යථාර්ථවාදී **අදහස** අපගේ හදවත් තුල සනිටුහන් වන විට ඔවුන්ගේ සංවේදී හදවත් තුලින් - උත්තරීතර මා පිය සෙනෙහසේ නාමයෙන් ගලාවන්නා වූ ආශීර්වාද මගින් අපගේ ගමන් මග ඒකාලෝක වනු ඇත. **මෙම අන්‍යොන්‍ය සිතිවිලි සම්ප්‍රේෂණය සඳහා ස්වභාව ධර්මය තුළ ගැබ්ව ඇත්තේ ඉතා සියුම් වූත් සුවිශේෂීවූත් ශක්ති ධාරාවකි.**

දරිද්‍රතාව වැනි අභියෝග හමුවේ වුවද **මව් පියන්ට ගරු සැලකිලි දැක්වීම** වැනි දේ ප්‍රායෝගිකරණය කිරීමට කිසිදු බාධාවක් නැත. එතුළින් ලබන්නා වූ ආශීර්වාද තම යහපත් අරමුණු සාක්ෂාත් කරවීමට සපයනු ලබන්නේ මාහැඟි සවියකි.

**සුඛා මත්තෙය්‍යතා ලොකෙ - අථෝ පෙත්තෙය්‍යතා සුඛා**
**සුඛා සාමඤ්ඤතා ලොකෙ - අථෝ බ්‍රහ්මඤ්ඤතා සුඛා**
(ධම්ම පදය - නාග වග්ග)

**Tending to mother & father is great contentment**
**Tending to Bhikkus & Noble Ones is also great contentment**

මෙම ගාථා ධර්මයෙන් ද පෙන්නුම් කර ඇත්තේ - මවට හා පියාට කරන උපස්ථානය වනාහි ලොව ඇති උතුම්ම සැපය බවත් භික්ෂුන් වහන්සේලා සහ බුද්ධාදී උතුමන් වෙනුවෙන් කරන්නා වූ සත්කාර වූ කලී ඒ හා සමාන සැපයන් බවත්ය. එවන් වූ සතුටක් සැපයක් නිසි ලෙසින් ලබන්නා - **බුද්ධ** - යන වචනය අරමුණු කරගත්තා වූ බුද්ධාලම්බන ප්‍රීතියෙන් ඔද වැඩී යනු ඇත. එතුළින් හදට දැනෙනුයේ මහත් වූ සැනසීමකි. එවන් සැනසීමක් ලබන්නකුගේ අපේක්ෂාවන් මුදුන්පත් වන්නේ නොසිතූවිරූ අයුරිනි. ඒ සඳහා මං සැලසෙන්නේ නිරායාසයෙනි. නුපන් කුසල් උපදවා ගැනීමට කෙනෙකුගේ දෛනික ජීවිතයේ යහපත් චර්යාවන්ගෙන් ලැබෙන්නා වූ බලපෑම් අති විශාලය.

**දරිද්‍රතාව** මෙයට බලනොපායි. තම නිවස තුලදීම ආරම්භ කල හැකිය. දෛනික ජීවිතයේදී කිසිදු බාධාවකින් තොරව ඉතා පහසුවෙන් වඩවාගත හැකියි. මෙම ශ්‍රේෂ්ඨ ධර්මතාවන් මත ජීවිතය කළමනාකරණය කරගන්නෙකුට අනාගත අභිවෘද්ධිය සඳහා මග හෙළිවන්නේ අනපේක්ෂිත ලෙසිනි. පෙර කරන ලද ඇතැම් අකුසල කර්මයන්හි විපාක පවා අවම වනු ඇත.

**යස්ස පාපං කතං කම්මං - කුසලෙන පිථීයති**
**සො ඉමං ලොකං පභාසෙති - අබ්භා මුත්තොව චන්දිමා**

(ධම්ම පදය - ලෝක වග්ග)

යමෙකු විසින් කරන ලද පව ඔහුගේම කුසලින් වැසේද ඔහු වලාකුළින් නික්මුණ සඳක් මෙන් සිය ආත්මභාවය හෙවත් ලෝකය බබුළුවයි.

**When One covers own evil deed with another good deed, he/she illuminates this world like the moon, freed from a dark cloud.**

බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීමෙන් පසු බෞද්ධ න්‍යායන්ට අනුකූලව සාර්ථක පාලනයක් ගෙන ගිය ප්‍රථම රජතුමා ලෙසට ඉතිහාසගත වී ඇති අශෝක රජු, මහජනයා අතර යහගුණ පුරුදු පුහුණු කරවීමට මහත් වෙහෙසක් ගත් අතර ඔහුගේ පරමාදර්ශයන් අතර **මව් පියන්ට සැලකීම** සුවිශේෂී වූ බව බෞද්ධ ඉතිහාසයේ සඳහන් වේ. සිඟාලෝවාද සූත්‍රයේ සිඟාල ගෘහපති වෙත දෙනු ලැබූ උපදෙස් එපරිද්දෙන්ම මහජනතාවට ලබා දෙමින් රට වැසියන් දැහැමි ක්‍රියාවන්හි යෙදවූ බවට ඉතිහාසය සාක්ෂි දරයි.

**තවත් ශ්‍රේෂ්ඨ රජෙකු වූ අට වන අග්බෝ රජු සිය මෑණියන් චෛත්‍යයක් සේ සලකමින් මෑණියන්ට වැඳුම් පිදුම් කල බව කියැවේ. විහාරස්ථානයකට ගිය විට පළමුවෙන්ම චෛත්‍යය වන්දනා කරන්නා සේ, දෛනික චර්යාවන්ගේ ආරම්භක කාර්යය ලෙසින් පසඟ පිහිටුවා මෑණියන්ට වැඳීම පුරුදු පුහුණු කරගත් ඔහු සියතින් මෑණියන් නාවා රාජ්‍ය සභාවට යාමට පෙර මෑණියන් නෑවූ ජලය හිසට වත්කරගෙන ගිය බව ඉතිහාසයේ සඳහන්ව ඇත. තමාට ජනතාවගේ ආශිර්වාදය සහ රාජ සම්පත් යස ඉසුරු සියල්ල හිමිවූයේ මෑණියන් උතුම් කොට සැලකූ නිසාම බව ඔහුගේ විශ්වාසය විය.**

බුදුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව, අද මව් පියන්ගේ රූපකාය අප අතරේ නොමැති වුවද ඔවුන් වෙනුවෙන් සිදු කල යුතු හා සිදු කල හැකි දෑ බොහෝ ය. අප මෙලොවට ජනිත වූ මොහොතේ පටන් **මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා** යන සතර බ්‍රහ්ම විහරණ හදවතෙහි රුවාගෙන ආදරයෙන් සෙනෙහසින් හා උදාර කැපවීමකින් යුතුව අපව හදා වඩා ගත් මව් පියන් අප අතහැර ගියද, ඔවුන්ගේ ගුණ හා ළබැඳි සෙනෙහස සදානුස්මරණීය වනු ඇත. ඔවුන් සිහිපත් කරමින්, **සමාජයේ උදව් උපකාර අවශ්‍ය කවරෙකු හෝ සොයා බලා** ඔවුන් වෙත කරුණා පෙරදැරිව උපකාර කරමින්, ඒ අසරණ ජනතාවගේ සිත්සතන් මොහොතකට හෝ සැනසීමට හැකි නම් එය ඉතාමත් ශ්‍රේෂ්ඨ වූ යුතුකමකි.

එවැනි සත් කාර්යයන් තුලින් ලැබෙන්නා වූ මානසික සතුට තමාට මෙන්ම අනුන්ට ද එකලෙස බලපෑම නිසා එයින් ලැබෙන්නා වූ කුසලය අති මහත්ය. අසරණ වී ඇති මවක් තම මෑණියන් සේ දැකිය හැකි නම්, එවන් පියෙකු තම පියා සේ දැකිය හැකි නම් එවිට ඇතිවන මෛත්‍රී සහගත සිතුවිලි තුළින් හදවතට දැනෙනුයේ ආත්මාලම්බන ප්‍රීතියකි. මෛත්‍රී වැඩීමේ ආනිශංස එම ප්‍රීතිය පසුපස ලුහුබඳිමින් අප්‍රමාදව ම තමා වෙතම ගලා එන්නේ අදහාගත නොහැකි ජවයන් දෛනික ජීවිතයට උරුම කරදෙමිනි.

එහෙත්, නූතනත්වය කරපින්නාගෙන සාර ධර්ම ඉවතලමින්, මව් පියන්ට හා වැඩිහිටියනට ගරු කිරීම හීන දීන කමක් සේ දකින, දරුවන් ද අද සමාජයේ නැත්තේ නොවේ. සිංහල බෞද්ධ සංස්කෘතියට ගැලපෙන සේ වැඩිහිටියන් ඇමතීමට පවා නොදන්නා අභාග්‍ය සම්පන්න මෙවැනි දරුවන් වත්මන් සමාජ රැල්ලට හසුවී අද ඉබාගාතයේ ගසාගෙන යන්නේ කොයිබටද ? මෙතරම් වටිනා ශ්‍රේෂ්ඨ ශ්‍රී සද්ධර්මය තවමත් ජීවමානව පවතින, ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන මේ කුඩා දිවයිනෙහි ඇති සංස්කෘතිමය වටිනාකම අති මහත්ය. උත්තරීතර පිතෘත්වයෙන් පිදුම් ලද පියෙකුගේ හදවතෙහි ඇති උතුම් සෙනෙහස, සදාතනික ලබැඳියාවකින් විචිත්‍ර කරවීමට සමත් ආදර බර **පියාණන්, තාත්තා, අප්පච්චි** ආදී වචන මෙන්ම **ශ්‍රේෂ්ඨ මාතෘත්වය** ලෙන්ගතුව සංකේතවත් කෙරෙන දයාබර **මෑණියන්, අම්මා, මව්තුමිය** ආදී ගැඹුරු සෙනෙහසක් ගැබ්වී ඇති හද බැඳි වදන්හි ඇති අමිල අරුත්බර සංවේදීත්වය **ඩැඩා .. මමා .. .. පපා ..** එසේත් නැත්නම් **එයා .. මෙයා ..** වැනි අර්ථ ශූන්‍ය කෙටි අක්ෂර හඬකින් විනාශකර දැමීමට දරණ උත්සාහය කෙතරම් ශෝචණීය ද?

රටින් රටට දූෂිතව හමා එන්නා වූ අර්ථ ශූන්‍ය වදන් භාෂා සංකලනයෙන් ව්‍යවහාරයට එක් වුවද, අප විසින් ග්‍රහණය කර ගත යුත්තේ අපගේ බුද්ධියට නිගා නොවන පරිද්දෙන් ඵලදායී සහ අර්ථවත් දෙයක් පමණි. අනවබෝධයෙන් සියල්ල ග්‍රහණය කරගැනීමට යාමෙන්, ජාතියක් වශයෙන් අනාදිමත් කාලයක සිට රැකගෙන ආ සංස්කෘතිය විනාශ වී යාම පමණක් නොව ඉදිරි පරපුරට දායාද කිරීමට ඉතිරි වන්නේ දූෂ්‍ය වූ අසාර වූ විකෘති වූ සංස්කෘතියකි. **ගොඩනගා ගත් සාරධර්ම, සමාජ රැල්ලට බිලි දෙමින් වත්මන් පරපුර ගොළු වත රකී නම් එයට වන්දි ගෙවන්නෝ අපගේම දරු මුණුපුරන්මය. ඔවුන්ගේ ජීවිත අකල්හි විනාශ මුඛය කරා ඇදී යාම වලකාලමින් ජාතියක ප්‍රෞඪත්වය සඳහා සංස්කෘතිය රැකගැනීම වැඩිහිටි පරපුරේ යුතුකම මෙන්ම වගකීම ද වේ.**

බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද **අකාලික** වූ (not limited for a certain period) ශ්‍රී සද්ධර්මයේ **සන්දිට්ඨික ගුණය** (exist & can be seen) මනාව දැකිය හැකි අවස්ථා බොහෝය. ධර්මානුකූලව තම ජීවිතයට අවශ්‍ය පරිසරය ගොඩනගා ගනිමින් තම යුතුකම් හා වගකීම් කෙරෙහි අවධානයකින් යුතුව ඉදිරියට යන්නෙකුගේ ජීවන සුවඳ මුළු සමාජයම සිසාරා යයි. මිනිස් ජීවිතයට එතුලින්ම ඇතිවන්නා වූ හැවුම් බවේ ඇති සුන්දරත්වය, උත්සාහ ගන්නා ඕනෑම අයෙකුට අත් දැකිය හැකි ධර්මතාවකි. සත්‍ය වූ ශ්‍රී සද්ධර්මය

**ඒහි පස්සිකය** (inviting one to come & see) ඇසු - දුටු පමණින් පිළිගැනීමක් අවශ්‍ය නොවන්නේමය. එයට අවතීර්ණව නුවණින් දැක විමර්ශනයට භාජනය කිරීමට ඇති ඉඩ කඩ අසීමිතය. එතුළින්ම මෙම ස්ථාවර වූ ධර්මස්කන්ධයේ සත්‍යතාව විදහා දැක්වේ.

එහෙත් මෙම ධර්මය අවබෝධ කර ගත හැක්කේ **තම තමාගේ නැණ පමණින්** බව වීදාගම මෛත්‍රිය හිමිපාණන් විසින් රචිත ලෝ වැඩ සඟරාවෙහි පැහැදිලිවම පෙන්වා දී ඇත.

ඇම පම ණින් පැවසු මුනි දැන තතු
මෙම හැම දෙන බලවයි දැක්විය යුතු
**තම තම නැණ පමණින් දැන ගත යුතු**
මම නම දිමි සද හමි පහදා සිතු

(ලෝවැඩ සඟරාව)

**With delight in mind, I pay homage to the true Dhamma proclaimed by the Buddha with discriminating wisdom, to suit the levels of understanding of all beings - The Dhamma which invites one to come and see and which is comperhensible by each, according to his Degree of Intelligence.**

**"පඤ්ඤාවන්තස්සායං ධම්මො - නායං ධම්මො දුප්පඤ්ඤස්ස"**
මේ උතුම් දහම් නුවණ ඇතියනටය - නුවණ නැත්තවුනට නොවේ
(බුදුරජාණන් වහන්සේ)

මෙම බුදු වදන් කෙරෙහි සිත් යොමා, තම තමාට හැකි පමණින් එම ශ්‍රේෂ්ඨ ධර්මතාවන් දෛනික ජීවිතය තුළ පුරුදු පුහුණු කරවන්නෙකුට, එහි ප්‍රතිඵල පැහැදිලිවම දැක ගත හැක. ධර්ම රසය සියලු රසයන් අභිභවා යයි.

**සබ්බ දානං ධම්ම දානං ජිනාති - සබ්බං රසං ධම්ම රසො ජිනාති**
**සබ්බං රතිං ධම්ම රතී ජිනාති - තණ්හක්ඛයෝ සබ්බ දුක්ඛං ජිනාති**

(ධම්ම පදය - තණ්හා වග්ග)

ධර්ම දානය සියලු දානය දිනයි. ධර්ම රසය සියලු රසය දිනයි. ධර්ම ප්‍රීතිය සියලු ප්‍රීතිය දිනයි. රහත් ඵලය සියලු දුක් නිවයි.

**The gift of Dhamma excels all other gifts. The flavours of Dhamma excels all other flavours. The pleasure in Dhamma excels all other pleasures. Extinction of craving conquers all pain.**

ධර්මය අමිල සම්පතකි. පවත්නා ධර්මතාවන් පිළිබඳව නිසි අවබෝධයකින් යුතුව මෙම ශ්‍රේෂ්ඨ සම්බුදු දහමට ළඟා වීමට **දරිද්‍රතාව අභියෝගයක් නොවන්නේමය.** මෙය දෙමාපියන් හමුවේම නිවසේදීම ආරම්භ කල හැකිය. **මෙසේ ධර්මය පාදක කරගෙන දිනපතා දෙමාපියන් සරණ යන්නෙකුගේ දෛනික ජීවිතයේ සුන්දරත්වය සියලු ආර්ථික හා භෞතික පීඩාවන් අභිභවා යයි.**

4

# වැඩිහිටියන් සැලකීමේ අගය

අභියෝග අභිභවා තම ලෞකික ජීවිත සාර්ථක කර ගැනීම සඳහා මීළඟ පියවර වන්නේ වැඩි මහල්ලන්ට ගරු බුහුමන් කිරීම සහ ඔවුන්ගේ වචනයට ඇහුම්කන් දීමයි. මිනිසෙකු නොපිරිහෙන, අභිවෘද්ධියට පමුණුවන ධර්මතාවක් ලෙසින් මෙය බුදුරජාණන් වහන්සේ විසින් ලිච්ඡවීන්ට වදාළ අපරිහානීය ධර්ම හතට ඇතුළත් වී ඇති සිව්වන ධර්මතාවයි. අකාලික වූ ශ්‍රී සද්ධර්මය එදා මෙන්ම අද ද ප්‍රාණිකව පවතී. ජීවමානය, මෙම ධර්මතා රකින පුද්ගලයෙක් වේ නම් ඔහු හෝ ඇය කුමන ආකාරයකින් හෝ පිරිහීමට පත් නොවන්නේමය. කවර තරමේ අඟ හිඟ කම්, ජීවන ගැටළු ඇති අයෙකු විසින් වුවද, මෙවැනි ධර්මතාවන් ඉතා පහසුවෙන් රැකිය හැකිය. **ඒහිපස්සික** වූ ශ්‍රී සද්ධර්මයේ ගැබ්ව ඇති මෙම ශ්‍රේෂ්ඨ ධර්මතාවන් පිළිබඳව දැනුවත් වී තම ජීවිතය තුල ප්‍රායෝගිකරණය කරන්නේ නම් දෛනිකවම දියුණුව දැකිය හැකි අතර, මෙම ධර්මතා පිළිබඳව නොසැලකිලිමත්ව කඩ කරන්නන්ගේ දෛනික පරිහාණිය ද අප්‍රමාදවම පසුපසම ලුහුබඳින ආකාරය ද දැකිය හැකිය. පුද්ගලයෙකු සතුව කවර තරමේ භෞතික සම්පත් ඌනතාවක් තිබුණද, එය මෙම ධර්මතාව වැඩීමට බාධාවක් නොවන අතර මෙයින් ලැබෙන්නා වූ ආනිශංස තුල, දෛනික ජීවිතයට අති මහත් වූ සුභවාදී බලපෑමක් සෘජුවම එල්ල කිරීමේ අති විශාල ශක්තියක් ගැබ්ව ඇත.

වැඩිහිටියන්ට ගරු බහුමන් කිරීම නම් වූ ශ්‍රේෂ්ඨ ධර්මතාවෙහි ආනිශංස අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථා වල දී මනාව පැහැදිලි කරමින් දේශනා කොට වදාළ සේක. ධම්මපදයේ ආයුවර්ධන කුමාරයාගේ කථාව ඇසුරෙන් මනාව පසක් කොට ඇත්තේ ද, වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීමේ ඇති ශ්‍රේෂ්ඨත්වයයි. දෛනික ඵලදායීතාවයි.

**අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධා පචායිනො**
**චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං**

(ධම්මපදය - සහස්ස වග්ග)

**One who constantly, respect, worship & venerate the ethically characterized elders ; restricted with moral virtues, will be blessed with Long life,**

**Beauty (Pleasant look), Happiness & Discriminate Strength to control anything or anyone, due to the improving intellect.**

**සීලාදී ගුණයෙන් වැඩිහිටියනට අභිනන්දනය කරන්නන්, එනම් ඔවුන් සරණ යමින් ඔවුන්ට ගෞරව, ප්‍රශංසා, වැඳුම් පිදුම් කරන්නන් මෙන්ම .. .. නිරතුරුවම වයෝ වෘද්ධ, ගුණ වෘද්ධ, ඥාන වෘද්ධ, අය සමඟ පිළිසඳරෙහි යෙදෙමින් ඔවුන්ගේ සුව දුක් සහ අත්දැකීම් විමසා බලන්නන් ගේ ද, ආයුෂ, වර්ණ, සැප, බල නමැති .. .. ධර්මතාවන් 4 ක් වර්ධනය වන බව මෙයින් කියැවේ.**

උතුම් සංඝ රත්නයේ සහ **වයෝ වෘද්ධ, ඥාන වෘද්ධ, ගුණ වෘද්ධ** සත්පුරුෂයින්ගේ මාර්ගෝපදේශකත්වය ජීවිතාභියෝග පිටු දැකීමට මහත්සේ ඉවහල් වනු ඇත. ඔවුන් වෙත හැකි සෑම අවස්ථාවකදීම සමීප වෙමින් නිරතුරුවම ගෞරව දක්වමින් සුහද සංවාදයේ යෙදෙමින්, පරිනත භාවයත් සමගින්ම ඔවුන් විසින් ලබා ඇති අත්දැකීම් සම්භාරයෙන් බිඳක් හෝ තම ජීවිත වලට උකහාගෙන එමගින් ආදර්ශයක් ගත හැකි නම්, එය සාර්ථක ජීවිතයක් ගෙන යාමට මහත් රුකුලක් වනු නොඅනුමානය. මෙම මාවත ඔස්සේ ගමන් කිරීමට **දරිද්‍රතාව** බලනොපානු ඇත. මේ සියලු දෑ දරිද්‍රතාව හමුවේ වුවද කළ නොහැක්කේ නොවේ. **වැඩිමහල්ලනට යටහත් පහත් ගති පැවතුම් ඇති බව** යසස් ලැබීමේ මගක් බව සිඟාලෝවාද සූත්‍රයේ ද පෙන්වා දී ඇත. **පිදිය යුත්තන් පිදීම** දස පුණ්‍යක්‍රියාවන්හි ද අන්තර්ගතය.

මහා මංගල සූත්‍රයේ ද බාලයන් ඇසුරු නොකිරීම - පණ්ඩිතයන් ඇසුරු කිරීම පිදිය යුත්තන් පිදීම දෙලොවම යහපත ගෙන දෙන උතුම් මංගල කරුණු බව පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ මව් පිය උපස්ථානය, ලද දෙයින් සතුටු වීම, යටහත් පහත් බව, ඉවසීම, පස් පවින් වැළකීම, ශ්‍රමණයන් දැකීම, අටලෝ දහමින් කම්පා නොවීම, ඇතුළු කරුණු 38 ක් ඉතා පැහැදිලි ලෙස ගෙනහැර දක්වමින් ඒවා පිළිපදින තැනැත්තා පහසුවෙන්ම දෙලොවම ජයග්‍රහණය ළඟා කරගන්නා උතුම් පුද්ගලයෙකු බව පෙන්වා දුන් සේක. මෙම ශ්‍රේෂ්ඨ ධර්මතාවන් දෛනික ජීවිතයේ අභිවෘද්ධිය පිණිසම වේ.

සියලු ලෝ වැසියන් දුකින් මුදවාලීමේ පරම අධිෂ්ඨානයෙන් යුතුව සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පෙරුම් දම් පුරා සංසාරික පැවැත්මේ යථාර්ථය අවබෝධ කරගත් අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු ලෝවැසියන් කෙරෙහි මහා කරුණාවෙන් යුතුව කෙනෙකුගේ මෙලොව ජීවිත ඒකාලෝක කරන, පරලොව සුගතිගාමී කරන, දෙවියන්ට පවා යහපත සළසන ඒ **උතුම් මංගල කරුණු** දේශනා කර වදාළේ මීට වසර දෙදහස් පන්සිය පනස් දෙකකට පෙරදීය. සැවැත්නුවර ජේතවනාරාමයේ දී භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සදහම් සුවඳ පතුරවමින් සිටියදී එම පුණ්‍ය භූමියට පැමිණි එක්තරා දිව්‍ය පුත්‍රයෙකු බුදුරජාණන් වහන්සේ අභියසට පැමිණ වැඳ එකත්පසෙක සිට, දෙව් මිනිසුන්ගේ යහපත පිණිස හේතු වන මංගල කරුණු විචාල අවස්ථාවේදීය. එම දිව්‍ය පුත්‍රයා කෙරෙහි අනුකම්පාවෙන් එදා දේශනා කර වදාල ඒ **උතුම් මංගල කරුණු 38** එදා මෙන් අදට ද එලෙසින්ම බලපායි. එහි

ගැබ්ව ඇත්තේ අත්දැකිය හැකි සත්‍යතාවකි. දෙමාපිය වැඩිහිටියන්ගේ ආශීර්වාද දෛනික ජීවිත ආලෝකමත් කරයි.

**දරිද්‍රතාවෙහි** කිසිදු බලපෑමක් නොමැති වූත්, තම නිවස තුලදීම ආරම්භ කල හැකි වූත්, දෛනික ජීවිතයේදී කිසිදු බාධාවකින් තොරව ඉතා පහසුවෙන් වඩවාගත හැකි වූත්, මෙම ශ්‍රේෂ්ඨ ධර්මතාවන් නිසි ලෙස ප්‍රගුණ කරන්නෙකුට තම අනාගත අභිවෘද්ධිය සඳහා මග හෙළිවන්නේ බලාපොරොත්තු නොවන අයුරිනි. පෙර කරන ලද ඇතැම් අකුසල කර්මයන් පවා මෙලෙස ගුණ දම් වඩන විට අහෝසි වනු ඇත.

අරි අටඟ මගෙහි එන **සම්මා වායාමයෙහි ද** මෙය පැහැදිලිය. අප වීර්යය වැඩිය යුත්තේ නූපන් කුසල් උපදවා ගැනීමටත්, නූපන් අකුසල් නූපදවා ගැනීමටත්, උපන් කුසල් වර්ධනය කරගැනීමටත්, උපන් අකුසල් යටපත්කර ගැනීමටත් ය. මේ අනුව **උපන් අකුසල් ප්‍රහාණය කර ගැනීමට ද වීර්යය තුල ඇත්තේ සුවිශේෂී** බලපෑමකි. එසේ නම් දෛනික ජීවිතයට පහසුවෙන්ම එකතු කර ගත හැකි මව් පිය නමැදීම, වැඩිහිටියන්ට සැලකීම වැනි ශ්‍රේෂ්ඨ ධර්මතාවන් පිළිබඳව යථා දැක්මක් ඇතිව, අප්‍රමාදව තම දින චර්යාවට ඇතුලත් කරගෙන එය වැඩීමට වීර්ය කරන්නේ නම්, මොහොතක් මොහොතක් පාසා සිතට අප්‍රමාණ සැනසීමක් ලඟා වන අතර මෙලොවදීම සෞභාග්‍යමත් ජීවිතයකට එය කෙතරම් තීව්‍ර වූ බලපෑමක් ඇති කරන්නේ ද යන්න ප්‍රායෝගිකවම අත් දැකිය හැකිය. **යහපත් ලෙස දිවි ගෙවීමට මෙලෙසින් වීර්යය වැඩීමේදී ජීවන ගැටළු නිරාකරණය කරගෙන ඉදිරියටම යාමට තරම් ප්‍රබල වූ ආලෝක ප්‍රභවයක් තම හදවත තුලම උත්පාදනය වන හෙයින්, එමගින් නිකුත් වන ආලෝකධාරා තම ජීවන මග ඒකාලෝක කරයි.**

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබීම සඳහා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පිරුවා වූ දස පාරමීතා අතර ද **වීර්ය පාරමිතාව** තුලින් මෙහි සත්‍යතාව වඩාත් පැහැදිලි වෙයි. ලෝසතුනට සෙත සැලසීම පිණිස සිතින් කයින් වචනයෙන් ශක්තිමත් වීම සඳහා යහගුණ තම ජීවිතයට ආදේශ කර ගනිමින්, ආත්ම ගණනාවක් පුරා ගත්තා වූ වීර්යය කෙතරම් සාර්ථක ලෙස අවසානයේදී මල් ඵල ගැන්වී ඇත්ද? තුන්ලෝකාග්‍ර වූ ඒ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ජීවිතය තුලින් මෙන්ම උන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කර වදාළ **ශ්‍රී සද්ධර්මය** තුලින් ඕනෑම අභියෝගයක් ජයගැනීමට ලද හැකි ආදර්ශයන් අපමණය. උන් වහන්සේ පෙර ආත්ම භවයන් හීදී ද නොයෙකුත් බාධක මධ්‍යයේ වුවද, කරුණාව, දයාව, ඉවසීම, පරිත්‍යාගය, ගුරු දෙමාපිය වැඩිහිටියනට සැලකීම ආදී යහ ගුණ තම ජීවිතයට ළඟා කර ගනිමින් ජීවන ගමනේ පාරමී දම් පිරූ ආකාරය පිළිබඳව ජීවමාන තතු හෙළි කරමින්, සත්‍ය වූත් නිවැරදි වූත් අවබෝධයක් පුහුදුන් ජනතාවට ලබාදීමට **පන්සිය පනස් ජාතක පොත් වහන්සේ** අදත් විරාජමානව පැවතීම වත්මන් මිනිස් ජන සමාජයේ භාග්‍යයකි.

ඕනෑම අභියෝගයක් ජය ගැනීමට ළඟා විය යුත්තේ **ශ්‍රී සද්ධර්මයටමයි**. එය තමාගේ නැණ පමණින්ම දැකිය යුත්තකි. "- **පච්චත්තං වේදිතබ්බො විඤ්ඤුහි**" (to be personally realized by the wise) එහි සාරය උරා ගැනීමේ ප්‍රවණතාවය එක් එක් පුද්ගලයාගේ ප්‍රඥාවට සාපේක්ෂ වනු ඇත. සර්වඥතාඥානයෙන්, දස දහසක් ලෝක ධාතු ඉක්මවා අනන්ත විශ්වයේ ඇති සියළුම දේ ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දැනගත් ඒ කාරුණික වූ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සකල ලෝකවාසීන්ගේ යහපත පිණිස, ක්‍රමානුකූලව අවබෝධ කරගත හැකිවන සේ දේශනා කර වදාල මෙම ධර්මය **ස්වාක්ඛාත ගුණයෙන්** (Perfectly expounded from the beginning to the end) පරිපූර්ණය, විද්‍යමානය, අති පාරිශුද්ධය, මෙම ධර්ම මාර්ගයට අවතීර්ණව ඕනෑම කෙනෙකුට විමර්ශනාත්මකව එහි අන්තර්ගතය දෙස බැලිය හැකිය. එය **ඒහිපස්සිකය** (Invites to come & see) . මෙය ජාති ආගම් කුල භේද හා ඇති - නැති සීමාවන්ගෙන් තොරවූ විවෘත ආරාධනයකි.

**දරිද්‍රතාව මත අකර්මණ්‍ය නොවී, මිනිස්කමට උරුම වූ තම බුද්ධියට ගරු කරමින් ප්‍රඥාව මෙහෙයවා සන්සුන්ව දූරදර්ශීව, දෛනිකව වඩවා ගත හැකි මෙම ගුණ ධර්ම කෙරෙහි අවධානය යොමු කරවීමට සෑම විටම උත්සාහ ගත යුතුයි. අහංකාර මානාධික ගති ඉවත ලා නිරහංකාර අනතිමානී බවෙන් ජීවිතය සරසා ගෙන මව්පියන්ට හා වැඩිහිටියනට ගරු කරන්නන්ගේ ජීවන ගමන ඒකාලෝක වන්නේ ස්වභාවධර්මය තුල ඇති ගුප්ත බලවේගයන් විදහා දක්වමිනි. විශ්ව ශක්තිය සියළු ශක්තීන් අභිභවා යයි.**

5

# කල්‍යාණ මිත්‍ර සම්පත්තිය

අභියෝග හමුවේ වුවද යා යුතු මගක් ඇත. කල යුතු දේ බොහෝය. ඒ පිළිබඳව දැනුවත් වීමට නම් මීළඟට වැදගත් වන්නේ **කල්‍යාණ මිත්‍ර සම්පත්තිය** යි. එය සාර්ථක ජීවිතයකට බලපාන මාහැඟි භූමිකාවකි. මෙහි රඟපාන්නන් බොහෝය. විමසිලිමත්වීම අත්‍යවශ්‍යම දෙයකි. එදිනෙදා ජීවිතයේ අපට ළංවන්නන් විවිධය. ඔවුන්ගේ අරමුණු විනිවිද දැකීමට ප්‍රඥාවන්ත විය යුතුයි. පුහුදුන් ජනතාවගේ ආර්ථික ගැටළු හා භෞතිකමය ප්‍රශ්න ඉදිරියේ සිතුම්ණක් සේ විරාජමාන වන මොවුන් සිය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගන්නේ ළඟා වූවන් කබලෙන් ලිපට ඇද දමමිනි. **දරිද්‍රතාවෙන්** පෙළෙන්නන් වඩාත් සැලකිලිමත් විය යුත්තේ එබැවිනි.

සංසාර සාගරයේ අතරමංවී සිටින ඔබ - අප සැමගේම කල්‍යාණ මිත්‍රයා නම් වෙනත් කිසිවකු නොව, **යා යුතු මඟ හෙළි කර දුන් අප තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේමය.** එසේ නම් උන්වහන්සේ විසින් දේශනාකර වදාළ අති රමණීය වූ නිර්මල ශ්‍රී සද්ධර්මයට අප ළඟා විය යුතුමය. එවිට ජීවමාන බුදුරජාණන් වහන්සේ දැකිය හැකිය. එම ශ්‍රී සද්ධර්මය වසර 2552 අධික කාලයක් සුරැකිව ආරක්‍ෂා කර ගැනීමට බුදුන් දවස සිටම කැපවෙමින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මහා මෙහෙවරක් සිදු කරනු ලබන **මහා සංඝරත්නය** කරා නැඹුරු වන්නෙකුට ජීවිතාභියෝග ජයගැනීමට අවශ්‍ය වාතාවරණය නිතැතින්ම සකස් වනුයේ එබැවිනි. සද්ධර්මය ඇසීමට පවා එවන් සත්පුරුෂ ඇසුරකින් ලැබෙනුයේ ඉමහත් පිටිවහලකි.

**න භජේ පාපකෙ මිත්තෙ - න භජේ පුරිසාධමෙ**
**භජේථ මිත්තෙ කල්‍යාණෙ - භජේථ පුරිසුත්තමෙ**

(ධම්ම පදය - පණ්ඩිත වග්ග)

මෙහි අදහස ද සරල බසින් අවබෝධ කර ගත හැක. කුමන ආකාරයේ පුද්ගලයින් ඇසුරු කල යුතුද යන්න මෙයින් කියැවේ.

**One should not associate evil minded and lowly men as friends. One should associate only the good & noble friends.**

ධම්ම පදයේ පණ්ඩිත වර්ගයේ එන මෙම ගාථා පාඨයෙන් පැහැදිලි වන්නේ පව්ටු නරක මිතුරන් සහ අධම පහත් මිතුරන් ඇසුරු නොකළ යුතු බවත් කල්‍යාණ මිතුරන් සහ උතුම් මිනිසුන් ඇසුරු කළ යුතු බවත්ය.

බාලයන් ඇසුරු නොකරන ලෙසත් පණ්ඩිතයන් ඇසුරු කරන ලෙසත් මංගල සූත්‍රයේ පෙන්වා දී ඇත්තේ ද මෙම ධර්මතාවමය. මිනිසා සාමූහිකව ජීවත් වීමට කැමති සමාජයීය සත්වයෙක් හෙයින් දෛනික ජීවිතයේ දී සම්මුතියට අනුව මිතුරන්ගේ ඇසුරට පත්වීම ස්වාභාවිකය. එහෙත් ඉතා බුද්ධිමත්ව කල්‍යාණ මිතුරා කවරෙකුද යන්න හඳුනාගැනීම වටී.

භාග්‍යවතුන් වහන්සේ කෝලිය දනව්වෙහි වැඩ වසන සමයක, ගිහි ජීවිත ගත කරමින්, මෙලොව පස්කම් සැප විඳිමින් සිටි දීඝජාණු කෝලිය පුත්‍ර තෙම බුදුන් වහන්සේ අබියසට පැමිණ මෙලොව පරලොව දෙකෙහිම සැප පිණිස වූ දහම් කරුණු දේශනා කොට වදාරන මෙන් ඉල්ලා සිටි අවස්ථාවේදී **ව්‍යග්ඝ පජ්ජ සූත්‍රය** දේශනා කර වදාළහ. එහි මෙලොව දියුණුව පිණිස හේතුවන කරුණු ලෙසින් **උත්සාහ සම්පත්තිය**, ආරක්ෂ සම්පත්තිය, **කල්‍යාණ මිත්‍ර සම්පත්තිය** සහ සමජීවිකතාව පැහැදිලි කෙරෙන අතර, පරලොව සුගතිගාමී වීම සඳහා ශ්‍රද්ධා සම්පත්තිය, ශීල සම්පත්තිය, චාග සම්පත්තිය, ප්‍රඥා සම්පත්තිය මහත්සේ ඉවහල්වන බව මනාසේ පැහැදිලි කෙරේ.

ගිහි ජීවිතයේ කෙතරම් දුක් කම් කටොළු තිබුණ ද මෙම ධර්මතාවන් අනුව ජීවත් වීමට වීර්ය වඩන්නෙකුට එතුලින් ලද හැකි සැනසීම අති මහත්ය. **සිඟාලෝවාද සූත්‍රයේ** පෙන්වා දෙන අන්දමට අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභානී හා අපාය සහාය මිතුරන්ගෙන් ඉවත්විය යුතුමය. ඇසුරට ලඟාකරගත යුත්තේ උපකාරක, සමාන සුඛ දුක්ඛ, අත්ථක්ඛායී, අනුකම්පක මිත්‍රයන්ය. **මෙම මිත්‍ර සම්පත්තිය පිළිබඳව සැලකිලිමත්වීම බුද්ධිමත් බවේ ලක්ෂණයකි**. අපගේ ජීවිත දෙස ප්‍රඥා ගෝචරව ආපසු හැරී බලන විට අප බලාපොරොත්තු නොවූ සිදුවීම් ගණනාවකට අපට මුහුණ දීමට සිදුවී ඇති බව විටෙක පෙනී යයි. ඇතැම් සිද්ධීන් මනසට පීඩාකාරී වන මනසින් සතුට පලා ගිය අවස්ථා වන අතර ඇතැම් අවස්ථාවන්, සිහිපත් වන මොහොතක් මොහොතක් පාසාම හදවතට සැනසීමක්, මනසට තෘප්තියක් ළඟා කර දීමට සමත් වී ඇත. එලෙසින් සැනසුම් සුසුමක් හෙළීමට හැකි මොහොතක් වූයේ නම් එයට මූලික වී ඇත්තේ **කල්‍යාණ මිත්‍ර සම්පත්තියම** බව වඩාත් පැහැදිලි වනු ඇත.

**ඔවදෙය්‍යානුසාසෙය්‍ය - අසබ්භා ච නිවාරයෙ**
**සතං හි සො පියො හොති - අසතංහොති අප්පියො**

(ධම්ම පදය - පණ්ඩිත වර්ගය)

**The wise man that advises and instructs the others & also refrains them from awful deeds is sought by good men but detestable by the evil beings.**

නුවණැති කල්‍යාණ මිත්‍රයා යමෙකුගේ වරද නිසි අයුරු දැක ඔහුට අවවාද කරයි. අනුශාසනා කරයි. අසභ්‍ය දෙයින්, අකුසලයෙන් වළක්වයි. එසේ කරන්නවුන් **සත්පුරුෂයින්ට ප්‍රිය මනාප වේ. අසත්පුරුෂයින්ට නම් අප්‍රිය වේ.** අමනාප වේ.

අයෙකු වරදකින් මුදවා සුමගට යොමු කිරීමට වෙර දරණ කල්‍යාණ මිතුරෙකුගේ දූරදර්ශී ක්‍රියා මාර්ගය එක් වරම අවබෝධ කර ගැනීමට නොහැකි ඇතැම් අන්ධබාල පෘථග්ජනයින් තමා වෙත පෙන්වා දුන් වරද ඉදිරියේ කෝපාවිෂ්ටව රළු වදනින් දොස් නැගුව ද බුද්ධිමත් කල්‍යාණ මිතුරා, වරදකරුගේ අමනෝඥ ක්‍රියාකලාපය හමුවේ කිසිවිටක නොසැලේ. **වරදකරු නිතරම වරද සාධාරණීකරණය කිරීමට වෙහෙසෙයි. ඒ පෘථග්ජන ස්වභාවයයි.** අසත්පුරුෂයා වරද පෙන්වන්නා සමඟ අමනාප වෙයි. චිත්ත රූප මවමින්, තම වාග් පථය පාලනය කර ගත නොහැකිව දුම්මල වරම අතට ගත් යකැදුරන් සේ ඇතැමුන් රඟපායි. ලේ ධාතුව කිපී, මුහුණු කළු වී විරූපී වෙයි. දහඩිය වැගිරෙයි, වෙව්ලයි, දැඟලයි, පසුවද කල කී දේ සිහිවන මොහොතක් පාසාම මනසින් පීඩා විඳියි. මොනතරම් අවාසනාවක් ද?

**එහෙත් ප්‍රඥා සම්පන්න කල්‍ණ මිතුරා ඒ කිසිවකට ප්‍රතිචාර නොදක්වයි. හෙතෙම සංසාර භවයන් පුරා ඉතා වෙහෙසව අමාරුවෙන් සකස් කරගෙන ඇති මෛත්‍රී සහගත චිත්ත පථය කිසි සේත් අවුල් කර නොගනී.** නිහඬව සවන් දී සිටියි. එම නිහඬතාව වරදකරු දකින්නේ තම ජයග්‍රහණයක් ලෙසයි. එහෙත් බුද්ධිමත් ප්‍රේක්ෂකයා සත්‍යාර්ථය දකී. අඥාන ආශ්‍රිතයා වරදකරුගේ ක්‍රියා කලාපය අගයමින් ආදර්ශයට ගනී. ඔවුන් වරද සාධාරණීකරණය කරන ආකාරය ද අනුකරණය කරමින් එය ශ්‍රේෂ්ඨ යැයි සිතා මෝහන්ධාකාරයෙන් මුළු ජීවිතයම පාපී ක්‍රියාවන්ටම බිලි දෙයි. බුදු දහමට අනුව බාල පරපුරට එවන් වූ සාවද්‍ය ආදර්ශයක් කවරෙකු හෝ විසින් ලබා දුන්නේ නම් එම සමාජද්‍රෝහී පුද්ගලයා සමාජය විසින්ම ගැරහුම් ලබයි. මිනිසත් බවට නිගරු කරන එවැනි දුෂ්ට පාපීන් හට නැවත මිනිස් භවයක් ලබා ගැනීම ඉතා අසීරු වනු ඇත.

හඬනගා වාග් පථයක් ඔස්සේ බාහිර ලෝකයා ඉදිරියේ වැරදි සාධාරණීකරණය කළ ද, තමා වරදකරු බව හදවත දකී. එය කිසිසේත් මිනිස් හදවතකින් ප්‍රතික්ෂේප කළ නොහැකිය. කල්‍ණ මිතුරා උත්සාහ දැරුවේ තමා යහපතෙහි පිහිටවීමට බව කල්‍යාමේදී අවබෝධ වුවද, එහෙත් සෑම මොහොතකම ද්වේශයෙන් හා ක්‍රෝධයෙන් දිවිගෙවයි. මෝහය හද තුල වද දෙයි. මුහුණු අශෝභන වෙයි. ස්වයං දණ්ඩනීයත්වයට මොහොතක් පාසා පාත්‍රවෙයි. අවසානයේදී ඇතැමුන් පසුතැවෙයි. මෙය ස්වභාව ධර්මයේ අපූර්වත්වය මත ලැබෙන්නා වූ දඬුවමයි. එය ද කිසිවෙකුට ප්‍රතික්ෂේප කල නොහැකියි. හදවතේ කැඩපත මුහුණයි. The face is the mirror of heart. මෙය ඉංග්‍රීසි ප්‍රස්ථා පිරුළක් සේ ද සැලකේ. එහෙත් මෙත්තානිශංස සූත්‍රයේ - **මුඛ වණ්ණෝ විප්ප සීදති** යනුවෙන් වඩාත් පැහැදිලි වන්නේ ද මෙම ධර්මතාවයි.

**පඬි වදන් ලෙසින්, ආප්තෝපදේශයන් ලෙසින්, විද්‍යාත්මක නිගමනයන් ලෙසින් පසුකාලීනව එළි දක්වා ඇති සෑම න්‍යායක්ම මීට වසර 2552 ට පෙර අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ස්වකීය ආර්ය පර්යේෂණය තුලින් ලද අවබෝධඥානයෙන් එළි දක්වන ලද විශ්ව්‍ය ධර්මතාවන්මය.**

තමා යහ මගට ගැනීමේ අරමුණෙන් කල්‍යාණ මිතුරෙකු යමක් කල කී විට, එය මනසට පීඩාවක් සේ ඒ මොහොතේ දුටුවද, ප්‍රඥාවන්තයකු කිසි විටක ක්ෂණික ප්‍රතිචාර නොදක්වයි. ප්‍රඥා ගෝචරව උද්ගත වූ තත්වය පිළිබඳව විමර්ශනය කරයි. තමා වරදින් මුදවා ගැනීම සඳහා ඒ ගත්තා වූ ක්‍රියා මාර්ගය නිවැරදි බව අවබෝධ වනවාත් සමග දෙපාර්ශවයේ ඇසුර වඩාත් ශක්තිමත් වූ බැම්මකින් වෙළී යනු ඇත. **කල්‍යාණ මිත්‍ර ඇසුර ජීවිතයට සම්පතකි.** එවන් මිතුරන් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ වටිනාකම අවබෝධ වන්නට ගත වන්නා වූ කාලය තම තමාගේ බුද්ධියට සාපේක්ෂ වනු ඇත. වරදක් පිළිගැනීමට මැළි පුද්ගලයා, තම දුර්ජන සිත පුරා වෙළී ඇති මානාධික පාපී සිතිවිලි මගින් මොහොතක් පාසාම දැවී දැවී ඉතා සීඝ්‍රයෙන් පරිහානිය කරා ඇදී යන්නේ එබැවිනි.

සිඟාලෝවාද සූත්‍රයේ පෙන්වා දෙන අන්දමට පවිටු මිතුරා වරද අගය කරයි. මිත්‍ර ප්‍රතිරූපකයා ද පවට අනුබල දෙයි. ඔවුන් තම මිත්‍රයා පවින් වළකාගැනීමේ ක්‍රියා මාර්ගයකට අවතීර්ණ නොවෙයි. බුද්ධිමත් කල්‍යාණ මිතුරා වරදක් පෙන්වා දෙන්නේ අන් අය ඉදිරියේ නොවේ. ඉතාමත් දූරදර්ශී ලෙසිනි. එසේ වරදක් පෙන්වා දීම ද තම මානයට කැළලක් සේ දකින දුෂ්ට චරිත ද අද සමාජයේ දැකිය හැකිය. එවැන්නන් වරද පිළිගැනීමට මැළි වෙති. වරද යටපත් කරමින් තමා නිවැරදි බව හුවා දක්වමින්, වරද පෙන්වා දුන් තැනැත්තා සමග උරණව ප්‍රසිද්ධියේ අවඥාවට ලක් කිරීමට ඇතැමුන් වෙර දරයි. එය සිය දුර්ගුණ තව දුරටත් එළි දැක්වීමක් පමණි. ඔවුනට කල්‍යාණ මිතුරෙකු හඳුනා ගැනීමට තරම්වත් ප්‍රඥාවක් නොතිබීම මහත් අභාග්‍යයකි.

මෙලොව පරලොව දෙකෙහිම සැප ළඟා කර ගැනීම සඳහා මහත් වූ දායකත්වයක් සපයන කල්‍යාණ මිතුරන්ගේ ඇසුර ඉතාමත් ශ්‍රේෂ්ඨය, සිදුහත් කුමරා කල්‍යාණ මිතුරෙකු සේ සමීපව ඇසුරු කල ඡන්න ඇමති අභිනිෂ්ක්‍රමණයට බාධා කළේද ? නැත. වෙන්ව යාම හදවතට දරාගත නොහැකි වුවද, යහපත් අරමුණක් ඇතිව සිදු කරනු ලබන ක්‍රියාවනට සහයෝගය දීම කල්‍යාණ මිතුරකුගේ ලක්ෂණයයි.

බෞද්ධ ජනතාව නිරන්තරයෙන්ම කුසල කර්මයක් සිද්ධ කර ගැනීමෙන් අනතුරුව, පැහැදුණ සිතින් කරන්නා වූ ප්‍රාර්ථනය ඉතා ශ්‍රේෂ්ඨය.

**ඉමිනා පුඤ්ඤ කම්මෙන - මාමෙ බාල සමාගමො**
**සතං සමාගමො හොතු - යාවනිබ්බාන පත්තියා**

(බුදුරජාණන් වහන්සේ)

**By means of this meritorious deed; May I never join with the foolish**
**May I join always with the wise, Until the time I attain Nibbana**

මා විසින් සිදු කරගනු ලැබූ මෙම කුසල කර්මයේ බලයෙන්, උතුම් නිර්වාන ධර්මය අවබෝධ කර ගන්නා තෙක්ම, කවර කලකදීවත් මා අසත්පුරුෂ බාලයින්ගේ ඇසුරකට පත් නොවේවා ! නිරන්තරයෙන්ම බුද්ධිමත් සත් පුරුෂයින්ගේ ඇසුරම ලැබේවා !!! යන්න මෙහි අර්ථයයි.

මෙය නිවන් අවබෝධ කරගන්නා තෙක් උපදිනා ආත්මයක් පාසාම කල්‍යාණ මිතුරු සම්පත්තියම ලැබීම සඳහා නිරතුරුවම බෞද්ධ සිත් සතන් තුල ඇති කරගත යුතු මාහැඟි ප්‍රාර්ථනයකි. මෙම අනුහස් සහිත ශ්‍රේෂ්ඨ ප්‍රාර්ථනා අඩංගු ගාථා ධර්මයන් වසර 2552 පුරා රැක ගනිමින් වත්මන් සමාජයට දායාද කිරීමට ඇප කැප වී කටයුතු කල අපගේ සඟ පරපුරට සකල ලෝක වාසී බෞද්ධ ජනතාවගේ ගෞරවය හිමිවිය යුතුමය.

ශ්‍රී ලාංකික දිරිය දරුවන්ගේ භාග්‍යයට උපන් සංඝ පීතෘවරයින්ගෙන් සමස්ථ සමාජය තවමත් පෝෂිත වී තිබීම, අකාලික වූ ශ්‍රී සද්ධර්මයට මාහැඟි නිදසුනකි. නිර්මල බුද්ධ ධර්මය මේ දක්වා පවතින මෙම ශ්‍රී ලංකාද්වීපයේ **සඟ පරපුරෙන්** සිදුවන ශාසනික සමාජ මෙහෙවර අති මහත්ය. අප සැමගේ කල්‍යාණ මිත්‍රයා වූ තථාගත බුදු සම්ඳුන් වෙත ළඟා වීමට මග පෑදෙන්නේ ශ්‍රී සද්ධර්මය තුලිනි. එහි අමා රසය ලබා දෙමින් අපව ධර්මයෙන් පෝෂණය කරන්නෝ සංඝ රත්නයමය. අවශ්‍ය වන්නේ සක්කාය දිට්ඨියෙන් තොරව සරු දේ සරු හැටියටත්, නිසරු දේ නිසරු හැටියටත් දකිමින්, මාර්ගෝපදේශකයාණන්ගේ ශාස්තෘවරයාණන්ගේ උපදේශයනට හොඳින් සවන් දී, **බාධක ගැටළු අපහසුතා කොතෙක් පැන නැගුණ ද සියල්ල අභිභවා යා යුතු මග ගමන් කිරීමයි**. අතීත කථා වස්තුවක සඳහන් පරිදි, ඇතා පරීක්ෂා කල අන්ධයින් මෙන්, තමාගේ ස්ථාවරයටම වැට කඩොළු බැඳගන්නේ නම් සම්මා දිට්ඨිය පහළ වීමට ඇති ඉඩ කඩ ඇහිරී යයි. අන් මතයන්ට ද **නම්‍යශීලීවීම** වැදගත් වන අතර එය විමර්ශනය කිරීමේදී බොහෝවිට නිවැරදි වූ ක්‍රියා මාර්ගයනට අවතීර්ණ විය හැක. ස්වයං මතධාරී වීම බොහෝ විට අවුල් වියවුල් වලට මග පාදයි. උතුම් බුද්ධ පුත්‍රයෙකුගේ අනුශාසනා පුහුදුන් ජනතාවගේ ජීවන ගැටළු වලට මහත් වූ අස්වැසිල්ලක් මෙන්ම ආශිර්වාදයක් වන්නේ සැබවින්ම ධර්මය තුල පෝෂණය විය හැකි ආකල්පමය වෙනසකට එමගින් පසුබිම සකස් කෙරෙන බැවිනි. ශ්‍රී සද්ධර්මයේ ගැබ්ව ඇති සත්‍යයේ බලය අභිභවා යා හැකි කිසිදු ශක්තියක් හෝ බලවේගයක් නැත්තේමය.

නිර්භීත ශ්‍රේෂ්ඨ චරිතයකින් මෙන්ම, රට ජාතිය බේරා ගැනීම සඳහා මහා සාගරයට තරුණ වියේදීම බිලිවීමට තරම් ආත්ම ශක්තියකින් පරිපූර්ණ, විහාර මහා දේවිය **බුදු ගුණ** හා ජාත්‍යනුරාගී ගී ගයමින් සිය දරුවන් නැළවූ බවත්, **භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් හා ආශිර්වාද** ලබමින් පෙරමුණට යාමේ වැදගත්කම තරුණ වයසට පත් වූ පසුද සිය දරුවන්ට කියා දුන් බවත්, ස්වාමීන් වහන්සේලා 500 නමක් දුටුගැමුණු සේනාවේ මුලට වැඩම කරවීමට උපදෙස් දුන් බවත් ඉතිහාසයේ සඳහන්ය.

සඟ පරපුරේ කල්‍යාණ මිත්‍ර ඇසුර ලැබීමට භාග්‍ය සම්පන්න වූ අසරණ ජනතාවට ත්‍රිවිධ රත්නය සරණ වනු නියතය. මේ සඳහා පළමුවෙන්ම **ශ්‍රද්ධාව** ඇතිකරගත යුතුයි. මෙවන් කල්‍යාණ මිත්‍ර ඇසුර ලැබීමට භාග්‍ය සම්පන්න වූ පුහුදුන් ජනයා තම නූපන් කුසල් උපදවා ගැනීමටත්, උපන් කුසල් වඩවා ගැනීමටත් භාග්‍ය සම්පන්නවනු නියතය. ඒ අනුව අසරණ දුක් විඳින ජනතාවට තමාට හැකි කුමන අයුරකින් හෝ පිහිට වීමට ද හදවතින්ම පෙළඹෙනු ඇත. උපන් සෑම පුද්ගලයෙකුම සතුට සොයා යයි. කරන, කියන, සිතන, පතන සෑම දෙයක්ම තමන්ගේ මෙන්ම අනුන්ගේ සතුටටත් හේතු වන විට සිත **යහපතටම** යොමු වේ. පිං සිතිවිලි වර්ධනය වේ. එවන් පුද්ගලයා තුල නිරන්තරයෙන්ම වැඩෙනුයේ **දාන පාරමිතාවයි. නොවැඩූ ගුණ වඩවාලමින්, නොඇසූ බණ අසාගනිමින් ජීවිත ගුණ දහමින් පුරවාගෙන නිවැරදි දැක්මක් ඔස්සේ යහපත් වූ සංකල්පනාවන් මත පරිත්‍යාගශීලී බුද්ධිමතුන් මැදුම් පිළිවෙත ඔස්සේම ගමන් ගනී.** මෙහොතින් මොහොත ඒ පරිත්‍යාගශීලී හදවත් නිරාමිස ප්‍රීතියෙන් පිනා යනු ඇත. ජීවිතයේ යථාර්ථය අවබෝධ කරගැනීමට **කල්‍යාණ මිත්‍ර සම්පත්තිය** මගින් ලැබෙනුයේ ඉමහත් දායකත්වයකි. **දහම් රසය හඳුනාගත්තෝ පහන් සිතින් සැමදා සුවසේ වෙසෙති.**

මිනිසා එදිනෙදා මුහුණ දෙන ජීවන දුක් ගැටළු වලට කාලෝචිත විසඳුම් ගැබ්ව ඇති **බුදු දහම** සසර දුකින් එතෙර වීම සඳහා මඟ පෙන්වන ඉගැන්වීමක් පමණක් නොවේ. අංග සම්පූර්ණ සමාජ දර්ශනයක් බුදු දහම තුලින් නිර්මාණය වේ. වත්මන් සමාජය දෙස අවධියෙන් සිට ලෝ වැස්සන්ගේ බුද්ධිමය නෙත විවර කරවීමට වෙර දරණ අපගේ සඟ පරපුර දරන්නා වූ කාලෝචිත වෑයම සුළු පටු නොවන අතර ඉඳ හිට හෝ මල් ඵල ගැනෙන අයුරුද අද සමාජය තුලින්ම විද්‍යමාන වේ. බුදුරජාණන් වහන්සේ විසින් පසක් කොට දුන් නිර්වාණ ගාමිණී පටිපදා මාර්ගය වූ මැදුම් පිළිවෙත හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අවබෝධයකින් යුතුව නෙත් පිසදා අවතීර්ණ වීමට අද අන්තර්ජාතික ප්‍රජාව පවා දක්වන්නේ මහත් උනන්දුවකි.

ඔවුන් අද සදහම් පිපාසිතව ශ්‍රී ලාංකික බෞද්ධ භික්ෂූන් වහන්සේට ශාසනාලයෙන් ඇරයුම් කරයි. ඔවුන්ගේ බාහිර ජීවිත භෞතික සැප සම්පත් වලින් කෙතරම් සුඛෝපභෝගී වුවත්, ඇතුළත කුමක් හෝ අඩුවක් ඇතිබව ඔවුන්ගේ බුද්ධියට ගෝචර වී ඇත. ඒ අධ්‍යාත්මික සැනසීමයි. එය ලබාගැනීමට නම් ව්‍යක්ත ධර්මධර භික්ෂූන් වහන්සේ ගේ ඇසුර අත්‍යවශ්‍ය බවට අද බටහිර ලෝකය දැනුවත් වී හමාරය. ඒ සඳහා අද ඇති ඉල්ලුම අති විශාලය. ඔවුන්ගේ සදහම් පිපාසය සංසිඳුවීමට වැඩම කරවන බුද්ධිමත් මහා සංඝරත්නය මෙම පින් බිමෙහි ආර්ථික හා සමාජ සංවර්ධනය පිණිස ජාත්‍යන්තර ප්‍රජාව යොමු කරනුයේ ඔවුන් වෙත ලබා දෙන්නා වූ ආගමික හා අධ්‍යාත්මික සංවර්ධනය තුලින්ම ය. බෞද්ධ ධර්මය නිසි ජීවන මඟ පෙන්වයි. දස කුසල්හි ආනිශංසත් පංච දුෂ්චරිතයන්ගේ ආදීනවත් බුද්ධියට ගෝචර කර ගනිමින් දෛනික ජීවිතයේ ප්‍රායෝගිකවම ප්‍රගුණ කල හැකි **පරෝපකාරය, වැඩිහිටියන්ට සැලකීම** වැනි සදාචාරාත්මක ක්‍රියාවන්හි නිරතවීමට

ස්වේච්ඡාවෙන්ම ඔවුන් පෙළඹෙනුයේ භෞතික ලෝකයේ පවතින මේ සියලුම දෙයෙහි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම නම් වූ ත්‍රිලක්ෂණය අවබෝධ වීමෙනි.

මේ අනුව විදේශීය ජනතාව, සඟ පරපුරෙන් සිදු වී ඇති ප්‍රතිභාපූර්ණ මාහැඟි සේවය මහත් සේ අගයමින් මුළු ලොවටම කියා පාමින් අඟ හිඟ කමින් තොර ගුණ දහමින් සපිරි සමෘද්ධිමත් සමාජයක් ගොඩනැංවීමෙහි ලා සද්ධර්මාවබෝධයෙන් කැපවී සිටීම දෙලොවම ජයගැනීම සඳහා වූ මාහැඟි ප්‍රවිෂ්ඨයකි. තථාගත බුදුරජාණන් වහන්සේ සංසාරගත සත්වයාගේ කල්‍යාණ මිතුරා බව අවබෝධ වන්නේ ශ්‍රී සද්ධර්මය තුලිනි. ඒ සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දෙන සඟ පරපුරට සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පූජෝපහාරය ලැබිය යුතුමය.

# 6

# විරිය වඩන දිරිය සිසුන්

කුමන රටක කුමන සමාජයක කුමන තරාතිරමක උපත ලැබුවද, උපන් සෑම සත්වයෙකුටම එක හා සමාන කුසලතාවන් උරුම වන්නේ නැත. උපන් කුසලතාවන් තිබුණද, එය වර්ධනය කර ගැනීම සඳහා ලැබෙන්නා වූ වාතාවරණයන් ද විවිධය. අද සමාජය දෙස බලන විට, ඉතා සීමිත දිරිය සිසු දරුවන් පිරිසක් සුපිරි ජීවිත ගත කල ද, බහුතරයකගේ සැබෑ තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස්ය.

**ජය ගැනීමට ද අභියෝගයක් තිබිය යුතුමය.**

දහසකුත් එකක් අඟ හිඟ කම්, බාධක කම්කටොළු මධ්‍යයේ අධ්‍යාපන මාවතේ පා නගන දරුවෝ තෙවන ලෝකයේ රටක් වන, සම්බුද්ධ ශාසනයේ සදහම් සුවඳින් නැහැවී පවතින මේ ශ්‍රී ලංකා දෙරණ තුල බහුල වශයෙන් දැකිය හැක. කුසට නිසි අහරක් නොමැතිව කොළ කැඳ කොප්පයකින් හෝ මඤ්ඤොක්කා අලයකින් දවසේ කුසගින්න සංසිඳුවා ගනිමින් **අධ්‍යාපන මාවතේ ජය ලැබීමට මහත් වූ වෙහෙසක් ගන්නා දරුවෝ** බහුතරයක් මෙම දෙරණ තළය පුරාම විසිරී ඇති බව සමාජය දෙස අවදියෙන් බලන්නෙකුට මනාව පැහැදිලිය. සැතපුම් ගණන් පා ගමනින්ම පාසැල වෙත පියනගන සිසු දරු දැරියන්ගේ දුක් කඳුළු හා දහඩිය බිඳු පාසැල් නිල ඇඳුම මතම සිඳී වියලී යනු ඇත. ඔවුන් දිනපතා සැතපුම් ගණන් දෙපයින් ගමන් ගන්නා ගමන් මාර්ග බොහෝවිට ඉතාමත් අනාරක්ෂිතය. ඇතැම් ගම්බද පෙදෙස් තවමත් වන ලැහැබ කටු පඳුරු ආදියෙන් ගහණව ඇති අතර විසකුරු සතුන්ගෙන් සිදුවන උවදුරු ද ඉතා භයානකය. නිසිලෙස කාලීනව නඩත්තු නොකරනු ලැබූ මාර්ගයන්හි ඇති පාලම් බෝක්කු ආදිය ද ගම්බද පාසැල් දරුවනට මහත් තර්ජනයක් වී ඇත.

එම සියලුම අභාග්‍ය සම්පන්න වාතාවරණයන් හමුවේ වඩාත් ශෝචනීය වූ අවස්ථාවන් උදා කරවමින් අපගේ සිසු දැරියන් ගේ ජීවිත පවා බිලි ගැනීමට තරම් විකෘති මානසිකත්වයකින් යුත් ම්ලේච්ඡ, මනුෂ්‍යත්වයට පවා නිගා කරගන්නා මිනිසුන්ගෙන්ද ගහණ වන ලැහැබවල් හරහා මේ දිරිය දරු දැරියන් පාසැල වෙත පිය නගනුයේ තම ජීවිත පරදුවට තබා යහපත් හෙට දිනයක් උදා කරගැනීමේ අරමුණෙනි.

එහෙත් අභාග්‍යය නම් මෙවන් සිසු දරුවන්ගේ යථාර්ථය විවිධ කඩතුරාවන්ගෙන් ආවරණය වී තිබීමයි. බොහෝ විට සමාජය මතුපිටට එළිදරව් වන්නේ සියල්ල අවසන් වීමෙන් පසුවය. එතෙක් ඔවුන් පිළිබඳව අවධානය යොමු වන්නේ ඉතා සීමිත පිරිසකගේ පමණි. සැබෑ තතු හෙළි වීමෙන් පසුව ද බහුතරයක් එම තත්ත්වයනට වගකිවයුත්තෝ කවුරුන්දැයි සොයමින් සිටිනු විනා එවන් දරුවන් වෙනුවෙන් කල යුතු දෑ පිළිබඳව නොසිතයි. අනාගත ලොවේ පූදින්නට වෙර දරණ මල් කැකුළුවලට රැකවරණයක් පිහිටක් වීම සඳහා තම තමාට හැකි පමණින් හෝ අවතීර්ණ වන්නේ නම් එය මෙලොව පරලොව දෙකෙහිම සැප පිණිසම හේතු වේ.

**දිරිය දරුවකුගේ සත්‍ය කථා පුවතක් මෙසේය.**

ඔහු කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රැටියල ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශයට අයිති ගෝවින්න - ඉමලකන්ද නම් වූ දුෂ්කර ග්‍රාමයේ පදිංචි, අයහපත් ආර්ථික පසුබිමක් උපතින්ම උරුම වූ පවුලක එකම දරුවා විය. රබර් කිරි කැපීම වෘත්තිය කර ගත් සිය දෙමාපියන් මේ දරුවා හදා වඩා අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා දුන්නේ දහසකුත් එකක් බාධක කම්කටොළු මැදිනි. අයහපත් කාලගුණික තත්වයන් පැවති දිනවලදී රබර් කිරි කැපීම සිදු නොවන හෙයින් දෛනිකව ලැබෙන්නා වූ සුළු වේතනය පවා අහිමිව දින ගණන් කුසගින්නෙන් ගත කළ අතර පාසල් යන එකම දරුවාගේ කුසට මස්ද්කොක්කා අලයක්වත් තම්බා දීමට නොහැකිව උණු කඳුළු බිඳී කුසගින්න දරාගත් අවස්ථා එමටය.

තම ආදරණීය දෙමාපියන්ටත්, ගුරුවරුන්ටත් වැඩිහිටියන්ටත් ඉතා කීකරුව, ගෞරව සම්පන්නව, ආචාරශීලීව අධ්‍යාපන කටයුතුවල නිරත වූ ඔහු කිසිදු අමතර පන්තියකට ගියේ නැත. භූමිතෙල් කුප්පියේ පහන් සිළුව තම ජීවිතයට ඇති එකම ආලෝකය බව නුවණින් කල්පනා කර කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබාගනිමින් සියලු අභියෝග අභිභවා ජීවිත ජයග්‍රහණය ලැබීමට මහත් වෑයමක් දැරුවේය. ඇතැම් අවස්ථාවලදී යහළුවන් අතර අවමානයට පත් වුවද, අධිෂ්ඨාන පූර්වකව යහපත් දෛනික පැවැත්මකින් ඉදිරියට ගිය ඔහු අවඥා, අවමාන හමුවේ මොහොතකුදු නොසැළුණේය.

අළුයම **සැතපුම් 3 1/2 ක්** පමණ දුරක් පා ගමනින්ම, ගමේ පාසල කරා පා නැගූ දිරිමත් සිසු දරුවකු වූ මොහු 1997 පැවති 5 වසර ශිෂ්‍යත්ව විභාග යෙන් ලකුණු 172 ක් ලබා වැඩිදුර අධ්‍යාපනය සඳහා හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළු වූයේ යහපත් අනාගතයක බලාපොරොත්තු පොදි බැඳගෙනය. එහෙත් මෙම පාසල පිහිටියේ තවත් යොදුන් හයක් පමණ ඔබ්බෙනි. පාසල වෙත නියමිත වේලාවට යාම මෙම දිරිය දරුවාට මහත් අභියෝගයක් විණි. පාසල් ගමන සඳහා වැඩි කාල සීමාවක් යෙදවීමට සිදු විය. අභියෝග හමුවේ නොසැළුණ ඔහු නිවසේ සිට සැතපුම් තුන හමාරක දුර පා ගමනින් ගොස් ඉතිරි දුර ප්‍රමාණය යාමට බස් රථයක් ගැනීමට පෙළඹුණි. ඇතැම් දිනවල අළුයම අල්ලට සීනි ටිකක්

ගෙන තේ කහට කෝප්පයකින් සප්පායන් වන ඔහු පාසැල් නිල ඇඳුමෙන් සැරසී, පොත් ටිකත්, සපත්තු කුට්ටමත්, හුළු අත්තත් අතැතිව රබර් වගාකොට ඇති ඉමලකන්දේ පිහිටා ඇති තම නිවසේ සිට කඳු පාමුලට විත් හුළු අත්ත නිවා දමා පාවහන්ද පැළඳගෙන බස් රථයකට නැගීම සඳහා යුහුසුළුව **ගෝවින්න මංසන්දිය** වෙත ගමන් කරන්නට වූයේ නියමිත වේලාවට කෙසේ හෝ පාසලට යාමේ අරමුණෙනි. රබර් වත්තේ ගල් මුල්වල හැපීම නිසා, ඔහු සතු එකම පාවහන් යුගලට සිදුවන හානි අවම කර ගැනීම ද ඔහුගේ වෑයමක් විය.

කුසට නිසි අහරක්වත් නොලබා යොදුන් 8 පමණ මග ගෙවමින් පාසල් අධ්‍යාපනයේ සාර්ථක ඵල ලබා ගත් ඔහු 2003 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී පෙනී සිටි **විෂයන් 9 ටම විශිෂ්ඨ සාමාර්ථ** ලබා ගත්හ. අනතුරුව අධ්‍යාපන මාවතේ ඉදිරියට යාම ඔහුට සිහිනයක් බඳුවිය. එහෙත් යහපත් අරමුණක් ඇතිව සුවච කීකරු ශිෂ්‍යයෙකු ලෙසින් යන්නා වූ මෙම ගමනට කාගේ හෝ පිළිසරණක් ලැබෙනු ඇතැයි ඔහු තුළ විශ්වාසයක් විය. පුස්තකාලයකින් හෝ අසල්වාසී නිවසකින් හෝ **"බුදුසරණ"** පුවත්පත ලබාගෙන කියවීමේ පුරුද්දක්ද, නිසි ලෙස අඛණ්ඩව බුදුන් වැඳීමේ පුරුද්දක් ද ඔහු සතු විය. ජනෙල් දොර පියන් පවා නැති ඔහුගේ නිවහනේ ඔහුට පාඩම් කිරීම සඳහා වෙන්ව තිබූ අබලන් වූ කුඩා මේසය මත බුද්ධ රූපයක් තබා ගෙන කුප්පි ලාම්පු එළියෙන් **"බුදුසරණ"** පුවත්පත බලද්දී, ඔහුගේ දෙනෙත් යොමු වූයේ **දුප්පතුනට සෙත සලසන ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම** යන ශීර්ෂයටය. ඔහු ඉතා උනන්දුවෙන් පුවත්පත් දැන්වීම කියවන්නට විණි. ආර්ථික අසමතුලිත වාතාවරණය හෙවත් දුප්පත්කම **ප්‍රධාන සුදුසුකමක්** සේ දුටු ඔහුට ඇති වූයේ අප්‍රමාණ සතුටකි. අවශ්‍ය සියලු ලිපි ලේඛන සියල්ලක් නිසි ලෙස සකස් කර විදුහල්පති තුමා සහ ග්‍රාම නිලධාරී මගින් සහතික කරවා, ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පෙර **ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමේ** ශ්‍රී ලංකා සම්බන්ධීකරණ කාර්යාලය වෙත එවීමට ඔහු සමත් විය.

**දරිද්‍රතාවෙන් පෙළෙන දිරිය දරුවකුගේ හද සැනසූ, 2004/05/04 "බුදුසරණ" පුවත්පත පළ වූ දැන්වීම**

ගත වුයේ සති කීපයකි. යහපත් ලෙස ධාර්මික ජීවිතයක් ගත කල මේ දිරිය දරුවාගේ අනාගත බලාපොරොත්තු මල් ඵල ගැන්වෙන්නට විය.

ඒ අනුව තමා ශිෂ්‍යත්ව ලාභියෙකු ලෙස සුදුසුකම් ලබා ඇති බවත් ත්‍රෛමාසිකව රුපියල් 2250/= බැගින් අ.පො.ස උසස් පෙළ විභාගය දක්වා ශිෂ්‍යාධාර හිමිවන බවත් දන්වමින් ඔහු වෙත ලැබුණා වූ ලිපිය කියවීමෙන් අනතුරුව ඔහුගේ නිරහංකාර හදවතට දැනුනා වූ අහිංසක සතුට දෙනෙත් බොඳ කරමින් උතුරා හැලෙන්නට විය. තමා වෙත ලැබුණා වූ මෙම ශිෂ්‍යත්වය සිය දෙමාපියනට ද මහත් වූ ශක්තියක් බව ඔහුගේ පිළිතුරු ලිපියෙහි සඳහන් වූයේ සිය දෙමාපියන් ඔහු වෙනුවෙන් කෙතරම් දුක් විඳිනවා ද යන්න අපහට ප්‍රත්‍යක්ෂ කරවමිනි.

තමා වෙත මාසිකව කලට වේලාවට ලැබුණ ශිෂ්‍යාධාර මුදල, ධෛර්යමත් මේ සිසුවාගේ වීර්යය වඩ වඩාත් තීව්‍ර කිරීමට සමත් විය. දුක් කම් කටොළු අභිභවා ඉදිරියට යාමට ලැබුණා වූ ආර්ථිකමය ශක්තිය සමගින් ගුණ දම් පෝෂණයක් ලද ඔහු නිරතුරුවම තමාට ලැබුණා වූ ශිෂ්‍යත්වය අගය කරමින්, ශිෂ්‍යත්ව පදනමේ නීති රීතිවලට අනුව පාසල මගින් සහතික කර එවිය යුතු වූ සියලු වාර්තා **ක්‍රමානුකූලව අප්‍රමාදව** ශිෂ්‍යත්ව පදනම වෙත ඉදිරිපත්කලේ ශිෂ්‍යත්ව පදනම තුලින්ම ලැබුණා වූ පන්නරය විදහා දක්වමිනි. ශිෂ්‍යත්ව පදනමේ විධිමත් පරිපාලනය හා කාර්යක්ෂම සේවය සඳහා එතුලින් ලැබුණේ ඉමහත් සහයෝගයකි.

සිය කුඩා නිවසේ ජනෙල් පියන් පවා නොමැති කවුළුව අසල අබලන් වූ මේසයේ ඉදිරියෙන් තබාගෙන සිටි බුදුරජාණන් වහන්සේගේ පින්තූරයට මල් පුදා පොල්තෙල් පහනක් දල්වා දිනපතා බුදුන් වැඳීම ඔහුගේ ජීවිතයේ ශ්‍රේෂ්ඨ අංගයක් විය. ඒ සඳහා මූලිකත්වයක් දුන් ඔහු අනතුරුව නිසි කාල කළමණාකරණයකින් යුතුව තම අධ්‍යයන කටයුතුවල නිරත වුණි. පාඩම් කටයුතු අවසන් වූ පසු මේසය මත වූ පොත් පත් සියල්ල ඉටි රෙද්දකින් ආවරණය කරන ඔහු, දින පොතක් නොමැති වුව ද අභ්‍යාස පොතක ජීවිත අත්දැකීම් සටහන් කර තැබීමට අමතක නොකළේය.



**ඔහුගේ කාමරය -**
**බුද්ධ ප්‍රතිමාවක් මේසය අබියස තබා සුදානම් කරගෙන තිබූ අයුරු**

සියලුම විෂයයන් කෙරෙහි නිසි අවධානය යොමු කරමින් ඉදිරියටම සාර්ථක ලෙස අධ්‍යයන කටයුතුවල නිරත වූ ඔහු 2006 වසර අ.පො.ස උසස් පෙළ විභාගයට ජීවිතයේ පළමු වරට පෙනී සිටිමින් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සහ ජීව විද්‍යාව විෂයයන්ට **විශිෂ්ඨ සාමාර්ථ** (A) සහ ඉංග්‍රීසි විෂයට **ඉතා හොඳ සාමාර්ථයක්** (B) ලබා ගනිමින් **කළුතර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කුසලතාව** පවා හිමිකරගැනීමට සමත් වූයේ නිරතුරුවම දුක් කඳුලින් පිරී සිය අහිංසක දෙමාපියන්ගේ දෙනෙත්වලට සතුටු කඳුලක රසාස්වාදය මොහොතකට හෝ පසක් කර දෙමිනි. **දිරිය දරුවන්ගේ වීර්යය මල් ඵල ගැන්වෙන ආකාරය සමස්ථ සිසු පරපුරටම පෙන්වා දෙමින්**, දිවයිනම නියෝජනය කෙරෙන කුසලතා

ලැයිස්තුවේ **47** වන ස්ථානය හිමි කරගත් ඔහු **2007** වර්ෂයේදී කොළඹ වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධව සරසවි අධ්‍යාපනයට වරම් ලැබුවේ ය. නිසි ශිෂ්‍යත්ව ක්‍රමයක ශිෂ්‍යත්වලාභියෙකු වීමට භාග්‍ය ලද ඔහු දෙමාපියනට ගුරුවරුන්ට හා වැඩිහිටියනට ගෞරව භක්ත්‍යාදරයෙන් යුතුව අධ්‍යාපනය ලබමින්, තමා වෙත ලැබෙන්නා වූ අමිල ශිෂ්‍යත්වය නිරන්තරයෙන්ම අගය කරන්නට විය.


0425

2007.01.27.

දළදා සමිඳු පිහිටයි!

සීතා ගුණතිලක මහත්මිය,
[illegible] ලේකම්,
ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම.

ගරු මහත්මියනි,

ලැබූ 2007 වසර ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමේ [illegible]

පුරා වසර දෙකක් ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමේ අනුග්‍රහය [illegible] ලද මා 2006 අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් කොළඹ වෛද්‍ය විද්‍යාලයට [illegible] ලබමින් [illegible]

සියලු සතුටු ලැබේවා!

මෙයට,
ශිෂ්‍යත්වලාභී,

අධ්‍යාපනික ශිෂ්‍යත්වයේ නිසි ඵල ලැබීමෙන් අනතුරුව, වෛද්‍ය විද්‍යාල අධ්‍යාපනය සඳහා ද අනුග්‍රාහකත්වය අපේක්ෂාවෙන් ..

# 7

# බෞද්ධ නායකත්වය

ඉගෙනීමට දක්ෂකම් ඇති වාසනාවන්ත, මව් පිය සෙනෙහස ලද, දරුවකු දෙමාපියන් විසින් ශාසනයට පූජාකළේ නම් එය මහාර්ඝ උදාර ශාසන හිතකාමී පරිත්‍යාගයකි. එහි පුණ්‍ය සම්භාරය මූලිකවම එම දෙමාපියනට හිමි විය යුතුමය. එවන් භික්ෂුන් වහන්සේ නමක් ශ්‍රද්ධාවෙන් ධර්මානුධර්ම ප්‍රතිපත්තියේ යෙදෙමින් ඉගෙනීමේ අගය හඳුනා ගනිමින්, ලොවටම එහි අගය හඳුන්වා දෙමින් සිදු කරන්නා වූ මහජන සේවයක් වේ නම්, එහි ඵල ලබන්නන් එම බෞද්ධ නායකත්වය යටතේ සමාජ සාරධර්මයන්හි ගුණ සුවඳ විහිදුවමින් අනාගත ලෝකය බබලවනු නියතය. ශ්‍රේෂ්ඨ අරමුණකින් යුතුව එවන් අවකාශයක් ගොඩනැංවීමෙහිලා **අති පූජණීය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගේ** චින්තනය ඉවහල් වීම දරිද්‍රතාවෙන් පෙළෙන අධ්‍යාපනයෙහි දක්ෂකම් ඇති දරුවන්ගේ මහත් වූ භාග්‍යයක් මෙන්ම ඔවුන්ගේ නුපන් කුසල් මතුකරලීමේ ආශ්චර්යමත් සංසිද්ධියකි.

අධ්‍යාපන මාවතේ ඉදිරියටම පිය නැගීමට කොතෙකුත් දක්ෂතාවන් තිබුණ ද, පවුලේ ආර්ථික පසුබිම එයට බාධාවක් වීමේ හේතුවෙන් අධ්‍යාපන කටයුතු අතර මග නවතා දමන දරුවන්ගේ සංඛ්‍යාව අති විශාල ය. අ.පො.ස සාමාන්‍ය පෙළ ඉතා උසස් ලෙස සමත්ව දරිද්‍රතාවේ සෝ සුසුම් මැද උසස් පෙළ අධ්‍යාපනය පවා අත් හරින ශ්‍රී ලාංකික දූ පුතුනට, අධ්‍යාපනය ඉදිරියටම කරගෙන යා හැකි යහපත් ආර්ථික පසුබිමක් සැකසෙන්නේ නම් සමාජයට එලදායී ලොවමට වැඩදායී රැකියාවල නියුතු විය හැකි උගතුන් දස දහසක් බිහි වනු ඇත. හැකියාවන් නිපුණතාවන් ඇති ශ්‍රී ලාංකික දරුවනට ආර්ථික බාධකයන් ජයගැනීමට හැකිවන්නේ පරිත්‍යාගශීලි සුපින්වතුන්ගේ කාරුණික අවධානය ඔවුන් වෙත යොමු වන්නේ නම් පමණි. මෙම ශ්‍රේෂ්ඨ අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙන් පරිත්‍යාගශීලි පිරිසකගේ ආධාර උදව් ඇතිව, **වාර්ෂිකව අ.පො.ස උසස් පෙළ අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකාවේ සියලු පළාත් නියෝජනය වන පරිදි, කිසිදු භේදයකින් තොරව ශිෂ්‍යත්ව ලබාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නට වූයේ මීට වසර දහයකට පමණ පෙරදීය. එවකට අ.පො.ස සාමාන්‍ය පෙළ උසස් ලෙස සමත් අඩු ආදායම් ලාභී දරුවනට දීප ව්‍යාප්ත ශිෂ්‍යත්ව ක්‍රමයක් නොපැවතිණි.** නැණවත් පුරවැසියන් ලෙසින් ලොව බැබලවීමට කුසලතා

පරිපූර්ණ සිසුන් දරන්නා වූ අති ශ්‍රේෂ්ඨ වෑයමට ආර්ථික මෙන්ම අධ්‍යාත්මික පරිපෝෂණයක් ලබා දීමේ අරමුණෙන් 1998 දී **ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනම** බිහි විය. එවකට අධ්‍යාපනික මෙන්ම ශාසනික ජාත්‍යන්තර සමාජ මෙහෙවරක යෙදී සිටි **අති පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගේ** දූරදර්ශී චින්තනය ඔස්සේ ශ්‍රද්ධාසම්පන්න හිතෛෂී බුද්ධිමතුන් පිරිසකගේ සහයෝගය ඇතිව මෙම කාලීන සමාජ මෙහෙවරට කැනඩාවේදී මුලාරම්භය යෙදිණි.

සංසාර චක්‍රයට අනුව චල්මත් වුවන් සේ ඉපදී ඉපදී මැරී මැරී යන ජීවිත ගමනේ ලැබුවා වූ මෙම වාසනාවන්ත මිනිස් භවය හරවත් ලෙස ගතකරන, උසස් මානුෂික ගුණ දහම්වලින් පරිපූර්ණ පරිත්‍යාගශීලි භවතුන්ගෙන් මෙම ධර්මද්වීපය හීන වී නැත. තාක්ෂණික භෞතික හා ආර්ථිකමය වශයෙන් ඉතා දියුණු රටවල ජීවත් වුවද, මෙම මහාර්ඝ ධර්මද්වීපය තුල ඇති සදහම් සිසිල සහ මනබන්දණීය චමත්කාරය ශ්‍රී ලාංකිකයින්ගේ හදවත් තුල සදාතනික සිහිවටනයන් තබනුයේ **ලෝකෙන් උතුම් රට ශ්‍රී ලංකාවයි යන අභිමානය** හදවත් තුල සනිටුහන් කරමිනි. ප්‍රෞඪ ඉතිහාසයකට, නිර්මල සංස්කෘතියකට, සමසීතෝෂ්ණ දේශගුණයකට, අද්විතීය ස්වභාවික සෞන්දර්යකට හිමි කම් කියන, මෙම කුඩා දිවයින තුල තිබෙන **දහම් සුවඳ** අද දෙස් විදෙස්හි සිසාරා යමින් මුළු ලොවම ඔකඳ කරවනු ඇත. සම්බුද්ධ ශාසනයේ **සදහම් සුවඳ** දසත විහිදුවීම සඳහා පැවිදි බිමට බට ශ්‍රේෂ්ඨ සංඝ පීතෘවරුන්ගේ උදාර කැපවීමෙන් මහින්දාගමනයේ පටන්, සදහම් කිරණින් ඒකාලෝකව පවතින මෙම ශ්‍රී ලංකාද්වීපයේ අගය වදනින් සනිටුහන් කිරීම උගහටය. කෙටි කාලයකට හෝ විදෙස්ගතවන දේශාභිමාන ප්‍රඥාවන්තයෙකුට එහි සත්‍යතාව වඩාත් හොඳින් අවබෝධ වනු ඇත. විදෙස් රටවල ජීවත් වුවද අප ශ්‍රී ලාංකිකයින් බහුතරයක් නිවැරදි බෞද්ධ නායකත්වයක් වටා එක්රොක් වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

සාංසාරික කර්ම ඵල අනුව විශිෂ්ඨ කුසලතාවන් සහ හැකියාවන් උරුම වුවද, ආර්ථික අභියෝග හමුවේ සුසුම්ලන, සිසු දරුවන් අද ශ්‍රී ලංකාද්වීපය තුල එමටය. රට ජාතිය ආගම ඒකාලෝක කල හැකි ස්වර්ණමය සම්පත් වූ ශ්‍රී ලාංකික දරු පරපුර මිලිනව යා නොදී, ආත්මශක්තියකින් යුතුව ජාත්‍යන්තර ප්‍රජාව අවදිකරවීමට තරම් ශක්තියක්, අපගේ උතුම් සඟ පරපුර සතුවීම මෙම නිජ බිමට හිරුණලු උදාවකි. මෙවන් ප්‍රඥාවන්ත එඩිතර සත් පුරුෂයන් මිනිස් ජන සමාජය තුළ අද විරල වුවත්, දැයේ සමුර්ධිය වෙනුවෙන් කලින් කලට හෝ මතුවන්නේ නිර්මල බුද්ධ ධර්මය තවමත් ලොවතුල ජීවමානව පවතින බව සැබෑ කරවමිනි. හැකියාවන් කුසලතාවන් මුවහත් කරගනිමින් ඉදිරියට එන දරුපරපුරට අනාගත ලෝකය භාර කෙරෙන විට විවිධ ක්ෂෙත්‍රයන්හි නායකත්වය දැරීමට ඔවුන් ගුණාත්මක බවින් පිරිපුන් කුසලතාපූර්ණ මිනිස් රත්නයන් විය යුතු අතර, **බෞද්ධ නායකත්වයක** තිබිය යුතු ශ්‍රේෂ්ඨ ගුණාංග වලින් ඔවුන් පරිපෝෂණය ලබා තිබිය යුතුමය. එම අරමුණ මූලික කරගත් ශිෂ්‍යත්ව පදනමක් වූ **ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම**, ශිෂ්‍යත්වලාභීන් වෙත ලබාදෙනුයේ මුල්‍යමය සහනාධාරයට අමතරව අධ්‍යාත්මික සංවර්ධනයක් ඉලක්ක කරගත් ගුණ දම් පෝෂණයකි.

දිවයින පුරාම හැකියාවන් සහ කුසලතාවන් ඇති ආර්ථික අපහසුතාවන් හමුවේ සුසුම්ලන දරුවන් කොපමණ සිටියත්, දෙස් විදෙස්හි පරිත්‍යාගශීලි බුද්ධිමතුන් කොතෙක් සිටියත්, එම දෙපාර්ශවය අතර සම්බන්ධයක් ඇති කිරීමට ශක්තිමත් අඩිතාලමක් අවශ්‍යමය. එම ශක්තිය හා යෝධ බලය ද **බෞද්ධ නායකත්වයමය**.

ඉතා යහපත් වූත් කාලෝචිත වූත් එවන් මූලික අරමුණකින් යුතුව ස්ථාපිත කරන ලද මෙම **ශිෂ්‍යත්ව ව්‍යාපෘතීන්හි** සාර්ථකත්වයේ පූර්ණ ගෞරවය එහි බෞද්ධ නායකත්වයට හිමිවන්නේ නිතැතිනි. පදනමක ස්ථාවරත්වය සඳහා බෞද්ධ නායකත්වයකින් ලැබෙන්නා වූ ශක්තිය ඉතා විශිෂ්ඨය. ලැබුණා වූ අනුශාසකත්වය මාහැඟිය. පෞද්ගලික ලාභ ප්‍රයෝජන කිසිවක් නොතකා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සමාජයට අර්ථවත් වූ සේවාවක් ඉටුකිරීමට, හැකියාවන් සහ කුසලතාවන් ඇති ශ්‍රේෂ්ඨ මිනිසුන් වත්මන් සමාජයේ බහුලව නැතත්, යටත් පිරිසයෙන් සිටිනා පිරිස ඒකරාශි කරගැනීමට දූරදර්ශී නායකත්වයක් අවශ්‍යමය. ඔවුන් අධ්‍යාපනික, සමාජයීය සහ ආර්ථිකමය වශයෙන් යහපත් ස්ථාවරයක සිටිය ද, කැපවීමකින් යුතුව යහපත් සමාජ මෙහෙවරක යෙදීමට නම් ඒ සඳහා නිසි මාර්ගෝපදේශකත්වයක් අවශ්‍ය වන්නේමය. **ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනම** යනු ස්වේච්ඡාවෙන් සේවය කිරීමට කැමති කුසලතා පරිපූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරා පත්කර ගනිමින්, **ආචාර්ය මිරිස්සේ ධම්මික හිමිපාණන්ගේ පුරෝගාමීත්වයෙන් සහ අනුශාසකත්වයෙන් 1998 දී කැනඩාවේදී ස්ථාපිත කරන ලද ස්වේච්ඡා සංවිධානයකි.**

අනතුරුව අන්තර්ජාතික සබඳතාවන් ශක්තිමත් කරමින්, දීප ව්‍යාප්තව මෙම ශිෂ්‍යත්ව ක්‍රමය ඉදිරියට ගෙන යා හැකි ශක්තිමත් සම්බන්ධීකරණයක අවශ්‍යතාව පැන නැඟුණි. ඒ සඳහා, කැපවීමෙන් යුතුව කටයුතු කල හැකි, සිංහල බෞද්ධ සාරධර්ම අගයන එහෙත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳව මනා දැනුමක් ඇති, එමෙන්ම සිසු දරුවන්ගේ සිතුම් පැතුම්, චර්යාවන් සහ අවශ්‍යතාවන් විනිවිද දැකීමේ ඥානයක් ඇති, විද්‍යුත් මෙන්ම ලිඛිත මාධ්‍යයන් තුලින් ඔවුන්ගේ හදවත් අවදි කරවීමේ කුසලතාවන් ගෙන් සපිරි පුද්ගලයකු සොයා ගැනීමෙහිලා ඉතා සූක්ෂම ලෙස උන්වහන්සේ තම අවධානය යොමු කරවන්නට වූ සේක. **1995 දී කොළඹ 7 ඩී. එස්. සේනානායක විද්‍යාලයේ දී තමන්වහන්සේ සමඟ එකම ආචාර්ය මණ්ඩලයේ සේවය කරමින් සිට 1996 දී වසර විසි පහක ගුරු සේවයේ අත්දැකීම් ලබා විශ්‍රාම ලබා සිටි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමෙහි ප්‍රවීණ ගුරු මහත්මියක පිළිබඳව උන්වහන්සේගේ මතකය අවදි වූයේ මෙම අවස්ථාවේදී ය.**

ආර්ථික අභියෝග හමුවේ අසරණව සිටි ශ්‍රී ලාංකික දක්ෂ දූ දරුවන්ගේ නැණ පහන් දැල්වීමේ කාලෝචිත වූ සමාජ මෙහෙවරකට අවතීර්ණ වීම සඳහා මා අනපේක්ෂිත ලෙස භාග්‍ය සම්පන්න වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. අන්තර්ජාතික සංවිධානයක සුවිශාල කාර්ය භාරයකට උරදීමට තරම් ශක්තියක් මා සතුව එවකට තිබුණේදැයි මම නොදත්තෙමි. මුලදී විශාල අභියෝගයක් ලෙසින් දිස් වුවද,

අභියෝග හමුවේ නෛපසුඛස්නා වීර්යයෙන් යුතුව කටයුතු කිරීමේ අධිෂ්ඨාන ශක්තියක් හදවතට ආරෝපණය වී තිබුණෙන්, එම වගකීම භාරගැනීමට මා පසුබට නොවිණි. ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්තව පැවතිය යුතු මෙම අන්තර්ජාතික සංවිධානයේ කාර්යභාරයට උරදීමටත්, එහි සාර්ථකත්වය සඳහා ස්වේච්ඡාවෙන් කැපවී කටයුතු කිරීමටත් හෘදය සාක්ෂිය ඉදිරියේ අධිෂ්ඨාන පූර්වකව ප්‍රතිඥා දෙමින්, **අනුශාසක ස්වාමීන් වහන්සේ එදා, 1998 දී කැනඩාවේ සිට දුරකථනයෙන් කරනු ලැබූ වාචික ඉල්ලීමට යහපත් සේ ප්‍රතිචාර දැක්වීමට මා පෙළඹුණි.** එදා මෙදා තුර ශිෂ්‍යත්ව පදනමේ චිරස්ථිතිය පිණිස අප්‍රමාණ වෙහෙසක් දැරීමට සිදුවුවද, මෙම ශිෂ්‍යත්ව ක්‍රියාදාමය තුළින් ලැබුවා වූ මානසික සතුට සදානුස්මරණීයයි. අධි කාර්ය භාරයක් හමුවේ දිනෙන් දින ලද පන්නරය හද තුල **සදාතනික නිරාමිස ප්‍රීතියක්ම** ජනිත කරවන්නට විය. ගත වූ අතීතය දෙස ආපසු හැරී බලන මොහොතක් මොහොතක් පාසා, ගිහියෙකුට තම චිත්ත සන්තානය තුල පහල කර ගත හැකි ලොව ඇති උතුම්ම සැප ලෙස සැලකෙන **අත්ථි සුඛය, භෝග සුඛය, අණන සුඛය හා අනවජ්ජ සුඛයෙන්** මා හද ඉපිලී යයි. එනම් අධිෂ්ඨානයෙන් හා උත්සාහයෙන් සාධාරණ ලෙස මුදල් ඉපයීමෙන් ලබන සතුටත්, එසේ ඉපයූ ධනය නිසි අයුරින් පරිභෝජනය කරමින් අන් අයගේ යහපත සඳහා ද යෙදවීමෙන් ලබන සතුටත්, කිසිම පුද්ගලයෙකුට හෝ කිසිම ආයතනයකට ණය නොමැති වීමෙන් ලබන සතුටත්, මාහැඟි කැපවීමෙකින් හා අප්‍රතිහත උත්සාහයකින් යුතුව, අභියෝගයනට සාර්ථකව මුහුණ දෙමින් මෙතෙක් ඉදිරියට ගෙන ආ ජීවිතය දෙස ආපසු හැරී බලනා විට හදතුල ජනිත වන ප්‍රීතියත්ය.

**දස වසරක සේවය ඇගයේ**

ලැබුවා වූ කාලීන අනුශාසකත්වය මත මාහැඟි කළමනාකරණයකින් හා දැඩි කැපවීමකින් යුතුව වසරින් වසර මෙම ව්‍යාපෘතිය සාර්ථකත්වයෙන් සාර්ථකත්වයටම ගෙන යමින් **හයසියයකට** ආසන්න ශිෂ්‍යත්වලාභීන් පිරිසක් වෙනුවෙන් දස වසරක් පුරා උදාර මෙහෙයක් ඉටු කර **යථාරූප්ප සන්තෝෂයෙන්** යුතුව කාර්ය භාරයෙන් සමු ගත්තෙමි. අනතුරුව ද, ලැබුවා වූ පන්නරය හමුවේ අසරණ ජනතාවට සහන සලසමින් විවිධාකාර වූ ව්‍යාපෘතීන් දියත් කිරීමට තවදුරටත් ශක්තිය ලබා දෙන අනුශාකත්වය, සමාජගත අසරණ ජනතාවගේ දුක් සුසුම්වල නාමයෙන් මහත් සේ අගයන්නෙමි. **බෞද්ධ නායකත්වයක් වටා එක් රොක් වන්නෝ දෙලොවම ජය ලැබුවෝ වෙති.**

8

# ශිෂ්‍යත්ව ක්‍රියාදාමය සහ සිසු ආකල්ප

**1998** නොවැම්බර් මස **7** දින සමාරම්භක ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය කොළඹ 7 ඩී. එස් සේනානායක විද්‍යාලයීය ශාලාවේදී **අමරපුර සංඝ රක්ෂිත මහා නිකායේ අග්ග මහා පණ්ඩිත මඩිහේ පඤ්ඤාසීහ මහා නායක ස්වාමීන් වහන්සේගේ** ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. දිවයිනේ විවිධ ප්‍රදේශවලින් කිසිදු භේදයකින් තොරව, අ.පො.ස (සා.පෙ) විභාගයෙන් උසස් ලෙස සමත්, අඩු ආදායම්ලාභී පවුල්වල සිසු සිසුවියන් **37** දෙනෙකු මෙම ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබා තිබුණෙන් ඔවුන් වෙත සහතික පත් හා රුපියල් **500**/= බැගින් වූ ආරම්භක මුදල් චෙක් පත් ප්‍රදානය කිරීම එහිදී සිදුකරන ලදී. එතැන් සිට අ.පො.ස උසස් පෙළ විභාගය දක්වා, පුරා වසර 2 ක් සෑම අධ්‍යයන මසකටම චෙක්පත් නිකුත්කිරීම සිදුකරනු ලැබූ අතර, ඔවුන්ගේ **විෂය ප්‍රගතිය ඇගයීමටත්, සාරධර්ම ප්‍රගුණ කිරීමටත් සුවිශේෂ වූ ක්‍රමවේදයන් ද අනුගමනය කෙරිණි.** එහි ප්‍රතිඵලයක් ලෙසින් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ශිෂ්‍යත්වලාභීන්ගෙන් 70% ඉතා සාර්ථක ප්‍රතිඵල ලැබූ අතර අද යහපත් පුරවැසියන් ලෙසින් **වෛද්‍ය, ඉංජිනේරු, ගුරු, හෙද** ආදී සමාජයේ විවිධ තලයන්හි නිල තල හොබවමින් ඔවුන් මුළු මහත් සමාජයම සුවඳවත් කරනු ඇත. එම ගුණ සුවඳ මෙවැනි ශිෂ්‍යත්ව ක්‍රමයකට අවතීර්ණව මාහැඟි කැපවීමකින් සේවය කරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනුග්‍රාහක භවතුන්ගේ අධ්‍යාත්මික සතුටට ලබා දී ඇත්තේ ඉමහත් දායකත්වයකි. මෙවැනි සත්කාර්යයන් තුලින් ලබන්නා වූ නිරාමිස ප්‍රීතිය අත් විඳීමට මග පාදා දුන් බෞද්ධ නායකත්වයට සමස්ථ සමාජයේම ගෞරවය හිමිවිය යුතුමය.

අන් අයට සරණ වීමට කැමති, ඒ සඳහා ප්‍රමාණවත් වූ ආර්ථික පසුබිමක සිටින, හදවතින්ම පරිත්‍යාගශීලි උතුමන්ගෙන් වත්මන් සමාජය හීන වී නැත. පිහිට ලැබිය යුතු අසරණ ජනතාව ද අපමණය. අසරණ වූ කවරෙකුගේ හෝ යහපත පිණිස කරනු ලබන පරිත්‍යාග වක්‍රාකාරයෙන් වංචනික ක්‍රියා මාර්ග ඔස්සේ ගමන් ගන්නා අවස්ථා ද අද සමාජයේ නැත්තේ නොවේ. එබැවින් සුදුස්සන් සොයා ගැනීමත්, පරිත්‍යාගයන් නිසි අයුරින් ක්‍රමානුකූලව ඔවුන් අතට පත්කරවීමත්, ඉතා සූක්ෂම ලෙසින් විශ්වාසනීය මාර්ගයක් ඔස්සේ පැවතිය යුතුමය. **එය පරිගණකයකට භාර දිය හැකි කාර්ය භාරයක් නොවේ.** ඒ සඳහා

මිනිස් ශ්‍රම සම්පත් අත්‍යවශ්‍යමය, පරිත්‍යාගයක් නිසි ලෙස, සම්පූර්ණයෙන් ආධාර ලැබිය යුතු අසරණ ජනතාව අතට සෘජුව පත්කිරීමේ ක්‍රියාදාමයකට අවතීර්ණ වීම පිළිබඳව ද බෞද්ධ නායකත්වයක් සතු ප්‍රායෝගික අත් දැකීම් සම්භාරය අපමණය. අද සමාජයේ හතු පිපෙන්නා සේ පැන නගින ඇතැම් සංවිධාන අසරණයින්ට සරණ වීමේ මුවාවෙන් සිදුකරනු ලබන වංචනික ක්‍රියාදාමයන් බොහෝය. බුද්ධිමත් පරිත්‍යාගශීලින් ඉතාමත් විමසිලිමත්ව අසරණ ජනතාවට සරණ වීම සඳහා එක් රොක් වන්නේ, තම පරිත්‍යාගය ලබමින් දිනෙන් දින දියුණු වන අසරණ ජනතාව පියවි ඇසින්ම දැකිය හැකි වන සේ ශක්තිමත් ලෙස ස්ථාපිත කරන ලද, එමෙන්ම අවංක, සෘජු, උගත්, නැණවත්, බෞද්ධ නායකත්වයක් මගින් මෙහෙයවනු ලබන සංවිධාන වටා පමණි. එවන් සංවිධාන පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම පවා මාහැඟි සමාජ මෙහෙවරකි.

## සමාරම්භක උළෙල - කැමරා ඇසින්

සම්ප්‍රදායානුකූල චාරිත්‍ර සුරකිමින්, මගුල් බෙර හඬ මධ්‍යයේ විශ්‍රාමික විදුහල්පති මායාදුන්නේ ගුරුපියාණන් අතින් පොල් තෙල් පහන දල්වනු ලැබූ මොහොත ..



සමස්ථ ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ නාහිමියන්ගේ පින්බර දෝතින් ප්‍රථම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබූ මොහොත ..

අදාල සහතික පත්‍රය සහ මුදල් චෙක්පත, විජයසේන කිරිවත්තුඩුව මැතිතුමා අතින් ශිෂ්‍යත්වලාභි දියණියකට පිරිනැමුන මොහොත ..

ඒ. ජයසිංහ මැතිණියගේ පින්බර දෝතින් ශිෂ්‍යත්වලාභී දරුවකුට ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබූ මොහොත ..




වසර දහයකට පෙර - කොළඹ - 7 ඩී. එස්. සේනානායක විද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය

## Sri Lanka - Canada Scholarship Foundation - inaugural award ceremony

by Mrs K. S. N. Goonetilleke Sri Lankan Co-ordinator

The inaugural distribution of scholarship funds by the Sri Lanka - Canada Scholarship Foundation was held recently at D.S. Senanayake College, Colombo 7. The ceremony which was presided over by Madihe Pannaseeha Mahanayake Thero was flourished by the Buddhist Society of the school.

The 35 recipients had been selected from about 300 applications received

Scholarships were awarded to deserving students at a ceremony held at the D.S. Senanayake College, Colombo.

ඩී. එස්. සේනානායක විද්‍යාලයීය ශාලාවේදී සමාරම්භක උළෙල පැවැත්වුන වගයි.
1999 නොවැම්බර් 6 sunday Observer පුවත් පතින් ....

ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනම සිය වාර්ෂික ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය පවත්වනුයේ ඉතාමත් චාම් අයුරිනි. එහෙත් උත්සවයක පැවතිය යුතු සම්ප්‍රදායානුකූල චාරිත්‍ර අනාගත පරපුරට දායාද කිරීම සඳහා එලෙසින්ම සුරක්ෂිත කරවමිනි. වාර්ෂිකව අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ සැනෙකින් ආරම්භක පියවර තබමින් කාලීනව පවත්නා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ මහජනතාව දැනුවත් කරමින් මෙම ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලබයි. අ.පො.ස (සා.පෙ) විභාගය ඉතා උසස් ලෙසින් සමත්, දිවයින පුරා විහිදී සිටින අඩු ආදායම්ලාභී පවුල්වල සිසු දරු දැරියන් කිසිදු භේදයකින් තොරව මෙම ශිෂ්‍යත්ව ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි. මෙලෙස විවෘතව ඉල්ලුම්පත් කැඳවීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම් වෙත ලැබෙන්නා වූ දහසකට ආසන්න ඉල්ලුම්පත් අතුරෙන් සුදුසුකම් සපුරා ඇති සියලුම ඉල්ලුම්පත් විද්‍යුත් තැපෑලෙන් කැනඩාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කෙරෙනු ඇත. පරිගණක තාක්ෂණය ඔස්සේ එහිදී තෝරාගනු ලබන ජයග්‍රාහී ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛනය, ඉදිරි අවශ්‍ය කටයුතු සඳහා ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය වෙත ලැබෙනුයේ ඉන් අනතුරුවය. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරුවල සත්‍ය අසත්‍යතාව සොයා බැලීම පිළිබඳව ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම්ගේ මූලික අවධානය මේ අදියරේදී යොමුවනු ඇත. තෝරාගනු ලැබූ ශිෂ්‍යත්වලාභීන්ගේ නාමලේඛනය පුවත් පත් මගින් ප්‍රසිද්ධියට පත් කිරීම, ජයග්‍රාහී ශිෂ්‍යත්වලාභීන් වෙත පෞද්ගලිකව දැනුම් දීම, ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා අවශ්‍ය සියලු කටයුතු සූදානම් කිරීම ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම්ගේ දැඩි අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරකම් අතර ප්‍රධාන තැනක් ගනී.

දහසකුත් එකක් ආර්ථික අභියෝග හමුවේ අධ්‍යාපන මාවතේ එක් කඩඉමක් ජයග්‍රාහී ලෙස පසුකරගත් මෙම දිරිය දරුවන් වෙනුවෙන් පවත්වන්නා වූ ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය සැබවින්ම ආදර්ශවත්ය. ඒ පිළිබඳව වූ සිසු දරුවන්ගේ ආකල්පයන් මාහැඟි ය.

සියලුම ශිෂ්‍යත්වලාභී දරුවන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ලිපිගොනු පවත්වාගෙන යනු ලබන අතර, ශිෂ්‍යත්වලාභීන් විසින් ඉදිරිපත් කර ඇති ලිපි ලේඛන පිළිබඳ සමීක්ෂණයක් කරමින් සිසුන් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය දිනයේදී කිසියම් කාලසීමාවක් වෙන් කරනු ලබයි. එහිදී අනුශාසක ස්වාමීන්වහන්සේගේ අවධානය එක් එක් ශිෂ්‍යත්වලාභීන් වෙත යොමුවන අතර, ක්‍රමවත් ලෙස ඉදිරිපත් කර ඇති ලිපි ලේඛන ඇගයීමකට භාජනය වේ. අවිධිමත් බවින් හා නොදැනුවත් කමින් සිසු දරුවන් විසින් සිදු කර ඇති අඩු පාඩු කම් පිළිබඳව ඉතා කාරුණිකව තතු පහදා දෙනු ලබයි. මූල්‍යමය ආධාර ලබාදීම පමණක් අරමුණු කර **නොගත්** මෙම ශිෂ්‍යත්ව පදනම සිය අභිමතාර්ථයන් සාර්ථක ලෙස ඉටුකරගැනීම සඳහා දරනුයේ මහත් වූ වෑයමකි. සිදු කරනු ලබන කුමන හෝ කාර්යයක ක්‍රමානුකූලත්වය, කාර්යක්ෂමතාව සහ නිරවද්‍යභාවය ආදර්ශයෙන්ම සිසු දරුවන්හට පෙන්වා දෙන මෙම ශිෂ්‍යත්ව ක්‍රමය තුලින් ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලැබූ දරුවන් වෙත නිතැතින්ම ලැබෙනුයේ

සාර්ථක ජීවිතයක් සඳහා ඉවහල් වන මාහැඟි ගුණ දම් පෝෂණයකි.

පෙ.ව 10.00 සිට ප.ව 4.00 දක්වා පැවැත්වෙන මෙම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේ දෙවන අදියර ආරම්භ වනුයේ ප.ව 2.00 ටය. බත්තරමුල්ල සිරි සුදස්සනාරාම විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලැබූ මෙම ශිෂ්‍යත්ව ප්‍රදානයේදී, දිවයිනේ නන් දෙසින් පැමිණ සිටින ශිෂ්‍යත්වලාභීනට සහ ඔවුන්ගේ දෙමාපිය භාරකාරාදී සියලු දෙනාටම එදින දිවා ආහාරය මෙන්ම අනිකුත් සියලුම පහසුකම් ද සැපයෙනු ඇත. දිවා ආහාරයෙන් පසු සමූහ ඡායාරූපයකට පෙනී සිටීමෙන් අනතුරුව දවසේ ඉදිරි කටයුතු න්‍යාය පත්‍රයට අනුව දියත් කරනු ලබයි.

මෙම ශිෂ්‍යත්ව, ප්‍රදානය කිරීම සඳහා අනුග්‍රාහක භවතුන් වෙත ම අවස්ථාව ලැබෙන අතර ඔවුනට පැමිණිය නොහැකි අවස්ථාවල දී ඔවුන් විසින් පත් කර එවනු ලැබූ නියෝජිතයෙකු වෙත එම අවස්ථාව හිමිවනු ඇත.

**පසුකාලීන ශිෂ්‍යත්ව ප්‍රදාන - කැමරා ඇසින්**

මහාධිකරණ විනිසුරු එන්.ඊ. දිසානායක මැතිතුමා, පොල්තෙල් පහන දල්වමින්

ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමින් වහන්සේ ආරම්භක දේශනය පවත්වමින් ....
(මූලාසනය - පූජ්‍ය තලගල සුමනරතන නාහිමියෝ)

ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයදා, පෙර වරුවේ පැවැත්වෙන ලිපි ගොනු සමීක්ෂණය සහ පොදු සාකච්ඡා වාරය

පරිත්‍යාගශීලී අනුග්‍රාහක නිමල් ගුණතිලක මහතා ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරමින් ..

පරිත්‍යාගශීලී අනුග්‍රාහකත්වය නියෝජනය කෙරෙන පද්මාලි විජේවීර මහත්මිය ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරමින් .. ..



තමාට හිමි සහතික පත්‍රය සහ මුදල් චෙක් පත ලබාගත් ශිෂ්‍යත්වලාභී දියණියක් සතුටු සිතින් .. ..

ආරාධිත මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මැතිතුමාගේ දේශණයකට සවන්දීමට අවස්ථාව සලසමින් .. .. (මූලාසනය - ගංගාරාම පරිවෙනාධිපති පූජ්‍ය මාලිම්බඩ ගුණානන්ද හිමිපාණෝ)

ශිෂ්‍යත්වලාභීනට සභාව ඇමතීමට අවස්ථාව සලසමින් .. ..
(මූලාසනය - ආචාර්ය පූජ්‍ය මිරිස්සේ ධම්මික හිමිපාණෝ)

සම්බන්ධීකරණ ලේකම්තුමිය ස්තුති කථාව පවත්වමින් .. ..

ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය අවසානයේ ජාතික ගීය ගායනා කරමින් .. ..

2000 - ශිෂ්‍යත්වලාභී දරුවන් සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින් .. ..

2001 - ශිෂ්‍යත්වලාභී දරුවන් සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින් .. ..

2002 - ශිෂ්‍යත්වලාභී දරුවන් සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින් .. ..

2003 - ශිෂ්‍යත්වලාභී දරුවන් සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින් .. ..

2004 - ශිෂ්‍යත්වලාභී දරුවන් සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින් .. ..

2005 - ශිෂ්‍යත්වලාභී දරුවන් සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින් .. ..

**2006 - ශිෂ්‍යත්වලාභී දරුවන් සමූහ ජායාරූපයකට පෙනී සිටිමින් .. ..**

**1998 සිට 2001 දක්වා වූ ශිෂ්‍යත්වලාභී දරු දැරියෝ**




ආරම්භක වසර 5 තුල නොමියෙන සිහිවටන



සාර්ථක ගමන් මගක පසු විපරම - 2003

# வறிய மாணவர்களுக்கு உதவுகின்ற திட்டம்

කිසිදු භේදයකින් තොරව විවෘතව ඉල්ලුම්පත් කැඳවේ.

සාර්ථක ගමන් මගක
පසු විපරම - 2004

සාර්ථක
ගමන් මගක
පසු විපරම - 2006

**සාර්ථක ගමන් මගක පසු විපරම - 2005**

අනුශාසක ස්වාමීන් වහන්සේගේ ප්‍රධාන දේශනය තුලින් මෙවැනි ශිෂ්‍යත්ව පදනමක අරමුණ පැහැදිලි කෙරෙන අතර සාර ධර්ම අගයන උගතුන් පිරිසක් ලොවට බිහිකරවීමේ කාලීන අවශ්‍යතාව ද මැනවින් පිළිබිඹු කරනුයේ සිසු හදවත් තුල සදාතනික අභිමානයක් ජනිත කරවමිනි. තම රට වෙනුවෙන් ජන සමාජය වෙනුවෙන් අවංක ශ්‍රේෂ්ඨ මෙහෙයක් ඉටුකරලීම පිණිස යහ ගුණ තම ජීවිතයට ආභරණයක් කර ගත යුතු බව ආරම්භක දේශනය තුලින්ම හදවත් තුලට උකහා ගන්නා ශිෂ්‍යත්වලාභීන් ඔවුන් වෙත ලැබෙන ශිෂ්‍යත්වයට අමතරව පෞරුෂ වර්ධනය සඳහා අවශ්‍ය මාහැඟි පෝෂ්‍ය පදාර්ථයන් මෙදින නෙලා ගනු ඇත.

දිවයින පුරා විහිදී සිටින ශිෂ්‍යත්වලාභීන් ඒකරාශී කර පවත්වනු ලබන මෙම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය තුලින් සාර්ථක ජීවිතයකට ලද හැකි ආදර්ශයන් අපමණය. ප්‍රසිද්ධිය සඳහා වන අනවශ්‍ය වියදම්වලින් තොරව එහෙත් සංස්කෘතිමය වටිනාකම රැකෙන පරිද්දෙන් ආගමික පරිසරයක පවත්වනු ලබන මෙම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය ඉතා සරල වුවද, එතුලින් සිසුන් ලබන්නා වූ විපුල ඵල අති මහත්‍ය, සභාගර්භය තුල කාල කළමණාකරණයෙන් යුතු මනා සංවිධානයකි. මාහැඟි ආගන්තුක සත්කාරයන්‍ය. දිවයිනේ විවිධ පළාත්වල සිට සැතපුම් ගණන් මග ගෙවාගෙන සපැමිණි ශිෂ්‍යත්වලාභී දරුවනට සහ දෙමාපියනට ශිෂ්‍යාධාර මුදලට අමතරව ගමනාගමනය සඳහා වූ මග වියදම් මෙන්ම අධ්‍යයන උපකරණ කට්ටල හා සාර ධර්ම ගැබ්ව ඇති හරවත් ග්‍රන්ථ ද ප්‍රදානය කෙරේ. එම සියලු පරිත්‍යාගයනට අමතරව සෑම වසරකදීම ආරාධිත අමුත්තෙකුගේ හරවත් දේශනයකට ද සවන් දීමට ශිෂ්‍යත්ව ලාභීන්ට අවස්ථාව සැලසෙනු ඇත. එතුලින් සිසු දරුවන් තුල ජනිත කරවනු ලබන උදාර හැඟීම් සහ ලබන්නා වූ පන්නරය ශිෂ්‍යත්වය තුලින් ලබන්නා වූ මූල්‍යමය ශිෂ්‍යාධාරය අභිභවායයි. දෛනික ජීවිත සාර්ථක කර ගැනීම සඳහා එම දේශන තුලින් සිසු හදවත් තුල උත්පාදනය වනුයේ ප්‍රබල ජවයකි.

2004 අගෝස්තු මස 21 දින බත්තරමුල්ල සිරි සුදස්සනාරාමයේ පැවති 7 වන ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය වඩාත් හරවත් කල, වඩාත් වර්ණවත් කල විචිත්‍ර ධර්ම කථික මේජර් ජනරාල් ආනන්ද වීරසේකර මැතිඳුන් විසින් පවත්වනු ලැබූ දේශණය පිළිබඳව සිසු දරුවන්ගෙන් ගලාඑන්නට වූ ප්‍රතිචාර මාහැඟිය.

**ව්‍යක්ත දේශක මේජර් ජනරාල් ආනන්ද වීරසේකර මැතිඳුන් සිසු හදවත් අවදිකරමින්..**
**(මූලාසනය - ආචාර්ය පූජ්‍ය මිරිස්සේ ධම්මික හිමියෝ)**

යාව ජීව අනුග්‍රාහක විද්‍යාපති සදේව ගුණතිලක මැතිඳුන් පොල් තෙල් පහන දල්වමින් .. ..

දේශණයට සවන් යොමු කරන සභාගර්භය

**මේජර් ජනරාල් ආනන්ද වීරසේකර මහතාගේ සම්පූර්ණ දේශණය මෙසේ ය.**

අපට අවවාද දෙන
අපේ ජීවිත සකස් කරවන,
අපට අනුශාසනා කරන,
අපට මග පෙන්වන,

මා කල්‍යාණ මිත්‍ර,
ගුරුන් වහන්සේ කෙනෙක් සේ සලකන
විහාරාධිපති, මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගෙන් පළමුව අවසරයි.

**සීතා** .. කියන නම මගේ හදවතට බොහොම සමීපයි.
කිමද? මගේ බිරිඳගේ නමත් .. .. එයමයි.
තවත් **සීතා** කෙනෙක් ඉන්නවා ..
ඉස්කෝලේ උගන්වන කාලෙ ඉඳලා .. .. මම දන්න හඳුණන, හොඳ කථිකත්වයක් ඇති, බොහොම ක්‍රමවත්ව වැඩ කරන,
හොඳ සංවිධාන ශක්තියක් තියෙන දක්ෂ ගුරු මහත්මියක්, හොඳ අම්මා කෙනෙක්..
**ඒ .. .. මේ ශිෂ්‍යත්ව පදනමේ සම්බන්ධීකරණ ලේකම්තුමිය .. .. ඒ** මැතිණියගෙනුත් අවසරයි.

දෙමාපියනි,
රත්තරන් දූ පුතුනි,

මාගේ වයස අවුරුදු 62 ක්. දරු තුන් දෙනෙකුගේ පියෙක්, සීයා කෙනෙක්, අවුරුදු 35 ක් යුධ හමුදා සේවයේ බැඳී සිටි නිලධාරියෙක්, මේ පසුබිම මම ම කියාගත්තේ, මම මේ කථා කරන්න යන මාතෘකාවට අදාල නිසයි.
කෙනෙක් දේශනයක් පවත්වද්දී .. .. ඔහුගේ මාතෘකාව ගැන කථා කරන්න, ඒ පුද්ගලයා සුදුසු ද කියලා ශාලාවේ ඉන්න අය හොඳින් කල්පනාවෙන් ඉන්න ඕනෑ. එය ස්ථිර කරන්නයි .. ඒ හැඳින්වීම කලේ.

**බෞද්ධ නායකත්වය**

මේ ශිෂ්‍යත්ව ලාභී දූ පුතුන්ගේ නම් කියවන විට මට ඇහුණා .. මට තේරුණා .. විවිධ ආගම්වල අයත් මෙතන ඉන්න බව. මා ඉගෙන ගත් .. .. ධර්මය .. .. **ස්වභාව ධර්මයයි**. ඒක බෞද්ධ දර්ශනය කියලත් කියනවා .. .. මේකේ .. .. **නායකත්වය** ගැන ලස්සන සිද්ධාන්ත, චරිතාංග, න්‍යාය ගැබ් වෙලා තියෙනවා. ඒ ගැබ් වූ සාරාංශය තරමක් හෝ ඉගෙන ගත් නිසා මාගේ හමුදා සේවය බොහොම සාර්ථකව ඉටුකරන්න පුළුවන් වුනා. හතලිස් දාහක් පමණ සෙබළු පුහුණු කරන්න හැකි වුනා .. .. තුවක්කු ගත්ත .. .. නා නා චරිතවලින් හෙබි දැඩි මනස් ඇති තරුණයන් පුහුණු කරන්න හැකියාව ලැබුණා. ඒ **බෞද්ධ නායකත්වයට** අදාල න්‍යාය මා ඉගෙන ගත්ත නිසා.

දැන් .. .. **ප්‍රශ්නයකින්** .. .. මේ දේශනය පටන් ගන්නවා.

**නායකත්වය යනු කුමක් ද?**

දුවෙකුයි .. පුතෙකුයි .. නැගිටලා කියන්න, තමුන්ට හැඟෙන්නේ මොකක් ද? කියන්න බලන්න .. What is LEADERSHIP?

හොඳ නායකයන් නායිකාවන් වීමට ඉන්න අය වට පිට බලන්නේ නෑ කෙලින්ම නැගිටලා, ප්‍රශ්ණයට උත්තර දෙනවා.

ඔව් .. .. කියන්න .. කණ්ඩායමක් .. හැසිරවීම, තමා ආදර්ශමත් වීම, සංවිධාන ශක්තියක් තිබීම.

ඔව් .. .. අර .. .. පිටුපසින් නැගිට්ට පුතා කියන්න බලන්න.

.. .. .. .. .. ..

.. .. .. .. .. ..

ඔව් .. ඒ සේරම කිව්වේ චරිතාංග. නායකත්වයේ තිබිය යුතු චරිතාංග .. .. හොඳයි .. .. වාඩි වෙන්න.

මේ නායකත්වය කියන්නේ .. .. ඔව් ! .. .. පිරිසකට නායකයෙක්. නායකත්වය යන්නෙන් විග්‍රහ කරන්න පුළුවන් වන්නේ .. .. එයින් තේරුම් යන්නේ .. .. ..

**තමා මෙහෙයවන කණ්ඩායම .. .. තමා දෙන අණට ස්ව කැමැත්තෙන් ක්‍රියා කිරීමයි.** හොඳට මතක තියාගන්න.. ස්ව කැමැත්තෙන් ක්‍රියා කිරීම .. මතක තියාගන්න මුළු ජීවිතේටම .. .. **එයයි නියම නායකත්වය .. ..**

මට මිනිසුන් බය කරලා වැඩ ගන්න පුළුවන් .. .. .. එය සාර්ථක නෑ ---
චක්‍රලේඛ පෙන්වලා වැඩ ගන්න පුළුවන් .. .. .. .. එය සාර්ථක නෑ ----
අල්ලසක් දීලා වැඩ කරවාගන්න පුළුවන් .. .. .. .. ඒ කිසිම නායකත්වයක් සාර්ථක නෑ ----

**ස්ව කැමැත්තෙන් නායකයා පසුපස යනවා නම්** .. .. ..
.. .. .. මොහු ආදර්ශවත් .. .. .. මොහු අවංකයි .. .. .. මොහු පසු පස ගියොත් අපට ජයග්‍රහණය තියෙනවා..
.. .. .. මොහු හොඳ මිනිසෙක් .. .. .. මොහු හොඳ නායකයෙක් .. .. .. **කියන හැඟීම ඇවිල්ලා** .. .. .. තමුන්ගේ වැඩ කෙරෙනවා නම් අන්න එතනයි නිවැරදි **නායකත්වය තියෙන්නේ** .. .. ..

මේ නායකත්වය පාසලේ ඉගෙන ගන්න පොත්පත්වලත් කරුණු එකොළහකින් දොළහකින් පමණ විස්තර වෙනවා.

❁ ❁ ❁

ඊළඟට මම මේ කියන්න යන්නේ ස්වභාව ධර්මයේ තියෙන දෙයක්.

**අකාලිකෝ .. .. .. .. / ඒහි පස්සිකෝ .. .. .. ..**
**අකාලිකෝ ---** හැම කාලයකටම සුදුසුයි .. .. .. .. හැම කල්හිම විපාක දෙනවා.
**ඒහි පස්සිකෝ --** එකම ශාස්තෘවරයා .. එකම ගුරුවරයා .. බුදු හාමුදුරුවන්ගේ ධර්මය ඒහි පස්සිකයි.
එන්න බලන්න, පර්යේෂණ කරන්න. අත්හදා බලන්න. සුදුසු නම් පිළිගන්න .. .. .. කියපු ලොව පහළ වූ එකම ශාස්තෘවරයා .. ගුරුවරයා .. .. **බුදුරජාණන් වහන්සේයි.**
**නායකයා** මේවා දැනගෙන ඉන්න ඕනෑ .. .. ..

ඔහු දේශපාලනඥයෙක් වෙන්න පුළුවන් ..

ඔහු විදුහල්පතිවරයෙක්, ගුරුවරයෙක් වෙන්න පුළුවන් ..
පියෙක් වෙන්න පුළුවන් ..
ගොවියෙක් වෙන්න පුළුවන් ..
වෙනත් සැලකිය යුතු තනතුරක් දරණ අයෙක් වෙන්න පුළුවන් ..

මේ න්‍යායයන් දැනගන්න ඕනෑ..

☸ ☸ ☸

**මම එක සත්‍ය කථාවක් කියන්නම්,**

මා හමුදාවේ සිටින කාලේ ඉතාම ජව සම්පන්න නාවික හමුදාවේ ලුතිනන් කෙනෙක් හිටියා. ත්‍රිකුණාමලයෙයි සේවය කළේ. හරි ආසයි මාළු අල්ලන්න. දවසක් නැව් තටාකයේ ඉඳං බිලි පිත්ත දාලා මාළු ඇල්ලුවා. අඩි 2 1/2 ක විතර මාළුවෙක් අල්ලලා බිලී කොක්කත් එක්ක - අරං ඇවිල්ලා, ඒ හමුදා ප්‍රධානියාට කිව්වා .. **සර් .. මම මාළුවෙක් ඇල්ලුවා .. තවම දඟලනවා** .. කියලා. ඒ නිලධාරියා කීවා .. වහාම ගිහින් මුහුදට දාපං කියලා.

එහෙත් ආඩම්බර කමට, මානාධික කමට අවවාදය අහන්නේ නැතුව .. .. ඔහු නේවාසිකාගාරයට මාළුවා අරං ගිහිල්ලා .. .. කටේ තිබ්බිච්ච බිලි කොක්ක ගලවලා ඇහැට දාලා, මාළුවා උයන්න කෝකියාට කිව්ව දවල් 11 ට විතර ඇති .. .. මාළුවා කපලා කොටලා දවල් 12.15 ට පමණ කෑමට ගත්තා.

හරියට දවල් 1.00 ට කාලිනගර්හි නාවික හමුදා කඳවුරට වාර්තා කරන්න සිදුවුනා. අහස්යානයකින් පලාලි වලට ගෙනිච්චා. එතැනින් හෙලිකොප්ටරයකින් කාලිනගර් හි නාවික හමුදා කඳවුරට ගෙනිච්චා. රාත්‍රී 7.00 ට විතර ඇති මිත්‍රයින් හමුවෙලා රාත්‍රියට කාල වැඩි වේලාවක් ගත වුයේ නැහැ .. .. එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් ආක්‍රමණය කරලා වටකරලා ගැහුවා.

එළිය වැටීගෙන එනවිට එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් පසු බැස්සා. උදේ 5.45 - 6.00 විතර වන විට, කඳවුරේ අණ දෙන නිලධාරියා තුවාලකරුවන්, මැරිච්ච අය සොයන්න පටන් ගත්තා. එක් නිලධාරියෙක් මුණින් අතට වැටිලා හිටිය. හරවලා බලන කොට ඊයේ රාත්‍රී වාර්තා කරපු ලුතිනන් මැරිලා.

**ඔහු මැරිලා තියෙන්නේ කොහොමද ? .. ..** දකුණු ඇහැට වැදුණු උණ්ඩයක් පිටුපසින් කඩා ගෙන ගිහින්.

**මෙතන මොකක්ද තියන බලය? මොකක් ද ඒ ශක්තිය .. ..?**

අර දඟලන මාළුවාගේ කටට දාපු බිලී කොක්ක ගලවලා අරන් ඇහැට දාලා කපලා කොටලා උයවලා කෑමට ගත්ත මේ ලුතිනන් පැය ගණනක් යන්න කලින් හැංගිලා හිටපු නන්නාඳුනන හතුරෙකුගේ වෙඩි පහරකට ලක් වුනා.

**මේ සොබා දහමේ අපට නොපෙනෙන ශක්තියක් තියෙනවා.**

ක්‍රිස්තු භක්තිකයෝ කියන්න පුළුවන් .. .. මෙය සර්වබලධාරී දෙවියන්ගේ වැඩක් කියලා අපි කියනවා .. ධර්මය කියලා.. .. අර .. .. අකාලිකෝ .. එහි පස්සිකෝ .. එව ! බලව ! කියපු ඒ ධර්මය අකාලිකයි.
මේ න්‍යාය .. .. .. මේ සත්‍යය .. .. .. බෞද්ධ නායක නායිකාවන් දැනගන්න ඕනැ. මෙවැනි **ශක්තියක්, බලයක්, න්‍යායක්**, අප අතර ස්වභාව ධර්මයේ තිබෙන බව නොදන්නා පාලකයා .. .. නොදන්නා දේශපාලනඥයා .. .. නොදන්නා විදුහල්පතිවරයා .. .. නොදන්නා පියා .. .. නොදන්නා නායකයා **සාර්ථක නායකයෙක් නොවෙයි.**

**මේ පවත්නා ධර්මය අකාලිකයි.. මේ ධර්මය ඒහිපස්සිකයි .. සන්දිට්ඨිකයි.**

❁ ❁ ❁

අවිස්සාවේල්ලේ එක ලන්සි මහත්තයෙක් හිටියා .. .. .. **මේකත් එක සත්‍ය කථාවක්.**

ඔහු මස් කන්න බොහෝම කැමතියි. ගෙදර ලොකු වත්තක් තිබුණා. හැමදාම හවසට මේ වත්තේ මේසයක්, පුටුවක් තියාගෙන මස් දීසියක් ළං කරගෙන පාන් එක්ක මස් කන්න පුරුද්දක් මේ ලංසි මහත්තයා ළඟ තිබුණා.
දවසක් පොතක් බල බල මස් කකා ඉන්දැද්දී, බළලෙක් ඇවිත් අර මස් කෑල්ලක් අරන් දීසියත් පෙරළලා දුවන්න පටන් ගත්තා. මොහු පැනලා බළලාගේ බෙල්ලෙන් අල්ලගෙන ටිකක් එහාට ඇවිද ගෙන ගිහින් පොල් අත්තක් ඉරලා ඉරටු අරන් බළලාගේ එක ඇහැකින් දාලා අනිත් පැත්තෙත් අරන් බළලාව අල්ලලා වීසි කළා.
**ඇඟ කිළිපොලා යනවා.**

ඒ සිද්ධිය ඉවරයි. .. .. .. මාස කීපයක් ගියා .. ..

වත්තේ එළිමහනේ ඉන්න වෙලාවක, දවසක් ගහකින් පුවක් අත්තක් ගැලවිලා පාවී .. .. පාවී .. .. ඇවිත් මොහුගේ දකුණු ඇහේ ඇණුනා .. .. .. ඇහැ තුවාල වුනා .. .. .. වෛද්‍යවරු සොයාගෙන ගියා .. .. .. බෙහෙත් කලා .. .. .. දවස් කීපයක් ගත වුනා. වෛද්‍යවරු කිව්වා ඇහැ නරක් වෙලා කියලා .. අවසානයේ දී ඒ ඇහැ ගලවන්න සිදු වුනා.

තවත් මාස 4 ක් පමණ ගතවුනා .. .. අපේ කථාවක් තියෙනවානේ .. .. ඔය - ඔඩු දුවනවා - කියලා. අනිත් ඇහැටත් බලපෑවා .. .. .. මාස 6 ක් පමණ ගත වුනා .. .. .. සුවකරන්න බෑ .. .. .. ඒ ඇහැත් ගලවන්න සිද්ධ වුනා.

දැන් ඇස් දෙකම අන්ධයි .. .. කාත් කවුරුත් නෑ බලාගන්න. වයසක ගැහැණු කෙනෙක් ගෙන්වා ගත්තා කෑම ටික උයවා ගන්න. ටික දිනකින් ඇගේ කුෂ්ඨයක් ආවා .. .. හම ගැලවෙන්න ගත්තා .. .. පුංචි මැස්සෙක් වැහුවත් කෑ ගහනවා .. .. .. මර ලතෝනි දෙනවා .. .. වේදනාව ඉවසගන්න බැරුව .. .. ඔහොම ඉඳලා ඉඳලා මැරුණා.

**බළලා ගේ කථාවෙත් .. .. මේ මහත්තයා මැරුණ ආකාරයෙත් සම්බන්ධයක් තියෙනවා.**

ඒවා ගැන සිතුවිල්ලේ පසුවන නායකයා **සාර්ථක නායකයෙක්**, රට අකුසල කර්ම වලින් බේරා ගන්නවා.

☸ ☸ ☸

නායකයෙන් වුනහම නිතරම **විවේචනයට** භාජනය වෙනවා .. .. විවේචනය කරනවා.

බුදුරජාණන් වහන්සේ විවේචනය අනු දැන වදාලා .. .. සංයුක්ත නිකායේ .. .. විවේචනය කරන්න .. .. නමුත් විවේචනය කරන්න කලින් කරුණු 5 ක් පසක් කර ගන්න ඕනෑ ..

මොකක් ද? ඒ කරුණු 5 ..

විවේචනය කරන විෂය සත්‍ය වෙන්න ඕනැ .. .. අසත්‍ය විෂයයක් ගැන විවේචනය කරනවා නම් හොඳ නායකයෙක් නෙමෙයි .. දැන් ගුවන් විදුලියේ .. රූපවාහිනියේ .. සංවාද, විවාද .. .. බොහෝ තියෙනවා . ඒවායේ සත්‍යය අපට පේනවා .. .. හැඟෙනවා .. .. විවේචනය කලයුත්තේ **සත්‍ය විෂයයක්** .. .. .. හොඳ නායකයෙක් විවේචනය කරන්නේ සත්‍ය විෂයයක්.

විවේචනය කිරීමෙන් **තමන්ට යහපතක්** තියනවාද බලන්න ඕනෑ. සත්‍ය වන, තමන්ට යහපතක් වන දෙයක් විවේචනය කරන්න.

විවේචනය කරන දේ **අනුන්ට යහපතක්** වෙනවද .. බලන්න ඕනැ.

මේ විවේචනය .. .. **සුදුසු කාලයේ දී** .. .. කරන්න ඕනැ. එහෙම නැති විවේචන අපේ සමාජයේ අපේ රටේ අනන්තයි. අප්‍රමාණයි. රට වෙනත් පරිහානියකට පත් වෙලා තියන වෙලාවක, රටට ගං වතුරක් ආ වෙලාවක, ආත්මාර්ථකාමීව .. .. පඩිය ගැන කියලා, කෑ ගහලා විවේචන කිරීම .. .. සුදුසු කාලයේ කරන විවේචන නෙමෙයි.

අන්තිමට විවේචනය සිදු කල යුත්තේ **මෘදු වචනවලින්** .. .. .. පෝස්ටර් දැක්කහම - විවිධ සංවිධානවල විශ්ව විද්‍යාල තරුණ සංවිධානවල .. අපට මෘදු සංවර වචන පෙනෙන්නේ නෑ .. .. මෙය **දියව් .. .. .. කරවු .. .. .. මරව් .. ..** වැනි මහා .. .. කටුක වචන.

ඒ නිසා .. .. ඉදිරියේ දී .. .. හොඳ බෞද්ධ නායකයන් වෙන්න ඉන්න .. .. මේ දූලා .. .. පුතාලා විවේචනය කරන්න. **ඒ විවේචන සත්‍ය වෙන්න ඕනෑ .. .. තමුන්ට ප්‍රයෝජනයක් තියෙන්න ඕනෑ .. .. අනුන්ට ප්‍රයෝජනයක් තියෙන්න ඕනෑ .. .. සුදුසු කාලයේ දී එම විවේචනය සංවරව මෘදු වචනයෙන් කරන්න ඕනෑ.**
**හොඳට මතක තියාගන්න.**

☸ ☸ ☸

ඊළඟට .. .. .. කවුරුත් අහලා තියෙනවා .. .. **සතර අගති**

කවුද දන්නේ? .. .. ඔව් කියන්න බලන්න .. .. තෑග්ගක් දෙනවා. අත උස්සන්න බලන්න. ඔව් ! .. .. .. **ඡන්ද .. .. ද්වේෂ .. .. භය .. .. මෝහ** .. ඔව් ! ඉස්කෝලෙදී මේ වචන ඉගෙන ගෙන තියෙනවා. මේකත් නායකත්වය විසින් හඳුනාගත යුතුම වචන 4ක්.

**ඡන්දය** - ඡන්දය කියන්නේ මැතිවරණයකදී අපි දාන ඡන්දය නෙමෙයි. ඡන්දය යනු වැඩි **ආශාවයි**. වැඩි ආශාවන් තියෙන නායකයෙකුගේ නායකත්වය .. .. අසාර්ථක නායකත්වයක්, සල්ලාලකමට, මුදලට, දේපලවලට, තනතුරුවලට, නම්බුවට, කැදර මිනිහා **ඡන්දය නිසාම අගතියට යනවා** .. .. බුදුහාමුදුරුවෝ දේශනා කරලා තියෙනවා, මේවා .. .. අපේ ජීවිත එක්ක සම්බන්ධ කර ගන්න පුළුවන්.

**පන්තියේ මොනිටර් වෙන්න පුළුවන්. ගුරුවරයෙක් වෙන්න පුළුවන්, විදුහල්පති වෙන්න පුළුවන්, ඡන්දයෙන් අගතියට ගියා නම් නියම නායකත්වය එතන නෑ.**

ඊළඟට **ද්වේශය**, ද්වේශය .. තරහ, කෙනෙක් සමඟ තරහෙන් ගන්න තීරණය නිවැරදි තීරණයක් නෙමෙයි. යුධ හමුදාවේ සිටින අවස්ථාවල ද්වේශය වැඩි වෙනවා. සේනාංක බෝම්බ එල්ල කරන අවස්ථාවල ද්වේශය වැඩි වෙනවා. ඒ ද්වේශය මෙල්ල කරගෙන ගන්නා තීරණ සාර්ථකයි. ද්වේශයෙන් තීරණ ගන්නා නායකයා අසාර්ථකයි .. .. ජනප්‍රියත්වයෙන් ඈත් වෙනවා. එවිට ස්ව කැමැත්තෙන් නායකයා පසු පස යාමක් සිදුවන්නේ නෑ .. ..

ඊළඟට .. .. **භය ..** .. භය කරල වැඩක් ගන්න හදන ටීචර් කියනවා .. .. ඔන්න ප්‍රින්සිපල් එනවා .. ළමයි පොත්වලට අවධානය යොමු කරන්න .. ..

ඒ ක්‍රමයට වැඩ අරන් පලක් නෑ .. එදාට ප්‍රින්සිපල් එන්නෙත් නෑ .. ළමයි පොත්වලට අවධානය යොමු කරන්නෙත් නෑ .. ..

චක්‍ර ලේඛයට භය කරලා .. රෙගුලාසිවලට භය කරලා .. .. නීතියට භය කරලා වැඩ ගන්න හදනවා .. නම් .. .. ඒවා .. ස්ව කැමැත්තෙන් කරන වැඩ නෙමෙයි.

**ඡන්දයෙන්, ද්වේශයෙන්, භයෙන්** යුතුව වැඩ ගන්නා විට, එතන සාර්ථක නායකත්වයක් නෑ.

ඊළඟට .. .. **මෝහය**

**මේ මෝහය** හෙවත් **මෝඩකම** කියලා කියන්නේ තමාට **අයිති විෂය පථය .. .. විෂය පරාසය පිළිබඳව නොදැනීම ..** .. දැන් මේ දරුවෝ උසස් පෙළ පන්තිවලට ඇවිත් ඉන්නවා .. .. හොඳට සාමාන්‍ය පෙළ පාස් වෙලා ..

ඉගෙන ගත යුතු විෂය පරාසය හොඳින් දැනගෙන ඒ අනුව විභාගයට මුණ දීලා

අද ජය අරන් මෙතනට ඇවිත් ඉන්නවා. ශිෂ්‍යයෙක් වුනාම අන්න ඒ තමාට **අයිති විෂය පරාසය** දැනගන්න ඕනැ .. ඒවායේ සීමාව දැනගන්න ඕනැ.
මේකත් .. ස්වභාව ධර්මයේ න්‍යායක්.

ඇතැම් අය ඒක දන්නෙ නෑ.. .. **මෝහයි .. .. මෝඩයි.** ඒ අය නිතරම තමාට වඩා ඉහල අයගේ විෂය පරාසය ගැන කථාකරනවා .. .. වැරදි හොයනවා.
ඇතැම් පාසැල් ශිෂ්‍යයෝ .. ගුරුවරුන්ගේ වැරදි හොයනවා .. තව සමහරෙක් ආණ්ඩුවේ වැරදි හොයනවා .. තවත් අය අම්මාගේ තාත්තාගේ වැරදි හොයනවා. ඔවුන් තමන්ගේ **විෂය පරාසය දන්නේ නෑ .. දරුකමේ සීමාවේ යුතුකම් දන්නේ නෑ .. තමාට අදාල සීමාව හඳුනාගෙන නෑ. ශිෂ්‍යභාවයේ සීමාව දන්නේ නෑ .. තමන්ට අයිති කටයුතු ටික දන්නේ නෑ ..**

**අන්න එවැනි අය මෝහයි .. මෝඩයි.**
මේ අනුව ස්වභාව ධර්මයේ න්‍යායන්ට එරෙහිව යන අය අගතියටම යනවා. **මෝහයි.. .. මෝඩයි.**

☸ ☸ ☸

අන්තිමට .. .. අපේ හාමුදුරුවරු බණ දේශනාවක් .. .. දානමය පින්කමක් අවසානේ දී නිතරම ආශීර්වාද කරන ගාථාවක් තියෙනවා .. අපි හොඳට අහගෙන ඉඳලා **සාධු .. .. සාධු** කියනවා ..

බලමු .. .. මොකක්ද මේ ගාථාව කියලා .. .. හොඳ සිහියෙන් අහගෙන ඉඳලා, සතියෙන් අහගෙන ඉඳලා .. .. අද පටන් තේරුම හොඳට දැනගෙන .. .. **සාධු** කියන්න ඕනෑ ..

**අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධා පචායිනො**
**චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයුවණ්ණෝ සුඛං බලං**

මෙය මහා ශක්තියක් තියෙන ශ්‍රේෂ්ඨ ගාථාවක්. බුද්ධ කාලයේ ඉඳලා .. .. මේ දක්වාම පරම්පරා ගණනාවක් රැක ගෙන අපට ගෙන ආ මහා බල සම්පන්න .. .. ශ්‍රේෂ්ඨ ආශීර්වාද බලයක් ඇති ගාථාවක්.

අපි බලමු .. .. .. **අභිවාදන සීලිස්ස** .. ..
සිලවත් අයට අභිනන්දනය කරන්න .. .. සලකන්න .. .. බලන්න කොච්චර ලේසිද කියලා?
Respect the people who disciplined
සිල්වත් අය කිව්වේ .. .. සුදු රෙද්දක් ඇඳ ගෙන ගහක් යට ඉන්න කෙනෙක්ද? නෑ .. ..
**සිත, කය, වචනය සංවර කරගත් විනය ගරුක පුද්ගලයන්ට** .. .. අන්න ඒ අයට අභිනන්දනය කරන්න. මෙය බොහොම ලේසියි.
ඊළඟට .. .. **නිච්චං වද්ධා පචායිනො ..** ..
මේ මං වගේ රැවුල පැහිච්ච .. .. වයෝ වෘද්ධ අයගෙන්, ඒවාගේම ඥාන වෘද්ධ

අයගෙන්, ගුණ වෘද්ධ අයගෙන් කරුණු විමසන්න. ප්‍රශ්ණ කරන්න .. .. බලන්න, කොච්චර ලස්සනට අපේ බුදුහාමුදුරුවෝ මේවා දේශනා කරලා තියනවා ද කියලා. වැඩි මහල් අය ළඟට ගිහිල්ලා කථා කරන්න .. අවවාද ගන්න ..
**.. .. මොන තරම් මහා ගැඹුරු .. .. ලස්සන සංස්කෘතියක් මැද්දට ද .. .. අපි ඇවිත් ඉන්නේ ..?**

එසේ කරන විට ධර්මතා 4 ක් වැඩෙනවා .. .. .. මොනවා ද?
**ආයු, වර්ණ, සැප, බල**
**ආයු .. කිව්වේ ආයුෂ ..** .. දීර්ඝායුෂ ලැබෙනවා .. .. අඩු වයසින් මග වැටිලා මැරෙන්නේ නෑ. පපුවේ අමාරු හැදිලා මැරෙන්නේ නෑ .. ..
**වර්ණ** .. .. සිරුරේ **වර්ණවත්** භාවය .. .. පියකරු භාවය .. සමහරු බලන්න අප්‍රිය සහගතයි .. එවන් තත්වයකට පත් වන්නේ නෑ .. වාසනාවන්ත .. ලස්සන .. සුකුමාල .. මුහුණු ලැබෙනවා .. .. **එඩිතර පෙනුමක් ලැබෙනවා** ..

**සැප ..** .. කිව්වේ .. මුලිකවම නිරෝගී බව .. .. නිරෝගී සුවයෙන් ඉන්න ලැබෙනවා .. .. හොඳ සෞඛ්‍යයකින් ඉන්න පුළුවන් වෙනවා .. **වැඩිහිටියන්ට සිල්වතුන්ට ගරු බුහුමන් කලාම ......**

**අයු - වණ්ණෝ - සුඛං - බලං**

මොකක් ද? .. .. මේ ඊළඟට තිබෙන **බලය**? ප්‍රධාන වශයෙන්ම තමන්ගේ සේවකයන් මෙහෙයවන්න පුදුම බලයක් ඇති වෙනවා. මේ කථා කරන්නේ සත්‍යයි. මේ කථාවෙන් ගන්න සාරයෙත් බලයක් තියෙනවා. අවනත වීමක් තියෙනවා. ඒ බලය මට ලැබෙනවා. මට ගරු කරනවා. මා පසු පස යනවා .. අනුන් මෙහෙයවීමේ ශක්තිය මට ලැබෙනවා.
ඒක නිකං ලබන්න බෑ .. වැඩිහිටියන්ට සිල්වතුන්ට ගරු බුහුමන් කරල, ඒ බලය ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.

☸ ☸ ☸

අපේ නැගණිය සීතාවනුත් .. .., ඒවාගේම ජාත්‍යන්තරව පවා කීර්ති නාමයක් ලබා, කැනඩා වැසියන් සමඟ එක්ව, අපේ දරුවන් ඉදිරියට ගෙනියන්න, රජකරවන්න මහන්සි වන අපගේ හාමුදුරුවන් වහන්සේත්, මේ දරන්නා වූ වෑයම ඉතාමත් අගය කරනවා..

එදා බුද්ධ කාලයේ හාමුදුරුවරුන්ට තනතුරු තිබුණා .. .. **සංඝ ශෝභන** කියලා .. .. එම තනතුරට අදාළ ලකෂණ තිබුණා .. .. ධර්ම ධර බව, විනය ධර බව, බහුශ්‍රැත බව .. .. ආදී වශයෙන්.

අපේ හාමුදුරුවන්ට ධර්මය පිළිබඳව ව්‍යක්ත චතුර කථිකත්වයක් තියෙනවා .. .. අපේ ධම්මික හාමුදුරුවෝ **ධර්මධරයි**. අපේ ධම්මික හාමුදුරුවෝ තමුන්ගේ භික්‍ෂුත්වය රැකගෙන .. .. රටේ ගෞරවය රැකගෙන .. .. සංඝ පරම්පරාව රැකගෙන මේ සියලු කටයුතු කරනවා .. .. අද ධර්මයේ නීති රීති රැකගෙන ඉන්න භික්‍ෂූන් අපට අඩුයි. අපේ හාමුදුරුවෝ **විනයධරයි**.

අන්තිම ගුණය තමයි .. .. **බහුශ්‍රැත** බව, බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව, ලෝකය, සමාජය හැඩ ගැහිලා තිබෙන්නේ කොහොම ද? ලංකාවත් සමඟ අන්‍යොන්‍ය සම්බන්ධතා ඇති වෙලා තියෙන්නේ කොහොම ද? ලෝකයේ පවත්නා වෙනත් ධර්මයන් න්‍යායයන් මොනවා ද? .. .. මේවා පිළිබඳව පුළුල් දැනීමක් තිබීම .. .. අපේ නායක හාමුදුරුවෝ **බහුශ්‍රැතයි**.

ඔබ වහන්සේ ගන්න ශක්තියට සියලු දෙවිවරුන්ගේ ආශීර්වාදය ලැබෙන්නට, දීර්ඝායු ලැබෙන්නට ප්‍රාර්ථනා කරමින් මාගේ දේශනය අවසන් කරනවා.

**සැම දෙනාටම තෙරුවන් සරණයි** !!!

මුළු සභා ඝර්භයම නිහඬය. සිසු දරුවන්ගේ පෞරුෂ වර්ධනයට අදාල වන සාර ධර්ම සම්පිණ්ඩණයක් හදවත් තුල පතිතවන්නේ නිරායාසයෙනි. මෙවැනි දේශනවල ඵලදායීතාව අති මහත්ය. මෙම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයට පැමිණෙන සිසු දරුවන් සහ වැඩිහිටියන් ජීවිත කාලය තුල නොලැබූ අත් දැකීම් සම්භාරයක් හා සාරධර්ම පෝෂණයක් මුළු හදින් දරාගෙන, අනුශාසක ස්වාමීන් වහන්සේට වැඳ නමස්කාර කොට සුදස්සනාරාම භූමියෙන් පිටත්වන්නේ ශිෂ්‍යත්ව පදනමේ සාර්ථකත්වය දෙනෙතින් ගලා හැලෙන සතුටු කඳුළු තුලින් සනිටුහන් කරමිනි. ඇතැම් අවස්ථාවලදී ගමනාගමන අවහිරතා නිසා තම ගම් නිවෙස් බලා යාමට අපහසු, දිවයිනේ දුර බැහැර පළාත්වලින් පැමිණි සිසු දරු දැරියන් සහ දෙමාපියන් වෙනුවෙන් පසු දින පහන් වන තුරු ඉතා ආරක්ෂිත ලෙස කෑම් බීම් නවාතැන් ආදී සියලුම පහසුකම් ලබාදීම ද මෙහි සුවිශේෂී ලක්ෂණයකි.

20

උදාර මිනිස්සු

**ලැබුණා වූ ශිෂ්‍යත්වයේ ඵලදායීතාව ප්‍රසිද්ධ මාධ්‍යයක් ඔස්සේ මහ ජනතාවට හඬනගා කියන දරුවෙක් (2004/01/18 දින සිළුමිණ පුවත් පතින්)**



සමාජය දෙස අවදියෙන් සිටින සත්පුරුෂ ජනතාවගෙන්

ශිෂ්‍යත්වලාභී දරුවකුගේ පියෙක් සිය කෘතඥතාවය පළ කරමින්



පිළිතුරු පබැඳුම - සීතා ගුණතිලක මිය,
සම්මානිතාරක ලේකම්
ශ්‍රී ලංකා - සංසඳ සිතාත්තර පදනම

ආර්. පියසේන ගුණතිලක මහතා වෙත,

අගයමි පුදනැමි මා වෙත යොමු කළ කරනා ජේවිය සාන පැහැදී
නොදුටිමි,ඔබ සොඳුරුසුළුම් එසමුත් පෙරවරත් සිහිකරණයා විසිදී
සිසු දරුවන් හට සරණම් වරමට ,සැදැහැ රැකෙමට මා උදී
ජිවිතා වස වර ගා කත් ඔබ අත, රැය් කළ විත් මා වෙත ලගදී

සදහන් යහපත ඉදිරියටම මහ චාරිත් රහිතල යයි පැදී
සම්දීම අනුහසන සිම් පැසෙන් , සමු වූ මට ගී පෙනදී
දුකිතෙම් රෙලා දුත අතය කරන වන සරණම් වරමට මග පැදී
ඇයි දරුවන්ගේ පෙළුටු කඳුළු සත ,සිහිලම් මා හද යයි පැදී

අනුව යා වී සිතක් රටකල් සහ වල්ව
ගී වැඩ කරන්නන් මගම හිත සැතපුමට
සුදුරුසන් අහස සතු වූව, සොකුන් සමට
සහත සදම් දරුවන් සිසු දරුවන්ට

සොයමෙන අදිම අහස පැදුනේ සහ සෙවන
දුනෙක දුකත් විදිනා සිසු පරදුරන
සහත ඇතින් මහ ලබනා සැතපුමන
සිසිලන මහ දැක්ක පුලිනුයි කල විසන

කරණ්ණා සෙනෙට විත් දුම් කර සැර
දිවිසහටෙනා සහමින් අතර සංසාර
විසහ දුකට යොමු වුන සිත සරණාර
සහ දුකගෙනිම් අන් සහ දේ සිත්සාර

වෙහෙර දිමට - පැතක් පුදනට - සැසිම් ඇයි මහ මම දකිම්
පෙහෙරට සිම් විය - සුතු දෙසුරු -,පොසෙක් සඳුසද, සිහි කරම්
සවි පද සොඳුමට උදක් පොත්සෙම් ,ආශ්‍රයෙකු රකුග මා , මහ දුකිම්
සකියාවක් ඉන් මදු සර සැතුමට , සහ දුක මේ- පිය පා වදිම්

දුකිත සහයට විස විස පොදු වේවා !
පැතක් අතින් දුක සහ දුලුවන් වේවා !
සවි සුහසුන සහ සහ සුර සංගේවා !
පුතක් පහම් සරිටර සහ සිහිවේවා !

සොයාරම් සරසුතු මා හට ඇයි මුත් පිළිතුරු එවනෙම් සොවී පමා
දුකසමින් සිත සුදු ඉඳුසුනු සුහැදුම් , පිළිගන්නෙම් මම සිරස නමා
සිසු දරුවන් සැළ ජනයන පලාව තුල සිට්නු දුකිම් මහ දෙගොස සොමා
සියම පැදී පෙළ සම් පුතක් පෙම් එල සිත සුහැඳුම්, සතු මහත සොමා

මෙයට,
සත්‍ය අගයම් පෙනුවන් සංහතුල දකන,
සීතා ගුණතිලක

**සමාජය දෙස අවදියෙන් සිටින සත්පුරුෂ ජනතාවගෙන්**

**අධි කාර්යභාරය හමුවේ අප්‍රමාදී ප්‍රතිචාරය - පිළිතුරු පබැඳුම්**

DATE..............................

ආර්. පියසේන ගුණතිලක.
[redacted]
වත්තේගෙදර ([illegible])
2013. 05. 12.

ශ්‍රී ලංකා සංසඳ පොදු පදනමේ සම්මානිතාරක ලේකම්
සීතා ගුණතිලක මහත්මිය ඇතුළු සැමට මගේ නමස්කාරය පුදමි:

1. දිනූ සිත සෙනෙහුවට සත පුරුදු කොට කදින යි ව
මිදු සිත ඇමිනියක ලබමින මෙවර ව
සීතා ගුණතිලක ලැබුවට හා සතු ව
ගී සත වලිය, සහ සෙනෙ කොමලේ තුළ ව

2. පිතා බුදු බමෙන සිහිකරනු සිය මා
මා සිත විදේශයක කොමලේ සිහි පිළිද මා
මා සිත ඔබ ළඟ ලියුන ලැබූ සුපුබැදි රසි මා
සීතා ගුණතිලක ලිපියට අනුමත මා

3. හිත ලියනුදුක පැසෙන් දුක රළ මා
ලෝසා පල මනා සොඳුරු සෙනෙහෝම මා
පිතා දිනකදුක සත්බුදු හින් රුව මා
සීතා ගුණතිලක ලිපිය සින සුද මා

4. ගසක් මුල උපන බුදුබව සිහිකරව මා
වයස් කළ හුනා සුමරව කොමලේ මා
මොසත්, මල් සපන දුකබව දුකසැලි මා
ජීවත් කළ සපන ලබනුම් බුදුබණ මා.

මෙයට,
ඔබේ සුලපත.
ආර්. පියසේන ගුණතිලක.

Page 1 of 1

**Seetha**

**From:** [redacted]
**Sent:** Thursday, April 28, 2005 3:03 PM
**To:** Seetha
**Subject:** RE: Dear Madam

**THE GUIDER WHO MADE MY DREAM TRUE.**

That was 1998.I just finished my O/L studies & was willing to continue my A/L studies with a dream of being an engineer.But it was not so easy task since I had many economical problems.

At that moment Sri Lanka Canada Scholarship Foundation(SLCSF) was a venture which embolden me to achieve my goal.There are no words can express how it was help full to me as a student.It was not only a monetary assistant to me but also were a superior guider to fulfill my aim.

Ven.Mirisse Dhammike thero & Mrs .S.Goonathileke are obliging persons who leads with commendable contribution to betterment of SLCSF.They have a proper management in everything ,sending our donations & replying for letters they did it at the correct time even when they were busy.This is an excellent example for all of us.

One the other hand it is one of my duty that remind about bountiful persons who donate to SLCSF & enliven it.I was lucky enough to propitiate from such a munificent persons to continue my studies,

As a result of all those things today I have reached the major step of my goal,Now I am an engineering student in Peradeniya university.In a manner of speaking I was able to do what they expect from the scholars.

The most important thing is even now they have not let me down,still help me & encourage me.I still devoutly cogitate & cherish the priceless memories of thire benevolence & bounties which made me strength when I was weak.

Eventually I hope SLCSF will be able to make more success students who work full to society & culminate in coming years.

[redacted] (99/14)

[redacted]

Free, simple, fast, memorable email
Become you@EmailAccount.com at http://www.emailaccount.com/

4/28/2005

විද්‍යුත් තැපෑලෙන් කෘතඥතාව දක්වන ජයග්‍රාහී ශිෂ්‍යත්වලාභී දරුවෙක්

සිසු දරුවන් තුල වඩාත් ඵලදායී වූ ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීමෙහි ලා මහත් කැපවීමෙන් යුතුව කටයුතු කරන මෙම ශිෂ්‍යත්ව පදනම ශිෂ්‍යත්වය බලපවත්නා කාලය තුලදී ශිෂ්‍යත්වලාභීන් වෙත විටින් විට ඵලදායී ග්‍රන්ථ රචනා කර තිළිණ කරනු ලබයි. සදහම් සුවඳ විහිදුවන, යහගුණ කැමති සමාජයකට තිළිණ කිරීම සඳහා ගරු අනුශාසක ස්වාමීන් වහන්සේ විසින් රචිත **තාරුණ්‍යය සහ බුදු දහම,** සම්බන්ධීකරණ ලේකම්තුමිය විසින් රචිත යහපත් ජීවිතයකට අවශ්‍ය සාර ධර්ම වලින් පෝෂිත **මා පිය ගුණ සමර** සහ **සාධු දැක්ම** (The Excellent View) වැනි ග්‍රන්ථ ශිෂ්‍යත්ව ලාභීන් වෙත තිළිණ කිරීමට ලැබීම අනාගත ලොව ගුණ සුවඳින් බබලවන පුරවැසියන් බිහිකරලීමේ උදාර අරමුණ මල්ඵල ගැන්වීමකි. සරුසාර හෙට දිනයක් වෙනුවෙන් සකස් කරනු ලැබූ මෙවන් තිරසාර පදනමක සාර්ථකත්වය එම ග්‍රන්ථ පරිශීලනය කල සිසු දරුවන්ගේ සිතුම් පැතුම්වල ජනිත වී ඇති ධනාත්මක චින්තනය තුලින්ම විදහා දැක්වෙයි.

## යහ ගුණ කැමති සමාජයකට තිළිණ කෙරෙන ග්‍රන්ථ




◀ මා පිය ගුණ සමර

තාරුණ්‍යය සහ බුදු දහම ▶




◀ සාධු දැක්ම

◀ පරිත්‍යාගය, ජීවිතයේ ප්‍රායෝගීකරණය කරන ශිෂ්‍යත්වලාභී දියණියක් .. ..

(ස්වකීය පරිශීලනයෙන් පසු, තිළිණ ලද "මා පිය ගුණ සමර" ග්‍රන්ථය වීරකැටිය රාජපක්ෂ මහා විද්‍යාලයීය පුස්තකාලයට පරිත්‍යාග කරන අයුරු)

මෙම ග්‍රන්ථ තිළිණ කිරීමෙන් අනතුරුව, එම ව්‍යාපෘතියේ ඵලදායිතාව සඳහා සුවිශේෂී වූ ක්‍රියාදාමයක් අනුගමනය කරමින්, ශ්‍රී ලංකා සම්බන්ධීකරණ කාර්යාලය සියුම් අධීක්ෂණයක නිරතුරුවම යෙදෙයි. එහි ප්‍රතිඵලයක් ලෙසින් සිසු දරුවන් එම ග්‍රන්ථ පරිශීලනය සඳහා යොමුවන අතර, අවසානයේ දී ඔවුන් තම ජීවිත වලට ආරෝපණය කරගත් සාරධර්ම පිළිබඳව ඔවුන්ගේ අදහස් සම්බන්ධීකරණ කාර්යාල වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලබයි. පවුලේ ඥාතීන්ගේ ද අසල්වැසි හිතවතුන්ගේ ද පරිශීලනයෙන් පසු **පරිත්‍යාගය තුළින් පරිත්‍යාගය පුහුණු කරවමින්** කිසියම් පුස්තකාලයකට එම ග්‍රන්ථ ශිෂ්‍යත්වලාභී දරුවන් අතින්ම පරිත්‍යාග කරවීම විදුහල්පතිවරුන්ගේ ද ප්‍රසාදයට හේතු වී ඇත. දරිද්‍රතාවෙන් පීඩිතව දිවයින පුරා විසිරී සිටින, අනාගත ලෝකයේ පූදින්නට වෙර දරණ මල් කැකුළුවන් මෙවැනි දිරිය දරුවන් අතලොස්සකට හෝ සරණ වෙමින්, සිසු දරුවන් තුල දාන පාරමිතාව පුහුණු කරවමින් ශ්‍රී ලංකා සම්බන්ධීකරණය මහත් වූ අධ්‍යාත්මික සතුටක් ලබයි.

## ග්‍රන්ථ පරිත්‍යාග ඇගයේ


Deputy Principal





PAROPAKARA SAMITHIYA - BORALESGAMUWA

පරෝපකාර සමිතිය - බොරලැස්ගමුව

2007 - 05 - 24

[redacted]

ග්‍රන්ථ පරිත්‍යාග අගයේ ▶

◀ පරිත්‍යාගය අගයමින් ශුභාශිංසන පිරිනැමෙයි



## ග්‍රන්ථ පරිත්‍යාගයේ ඵලදායිතාව

E/AW/812

[redacted]

2008.09.25

සීතා ගුණතිලක මැතිනිය,
ගරු සභාපතිනී,
මා පියා ...
392/2, ...
...
රාජගිරිය.

[illegible]

[illegible]

ස්තූතියි...!

මෙයට,
...
[redacted]

---

මගේ අංකය :- 618

[redacted]

2007.11.03

ගරු සම්බන්ධීකාරක ලේකම්,
සීතා ගුණතිලක මැතිනිය,
ශ්‍රී ලංකා ...

ගරු මැතිණියනි,

'සාධු දැක්ම' දෙවන ග්‍රන්ථය පිළිබඳව.

'සාධු දැක්ම' ... [illegible]

[illegible]

[illegible]

[illegible]

මෙයට,
...
[redacted]

ශිෂ්‍යත්වය බලපවත්වන කාලය තුල දී, පොදු උපදෙස් අවවාද සහ අනුශාසනා සමගින් ඔවුන් වෙත යැවෙන ලිපි මඟින් ක්‍රමානුකූලව කටයුතු කිරීමටත්, යුතුකම්හි අප්‍රමාදී වීමටත්, මානුෂික ගුණ දහම් දෛනික ජීවිතයට ළඟා කර ගැනීමටත් සිසු දරුවන් වෙත ලැබෙනුයේ මා හැඟි පන්නරයකි. **ත්‍රෛමාසිකව විෂය ප්‍රගතිය ඇගයීමකි.** වාරය තුල පාසල් පැමිණීමේ ප්‍රතිශතය සමඟින් පවත්වනු ලබන විභාගයන්හි විෂයානුබද්ධ ලකුණු සහතික කරවා ශිෂ්‍යත්ව පදනම වෙත එවීමට ශිෂ්‍යත්වලාභීන් බැඳී සිටී. අනතුරුව එම දත්ත ඇගයීම සහ ඒ ඒ විෂයන්ට දුර්වල සිසුන් ධෛර්යමත් කරවීමේ කාර්ය භාරය ද ශ්‍රී ලංකා සම්බන්ධීකරණය සතුය. මේ සඳහා පොදු උපදෙස් ලිපි සකස් කෙරෙන අතර, අදාල ලිපි ගොනුවල අඩංගු දත්ත සමඟ සසඳමින් එක් එක් ශිෂ්‍යයාට ගැලපෙන අයුරින් වෙන වෙනම ප්‍රගතිය ඇගයේ. මෙහි ප්‍රතිඵලයක් ලෙසින්, විෂයයන් කෙරෙහි සිසුන්ගේ උනන්දුව වඩ වඩාත් තීව්‍ර වන්නට විය.


Joseph Vaz College
Wennappuwa, Sri Lanka
ජෝශප් වාස් විද්‍යාලය
වෙන්නප්පුව, ශ්‍රී ලංකා
Tel/Fax: 031-2265317
Date: 2008.01.23
'One cannot easily do at the time of death what one has neglected to do all his life'
Fr. Joseph Vaz

සම්බන්ධීකාරක ලේකම්,
සීතා ගුණතිලක
ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව අරමුදල,
392/2, [illegible]
[illegible]
[illegible]

වාර පරීක්ෂණ ලකුණු හා පැමිණීමේ ප්‍රතිශතය සම්බන්ධවයි

13 E, හි ඉගෙනුම ලබන W.M. [illegible] ශිෂ්‍යාවගේ 2007 වසරේ තුන්වන වාර පරීක්ෂණ ලකුණු හා එම වාරයේ පැමිණීමේ ප්‍රතිශතය පහත සඳහන් වේ.

ජීව විද්‍යාව - 79
භෞතික විද්‍යාව - 73
රසායන විද්‍යාව - 62
පැමිණීමේ ප්‍රතිශතය - 85%

[illegible]
ස්තූතියි.

D. PERERA
ASST. PRINCIPAL
JOSEPH VAZ COLLEGE
WENNAPPUWA

ත්‍රෛමාසික ඇගයීම් සඳහා අවශ්‍ය දත්ත සනාථ කෙරෙයි....



619

D.M.L.Y. කුමාර,
13 A ශ්‍රේණිය,
බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය,
බණ්ඩාරවෙල.
[illegible]

සම්බන්ධීකරණ ලේකම්,
ශ්‍රී ලංකා-කැනඩා ශිෂ්‍යත්ව පදනම,
කොටුවේගොඩ,
රාජගිරිය,

මහත්මයාණෙනි,

වාර විභාගයෙන් ලබාගත් ලකුණු සනාථ කිරීමට

මාගේ පන්තියේ ඉගෙනුම ලබන N.M. සචිදු ලේෂිකා රණසිංහ ශිෂ්‍යා පළමුවන වාර විභාගයේ දී පහත සඳහන් කර ඇති ලකුණු ලබාගෙන ඇති බව සනාථ කරමි.

භෞතික විද්‍යාව - [illegible]
රසායන විද්‍යාව - [illegible]
සංයුක්ත ගණිතය - [illegible]

පාසලට පැමිණීමේ ප්‍රතිශතය - [illegible] %

මීට,
පන්ති භාර ගුරුතුමා,

විදුහල්පති තුමාගේ නිර්දේශය:
[illegible]
බණ්ඩාරවෙල

ත්‍රෛමාසික ඇගයීම් සඳහා අවශ්‍ය දත්ත සනාථ කෙරෙයි....

සෑම වසරකදීම ලිපි ගොනු සියයක පමණ මෙවැනි කාර්ය භාරයක් සඳහා කැප කරන්නට වූ ශ්‍රමය හා කාලය අසීමිතය. විටෙක දරාගත නොහැකි තරමේ වෙහෙසක් සිතට හා ගතට දැණුන ද, සකල ලෝක වාසීන් සංසාර දුකින් මුදවා ගැනීමට අප මහා බෝසතාණෝ කාලය ශ්‍රමය හා සියලු සම්පත් කැප කල ආකාරය සිහිපත් වන විට එම වෙහෙස නිවී යන්නට විය. දවසේ කාර්ය භාරය අවසන් වන විට මධ්‍යම රාත්‍රිය පසු වීම වලකාගත නොහැකි විය. යහන්ගත වුයේ උපරිම වශයෙන් පැය හයක කාලයක් පමණි. සකල ලෝක වාසීන්ටම සෙත සැලසූ බුදුපියාණන්ගේ දින චර්යාවට සාපේක්ෂව එය ද ප්‍රමාණවත් බව අවබෝධ කරගතිමි. සිත ශක්තිමත් වූයෙන් ගතට ද අපහසුවක් නොදැණිනි. එය දෛනිකව ප්‍රායෝගීකරණය වීම නිසා, කාලයෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් මෙම ශිෂ්‍යත්ව ක්‍රියාදාමය සාර්ථක ලෙස ඉදිරියටම ගෙන යාමට හැකිවිණි. අපහසුවක් දැණුන සෑම අදියරකදීම බුදු සමිඳුගේ දින චර්යාවට සාපේක්ෂව, සමාජ යහපත සඳහා වූ මෙම කාර්ය භාරය දෙස බැලීමේදී, ඇති වූ මානසික පිබිදීම මනරම්‍ය. එය මා හද තුල ජනිත කරවන්නට වූයේ ප්‍රබල ආත්ම ශක්තියකි. ධෛර්යයකි.



# ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ සිතුවිලි





## ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ සිතුවිලි



## ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ සිතුවිලි

[illegible]

ශ්‍රී ලංකා - කැනඩා [illegible]

[illegible]

[illegible]

ලැබෙන මෙම උදාර පරිත්‍යාගය, ඔබගේ සේ එක් රැස්වෙන දානයක් වන්නේය. ඒ සියලු පින්, මියගිය [illegible]! අනුමෝදන් වේවා! ඒ පින් හේතුවෙන් එතුමාගේ පරලොව ජීවිතය සැපවත් වේවා! සුවපත් වේවා! එතුමන්ට මේ ශාසනයේ බුදු සසුනේදීම පරම සුන්දර වූ අමා මහ නිවන දකින්නට මේ පින් උපකාර වේවා!

එසේම, [illegible] පිරිසක් සිහිකිරීමේ උදාර සිහිවිල්ලෙන් මේ උතුම් පරිත්‍යාගයන් සිදු කරන ඔබ තුමිය අප හැම දරුවන්ට ද, රටට ද ආදර්ශයකි. ඔබ දෙමාපියන්ගේ [illegible] සිහි කරවයි. මේ රැස් කරන සියලු පින් ඔබගේ ද මෙලොව, පරලොව යහපත පිණිස හේතුවේවා

[illegible]

[illegible]

[illegible]

# 9

# පරෝපකාරය

වත්මන් සමාජ ක්‍රමය තුල විවිධ සමාජ තලයන්හි පරෝපකාරය සඳහා ඉදිරිපත් වන්නන් බොහෝය. එහෙත් ඔවුන්ගේ පසුතල නිර්මාණයන් විවිධය. ඇතැමුන්ගේ අරමුණ වන්නේ පරෝපකාරයේ මුවාවෙන් ස්වකීය ගුප්ත අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීමයි. යසස, කීර්තිය, නම්බුනාම, ප්‍රසිද්ධිය ලබා ගැනීමේ අරමුණෙන් මෙන්ම බලය ලබා ගැනීමේ චේතනාවෙන් එසේත් නැතිනම් තම ආගමට, මතයකට එකඟ කරගැනීමේ අදහසින් පරහට උපකාර කරන්නට ඉදිරිපත් වන්නන් අද සමාජයේ බහුලය.

අප මහා බෝසතාණෝ සතහට පිහිට වූයේ පෙරලා කිසිවක් අපේක්ෂාවෙන් නොවේ. පිරිසිදු චේතනාවෙන් යුතුව යමෙකුට උපකාර අවශ්‍ය අවස්ථාවේදී පිහිට විය හැකිනම් එය ඉතා ශ්‍රේෂ්ඨය. කිසිදු උත්සාහයකින් තොරව, අලසව, කුසීතව කාලය ගතකරමින් අනුන්ගේ පිහිට යදින්නන්ද අද සමාජයේ විරල නැත. එවන් අයට පිහිටවීම ඔවුන්ගේ අලස බවට තවත් ශක්තිය ලබා දීමක් පමණි. එවිට සිදුවන්නේ ඔවුන් එම ජීවන රටාව මුළු ජීවිත කාලය පුරාම දියත් කරමින් බාල පරපුරද එම මාර්ගය ඔස්සේම ගෙනයාමයි. එය ද කල්යාමේදී සංවිධානාත්මකව සිදුකෙරීගෙන යන ආකාරය සමාජය පිළිබඳව විමසිලිමත්ව සිටින්නෙකුට අවබෝධ කර ගැනීම අසීරු නොවනු ඇත. ප්‍රසිද්ධ නගරයන්හි මෙවන් යාචක සංවිධාන ද පැවති බව පැහැදිලිය.

දෛනිකව විශාල පරිමාණයේ ආදායම් ලබමින් භවභෝග සම්පත් යසඉසුරුවලින් ආඪ්‍ය වූ ජීවිත ගතකරමින් සමනල ලොවක ඔබ මොබ සැරිසරන ධන කුවේරයන්ගෙන් ද, ඉතා අපහසුවෙන් ධෛර්යමත්ව සාධාරණ ජීවන වෘත්තියකට පිවිස සාර්ථක ලෙස දිවි ගෙවන මධ්‍යම පැලැන්තිකයින්ගෙන් ද, කාගේ හෝ පිහිටක් පතන - සම්පත් අවම අසරණ දුගී දුප්පත් ජනතාවගෙන් ද සමාජය නිර්මිතය. පීඩිත පැලැන්තියේ දුක නොදැනෙන බහුතරයක් අතර අසරණ ජනතාවට පිහිට වීමට තරම් උණුවන හදවත් ඇති අවංක සත්පුරුෂයන් අතලොස්සක් හෝ සිටීම අකාලික වූ නිර්මල බුද්ධ ධර්මය ලොව පවතින බවට මාහැඟි නිදසුනකි.

පරෝපකාරය ඉතා ශ්‍රේෂ්ඨ ධර්මතාවකි. පරහට උපකාර කිරීමට ඉදිරිපත් වන්නා උපකාර කල හැකි ස්ථාවරයක සිටීම ඉතා වැදගත්ය. එහෙත් සම්පත් තිබූ පමණින් පරිත්‍යාග කල නොහැක. ඒ සඳහා සංසාරගත පුරුද්දක් අවශ්‍යමය. **දීම, දානය හෙවත් පරිත්‍යාගය සංසාරිකව වඩවාලන පාරමිතාවකි.** එය පුරුදු කර ගත හැක්කේ ද මෙවන් උතුම් මිනිස් භවයක් ලද විටක පමණි. දුප්පතාගේ දුක දැකීමට තරම් සංවේදී නොවන හදවත් ඇති අසත්පුරුෂයිනට කොතෙක් සම්පත් ලැබුණ ද, සෑහීමට පත් විය නොහැක. **ඔවුන් වැය පක්ෂය ගැනම හුවා දක්වමින් තව තවත් වස්තුව රැස් කරයි.** තමාට එවන් ආර්ථික සමාජයීය හා අධ්‍යාපනික ස්ථාවරයක් උරුම කර දී මිය පරලොව ගිය දෙමාපියන්ගේ නාමයෙන්වත්, අසරණ අයෙකුට සරණ වීමට සිතක් පහළ නොවීම කෙතරම් අවාසනාවක් ද? සියල්ල **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** බව අවබෝධ කරගත නොහැකිව මනඃකල්පිත සුරංගනා ලොවක දිවි ගෙවුවද, එහි ඇත්තේ මායාවක් මිස සැනසීමක් නොවේ. ස්වභාව ධර්මය සියල්ල පාලනය කරයි. වත්මන් ලෝකයේ සුලභ දර්ශනයන් බවට පත්ව ඇති මහා පරිමාණයේ ජීවිත හානි, ධන හානි, දේපල හානි අනපේක්ෂිතව සිදුවන ආකාරය කෙතරම් විශ්මිත ද? ජීවත්ව සිටින කෙටි කාලය තුල අප්‍රමාදව කුසල් රැස්කර ගන්නෝ මෙලොව පරලොව දෙකෙහිම සැප ලබයි.

**ඉධ මොදති පෙච්ච මොදති - කතපුඤ්ඤො උභයත්ථ මොදති**
**සො මොදති සො පමොදති - දිස්වා කම්ම විසුද්ධමත්තනො**

(ධම්ම පදය - යමක වග්ග)

පිං කරන්නා මෙලොවත් සතුටු වෙයි. පරලොවත් සතුටු වෙයි. තමාගේ ශ්‍රද්ධා කර්මය දැක සතුටු වෙයි. වෙසෙසින් සතුටු වෙයි.

**The Virtuous man rejoices in this world and in the next, in both worlds he rejoices seeing the purity of his own doings.**

දීමනා අතුරෙන් උසස්ම දීමනා ලෙස සැලකෙන්නේ **දන් දීම සහ පින් දීමයි.** අසරණයින් කෙරෙහි අනුකම්පා සහගතව දෙන පරිත්‍යාග සහ පිදිය යුත්තන් කෙරෙහි පූජා කිරීමේ අදහසින් කෙරෙන පරිත්‍යාග දන් දීමට අයිති වේ. එසේම පින් දීම ද උසස් ය. මෙය දස පුණ්‍ය ක්‍රියාවන්හි ද ඇතුළත්ය. මල ගිය ඥාති හිතවතුනට පිං දීමෙන් තමන්ට පිං සිදුවනවා මෙන්ම අනුමෝදන් වන්නන්ට ඉමහත් සෙතකි. මෙම **පත්ති දානය** මගින් තමා විසින් කරනු ලැබූ පින වඩාත් වර්ධනය වන බවත්, ධන පරිත්‍යාගය දුන් පමණින් දෙගුණ තෙගුණ වී තමා වෙතම පැමිණෙන බවත් අත් දුටු සත්‍යයකි.

දෙන්නන් දන දුන් රන් සේ පොළියට
දුන් දුන් සේ තම කළ පින් අනුනට
එන්නෙන් දියුණු ව තියුණු ව තමහට
දැන් වත් නුකුසී වව් පින් දීමට

(ලෝවැඩ සඟරාව)

**The merits you transffered to others will come back to you increasing two fold or three fold, like gold coins let on interest to those who are sure to return them. Therefore don't be lazy in giving merits.**

තමා සතු යමක් නිර්ලෝභීව දීමේදී **ත්‍රිවිධ චේතනා ශුද්ධිය** ඇති වූයේ නම් දානමය පුණ්‍ය ක්‍රියාව සම්පූර්ණ වේ. එනම් දීමට මුල් වූ පූර්ව චේතනාව, තම අයිතියෙන් මුදා, පිරිනමන අවස්ථාවේ ඇතිවන චේතනාව සහ දීමෙන් පසුව ජීවිත කාලය පුරා එය සිහිපත් කෙරෙන අපර චේතනා වේ. මෙලෙස තුන් සිතම පැහැදෙන ආකාරයෙන් පරිත්‍යාගය සිදු වූයේ නම්, එය උපනුපන් භවයන්හිදී වස්තුව ලැබීමට හේතු වන බව ද, වීදාගම මෛත්‍රී හිමියන් විසින් රචිත ලෝ වැඩ සඟරාවෙහිම පෙන්වා දී ඇත.

සත වෙත පතළ මහා කරුණා ගුණයෙන් යුතු අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරාම පෙරුම් දම් පුරමින් අසරණයින්ට සරණ වී ඇති ආකාරය බෞද්ධ ඉතිහාසයෙන් එළි දැක්වෙයි. පිහිට ලබා ක්ෂණයකින් අකෘතඥ වුවන් පිළිබඳව ද ජාතක කථා මනා තතු හෙළි කරයි. එහෙත් ශාරීරික හා මානසික පීඩා හමුවේ අකම්පිතව ඉවසීමෙන් අකෘතඥ වුවන්ට පවා කරුණාව මෛත්‍රිය දැක් වූ ආකාරය රුරු මිග ජාතකයෙන් ඉතා පැහැදිලිය. බෝධිසත්වයන්වහන්සේ එක්තරා භවයක රුරු මුව රජෙකුව ඉපිද සිටිය දී, දියේ ගිලී මරණීය අවදානමකට ලක්ව සිටි මිනිසෙකුට, තම දිවි පරදුවට තබා පිහිට වීමෙන් අනතුරුව, තමා පිළිබඳව කිසිවකුට නොදන්වන ලෙස ඉල්ලීමක් කළහ. එහෙත් අකෘතඥ වූ ඔහු රජතුමාගෙන් වස්තුව ලබා ගැනීමේ අදහසින් එම දුර්ලභ ගණයේ රන්වන් මුවා පිළිබඳව රජවාසලට දැනුම් දීමේ පුවතක් එම ජාතක කථාවෙන් පිළිඹිබු වේ. එකල්හි බඹදත් රජුගේ බිසවට රන් මුවෙකුගෙන් බණ ඇසීමට දොළක් උපන් බව කියවෙන මෙම ජාතක කථාවෙහි අසත්පුරුෂයින්ගේ ගති ලක්ෂණ විස්තර කරමින් දේශනා කරන ලද බණ ඇසූ රජතුමා සහ බිසව බොහෝ පැහැදුණ බවත් අනතුරුව එම රන් මුවාට අකෘතඥ වූ අසත්පුරුෂයා මරා දැමීමට රජු සූදානම් වූ බවත් පැවසේ. එලෙසින් මරණීය දණ්ඩනය පැනවීමට සැරසෙද්දී එයට ද බෝසතාණන් එරෙහිව, ඔහුට අභය දානය ලබා දී ඇති ආකාරය වත්මන් සමාජගත මිනිසාට කෙතරම් ආදර්ශවත්ද? අප මහා බෝසතාණෝ සංසාර ගමන පුරාම නොයෙකුත් භවයන්හි ඉපිද අසරණයින්ට සරණ වෙමින් බලාපොරොත්තු වූයේ ලාභ, සත්කාර, කීර්ති ප්‍රශංසා නොවේ. ප්‍රත්‍යෝපකාර ද නොවේ. **තමා උපමා කොට අසරණ සත්වයින් කෙරෙහි කරුණාව දයාව මෛත්‍රිය දක්වන ලෙසයි.** එයට පිටු පෑ දුර්ජන මිනිසා කෙරෙහි ද සානුකම්පිතව කරුණාව මෛත්‍රීය පැතිරවූ ආකාරය මෙම ජාතක කථාවෙන් කියා පායි.

තුන්ලෝකාග්‍ර වූ අසම සමවූ ඒ මහාකාරුණිකයාණන් වහන්සේගේ මහඟු චරිතාදර්ශයන් අප ජීවිතවලට හැකි පමණින් ආදේශ කරගනිමින් හදවතට එකඟව ප්‍රතිපත්තියෙන් බුදුන් පුදනවිට ඇතිවන්නා වූ ආත්මාලම්බන ප්‍රීතිය

දෛනික ජීවිතයට එක් කරනුයේ මහත් සැනසීමකි. එහෙත් අද සමාජයේ යහපත් වූ කාර්යයන් සාර්ථකත්වය කරා ගෙන යාම පහසු නොවනු ඇත. පැන නගින්නා වූ සම්බාධක අපමණය. මානසික වශයෙන් අධෛර්යමත් කිරීමට වෙර දරන්නෝ බොහෝය. එහෙත් යහපත් වූ දැක්මක් ඔස්සේ පා තැබුවේ නම්, ඒ පය පෙරටම විනා ආපසු තැබිය යුතු නැත. ත්‍රිවිධ රත්නය කෙරෙහි අචල විශ්වාසයකින් යුතුව පා නගන්නෙකුට තමා හමුවේ ඇති බාධක සියල්ල අභිභවා ඉදිරියටම යාමට පුදුමාකාර ජවයක් ලැබෙනු ඇත.

ආරම්භයේදී සමාජ යහපත වෙනුවෙන් ඉදිරියට යන පුද්ගලයා හුදීජනයාගේ අවඥාවට ලක්වන වාර බොහෝය. අනතුරුව වචනයකින් හෝ අධෛර්යමත් කරවීමට වෙර දරයි. මීළඟ පියවර ලෙසින් අසත්‍ය ප්‍රචාර මගින් හෝ හැකි පමණින් බාධා පමුණුවයි. තවත් පිරිසක් ද්වේශ සහගතව අකුල් හෙලයි. ඉදිරි ගමන වළක්වාලීමේ අදහසින් අසත්‍ය චෝදනා නින්දා අපහාස ආදියෙන් හෝ මනස අවුල් වියවුල් කරවීමට සූක්ෂම ලෙස ක්‍රියා මාර්ග ගනී. **අවසානයේදී යන්ත්‍ර මන්ත්‍ර ආදී ගුප්ත ක්‍රියා මාර්ග පවා ගන්නා නූගත් අඥානයින් අද සමාජයේ නැත්තේ නොවේ. ඒ කිසිවකින් කම්පිත නොවන බවත්, උපේක්ෂා සහගතව ඉදිරියටම ගමන් කරන බවත් අවබෝධ වූ විට ප්‍රශංසා කරමින් යහපත් වූ එම කාර්යය වටාම රොක් වෙයි. ඒ පෘථග්ජන ස්වභාවයයි.**

යමෙකු පෙර කරන ලද කුසල් බලයෙන් හා උට්ඨාන වීර්යයෙන් ගොඩ නගා ගෙන ඇති ගෞරවණීය කීර්තිමත් පසුබිම හා සමාජ පිළිගැනීම ආදිය විනාශ කර දැමීමට දුර්ජන පාපී සිත් ඇත්තවුන් නිරන්තර වෑයමක යෙදෙයි. අනවශ්‍ය අවුල් ඇති කිරීමේ අදහසින් චෝදනා එල්ල කල ද, බුද්ධි හීනයක් සමග වාග් පටයකට අවතීර්ණ නොවීම ප්‍රඥාවන්තයින්ගේ ලක්ෂණයයි. මෛත්‍රී සහගතව තමා විසින් වීර්යයෙන් ගොඩ නඟා ගත් චිත්ත පාරිශුද්ධිය කෙලෙසා ගැනීමට ඔවුන් සූදානම් නොවීම එයට හේතුවයි. අවසානයේදී දුර්ජන බලවේග සියල්ල අභිභවා සත්‍යය එළි දකී. **අටලෝ දහමට අනුව නොසෙල්වෙන චරිතයක් ගොඩ නගා ගැනීමට ද මෙවැනි ප්‍රජා සත්කාර තුලින් ලබන්නා වූ අත්දැකීම් මාහැඟි භූමිකාවක් නිර්මාණය කර දෙයි.**

කෙසේ වුවද යහපත් වූ සමාජ සත්කාර්යයන්, සත්පුරුෂ ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වන්නේ නිතැතිනි. සමාජ සේවයකට තනිවම අවතීර්ණ වීමට නොහැකි සත්පුරුෂයින්, යමෙකු විසින් සිදුකරනු ලබන සේවය අගයමින් හැකි පමණින් දායකත්වය සපයමින් කුසල් සිත් වඩවා ගනී. ඔවුන් එවන් ව්‍යාපෘතීන්ගේ සාර්ථකත්වය සඳහා හැකි සෑම සහයෝගයක්ම ලබා දෙමින් ඒ වටා රොක් වෙයි. එක් වදනකින් හෝ නිරතුරුවම සත් කාර්යයන් අගයයි. ඉදිරියටම යාමට ශක්තිය ලබා දෙයි. ඒ ප්‍රඥාවන්ත සත්පුරුෂයන්මය. පරෝපකාරය තුළින් ලබන්නා වූ නිරාමිස සතුට මගින් ඔවුන්ගේ දෛනික ජීවිත, ලෞකික වශයෙන් උපභෝග සහ පරිභෝග සම්පත්තියෙන් පිරී ඉතිරී ප්‍රභාස්වර වන අතර ශ්‍රී සද්ධර්මයේ පෙන්වා දී ඇති ආකාරයට සදාකාලික සැපතට ද එයම හේතුවනු ඇත.

**දදං පියො හොති දදන්ති නං බහූං - කිත්තිසද්ද පප්පොති යසොහි වඩ්ඪති**
**අමංකු භූතො පරිසං විගාසති - විසාරදො හොති නරො අමච්ඡරි**

දෙන තැනැත්තා බොහෝ දෙනාට ප්‍රිය වේ. කීර්තිය පැතිරේ, යසස වැඩේ, පිරිසක් අතරට යන කල්හි නොබියව යයි, විශාරදව යයි.

කෙනෙකු අන් අයගේ උපකාර පතන්නේ අවංකවම අසරණ තත්වයකට පත් වූ විටය. එහෙත් අද මිනිස් සමාජය තුල බොරුව හා වංචාව මහා පරිමාණයෙන් හිස ඔසවා ඇති හෙයින් නියමාකාරයෙන් සරණ ලැබි යුතු අසරණයෙකු හඳුනාගැනීම උගහටය. **කරුණු එසේ වුවද එපමණකින්ම සමස්ථ අසරණ ජනතාව, සත්පුරුෂ පරිත්‍යාගශීලීන්ගේ දෘෂ්ඨි කෝණයෙන් ඉවතලන්නේ නම් එය ද සමාජ පරිහානියට මහත්සේ බලපානු ඇත.** එබැවින් පිහිට වීම සඳහා අසරණයින් හඳුනා ගැනීම ඉතාමත් සූක්‍ෂම වූ ක්‍රමවේදයක් මත සිදුවිය යුතුමය. **ඒ සඳහා දරිද්‍රතාව හඹා යා යුතුමය.** නෙතට ගෝචරවන යථාර්ථවාදී පසුබිම පිළිබඳව විමර්ශනාත්මකව කරුණු සොයා බලා පිහිට ලැබිය යුතු අසරණයින් නිවැරදි ලෙස හඳුනා ගත යුතු ය. දූෂිත සමාජයේ වංචාවනට ඇති ඉඩ කඩ අවම කරගනිමින් පරෝපකාරයේ යෙදීම වඩාත් ඵලදායී වනු ඇත.

**"මහණෙනි, බොහෝ දෙනාගේ හිත සුව පිණිස, යහපත පිණිස, ලොවට අනුකම්පාව පිණිස, දෙව් මිනිස් දියුණුව පිණිස, සැප පිණිස ගම් නියම් ගම්හි හැසිරෙව් ! "** බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළේ පස් වග මහණුන් ඇතුළු රහතන් වහන්සේලා 60 නම අමතා, මීට වසර 2552 ට පමණ පෙරදීය.

සැබවින්ම අසරණ වුවන් සොයා ගැනීම කෙතරම් අසීරු වුවත් ගත වූ දස වසර ඇතුලත ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම එම කාර්ය භාරය ද ඉතා සාර්ථක ලෙසින් මෙහෙයවීය. **ඒ දුරස්ථ පාලකයක් ඔස්සේ තාක්‍ෂණයෙන් නොවේ.** බාධක ගැටළු අභිභවමින් නගර ගම් දනව් පසුකර අති දුෂ්කර වූ ප්‍රදේශ කරා ගමන් කරමිනි. තත්කාලීන සමාජ ක්‍රමය තුල එම අරමුණ සාක්‍ෂාත් කරගැනීම සඳහා විවිධාකාර වූ භෞතික හා මිනිස් සම්පත් වල අවශ්‍යතාව අති විශාලය. කාලය ශ්‍රමය මෙන්ම මුල්‍යමය ස්ථාවරයක් ද තිබිය යුතුමය. **ශිෂ්‍යත්වලාභී දරුවන් වෙත පරිත්‍යාග කෙරෙන ශිෂ්‍යාධාරවලට අමතරව මූල්‍යමය වත්කමක් ශිෂ්‍යත්ව පදනම සතුව නොවිණි.** අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සැවොම ශිෂ්‍යත්වලාභීන් වෙනුවෙන් අනුග්‍රාහකත්වය ද ලබා සිටීමෙන් පදනමේ උන්නතියට නිර්මාණය කරනු ලැබුවේ මාහැඟි ශක්තියකි. එම සත්පුරුෂයින් ඈත දුරු රටක් වූ කැනඩාවේ පදිංචි වුවද, කිසිදු ප්‍රතිලාභයකින් තොරව ශ්‍රී ලාංකික දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් අසරණ සරණ සේවයට අවතීර්ණව මුල්‍යමය අනුග්‍රාහකත්වය දැරීම උපන් මව්බිමට මහත් වූ ගෞරවයකි. කල්යාමේදී ශ්‍රී ලංකාවේම සිටින සත්පුරුෂ දානපතීන් මෙන්ම ජපානය, ඕස්ට්‍රේලියාව, එංගලන්තය, ආදී රටවල පදිංචි ශ්‍රී ලාංකික පින්වතුන් පවා මෙම සත්කාර්යය වටා එක් රොක් වන්නට විය. වාර්ෂිකව ප්‍රදානය කෙරෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව දෙගුණ තෙගුණ වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

**අනුශාසක ස්වාමීන් වහන්සේ ශිෂ්‍යත්ව කටයුතු පිලිබඳ අධීක්ෂණයක .. ..**
**(රාජගිරිය කොටුවේගොඩ පිහිටා ඇති ශ්‍රී ලංකා සම්බන්ධීකරණ කාර්යාලයේදී)**

ලොවම හඳුනාගත් අන්තර් ජාතික ශිෂ්‍යත්ව පදනමකි. තාක්ෂණයේ දියුණුවත් සමග තොරතුරු සියල්ල ඇතුලත් වූ වෙබ් අඩවියකි. ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීම සඳහා අති විශාල කාර්යභාරයකි. ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව වාර්ෂිකව සිය ගණනින් දෙගුණ තෙගුණ වෙයි. දීප ව්‍යාප්තව ශ්‍රී ලංකාව තුල මෙම ශිෂ්‍යත්ව ක්‍රියාදාමය පවත්වාගෙනයාමේදී, පරිගණකයට භාර දිය නොහැකි වූ කාර්යයන් හමුවේ, ඒක පුද්ගල ශ්‍රී ලංකා සම්බන්ධීකරණය අසරණ වූ අවස්ථාවන් ද බොහෝය. **සත්‍යතාව සොයා බලා** සුදුස්සා වෙතම ශිෂ්‍යත්වය ලබා දීමේ අවශ්‍යතාව සපුරාලීමේ පටන් දෛනිකව, මාසිකව, වාර්ෂිකව ශ්‍රී ලංකාව තුල සිදු කරනු ලබන අධි කාර්යභාරය වෙනුවෙන් දුරු රටක සිටින ඒ පරිත්‍යාගශීලී අනුග්‍රාහක භවතුන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරී සහභාගීත්වය කෙසේ ලබන්න ද? මෙවැනි ක්‍රියාදාමයක සාර්ථකත්වය සඳහා **පරිත්‍යාග** කිරීමට සිදු වූයේ මුදල් පමණක් නොවේ. විවිධ පරිත්‍යාගයන් අදියර කිහිපයකින් දියත් කිරීම, අත්‍යවශ්‍ය භූමිකාවක් වශයෙන් නිර්මාණය වන්නට විය.

**ඒ වූ කලී ශ්‍රම පරිත්‍යාගය, කාල පරිත්‍යාගය සහ භෞතික සම්පත් පරිත්‍යාගයයි.** මෙම අභියෝගයට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් අධ්‍යාත්මික, පෞද්ගලික, ආර්ථික හා සමාජයීය පසුබිමක්, මා වෙත උරුම කර දුන් දෙමාපියන් කෘතවේදීව සිහිපත් කරමින් දරිද්‍රතාව හඹාගියෙමි. එහි ප්‍රතිඵලයක් ලෙසින් දරිද්‍රතාවේ පරතෙරටම ගිය දිරිය සිසු දරු දැරියන්ගේ ද භාග්‍යයේ හිරුණලු දිස් වන්නට විය. සියලු අභියෝගයන් පසුපස යෝධ සෙවනැල්ලක් මෙන් මාගේ ස්වාමි පුරුෂයාණන් ද සිටියෙන් නිර්මාණය වූ අත්‍යවශ්‍ය භූමිකාව හමුවේ සාර්ථකත්වයකරා ම ඉදිරියට යාමට කැපවීමෙන් යුතුව ඔහුගෙන් ලැබුණා වූ ශ්‍රම පරිත්‍යාගය මා හැඟිය. ශිෂ්‍යත්ව ලාභීන් වෙනුවෙන් වාර්ෂිකව අනුග්‍රාහක මූල්‍යමය පරිත්‍යාගයන් ද ලබා දෙමින් දෛනිකව පවුලේ සාමාජිකයින්ගෙන් ලැබුණේ මාහැඟි ශ්‍රම දායකත්වයකි. ඔවුන්ගෙන් ලැබුණා වූ සහාය, ආරක්ෂාව සහ කැපවීම අතිමහත්ය. ඔවුන්ගේ එම නිහඬ දායකත්වයේ ප්‍රතිඵලයක් ලෙසින් දස වසරක් පුරා ඉතා සාර්ථක වූ සමාජ මෙහෙවරකට අවතීර්ණ වීම සඳහා අවශ්‍ය වාතාවරණය යහපත් සේ සැකසුණ අතර එය හුදෙක් දරිද්‍රතාවෙන් පෙළෙන සිසු දරුවන්ගේ පෙර කරන ලද කුසල කර්මයනට අනුරූපවම විය.

කෙතරම් බාධක කම්කටොලු අවහිරතා මධ්‍යයේ වුවද, **සැබවින්ම** කවරෙකුගේ හෝ පිහිටක් ලැබිය යුතු ඉගෙනීමෙහි දක්ෂතාවන් ඇති දරුවන් **සොයා ගොස්** ඔවුනට පිහිටවීමේදී හදවතට දැනෙනුයේ අප්‍රමාණ සතුටකි. මෙවන් දරුවන් නිසිලෙස හඳුනාගැනීමට නම් **දරිද්‍රතාව හඹා** යා යුතුමය. සහතික කරන ලද ලිපි ලේඛන වල ඇති දත්ත **පමණක්** සැලකිල්ලට භාජනය කරන්නේ නම් සැබවින්ම සරණ ලැබිය යුතු අසරණයින් සොයා ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක වූයේ යැයි සෑහීමකට පත් විය නොහැක. සුදුස්සා පසෙක සිටිය දී, ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කරමින් බලවතා සියලු ප්‍රතිලාභ ලබාගන්නේ නම් එය බලවත් සරණ සේවයක් විනා අසරණ සරණ සේවයක් නොවන්නේය. එවන් අවස්ථා සමාජයේ නැත්තේ නොවේ. අවම කර ගැනීම සඳහා ක්‍රමවේදයන් සෙවිය යුතුමය.

**දුක යන්න හදවතකින් හදවතකට සම්ප්‍රේෂණය වන දෙයක් විනා භෞතික හෝ තාක්ෂණික මිනුම් දණ්ඩකට හසුකර ගත හැක්කක් නොවේ.** Lap Top / Palm Top සහ i-Pod **ආදී වශයෙන් නූතනයේ නාමකරණය කර ඇති, සූක්ෂම ලෙස නිපදවනු ලැබූ පරිගණකයකට, අසීමිත කාර්ය භාරයක් ක්ෂණිකව කල හැකි නමුත්, මිනිස් නෙතකින් රූරා හැලෙන දුක් කඳුළු බිඳුවක අඩංගු හැඟුම් සමුදාවලියේ ඇති සංකීර්ණ සංවේදීතාවය නිගමනය කල නොහැක්කේමය. එවැනි ක්‍රම වේදයක් තාක්ෂණය මගින් සොයා ගත් විද්‍යාඥයෙක් මේ දක්වා ලොව පහළ වී නැත.**




දිරිය දරුවකු ශිෂ්‍යත්ව ලබා ගැනීමෙන් අනතුරුව තම අභිමානවත් අනාගතය එළි දක්වයි




පිටකවරයට හේතු වූ සිසු සංකල්පනාවක්

සම්පත් අවම දිරිය සිසුන් ශිෂ්‍යත්වය ලබා ගැනීමෙන් අනතුරුව, චිත්ත සන්තානයේ ජනිත වූ අභිමානවත් අනාගතය විවිධාකාරයෙන් එළි දක්වන්නට විය.

දුක් කඳුලක සංවේදීතාවය නිගමනය කල හැක්කේ මිනිස් හදවතකට පමණි. මීට වසර 2552 ට පෙර අප තථාගත තුන්ලෝකාග්‍ර සම්මා සම්බුදුරජාණන් වහන්සේ, **තමන් වහන්සේගේ ආර්ය පර්යේෂණය තුළින්** එහි සත්‍යතාවය ලොවට හෙළිකල සේක. මිනිසාගේ ප්‍රඥාව / බුද්ධිය සියලු තාක්ෂණයන් අභිභවා යයි. **කෙනෙකුගේ දුක් කඳුළු මාංශමය නෙතින් දැක, මනෝමය නෙතින් විචාරා අසරණභාවය හදවතින් තක්සේරු කරගැනීමට නම් අවශ්‍ය වන්නේ මිනිස් සම්පතමය.** කෙනෙකුගේ දුක්ඛිත වූ ජීවන රටාව සියැසින්ම දැක ඔවුන්ගේ දුක් සුසුමකට සැනසුම් සුවයක් ලබාදිය හැකිනම් එය ඉතා ශ්‍රේෂ්ඨය. එවන් දරුවන් වෙත කරනු ලබන පරිත්‍යාගයන් ඉතාමත් ඵලදායී වන අතර ඔවුන් එහි වටිනාකම හඳුනාගනිමින් ඉගෙනීම සඳහා වූ අත්‍යවශ්‍ය වියදම් එමගින් පිරිමසාගනිමින් තම ජීවිත ඉලක්කයන් කරා සාර්ථකව ගමන් ගනී.

දුෂ්කර ප්‍රදේශයන්හි දිරිය දරුවන්ගේ සැබෑ තතු සොයා බැලීම සඳහා එම ප්‍රදේශවල සැරිසැරීමේදී මුහුණපාන්නට වන ගැටළු අනන්තය.අවදානම තියුණුය, වාහනයකින් තබා දෙපයින් වත් ළඟාවිය නොහැකි ග්‍රාමීය පෙදෙස් වුවද, එලෙසින් දරිද්‍රතාව හඹා ගොස් සත්‍යතාව වටහාගත් ශිෂ්‍යත්වලාභීන් කිහිප දෙනෙකුගේ සැබෑ තතු මෙසේය.

ඇය 2002 වසරේ ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කල ශිෂ්‍යාවකි. පදිංචිව සිටියේ ගාල්ල බටපොල ප්‍රදේශයේ දුෂ්කර ගම්මානයකය. පවුලේ සාමාජිකයින් සිව් දෙනෙකි. මව තරමක රෝගී තත්වයෙන් පසුවන නමුත් අසල්වැසි නිවෙස්වලට ගොස් හැකි පමණින් සේවයක් කොට සුළු කුලියක් ලබා ගනී. පියා ද කුලී වැඩ කරමින් මෙම දරුවන් පාසැල් යවයි. අ.පො.ස (සා.පෙ) විභාගය ඉතා උසස් ලෙස සමත් වුවද, අ.පො.ස (උසස් පෙළ) අභියෝගය ජයගැනීම ඇයට සිහිනයක් වූයේ පවුලේ අයහපත් ආර්ථිකයට අනුරූපවමය. පුවත්පතකින් දැනගත් තොරතුරක් අනුව මෙම ශිෂ්‍යත්ව සඳහා ඇය ඉල්ලුම් කළේ බලාපොරොත්තු දහසක් පොදි බැඳගෙනය. ඇය සියළුම සුදුසුකම් සපුරා තිබුණෙන් ශිෂ්‍යත්වලාභී නාම ලේඛණයේ ප්‍රමුඛ ස්ථානයක් ඇයට හිමිව තිබුණි. ශිෂ්‍යත්වලාභීන් වෙත ඒ බව දැන්වූවද එයට පිළිතුරක් ඇයගෙන් නොවීය. ගත වූයේ සති දෙකකි. ලියාපදිංචි තැපෑලෙන් ඇය වෙත යවනු ලැබූ එම ලිපිය නැවත ශ්‍රී ලංකා සම්බන්ධීකරණ කාර්යාලය වෙතම ලැබිණි. කල යුත්තේ කුමක් ද? **පරිපාලනමය වශයෙන් ශිෂ්‍යත්වලාභී ප්‍රමුඛතා ලැයිස්තුවෙහි ඊළඟ නම තෝරා ශිෂ්‍යත්වය ප්‍රදානය කිරීමට කිසිදු බාධකයක් නොවීය.** එහෙත් කලයුත්තේ එලෙසින් ඇයට ශිෂ්‍යත්වය අහිමි කිරීමද? දරිද්‍රතාව හඹාගොස් ඇයට සිදුවූයේ කුමක් ද යන්න සොයා බලා පිහිට වීම ද? සිතිවිලි අතරේ අතරමං වීමි. පෙර පින් බලයෙන් සහ අධිෂ්ඨානයේ සහ වීර්යයේ ප්‍රතිඵලයක් ලෙසින් මෙවැනි අවස්ථාවලදී සුදුසු පියවර, එඩිතර ලෙසින් ගැනීමට තරම් ප්‍රමාණවත් වූ ශක්තියක් ශ්‍රී ලංකා සම්බන්ධීකරණය සතු වූයෙන් පවුලේ සාමාජිකයින්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ඇතිව ඇයගේ තොරතුරු සොයා ගැනීමට පිටත් වුනෙමු.

කිලෝමීටර 110 පමණ කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ ගමන් කළ ද ඉන් ඔබ්බට වූ අතුරු පාරක් දිගේ තවත් කිලෝමීටර 10 පමණ යා යුතුව තිබුණි. වසර ගණනකින් නඩත්තු නොකරනු ලැබූ මඩ සහිත පටු මංමාවත් දිගේ ඉතාමත් අවදානමින් යුතුව මෝටර් රථය ධාවනය විණි. එහෙත් ඇයගේ නිවස අසලටම මෝටර් රථයක් යා නොහැකි විය. අනතුරුව පා ගමනින් නිවසට ළඟා වුනෙමු. **පොල්හුන්නාව** නමැති දුෂ්කර ග්‍රාමයක පිහිටි එම නිවස වර්ග අඩි 100 ක පමණ වූ, කොටසක් කඩා වැටී ඇති කටු මැටි බිත්ති දෙකකට මැදි වූ කුඩා පැල්පතකි. ඒ මොහොතේ ගෙතුල කිසිවකු නොසිටිය ද දිරා ගිය පුටුවක් සහ පොත් මේසයක් දුටුවෙමු. අසල්වාසීන් විසින් යවනු ලැබූ පණිවිඩයකට අනුව විනාඩි 10 පමණ කාල සීමාවක් ඇතුළතදී, කුලියට කුඹුරු කොටමින් සිටි ශිෂ්‍යත්වලාභී දැරියගේ පියා මඩ තවරාගෙන ම අප ඉදිරියට ආවේ හිසේ බැඳී ජටාව ගලවා දමමින් ඉතාමත් යටහත් පහත් විලාශයෙනි. යථාර්ථය අවබෝධ වීමට එකුදු වචනයක්වත් අවශ්‍ය නොවිණි. පාරේ අවදානම් තත්වය නිසාම ලිපි බෙදීම ද අක්‍රමවත් බව පැවසූ ඔහු "**මේවා ඉතින් අපි කාට කියන්න ද?**" යනුවෙන් පවසමින් දීර්ඝ සුසුමක් හෙළුවේ අසරණ බවේ පරතෙරටම කිඳා බසිමිනි. හෙට දවසක් ගැන කිසිදු බලාපොරොත්තුවක් ඔවුන් සතු නොවීය.

මිනිසත් බවක් ලබා **දෙනෙත්** ලැබුවේ දරිද්‍රතාවෙන් පෙළෙන මෙවන් මිනිසුන්ගේ යථාතත්වය දැකීමට නොවේදැයි මට සිතුනි. කාලය ශ්‍රමය හා අනිකුත් දෛවයෙන් උරුම වී ඇති සියලු සම්පත් සුරක්ෂිතව තබා ගෙන එම ශිෂ්‍යත්වය අහිමි කිරීමට කටයුතු කළේ නම් මොන තරමේ අසාධාරණයක් ද? මසිත මගෙන් ප්‍රශ්ණ කරන්නට විය. **මා දරිද්‍රතාව හඹා ගිය ගමනේ නිසි ඵල ලැබුවෙමි.** ශිෂ්‍යාධාර මුදලට අමතරව ඇය වෙනුවෙන් විෂයානුබද්ධ පොත් පත් පාඩම් සටහන් නිබන්ධන ආදිය ද සපයමින් මා ලැබුවේ අපමණ තෘප්තියකි. ඇය තමා ලද මූල්‍යමය ශිෂ්‍යාධාර සහ එයට පරිබාහිරව ලද අනෙකුත් ද්‍රව්‍යමය ආධාර මෙන්ම, ශිෂ්‍යත්ව ක්‍රියාදාමය තුළින් ලැබුවා වූ අධ්‍යාත්මික ශක්තිය නිරතුරුවම අගය කරන්නට වූවාය. ඒ සඳහා ඇය කාව්‍යමය සංකල්පනා යොදා ගත් අවස්ථා බොහෝය. ඇයගේ කාව්‍යමය කුසලතාවයන් වඩාත් ඔප් නැංවීමට ඇය වෙත ලැබුණා වූ ප්‍රතිචාරයන් ඉවහල් වූ බව ඇය ප්‍රකාශ කරන්නේ ඉතා සතුටිනි.

තව තවත් ප්‍රජා සත්කාර සඳහා මා පොළඹවනු ලැබුවේ මෙවැනි දරුවන් විසින්මය. **ඔවුන්ගේ හදවත් තුල උත්පාදනය වී තෙලි තුඩකින් කඩදාසිය මත පතිත වන දුක් සුසුම් මාගේ ව්‍යායාමය තව තවත් තීව්‍ර කරවන්නට වූයේ දෙනෙත් බොඳ කරවමිනි.** එහි ගෞරවය ඔවුන් වෙතම හිමිවනු ඇත.

තවත් ශිෂ්‍යත්වලාභී දියණියකගේ සත්‍යය යථාර්ථය මෙසේය. ඇය සමෘද්ධි ලාභී පවුලක දැරියකි. ශිෂ්‍යත්ව පදනම වෙත ලබා දී තිබුණේ කළුතර ඔද්‍රාති නිවසක ලිපිනයකි. පියා නිවාස පින්තාරුකරුවෙකු ලෙසින් පවුලේ නඩත්තුව සඳහා ඉඳ හිට තාවකාලික වෘත්තියක යෙදෙයි. අ.පො.ස (සා.පෙ) විභාගයේදී සියලු විෂයයන් සඳහා විශිෂ්ඨ සාමාර්ථ ලබා තිබූ අතර ශිෂ්‍යත්වයක් ලබා ගැනීම සඳහා

0235

[redacted]

බිබිලහෙල.
2002-12-21

ශ්‍රී ලංකා සම්බන්ධීකාරක ලේකම්,
ශ්‍රී ලංකා-කැනඩා ශිෂ්‍යත්ව පදනම

ඔබ විසින් පිරිනමන ලද වටිනා පොත් කට්ටලය ලැබුණු හෙයින්
~~ස්තූතිය පළ කිරීම.~~

හිතවත් ගුණතිලක මහත්මියනි,

2002-12-18 වන දින මාගේ නිවසට පැමිණ ලැබුණු වටිනා පොත් කට්ටලයක් පිරිනැමීම වෙනුවෙන් පළමුවෙන්ම මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි. එදින මා හට නිවසේ රැඳී සිටින්නට නොහැකි වීම පිළිබඳව අතිශය කණගාටුවට පත්වීමි. ඔබ විසින් පිරිනමන ලද ඒ වටිනා පොත් කට්ටලය මා අනාගත විභාග පුළුල් කිරීමට - ලැබුණු ප්‍රයෝජනවත් වන්නේය.

මා විසින් නිර්මාණය කරන ලද කවි පබැඳුම් පිළිතුරු ලබාදුන් නිර්මාණය කරමින් එක් සඟරාවකට මුද්‍රණය කර පසුව මා වෙත ලැබෙන්නට සැලැස්වීම තුළින් ලැබූ ප්‍රීතියක් ලද්දෙමි. එවැනි ප්‍රතිචාර ලැබීම තුළින් මගේ හැකියාවන් දියුණු කරගන්නට බලාපොරොත්තු වෙමි. අපගේ ... අපගේ හිත මිතුරු ... ඔබ දරුවන්ට ආදරණීය මවකි. ජීවිතය ජය ගන්නා ආකාරය පිළිබඳ වටිනා උපදෙස් ලබන් අප ... කරන ... ගුරුතුමියකි.

ඔබගේ මේ මහඟු කාර්යභාරයට අත්වැල දෙන ඔබේ ස්වාමි පුරුෂයාණන් - වන්, ආදරණීය දරුවන්ටත් මාගේ කෘතඥපූර්වක ස්තූතිය හෘදයාංගම පුදකරමි. ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම ආරම්භ කිරීමෙහිලා පුරෝගාමී ව කටයුතු කළ ගිලියන් ටුම්බ්‍රා ස්වාමිපුත්‍රයන් ... ද ඉතා සිතින් පූර්වකව හදවතින්න - යෙන් පුදමි ~~...~~. මාසිකව මාගේ ශිෂ්‍යත්ව මුදල වන රු. 300/= මා වෙත පිරිනමන දයාබර විල්සි රොජර්ස් මැතිනියටද ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නෙමි.

ඔබගේ දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා ම කටයුතු කරන උතුම් ඔබලා සැමට දෙනාටම නිරෝගී සුවය, දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරන්නෙමි.

ලබන්නා වූ 2003 නව වසර ඔබ සැමට දෙනාට ම ශුභ වසරක් නිරෝගිමත් වාසනාවන්ත එකක් වේවායි හද පතුලෙන්ම ප්‍රාර්ථනා කරමි.

**මූල්‍යමය ශිෂ්‍යාධාරයට අමතරව ලද සම්පත් අගය කරමින් .. ..**

අවශ්‍ය අනෙකුත් සියලුම සුදුසුකම් ද සපුරා තිබුණි. එවකට ත්‍රෛමාසිකව රුපියල් 2250/= බැගින් වසර දෙකක කාලයක් සඳහා වූ ශිෂ්‍යත්වයක් ලබා ගැනීමට ඇය භාග්‍ය සම්පන්න වූවාය. පළමුවන චෙක්පත, අප වෙත ලබා දී තිබූ ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් යොමු කළ ද එය ලද බවට පිළිතුරුක් නොවිණි. එවකට දුරකථන පහසුකම් ද නොවිණි. ඉදිරි චෙක්පත් යැවීමට පෙර කරුණු සොයා බැලීමට සුදුසු බව හැඟීගියෙන් ලිපිනය සොයා ගියෙමු. එම ස්ථානයේ වූයේ දිරාපත්වීගිය කඩපිලකි. පදිංචිකරුවන් ඒ මොහොතේ පෙනෙන්නට නොවිණි. නිසි තොරතුරක් ලබා ගැනීමට නොවූයෙන් අනතුරුව ඇගේ ස්ථිර පදිංචි නිවස සොයා ගියෙමු. කළුතර සිට කිලෝමීටර 10 ක් පමණ ඔබ්බෙහි වූ ඉතා දුෂ්කර වූ පෙදෙසක "අද්වකත් වත්ත" නම් වූ වෙන්දේසි කරන ලද ගම්බද ඉඩමක් විය. ඉතා කුඩා පැල්පත් කිහිපයක් දක්නට ලැබිණි. එහෙත් ඒ අසලට යාමට මාර්ග යක් නොවිණි. අප ගමන් කළ මෝටර් රථය යා හැකි උපරිම දුර ගොස් පාරේ නතර කර තබා වැට, කඩොළු, නියර හා වක්කඩ හරහා ගොස් එම දැරියගේ නිවසට ළඟා වුනෙමු.

## සිසු දරුවන්ගේ සැඟවුන කුසලතාවන් වඩාත් ඔප් නංවන ප්‍රතිචාර

# නිෂ්පත්ව පදනම වෙත පිදෙන තුති මල්

[illegible]

පැදුම :- [illegible]-0235

පිළිතුරු පැදුම :- [illegible]

1. [illegible]

2. [illegible]

පිළිතුරු පැදුම :- [illegible]

3. [illegible]

4. [illegible]

5. [illegible]

6. [illegible]

7. [illegible]

8. [illegible]

පිළිතුරු පැදුම :- [illegible]

[illegible]

Page 01

9. [illegible]

10. [illegible]

පිළිතුරු පැදුම :- [illegible]

[illegible]

11. [illegible]

12. [illegible]

13. [illegible]

පිළිතුරු පැදුම :- [illegible]

Page 02

තරමක වෙහෙසක් දැණුන ද මට එක් වරම මතකයට නැගුණේ **ත්‍රෛලෝක නාථ තථාගත බුදුපියාණන් වහන්සේය. උන්වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරාම අසරණ ජනතාවට සරණ වෙමින් කෙතරම් දුක් පීඩා විඳින්නට ඇත් ද? සිතිවිලි සමඟින් මාගේ වෙහෙස ද නිවී ගියේය.** රජයෙන් දෙනු ලැබූ කුඩා ඉඩම් කැබැල්ලක මහජන ආධාර මත ඉදිකරගෙන යන කුඩා නිවසේ ඉදිරිපස, තිරයකින් ආවරණය කර තිබූ කවුළුවකි. එය දොර සවිකර ගැනීම සඳහා වෙන් කරනු ලැබූ ස්ථානය බව දැන ගතිමි. නිවසේ දරුවන් එම අවස්ථාවේ නොසිටිය ද, දෙමාපියන් මුණ ගැසිණි. දරිද්‍රතාවේ රුදුරු බව සියැසින් දුටුවෙමි. ඉල්ලුම්පත් දහස් ගණනක් අතුරෙන් ශිෂ්‍යත්වයක් ලබා දීම සඳහා අප විසින් කරන ලද තේරීම කෙතෙක් දුරට සාධාරණ ද? නිවැරදි ද? යන්න අවබෝධ වනවාත් සමඟම හදවතට දැණුනේ මහත් සැනසීමකි.

කළුතර ඥාති නිවසකයැයි සඳහන් කරන ලද ලිපිනයක් ශිෂ්‍යත්ව පදනම වෙත ලබාදීමට හේතුව සක්සුදක් සේ අවබෝධ විණි. පාපැදියක්වත් යා නොහැකි එම ප්‍රදේශයේ එවකට ලිපි බෙදීමක් සිදු නොවීම එයට හේතුවයි. රජයෙන් දෙනු ලැබූ එම කුඩා ඉඩම් කැබලි වල, ඒ වන විට කුඩා නිවෙස් කිහිපයක් ඉදිවෙමින් පැවතුන අතර ඒවාට ලිපිනයන් ලැබී නොතිබුණි. දරිද්‍රතාවේ පරතෙරටම ගිය මෙවැනි දක්‍ෂ දරුවන්ගේ අනාගතය බැබලවීමට සත්පුරුෂ ජනතාව මෙලෙසින් කටයුතු කරද්දී, ඔවුන්ගේ මුවාවෙන් තම දුෂ්ඨ අරමුණු සාක්‍ෂාත් කර ගැනීමට වෙර දරන්නෝද අපමණය. මෙම දැරිය ඥාතියෙකුගේ ලිපිනයක් ශිෂ්‍යත්ව පදනම වෙත ලබා දී තිබීම සාධාරණය. එසේ කරනු ලැබුවේ විශ්වාසයකින් යුතුව විය හැකියි. එහෙත් සිදුවූයේ කුමක් ද? ඇයගේ චෙක්පත එම ඥාතීන් විසින් වංචා කිරීමයි. මුලදී එවන් චෙක්පතක් නොලද බව වංචනිකයන් තරයේ ප්‍රකාශකර තිබුණද, චෙක්පතට සිදු වූ දෙය සොයා බැලීමට ශ්‍රී ලංකා සම්බන්ධීකරණය අසමත් නොවිණි. නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව එය තමා විසින් වංචා කළ බව ප්‍රතික්ෂේප කිරීමට එම ඥාති සොහොයුරා අපොහොසත් වුයෙන් ශිෂ්‍යත්වලාභී දියණියට අදාල මුදල් ඇය වෙත ලබාදීමට ඔහු එකඟ වී තිබුණි. ශිෂ්‍යත්වලාභීන් වෙත මුදල් යැවීම පමණක් එකම අරමුණ සේ සලකා නිහඬව සිටියේ නම් ඇතැම් විට මෙම වංචාව ශිෂ්‍යත්ව කාල සීමාව පුරාම සිදුවන්නට ඉඩ තිබුණි. **එසේ වූයේ නම් ශිෂ්‍යත්වලාභී දියණිය ශිෂ්‍යත්ව පදනම කෙරෙහි කෙතරම් සාවද්‍ය වූ ප්‍රතිරූපයක් ගොඩනගා ගන්නට ඉඩ තිබුණේදැයි මට සිතුණි.** පදනමේ ගෞරවය ආරක්ෂා කර ගැනීමට හැකි වීම පිළිබඳව මට මහත් සතුටක් දැණුනි. අනතුරුව එම ලිපිනය වෙනස් කරමින් චෙක් පත් ලබා ගැනීම සඳහා වෙනත් විශ්වාසදායක ලිපිනයක් ලබා දුන් ඇය, අදාල මුදල් නිසි පරිදි තම අධ්‍යාපන කටයුතු සඳහා යොදාගනිමින් 2007 අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී **සියලුම විෂයයන්ට විශිෂ්ඨ සාමාර්ථ** ලබා ගනිමින් සරසවි වරම් ලැබීය.

ශිෂ්‍යත්වලාභීන් **37** දෙනෙකුගෙන් යුක්ත ආරම්භක කණ්ඩායමේ තවත් දැරියකගේ කථා පුවතක් මෙසේය. පියා මත් වතුරට ඇබ්බැහි වීම නිසා පවුලේ කිසිදු අවශ්‍යතාවක් ඔහුගේ අවධානයේ නොවිණි. නිවසේ ඇති සියලුම දෑ

විකුණමින් මේ දැරියගේ සහ ඇගේ මවගේ ජීවිත පත් කරනු ලැබුවේ අඳුරෙන් අඳුරටමය. ඇයගේද සැබෑ තතු සියැසින් දුටුවෙමි. ශිෂ්‍යාධාර මුදලට අමතරව වෛද්‍ය නලාව (stethoscope) මෙන්ම ද්‍රව්‍යමය ආධාර ද විටින් විට ලබා දෙමින් ඇයට ද ශක්තියක් වූවෙමු. තම අධ්‍යාපන ඉලක්ක කරා සාර්ථකව ගමන් කල ඇය අද රජයේ **වෛද්‍යවරියක** ලෙස දහස් ගණන් රෝගීන් සුවපත් කරමින් සමාජයට මාහැඟි සේවයක් ඉටු කරන්නීය.

දෙවන ශිෂ්‍යත්වලාභී කණ්ඩායම 1999 දී තෝරාගත් අතර අ.පො.ස (සා.පෙ) විභාගය ඉතා සාර්ථක ලෙස සමත් මෙම සිසු දරු දැරියනට ද අ.පො.ස (උ.පෙ) විභාගය අභියෝගයක්ව තිබුණි. පවුලේ අයහපත් ආර්ථික මට්ටමට අනුව **උසස් අධ්‍යාපනය අත්හැරීමට තීරණය කළ එක් දියණියක් හඹා ගියෙමු.** ඇය පදිංචිව සිටියේ බදුල්ල දිස්ත්‍රික්කයේ **රත්කරව්ව** ප්‍රදේශයේය. ඇයගේ උසස් අධ්‍යාපනය සඳහා පමණක් නොව ගෙදර අඳුර දුරලන භූමිතෙල් පහනට තෙල් ටික පවා මිලදී ගන්නේ ශිෂ්‍යත්ව පදනමට පිං දෙමින් බවට අප දැනුවත්වූවේ එම නිවසට ඇතුළු වූ විටයි. පාසලට යාමට බස් රථයකට නැගීම සඳහා කිලෝමීටර 4 කට ආසන්න දුරක් කඳු පල්ලම් ඔස්සේ දිනපතා සීතල මිහිදුම් සළු පොරවාගෙන අළුයම ගමන් ඇරඹිය යුතුව ඇත. අධ්‍යාපනයේ දක්ෂ වුවද, ශිෂ්‍යත්වය ලබා ගැනීමට භාග්‍ය සම්පන්න වුවද, ඇය සිටියේ ජීවිතය පිළිබඳව කලකිරීමකිනි. ඇය වෙත ද යම් පමණක හෝ ද්‍රව්‍යමය ආධාර ද ලබා දෙමින්, ධර්මය පදනම් කරගනිමින් හැකි පමණින් ධෛර්යමත් කළෙන්, අද ඇය ද **හෙද නිලධාරිනියක්** ලෙසින් බදුල්ල රජයේ රෝහලට අනුබද්ධව රෝගී ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන්නේ මාහැඟි සේවයකි.

දස වසරක් පුරාම හැකි සෑම අවස්ථාවකදීම ශිෂ්‍යත්ව ලාභී දරුවන්ගේ සැබෑ පසුබිම අත්දුටුවෙමු. ඉගෙනීමෙහි දක්ෂ දරුවන්ගේ සත්‍ය වූ ආර්ථික හා සමාජයීය වාතාවරණය **නෙතින් දැක** තරඟකාරී වාණිජ සංකල්පයන්ගෙන් තොරව ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් තීරණ ගැනීමේදී එය කෙතරම් සාධාරණ ද? යුක්ති සහගත ද? සැනසිලිදායක ද? යන්න අවබෝධ වන්නට විය. මෙම ක්‍රියා මාර්ගය තුලින් ලද හැකි තවත් අතුරු ඵලයකි. එනම් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් වංචනික ලෙස ආධාර ලබා ගැනීමට වෙරදරන්නන් හඳුනා ගැනීමට ද හැකිවීමයි. **ඉඳ හිට හෝ එවැනි වංචාකාරී පුද්ගලයින් කෙරෙහි ද ශිෂ්‍යත්ව පදනමක අවධානය යොමු විය යුතුමය.** කාලීන වශයෙන් සර්ව සම්පූර්ණ සාර්ථකත්වයක් කරා මෙම ක්‍රියාදාමය දියත් කලනොහැකි වුවද, යම් පමණකින් හෝ වංචනික අයදුම්කරුවන් හඳුනා ගැනීමට එය මහත්සේ ඉවහල් වනු ඇත. එවැනි අවස්ථාවල දී එම වංචනික ක්‍රියාවන් සාධාරණීකරණය කිරීමට ඔවුන් උත්සාහ කළ ද ඇසින් දුටු සාක්ෂි හමුවේ එය නිශ්ඵලය. එලෙසින් ව්‍යාජ දත්ත ඉදිරිපත් කරමින් ශිෂ්‍යත්ව ලබා ගන්නා වූ අය පිළිබඳව ද සමාජ සේවකයින් දැනුවත් විය යුතුමය.

එවැනි එක් අවස්ථාවක් මෙසේය. ඇය අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය ඉතා උසස් ලෙස සමත් දැරියකි. උසස් පෙළ අධ්‍යාපනය වෙනුවෙන් වසර දෙකක කාලසීමාවක් සඳහා ප්‍රදානය කෙරෙන ශිෂ්‍යත්වයක් සඳහා ඇය ඉල්ලුම් කර තිබුණි. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අදාල ඉල්ලුම්පත්‍රය ද, නිසි ලෙස සහතික කරවනු ලැබූ අනිකුත් අවශ්‍ය සියලුම ලිපි ලේඛන සමඟින් ඇය ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පෙර ශ්‍රී ලංකා සම්බන්ධීකරණ කාර්යාලය වෙත යොමු කර තිබුණි. පැවතුණා වූ පරිපාලනමය ක්‍රියාදාමය හමුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණයට යොමු කෙරිණි. අනතුරුව පවුලේ සාමාජික සංඛ්‍යාව, මාසික ආදායම ආදී සංඛ්‍යාත්මක දත්ත මත තීරණ දෙන පරිගණකය විසින් ඇයගේ නම ද ශිෂ්‍යත්වලාභි ප්‍රමුඛතා ලැයිස්තුවේ මුල් කොටසෙහිම ස්ථාන ගත කර තිබුණි. අදාල ශිෂ්‍යත්වය ප්‍රදානය කර, ගත වූයේ මාස කිහිපයකි. **දරිද්‍රතාව හඹා යන ගමනේදී** ඇයගේ නිවස ද එක් නැවතුම්පලක් විය. යථාර්ථය දුටුවෙමු. ඇය විසින් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරනු ලැබූ කරුණු ද නිවැරදිය. පවුලේ තොරතුරු සත්‍ය බවට නිසි පරිදි සහතික කරවා ඉදිරිපත් කර තිබුණ අතර ඉතා අඩු මාසික වේතනයක් ද සමඟින් පියාගේ රැකියාව ලෙසට සටහන්ව තිබුණේ **තාවකාලික රියදුරු** යන්නයි. එය ද අසත්‍ය නොවේ. නිවසේ පාසල් සේවය සඳහා යොදවන වාහන කිහිපයකි. එවායේ අයිතිකරුවන් ඔවුන්මයි. ඇයගේ පියා **තාවකාලික රියදුරු** බවට පත්වන්නේ ඒවායේ රියදුරන් නොපැමිණි දිනවලදී ය. යථාර්ථය අවබෝධ වුයෙන්, සුදුසු ක්‍රියා මාර්ගය ගැනීමට ප්‍රමාද නොවූවෙමු.

ඉතාමත් කලාතුරකින් උදාවන එවැනි අවස්ථා පිළිබඳව ද මනා අවධානයකින් යුතුව දස වසරක් ඉදිරියට ගෙන ආ මෙම ශිෂ්‍යත්ව ක්‍රියාදාමය තුලින් මව් බිමට සිදු වී ඇත්තේ අමිල සේවයකි. එය කිසිසේත් ලඝු කොට තැකිය නොහැක. වත්මන් සමාජයට සාරධර්ම වලින් පරිපෝෂිත ආකල්පමය සංවර්ධනයකින් යුතු, දසත ගුණ සුවඳ විහිදුවන උගතුන් පිරිසක් දෘෂ්ඨි මානයේ විරාජමාන වීම එයට හේතුවයි. ඔවුන් අද **ඉංජිනේරු, වෛද්‍ය, ගුරු, හෙද** වැනි නොයෙකුත් ඵලදායී වෘත්තීමය ක්ෂෙත්‍රයන්හි කිරුළු දරණ අතර ඇතැම් සිසුන් **වාණිජ, කළමනාකරණ, නීති සහ සෞන්දර්ය පීඨයන්හි** සරසවි අධ්‍යාපනය නිම කොට, රජයේ මෙන්ම විවිධ සංස්ථා සහ පෞද්ගලික අංශයන්ට අනුබද්ධව මුළු මහත් සමාජයටම ඉමහත් සේවාවක් ඉටුකරනු ලබයි. තවත් පිරිසක් එවන් වූ පැහැදිලි ඉලක්කයක් ඔස්සේ විශ්ව විද්‍යාලයන්හි පළමු, දෙවන, තෙවන හා අවසන් වසරවල ඉගෙනුම ලබයි. මේ අතර උසස් පෙළ සාර්ථක ප්‍රතිඵල මත විදේශිය ශිෂ්‍යත්ව ලබා විදේශ අධ්‍යාපනය ලැබීමට භාග්‍ය සම්පන්න වු දරුවන් ද වෙයි. **අවිනිශ්චිත අනාගතයක් හදට තුරුළු කරගෙන එදා දුක් සුසුම් හෙළු මෙම දරුවන් ද හෙට දිනයේ ලොව බබලවනු නියතය.**

විටින් විට ඔවුන්ගේ අදහස් තුල උත්පාදනය වූ අව්‍යාජ සංකල්පනාවන් මාහැඟිය. ශිෂ්‍යත්ව ක්‍රියාදාමය අඛණ්ඩව ඉදිරියටම ගෙන යාමට එමගින් ලැබුණා වූ ශක්තිය හා ධෛර්යය ද අතිමහත්ය.

# සිසු සංකල්පනා

## දිනක්තෙම හෙට දිනේ

අයාලු අයාලු කියලු
ඒ පුරම් සන්දියේ
ඇලු සිහින සිත නොහොත
අදුර අස ලුකී නිදිසි.
දිලුනු වූ මෝහයේ
ඉලු දෙසිදු වූ නාසී
දුක්කහා පැලුම් මල්
පයට පාගා දමසි.
නා පෙළින් අසත් ලොව
දැකගන්න වරම් ලද
පියඹන්න කලු නොමැද
දහස් වූ අය අතර
අනේ මට නැති ලුහනම්
දැලුම් අස නාසී ඇත......
අඳුරිනේ ගෙන ගැලුන
ඉදුකරය ලුහන්න
මිලිනා වූ මා සිතට
පහන් ඇදැසුය ගෙනිකී.
පලාවක ඉදි රුව
මා ගසක පහන් කළ
බුදුරියේ සිරි පැලුලු
මගෙ සමින් පීදේ ම....
දැනයකින් පැදි පියලි
මා ගසෙන් ලැබුමද
මෝහයෙන් දිනන්නට
ඒ නුලින් වරම් ලැබිසි...
පුදිනා හෙට දිනේ
දහස් වූ කුසුමකට
අස, පුදිදු, දැලුම මම
කුසුමියක් වන්නෙමිය....



## තුති කුසුම්.....

වෛද්‍ය වරයෙකු වීමේ සිහිනයේ
යථාර්ථවාදීත්වය අත්දකින්නට
ආර්ථික අපහසුතාවයක් අන්ධකාරයේ
මං මුලාවී අසරණව සිටි මා හට;
ගුරු පුරවැසියන්ට පැතිරි
සඳක් සේ;
ජීවිතයේ වීමේ සිහිනය සැබෑ කරගැනීමට
මා රියගනා මාවතට
එය එමින්;

ඒ මාවතේ වූ අන්ධකාරය
හිරු උදාව පිරි නිදු සේ සුරු විසුරු කර;
මගේ ඉදිරි ගමන
එකතු කළ ඔබ ආශියට
ඉදින්නෙම් නාගේ
නන්නාදර පුරා මය
මුර් හදවතින්ම.....

එලෙසින්ම ඔබ වැනි
සොයන්දී හදවතක් ඇත්තියක්
මෙලොවට දායාද කළාවූ
ඔබගේ දයාබර මාපියන්ට
එකසේ සාපයන්නට
ඇමා ගෙන නිවතින්.......

[redacted]

- [illegible] විශ්ව විද්‍යාලීය වෛද්‍ය පීඨය -
- මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය -
2007 - 07 - 29

## පැසසිය යුතු කිසෙසෝම කුමරියෝ

• පහසී හරි හැටි ඉගෙන ගන්නට
නොතිබු මුත් නුමනැති මු සිසුනට
රටම රන් මෙන් මගින මිනුනට
සමය ගත කරු ගෙවන් හදනට

• හාමුනා දිවියට අප උරුම ලද
ඉගෙන ගනිමින් නාම හාමෙළ ඇද
ගමන් හරමින් මෙහෙන් ආමද
කොඩුරා මිය අප ඉගෙනුම ද අද

• ගොනා බලමින් මබිහිලනේ මෙන්
දිරිය හිඳම සනහමින් දුන්
කරහ මෙමහෙමර මහමෙරන් වන්
අහය හරහට ලැහ විඳුන්

• හැණහැති මෙන් ඇණ ඇති මු දුරුමන්
කිසි හරන්නට හැප වෙමින්
මුළිඳු අප යහ හිගෙට යමමින්
මෙමහෙස මිහා නිහ ලැබට විත්

• හාගරඹද මෙන් අනා ගමිබඳ
සිසුන් හට අත්වැලක් මී අද
සිරිහ මේ රට මෙන් එහෙරට ද
සඳා ජය ප්‍රාට හොයි අප සඳ

නම :- [redacted]
අංකය :- 629
පාසල :- කො/ගෝනම් බාලිකා විද්‍යාලය

## සිසු සංකල්පනා

සීතා ගුණතිලක මහත්මියනි, ඔබතුමියට,

### ඔබ

ඔබ සිත්තරයි .......
දයාබරයි , හරිම ලෙංගතුයි
නුඹ ධෛර්යයයි
උත්තුංගයේ පරම ලාභයයි
ඔබ තාරුණිකයි
අනුන් වෙනුවෙන් දිවි ගෙවයි
ඔබ දියුණුවයි
සැමවිටම ජය ලබනයි
ඔබ වෙහෙසවෙයි
අපේ දෙනුවන් හොඳ කරයි
ඔබ දැනුමතුළයි
සැම සිත් සනහාලයි
ඔබ හඬසරයි
අපට ආදර්ශමත්මයි
ඔබ ආදරණීයයි
ඔබ දී දිවි මං සදයි
ඔබ ඇඳුරුතුමියයි !......
අපේ දිවිමග එළිය කරනා මෙරදරණ.....

616

## සිසු සංකල්පනා


608
අසිරි මල් මිටක්


621
අතීතය
O/L
A/L
වර්තමානය
O/L
A/L
අනාගතය
University
A-3
O/L
A/L

## සිසු සංකල්පනා


657
SEETHA GUNATILAKA
SRI LANKA - CANADA
SCHOLARSHIP
FOUNDATION

අංකය :- 641
විශ්ව
විද්‍යාලය
ශ්‍රී ලංකා - කැනඩා
ශිෂ්‍යත්ව
පදනම.
සමාජ
ආර්ථික
දුෂ්කරතා



## සිසු සංකල්පනා

# 10

## සහන සේවා ව්‍යාප්ත වෙයි

මනුෂ්‍යයා අන් සතුන්ගෙන් වෙනස් වන්නේ උසස් වූ මනස නිසාමය. **"මනං උස්සතීති මනුස්සෝ."** එම මනසට විද්‍යාව හෙවත් දැනුම ගෝචර වෙයි. ලබා ගන්නා වූ දැනුම් සම්භාරයන් සහ ජීවිත අත්දැකීම්, ඥාන වර්ධනයට මහත් සේ ඉවහල් වේ. එම ඥානය එදිනෙදා ජීවිතයේ ප්‍රායෝගීකරණය කිරීමේදී ප්‍රඥාව වැඩේ. **"පඤ්ඤාය පරිසුජ්ඣති"** - ගුණවන්තයෙකු නොවී ප්‍රඥාවන්තයෙකු විය නොහැක. ගුණ නුවණින් සපිරි ප්‍රඥාවන්ත සත්පුරුෂයින්, ධර්මය වඩ වඩාත් තම ජීවිත වලට ලං කර ගනිමින් පාරමීදම් පුරයි. මසුරුකම දුරලමින් දන් දෙයි. මව් පියන්ට සලකයි. ගුරුවර වැඩිහිටියනට ගරු සැලකිළි දක්වයි. සත්‍ය කථා කරයි. ධර්මයටම යොමු වේ. නිරන්තරයෙන්ම කරුණාව, මෛත්‍රිය, මුදිතාව, කෘතෝපකාරය, පරෝපකාරය පෙරදැරි කරගෙන ගුණ ධර්මයන්ගෙන් පිබිදෙයි. ධර්මය තුල පෝෂණය ලබයි. බෞද්ධ නායකත්වය වටා එක්රොක්වන එවන් සත්පුරුෂයින්ගේ මාහැඟි කැපවීමත්, පරිත්‍යාගශීලී ජනතාවගේ නොමසුරු දායකත්වයත්, කාලීන අනුශාසකත්වයත් මත මහා වෘක්ෂයක අතු බෙදී යන්නා සේ අසරණ ජනතාව වෙනුවෙන් සිදු කරනු ලබන සේවාවන් ව්‍යාප්ත වන්නට වූයෙන්, ලක් දෙරණෙහි ගම් දනව් සිසාරා **අසරණ ජනතාව** හඹා ගියෙමු.

එදා දඹදිව්තලය එකාලෝක කල **අනාථ නාථ** වූ අප තිලෝගුරු සම්මා සම්බුදු පියාණන්ගේ ගුණස්කන්ධය, යශෝරාවය හා කීර්තිය, ජීවමානව එදා මෙන්ම අද ද මුළු මහත් සමාජයම බබලවයි. උන්වහන්සේගේ ශ්‍රී සද්ධර්මය තුල විද්‍යමාන වන්නේ **පුද්ගල සංවර්ධනයට** මෙන්ම **සමාජ සංවර්ධනයට** ඉවහල් වන්නා වූ සාරධර්මයන්ගෙන් පරිපෝෂිත දේශනාමය, පරෝපකාරය තුලින් ඒ සඳහා නිර්මාණය වන්නේ මාහැඟි භූමිකාවකි. ජාතක කථා තුලින් මෙන්ම බුද්ධ චරිතය තුලින් ලද හැකි ආදර්ශ අපමණය. එම ආදර්ශයන් හැකි පමණින් හෝ තම තමාගේ දෛනික ජීවිත වලට ආරෝපණය කර ගැනීම සඳහා උදාවන දුර්ලභ ගණයේ ඵලදායී අවස්ථාවන්ගෙන් උපරිම ඵල ලබන සත්පුරුෂයින්ගේ ලෞකික ජීවිත වල සාර්ථකත්වයට මූලික පදනම වන්නේ කුමක් ද? **අසරණ ජනතාවගේ අනුවේදනාත්මක ජීවිත වෘතාන්තයකට අනුරූපව හදවත් තුල**

**තෙරපෙමින් ගලා හැළෙන සෝ සුසුමක ගැබ්ව ඇති සංවේදනීයත්වයමය. එවන් ස්ථාවර වූ පදනමක් මත ගොඩ නැගෙන ජීවිත සාර්ථකත්වය තුලින් ලබන්නා වූ නිරාමිස ප්‍රීතිය, සදාකාලික සැපතක් සඳහා ඉන් ඔබ්බට ද විහිදී යනු ඇත.**

☸ ☸ ☸

## ▶ දිළිඳු පවුල් වලට ද්‍රව්‍යමය ආධාර

ව්‍යාප්ත වී ගෙන යන මෙම මහජන සේවාවේ එක් අදියරක් දියත් කරමින් **දිළිඳු පවුල් වලට ද්‍රව්‍යමය ආධාර බෙදා දීම** ද ආරම්භ කෙරිණි. එමගින් මෙම අසරණ සරණ සේවය දිවයිනේ අති දුෂ්කර ගම් නියම් ගම් බලා ව්‍යාප්ත වන්නට වූයේ ගම්වාසී සැමට මහත් වූ සහන සලසමිනි. පරිත්‍යාගශීලි හදවතක් සසල වීමෙන් ශ්‍රී ලංකාවේ සම්පත් අවම දුෂ්කර ප්‍රදේශයක දරු දැරියන් අතරේ බෙදා හැරීම සඳහා අළුත් ළමා ඇඳුම් පැළඳුම් සෑහෙන ප්‍රමාණයක් ලැබී තිබුණි.

එම පරිත්‍යාගය ද සාධාරණ ලෙසින් බෙදා හැරීම සඳහා අවතීර්ණ වන්නට වූ ක්‍රියා මාර්ගය ද සුළු පටු නොවිණි. අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල ආදී දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් අදාල දිස්ත්‍රික්කයන්හි ඇති දුෂ්කර ගම්මානයන් පිළිබඳ සත්‍ය තොරතුරු ලබාගැනීමෙන් අනතුරුව, අනුශාසක ස්වාමීන් වහන්සේගේ අධීක්ෂණයට යොමු කරවමින් දිළිඳු ගම්මානයක් මෙම පරිත්‍යාගය සඳහා තෝරා ගනු ලැබිණි. එය අනුරාධපුර දිස්ත්‍රික්කයේ, **ඇලයාපත්තුව අංක 288 ග්‍රාම සේවා වසමට අයිති, මහ ඇහැටුවැව තුලානේ - ඉහළ ඔයා මඩුව** නම් වූ අතර, කුඩා ඇහැටු වැව, පානක්කා වැව, කුඩා වැලි වැව, සහ ඇත් පැටියාව යන අති දුෂ්කර වූ කුඩා ගම්වලින් සැදුම්ලත් දිළිඳු ගම්මානයකි. පවුල් ඒකක **63** කි.

ලැබී තිබුණා වූ පරිත්‍යාගයන් මෙම ගම්මානයේ වෙසෙන ළමා පරපුර සඳහා ප්‍රමාණවත් වුවද, සිදු කරනු ලබන පරිත්‍යාගය දරුවන් සඳහා **පමණක්** සීමාවීම සාධාරණ නොවන බව හැඟී ගියෙන්, පරිත්‍යාගය වඩාත් විධිමත් කිරීමේ අවශ්‍යතාව පැන නැගුණි. ඒ සඳහා තවත් පරිත්‍යාගශීලී පිරිසකගේ නිරතුරු සහයෝගය ලැබෙන්නට විය. පවුලේ සැමට ඵලදායී ලෙසින් සහනාධාර පාර්සලය බැගින් බෙදා හැරීම සඳහා ඒ ඒ පවුල් ඒකකය තුල සිටින්නා වූ සාමාජික සංඛ්‍යාව කාන්තා හා පිරිමි වශයෙන් මෙන්ම වයස් ප්‍රමාණයන් අනුව ද සංඛ්‍යා ලේඛනගත කරගැනීම සඳහා ද ක්‍රියාත්මක වුනෙමි.

සහනාධාර බෙදා දීමට පෙර, මහ ඇහැටුවැව තුලානේ ගම් වැසියන්
තිසරණ සහිත පංචශීලයෙහි පිහිටවමින් .. ..

ලේඛනගත තොරතුරු වලට අනුව ගෘහ මූලිකයන් අතට
සහනාධාර පුඟද්ජයන් බෙදා දෙමින් .. ..

සහනාධාර පුඟද්ජයන් හදපිරි සතුටින් දෝතට ගන්නා ගම් වැසියෝ .. ..

ඇඳුම්, පැළඳුම්, හාල්, පොල් ආදියෙන් සමන්විත වියළි ආහාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් සහ අභ්‍යාස පොත් සමගින් අධ්‍යයන උපකරණ කට්ටල ද ප්‍රවාහනය කරමින් අනුරාධපුරයට සේන්දු වුවද, **ඉහළ ඔයා මඩුව** දිළිඳු ගම්මානය වෙත ළඟා වූයේ අදාල ග්‍රාම සේවක මහතාගේ මග පෙන්වීමෙනි. මෙම පරිත්‍යාගය වෙනුවෙන් ද්‍රව්‍යමය ආධාර සැපයූ පරිත්‍යාගශීලී භවතුන් මෙන්ම ශ්‍රමය, කාලය හා භෞතික සම්පත් කැප කරමින් සහයෝගය දුන් හිතෛෂී පරිත්‍යාගශීලීන්ගේ වෙහෙස නිවාලීමට සමත් වූයේ, අපේක්ෂාවන් පොදි බැදගෙන දෙනෙත් අයා ගෙන මග බලා සිටි අසරණ ගම්වැසියන්ගේ දෙනෙත් වලින් රූරා හැලෙන්නට වූ කඳුළු බිඳු වල ගැබ්වතිබූ සංවේදීතාවයි. දින ගණන් සති ගණන් කුසට නිසි අහරක් නොලබා කුසගින්නෙන්, සම්පත් හංගත්වයෙන්, ගහ කොල පවා වියළී ගිය අති දුෂ්කර පරිසරයක, හෙට දිනයක් ගැන සුන් වූ බලාපොරොත්තු ඇතිව දිවිගෙවන මෙම අසරණ ජනතාවට **එදින දෙව්ලොවක් මැවුණා සේ** විය. ගෞරවණීය අනුශාසක ස්වාමීන් වහන්සේ විසින් පිරිස පංචශීලයෙහි පිහිටවමින් ඔවුන්ගේ හදවත්තුළට සදහම් සිසිල එක් කිරීමෙන් අනතුරුව, එක් එක් පවුල් ඒකකය සඳහා වෙන් වෙන්ව ඇසුරුම් ගත කර තිබූ ද්‍රව්‍යමය ආධාර ඉතා ක්‍රමානුකූලව බෙදා දෙන ලදී. කිසිම දිනක ස්වාමීන් වහන්සේ නමක් වැඩම කර නොතිබූ එම ගම්මානයේ අසරණ ජනතාව, මෙලෙසින් ස්වාමීන් වහන්සේ නමක් දැකීමටත්, බණ පදයක් ඇසීමටත් පෙර පින් තිබූ බව පවසන්නට වූයේ දෙනෙතින් ගලා හැලෙන්නට වූ කඳුළුකැට දෑතින් පිසදමමිනි. අසරණබවේ පත්ලටම කිඳා බැස සිටි ඔවුන්, තමා වෙත ලැබුණා වූ ද්‍රව්‍යමය පරිත්‍යාගයන් නිධානයක් ලැබුණාසේ ඇකයෙහි හොවා ගෙන, ආයාසයෙන් නෙත ගත යොමු කරමින් අප ආපසු පිටත්ව එන ආකාරය දෙස බලමින් හෙළනු ලැබූ සෝ සුසුම්, එම වියළි වායුගෝලයටම එක්වුවද, පරිත්‍යාග ශීලි හදවත් තුල මොහොතක් මොහොතක් පාසා දෝංකාර දෙනු ඇත. එවන් හඬකින් හදවතක් තුල සැනසුම් සුවයක් උත්පාදනය වන්නේ නම්, ඒ හදවත සදහම් රසයෙන් කුල්මත්ව නිවී සැනසී යයි.

☸ ☸ ☸

## ▶ දුෂ්කර පාසල් වලට පුස්තකාල පොත්

සත්පුරුෂ පරිත්‍යාගශීලීන්ගේ චිත්තනය වඩාත් ඵලදායී ලෙස කාලීන අවශ්‍යතා කෙරෙහි යොමු කරවීමේ ප්‍රතිඵලයක් ලෙසින් දිවයිනේ පුස්තකාල නොමැති දුෂ්කර පාසල් තුනකට **පුස්තකාල පොත් ලබාදීම** සඳහා රුපියල් 30,000/= ක පරිත්‍යාග මුදලක් ලැබී තිබුණෙන්, ඒ සඳහා ද අතුරු **ව්‍යාපෘතියක් අනතුරුව දියත් කළෙමු.**

සාධාරණ හා ඵලදායී අයුරින් මෙම අදියර සාර්ථක කරගැනීම සඳහා අනුගමනය කරනු ලැබූ ක්‍රියාදාමය ඉතා සංකීර්ණය, පුවත් පත් සහ විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය මගින්, පුස්තකාල නොමැති දුෂ්කර පාසල්වලින්

මේ සඳහා විවෘතව ඉල්ලුම්පත් කැඳවිණි, මාධ්‍ය ක්ෂේත්‍රය ද සීඝ්‍රයෙන් වාණිජකරණයට හසුවීගෙන යන වත්මන් සමාජය තුල යහපත් අරමුණකින් කෙරෙන මෙවැනි සත් ක්‍රියාවන් පිළිබඳව **මහජනතාව පොදුවේ දැනුවත් කිරීමට** ලැබුණා වූ ඉඩ කඩ ඉතා අල්පය. දැන්වීම් ලිපි සකස් කර විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්ට යොමු කල ද යහපත් වූ ප්‍රතිචාරයක් ලබා ගැනීමේ සම්භාවිතාව අවම විය. ඉඳ හිට හෝ එවැනි දැන්වීම් කෙරෙහි වගකිවයුත්තන්ගේ අවධානය යොමු වීම ශ්‍රී ලාංකික අසරණ සිසු දරුවන්ගේ භාග්‍යයකි. ඇතැම් අවස්ථාවල දී මෙවැනි දැන්වීම් පළ වූවද, එහි අන්තර්ගතය අපැහැදිලි වීමෙන් මහා ජනතාව අපහසුතාවයට පත් වූ අවස්ථා බොහෝය. **කෙසේ වූවද මෙවැනි සත්ක්‍රියාවකට වචනයකින් හෝ උදාර දායකත්වයක් සපයන මාධ්‍ය ක්ෂේත්‍රයන්, සමස්ථ සමාජයේම ගෞරවයට පාත්‍ර වනුයේ නිතැතිනි.**

අවංක සේවයක යෙදෙන තැපැල් සේවකයකු පවා තම රාජකාරිය හරිහැටි අවබෝධ කරගනිමින්, මෙවැනි සමාජ සත්කාර සඳහා යැවෙන ලිපි පිළිබඳව සැලකිලිමත්ව, **අවංකව මෙන්ම අප්‍රමාදීව තම කාර්යයන් නිසි ලෙස ඉටුකරන්නේ නම්, එය ද මෙවැනි සත් ක්‍රියාවනට සුළු වශයෙන් හෝ වක්‍රාකාරව සපයනු ලබන මාහැඟි දායකත්වයකි.** කිසිම ආකාරයේ පෞද්ගලික ලාභ ප්‍රයෝජන නොතකා සිදුකරනු ලබන මෙවන් යහපත් වූ සේවයකට එපමණකින් හෝ දායකත්වයක් ලබා දීමට ද පෙර පින් තිබිය යුතුමය.

කෙසේ වුවද යහපත් කාර්යයන් පහසුවෙන් ඉටු කර ගත නොහැකි බවත්, සත්පුරුෂයින් සමාජයේ විරල බවත්, ලෝකය අන්ධ බවත් ධර්මානුකූලව අවබෝධ කරගතිමි. හරියාකාරව යමක් දකින්නේ ටික දෙනෙක් පමණි.

**අන්ධභූතො අයං ලොකො - තනුකෙත්ථ විපස්සති**
**සකුන්තො ජාලමුත්තොව - අප්පො සග්ගාය ගච්ඡති**

(ධම්මපදය - ලෝක වග්ග)

මේ ලෝකය අන්ධය. මෙහි ටික දෙනෙක් පමණක් පඤ්චස්කන්ධය අනිත්‍යාදී වශයෙන් නිවැරදිව දකී. දැලෙන් මිදුණ කුරුල්ලන් මෙන් ටික දෙනෙක් පමණක් ස්වර්ගයට යයි.

**The world is engrossed in darkness, only a few see things clearly. Like birds escaping from a net, only a few would go to a blissful state, after death.**

අසරණ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් දියත් කරනු ලබන මෙම සියලුම ව්‍යාපෘතීන් විධිමත් ලෙස සාක්ෂාත් කර ගැනීමට අප්‍රමාණ වෙහෙසක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙසින් විශ්ව ශක්තියේ බලය, උත්සාහය මත පතිත වන්නට විය. විදුහල්පතිවරුන්ගෙන් ලැබුණා වූ ඉල්ලුම්පත් සියල්ල අනුශාසක ස්වාමීන් වහන්සේගේ අධීක්ෂණයට යොමු කරවීමෙන් අනතුරුව, ප්‍රමාණවත් සුදුසුකම් ලබා තිබුණා වූ **බදුල්ල හාලි ඇල උඩුවර මහා විද්‍යාලයයත්, කෑගල්ල අරුගම්මන විද්‍යාලයයත්, හම්බන්තොට ගොඩවානාගොඩ විද්‍යාලයයත්** මෙම

පරිත්‍යාගයන් සඳහා තෝරා ගන්නා ලදී. වැඩි ඵලදායීතාවක් සිසු දරුවන් වෙත ලබා දීමේ අරමුණෙන් එම පාසල් වල පවත්නා විෂය ක්ෂේත්‍රයන් හා පාරිසරික අවශ්‍යතාවනට ගැලපෙන සේ රචිත ග්‍රන්ථ ලබාදීමට ද අදහස් කරනු ලැබුවේ ශ්‍රේෂ්ඨ ගත්කතුවරුන්ගේ වටිනා ග්‍රන්ථ හා ආදර්ශවත් චරිතකථාවලට අමතරවය. ග්‍රන්ථ නාමකරණය සඳහා විදුහල්පතිවරුන්ට ද අවස්ථාව ලබාදෙමින් ග්‍රන්ථ සියල්ල මිලදී ගැනීමේ අදියරට පිවිසියෙමි. පාරිභෝගිකයින්ට වැඩි වට්ටම් ලබාදෙන **පොත් අලෙවි සැල් හඹා යමින්** ලැබී තිබුණා වූ රුපියල් 30000/= ආයෝජනය කරමින් රුපියල් **36000**/= කට අධික වටිනාකමින් යුත් ග්‍රන්ථ මිලදී ගතිමි.

පොත් අලෙවි සැල්වලට අනුබද්ධව පාරිභෝගිකයින් සඳහා වෙන්වූ රථ ගාල් නොතිබිණි. මිලදී ගත් පොත් සංඛ්‍යාව ද අති විශාලය. අපගේ පෞද්ගලික වාහනය නවතා තබා තිබූ, කිලෝමීටර් කිහිපයක් ඈතින් වූ රථ ගාල වෙත, මිලදී ගත් පොත් ජංගම කුලී රථ මගින් ප්‍රවාහනය කරවා ගැනීම ද පාරිභෝගිකයා සතු කාර්යයක්ම විය. අවංක සමාජ සේවයක නිරත වීම පහසු කාර්යයක් නොවන බව අත්දුටු අවස්ථා බොහෝ ය. එහෙත් **සකල ලෝක වාසීන්ගේ** යහපත වෙනුවෙන් අප මහා බෝසතාණෝ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරා විඳි අපමණ දුක් සිහිපත් වනවාත් සමඟින් මා සිතට ඇති වූයේ ධෛර්යයක් විනා පසුබෑමක් නොවේ. බාධා කරදර වෙහෙස මතින් උද්යෝගීමත් වීමි.

දින කිහිපයකට පසු ඒ ඒ පාසලට අදාල ග්‍රන්ථ වෙන් වශයෙන් ඇසුරුම්ගත කරගතිමි. අනතුරුව අසරණ දුගී දුප්පත් පාසැල් දරුවන්ගේ ගුණ නැණ වඩවාලීමේ අරමුණෙන් සිදු කෙරෙන මෙම පුස්තකාල පොත් පරිත්‍යාගයන් සඳහා පිටත් වූයේ එවකට අප සතුව තිබූ ටොයොටා ස්ටාලට් වර්ගයේ කුඩා මෝටර් රථයෙනි. **බඳුල්ල, හාලි ඇල උඩුවර මහා විද්‍යාලය වෙත**, ඉතා උස් වූ කඳුකරයේ ධාවනය වීමේදී, අධි තාපජනනය නිසා පැන නැගුණා වූ සම්බාධක අපමණය. එහෙත් ඒ සියල්ලට ධෛර්යමත්ව, අවස්ථානුරූපව, ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව මුහුණ දෙමින්, එම උත්තරීතර පුස්තකාල පොත් පරිත්‍යාගය සාර්ථක ලෙස නිමා කර ගතිමු. බාධක කම්කටොළු මැදින් ලබන්නා වූ සාර්ථකත්වය සුවිශාල ජයග්‍රහණයක් වන අතර එතුළින් ලැබෙනුයේ මාහැඟි පන්නරයකි. එය ධර්මය තුළින්ම උත්පාදනය වන හෙයින් සිහිපත් වන සෑම වාරයකදීම හදවතට දැනෙනුයේ අමා සිසිලකි.

බදුල්ල, හාලි ඇල උඩුවර මහා විද්‍යාලයීය පුස්තකාලයට ග්‍රන්ථ ප්‍රදානය කළ දා

කෑගල්ල, අරුග්ගම්මන මහා විද්‍යාලයීය පුස්තකාලයට ග්‍රන්ථ ප්‍රදානය කළ දා ...
ආචාර්ය මණ්ඩලය සමග




හම්බන්තොට ගොඩවානාගොඩ විද්‍යාලයීය පුස්තකාලයට ග්‍රන්ථ ප්‍රදානය කළ දා

# Sri Lanka-Canada Scholarship Foundation donates library books

The Sri Lanka-Canada Scholarship Foundation which is steered and patronized by Venerable Mirisse Dhammika Thera of Surrey Buddhist Vihara in British Colombia, Canada, has launched another project to supply books, food items and clothes to needy villages and rural schools in difficult areas, apart from its usual annual awards of scholarships given to the selected students who have had higher academic performance at the G.C.E. (O/L) examination but from economically disadvantaged families.

Taking its 2nd step into action in the year 2000, it has selected the Godawanagoda Vidyalaya in Tangalle education region in Hambantota District for this donation of books. The necessary library books worth more than Rs. 12,000 were donated at the school premises last week.

The Sri Lanka Co-ordinator Mrs. K. S. N. Goonetilleke hands over a bundle of new books to the head prefect of the school, while the principal Mr. A. H. B. K. Jayantha is standing behind. Mr. Dinesh (right) the English assistant of the staff also in the picture.

The Island 08/02/2001

සිදු කරනු ලැබූ ග්‍රන්ථ පරිත්‍යාගයන් මහත් සේ අගයමින්, එම පාසැල් වල විදුහල්පතිවරුන්, පාසලේ පවත්නා විවිධ ක්ෂේත්‍රයන්ට අදාල සම්පත් ඌනතාවන් හෙළි දක්වන්නට වූයේ හුදෙක් ඔවුන්ගේ පෞද්ගලික සුබ විහරණය සඳහා නොවේ. කර්මානුරූපව දරිද්‍රතාවේ පතුලටම ගිලාබැස, අරුණාලෝකය දැකීමට නෙත් අයාගෙන සිටින කුසලතා පරිපූර්ණ බුද්ධිමත් දරුවන්ගේ නාමයෙනි. ඉතා පැහැදිලි හා සත්‍ය වූ දත්ත ඉදිරිපත් කරමින්, කරනු ලැබූ එම ඉල්ලීම්වලට අනුව එක් පාසලක සිසුන් තිදෙනෙකු සඳහා රුපියල් 1000/= බැගින් ස්ථාවර තැන්පතු ඇරඹීමත්, තවත් පාසලක සිසුන් සඳහා පරිගණකයක් පරිත්‍යාග කිරීමත්, අනුරාධපුරයේ වෙනත් දුෂ්කර පාසලක් වූ පිහිඹියගොල්ලෑව විදුහලට අභ්‍යාස පොත් සහ පෑන් පැන්සල් ආදිය යැවීමත් සුදුසු බව අවබෝධ විණි. එහෙත් එම අමතර අරමුණු සඳහා ප්‍රතිපාදන නොතිබුණි. **එවන් මොහොතක ඉතාමත් නිහතමානීව මූල්‍යමය දායකත්වය ලබා දෙමින් අනුශාසක ස්වාමීන්වහන්සේ අප වෙත ලබා දුන් ආදර්ශය මාහැඟිය. අති ශ්‍රේෂ්ඨය. නැති බැරිකම් කියා පාන කවරෙකුට හෝ ඇති හැකි අයුරින් පිහිට වනු විනා අපහසුතාවයන් හුවා දක්වමින් නිහඬ වීම ලැබුවා වූ උත්තරීතර මනුෂ්‍යත්වයට නිගාවක් බව** තරයේම සිත්හි ධාරණය කරගත් මා එම අමතර පරිත්‍යාගයන් ද ඒ ඒ පාසැල් වලට ලබා දීමට අප්‍රමාදව කටයුතු කළෙමි. අප විසින් දක්වනු ලැබූ එම යහපත් ප්‍රතිචාරයන් ද විදුහල්පතිවරුන් විසින් අගය කරනු ලැබුවේ පුණ්‍යානුමෝදනා පෙරදැරිවමය.

## විදුහල්පතිවරුන් පරිත්‍යාගයන් අගයමින්



◀ මූල්‍යමය විශේෂ පරිත්‍යාග

විදුහල්පති,
බ/උඩුවර ම.වි.
හාලිඇල.
2001-11-23

කළමනාකාරිණී නිලධාරි මහත්මිය,
හැබිටාට් - ශ්‍රී ලංකා නිවාස පදනම,
394/2, පෙරේරා මාවත,
කොට්ටේ පාර,
රාජගිරිය.

මහත්මියනි,

විදුහලට පරිගණක යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම.

ඔබගේ සහාය් බ/උඩුවර මහා විද්‍යාලයට ඔබ ආයතනය මගින් පරිත්‍යාග ලද පරිගණක යන්ත්‍රය ඉතා සතුටින් හා කෘතඥපූර්වක පිළිගත් බව සඳහන් කරමි. මේ සම්බන්ධයෙන් පරිගණක යන්ත්‍රය ලබා දීමට කටයුතු කළ ආර්. ප්‍රේම [illegible] [illegible] මහත්මියට ගෞරව පූර්වක ස්තූතිය පුද කරමි. පරිගණක යන්ත්‍රය මෙම විද්‍යාලයට භාර දීම සඳහා මහත් වෙහෙසක් ගත් ඉතා [illegible] ක්‍රියා කරමින් [illegible] [illegible] ද ඇතුළු [illegible] විද්‍යාලයේ ස්තූතිය පිරිනමමි. හැබිටාට් ශ්‍රී ලංකා නිවාස පදනම් ආයතනය දිගින් දිගටම [illegible] වේවා යි පතමි.

මෙයට,
විශ්වාසී,
[signature]
බී. එච්. එම්. බී. ගුණසේකර,
විදුහල්පති,
බ/ උඩුවර මහ විදුහල
හාලිඇල.

◀ පරිගණක යන්ත්‍ර පරිත්‍යාගය

ලිපි ද්‍රව්‍ය පරිත්‍යාගය ▶

ආර්. එස්. පද්මසිරි
විදුහල්පති
ශ්‍රී [illegible]
[illegible]
200?-06-15

ශ්‍රී [illegible] සභාපතිතුමා
[illegible]
ශ්‍රී ලංකා [illegible] නිවාස පදනම
රාජගිරිය

[illegible] පොත් හා පුටු පරිත්‍යාග කිරීම

[illegible]

මෙයට
[signature]
[illegible]

2003 05 16

38

ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමේ පස් වසරක සේවාව

## ▶ විශේෂ පරිත්‍යාග .. .. මුදල් ඇණවුම්

ජීවිතය තුල ලද මාහැඟි ආදර්ශයන් දෛනිකවම ප්‍රායෝගී කරණය කිරීම සඳහා, අනතුරුව උදා වූ අවස්ථා බොහෝ ය. දිවයින පුරා ප්‍රචලිත අන්තර්ජාතික කීර්තිමත් ශිෂ්‍යත්ව පදනමක සම්බන්ධීකරණ කාර්යාලය අපගේ පෞද්ගලික නිවසෙහිම වූයෙන්, පිහිට පතා පැමිණෙන අසරණ ජනතාව මෙන්ම, ශිෂ්‍යත්ව ක්‍රියාදාමයෙන් පරිබාහිරව ගලා එන්නට වූ ලිපි සංඛ්‍යාව ද ක්‍රමයෙන් ඉහල නගින්නට විය. ඒ ලාංකික අසරණ ජනතාව, පවත්නා ආර්ථික හා ජීවන ගැටළු සාධාරණීකරණය කරමින් අපේක්ෂා කරන්නට වූයේ මූල්‍යමය ආධාරයන්මය. **එහෙත් එවන් පරිත්‍යාග සඳහා ප්‍රතිපාදන කිසිවක් ශිෂ්‍යත්ව පදනම සතු නොවිණි.** මේ අදියර වන විට පිහිට පතා තමා කරා පැමිණෙන්නෙකු අපේක්ෂාභංගත්වයෙන් ආපසු නොයැවීමට තරම් වූ උදාර ආදර්ශයන් මා ලබා තිබුණෙන්, දාන පාරමිතාව මනා ලෙස පිරීමට උදා වූ සියලුම අවස්ථා යොදා ගනිමින් යහපත් වූ ඵල නෙලා ගතිමි. ඒ සෑම අවස්ථාවකදීම උපන්නා වූ කුසල් සිත්හි උතුරා හැලෙන්නට වූ **පුණ්‍ය කදම්භයන්**, මනුෂ්‍යත්වයක් ලැබීමේ වරප්‍රසාදය මා වෙත උරුම කර දෙමින් ජීවන ගමනේ මෙවන් ස්ථාවරයකට ළඟාවීමට උදාර දායකත්වයක් සැපයූ **මාගේ දෙමාපියන්ගේත්**, නැණ නුවන පැදූ **ආදරණීය ගුරු මව් - පියන්ගේත්**, නිරතුරුවම යා යුතු සදහම් මග ආදර්ශයෙන්ම පෙන්වා දෙන **කල්‍යාණ මිත්‍ර සංඝ පීතෘන් වහන්සේලාගේත්**, නාමයෙන්ම පතිත වන්නට විය. එතුලින් මා ලද නිරාමිස ප්‍රීතිය ඉන් ඔබ්බට විහිදී යන්නට වූයේ නිතැතිනි.

ශිෂ්‍යත්වයක් ලබා ගැනීමේ අරමුණෙන්, දරිද්‍රතාවෙන් පෙළෙන අඩු ආදායම් ලාභී පවුල්වල ඇතැම් සිසු දරුවන් ඉල්ලුම්පත් යොමු කළ ද, පරිගණකය විසින් කරනු ලබන තේරීම්වලදී, දත්තයනට අනුරූපව ප්‍රතික්ෂේප

වන අවස්ථා නැත්තේ නොවේ. එසේ වනුයේ සංඛ්‍යාත්මක අගයන්ට අනුව විනා, **සැබෑ දුක් කඳුලක ඇති සංවේදීතාවයට සාපේක්ෂව** පරිගණකය තීන්දු නොදෙන බැවිනි. එබැවින් සානුකම්පිතව ඔවුන් දෙස අවධානය යොමු කරවීමට සිදු වූ අවස්ථා ද බොහෝ විය. සම්පත් අවම දුෂ්කර පෙදෙස්හි ජීවත්වන මෙම අසරණ සිසු දරුවන් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම සඳහා ද දරනුයේ අප්‍රමාණ වෙහෙසකි. ත්‍රිකුණාමලය, මොණරාගල, අනුරාධපුරය, රත්නපුරය, සූරියවැව, සෝමපුර, කුරුවිට ආදී පෙදෙස්හි ඇතැම් සිසු දරුවන් **ලියා පදිංචි තැපෑලෙන්** ඉල්ලුම්පත්‍රය යොමු කිරීම සඳහා රාත්‍රී කෑමට පාන් ගෙඩියක් මිලයට ගැනීමට තිබූ මුදල් වැය කල අවස්ථා ද අපමණය. එවන් දරුවන්ගේ අපේක්ෂකත්වය කරුණාව, දයාව, මෛත්‍රිය පිරි හදවතකින් කෙසේ ඉවතලන්න ද? මාගේ ශක්ති ප්‍රමාණයෙන් එවන් සිසු දරුවන් වෙනුවෙන් රුපියල් **1000/=, 500/=** බැගින් වූ මුදල් ඇණවුම් තැපැල් මගින් යවමින් මා ලැබුවා වූ නිරාමිස සතුට අති මහත්ය. **මෙවන් සතුටක් ලැබීමට විශාල පොහොසතෙකු විය යුතු නැති බව මට ක්‍රියාවෙන්ම අවබෝධ වන්නට විය. අවශ්‍ය වන්නේ ප්‍රගුණ කරවනු ලැබූ අධ්‍යාත්මික ශක්තියක් සහ සාධාරණව උපයා ගනිමින් ගොඩ නගා ගත් මධ්‍යස්ථ ආර්ථික ස්ථාවරයක් පමණි.**

## විශේෂ පරිත්‍යාගයන් ප්‍රශංසාත්මකව ඇගයේ



සිසු දරුවන් සඳහා වූ මූල්‍යමය පරිත්‍යාගය අගය කරන ස්වාමීන් වහන්සේ නමකගෙන් .. ..


[redacted]
කුරුණෑගල
9/7/2006

ගරු මහත්මයාණෙනි,

වෛද්‍ය සිසුවියක් ලද මූල්‍යමය පරිත්‍යාග අගයමින්


[redacted]
2004.02.19

පොදු ජනතාව මූල්‍යමය පරිත්‍යාග අගයමින් .. ..

ශාස්ත්‍රපති අ. ශ. දොම්බගහවෙල,
දු. මං. මාමල්ගමුව,
2008 ..01...28.......

ගෞරවයෙනි, [illegible] ශ්‍රී ලංකා
ගෞරවණීය අධිකාරී [illegible] ශ්‍රී ලංකා. මැතිතුමිය වෙතය,

ගරු මැතිතුමියණි,

මෙම ලිපිය මා ලියනුයේ මෙයට පෙර මා මුණ ගැසුන වැදගත් ශ්‍රේෂ්ඨ සංඝ පියවරයාණන් වහන්සේලාගේත් සත් ගුණ ගරුක මහත්මි මහත්මීන්ගේ සිප පලනයේම සාරුණික මාර්ග උපදේශකත්වය මතය. මා පිළිබඳව කරුණු අවබෝධ කර ගත් ඒ පින්වතුන් මට කියා සිටියේ ගරු මැතිතුමිය ද හමුවට යන මෙන්ය. එසේම ගරු මැතිතුමියගේ උසස් ගුණ ධර්මයන් මෙන්ම, ශ්‍රේෂ්ඨ කාරුණිකත්වය පිළිබඳවද මට පැහැදිලි කර දෙන ලදී. ඒ උතුම් ගුණෝපාංගයන් කෙරෙහි මා තුළ ඇති කර ගත් ගෞරවනීය භක්තිය මත යම් පිළිසරණක් පතා ගරු මැතිතුමියන් වෙත මෙය යොමු කිරීමට මට සිත් විය.

ගෞරවනීය මැතිතුමියණි මා ද කලක් උපාධිධාරී ඉංග්‍රීසි ගුරුවරයෙකු වශයෙන් සේවය කොට වරින් වර ඇති වූ ආබාධිත අසනීපයන් අවසානයේ යටි බඩේ හටගත් සම්භාර පිළිකා රෝගයෙන් කරන ලද සැත්කමින් පසු මගේ සේවය අකාලයේ අත් හිටු වීමට සිදු විය. මා විවාහ වී සිටියේ ද උපාධිධාරී විද්‍යා ගුරුවරියක් සමඟය. එය මගේ කරුණ දිවියත් ඉක්ම වුවාටත් පසුවය. පසු කලෙක දී ඇය විශාල මුදලක්ද පැහැර ගෙන මාත්, දරු දෙදෙනාත් හැරදා පළා ගියාය. දනට මෙම දරු දෙදෙනා ස්වර්ණමාලී මධ්‍ය මහා විද්‍යාලයේ දහසත් අවුරුදු මට්ටමේ පිත්සතර හදාරන්නෝය. මා අවසන් වරට සේවය කළ පාසල ද එය වේ. පින්වත් උතුමියණි, අද මා ජීවිතයේ ඉතාමත් අසරණ තත්වයට පත් වී සිටින්නෙමි. නොපෙනෙනා අනාගතයක් තුළ දෙවිය විසින් අප අතරමං කර ඇත.

මා ගරු උතුමියණි, මසක් පාසා ප්‍රතිකාර ගැනීම සඳහා මහරගම පිළිකා රෝහලටත්, ස්ලාස් හලුස් ශල්‍යාගාරයටත් යා යුතු අතර, විදුලිය එන්නතකින් පසු ශරීරය සම්පූර්ණයෙන්ම ඉදිමෙන්නේය. දිනකට එක වේලක් බත් හැදි දෙක තුනක් පමණක් ආහාර වශයෙන් ලබා ගනිමි. මේ හැර සත්වත්, තන්පැට් සහිත විශේෂ පිටි මිශ්‍ර ආහාරයන්ගෙන් සින්න සංසිද්ධවා ගන්නෙමි. මා ලබන විශ්‍රාමික වැටුප ඖෂධ ප්‍රතිකාරයන් සඳහා හෝ ප්‍රමාණවත් නො වන්නේය. මෙසේ බර මැතිතුමියගේ සත් ගුණ ගරුක සානුකම්පිත අවධානය අබල දුබල, අසරණ ගුරුවරයෙකු වශයෙන් මා කෙරෙහි යොමු කොට මට සත්වත් ආහාරයක් ලබා ගැනීමට යම් පිළිසරණක් ලබා දෙන ලෙස ගරු මැතිතුමියගේ දෙපා පිංණිස කොට ගෞරව පූර්වකත්වයෙන් හා මැනැලත්වයෙන් යුතුව අයැද සිටිමි. මේ දානමය පින් ගරු මැතිතුමියට සංසාර භවයක් පාසා අත්වේවා. එසේම මෙවන් ශ්‍රේෂ්ඨ පුත් රුවනක් සාසනික ලොවට බිහිකළ ඒ ගරු මෑණියන් වහන්සේටත්, උදාර පිය තුමන්ටත් මේ උතුම්කර පින්, පින්බර දරුවනුගේ නාමයෙන් එම දෙපලටත්, දෙලොවටම සිත සුව පිහිසම අත්වේවා. එසේම මෙම වාසනා ඉදිව තුමියට ආධිපත්‍ය දරණ සියළු දෙවි දේවතාවුන් වහන්සේලාටත් මෙම දානමය පිං අනුමෝදන් වේවා.

එසේම මෙවන් අසරණ සරණ පිං දම් මතුවටත් කර ගැනීමට දළදා සමිඳුන්ගේ ආශිර්වාදයෙන් ද ආයුරාරෝග්‍ය සම්පත්තියෙන් ද සපිරිව සව බොහෝ කාලයක් මෙම උතුම් බිස්ථ සමාජයේ නිරෝගි සුව විඳීමට මහගාමිර ශෝභ වාසනා ගරු මැතිතුමියන්ට අත්පත් වේවා යි නිරතුරුවම ප්‍රාර්ථනා කරමි. මෙම පිංබර උතුම් සිතුවිල්ලෙන් කරනු ලබන පැමිණත් කාරියාණිවිදීම මා ගරු මැතිතුමියන්ට ධර්මයේ සත්‍ය ගුණබලයෙන් ජයශ්‍රී අත්වේවායි මා ගරු උතුමියන්ගේ දෙපා පිංණිසා කොට ගෞරව පූර්වකත්වයෙන් හා මැසි සිහින් යුතුව ප්‍රාර්ථනා කරමි. එසේම අභිගරු මැතිතුමිය විසින් මේ කරන ලද දානමය කුසල් සම්භාරයේ අනන්ත වූ පිං අභිගරු මැතිතුමියන්ගේ මිය පරලොව ගියා වූ සියළු දොඕත්වත් අනුමෝදන් වේවා. එසේම අභිගරු මැතිතුමියගේ මෙම උතුම් දානමය පිළිසරණ ධර්මයේ සත්‍ය පංමින් ඔබ තුමියගේ ජීවිතය පුරා භවය පුරා පසුපස හබා එන ධර්මයේ පවිත්‍ර කුසාලු කුසල් සම්භාරයන් වන්නේමය. ඒ අනුරිණම මේ උතුම් පරිත්‍යාගශීලී පිළිසරණ දානමය පිං ගරු මැතිතුමියන්ටත් දුදරු සෑම සියළු දෙනාටමත් අත්පත් වේවා.

මෙයට, සත්‍යගුණවත්

අ. දොම්බගහවෙල බී. ඒ. ගෞරව (ලංකා:

**පරිත්‍යාගයක් සඳහා ඉවහල් වූ විශේෂිත ලිපියක්**

බුදු දහමේ පෙන්වා දෙන සතර සංග්‍රහ වස්තු අතර පළමු වැන්න දානයයි. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යා හා සමානාත්මතා යන ගුණාංග ජීවිතය තුල පුරුදු පුහුණු කරවමින් ජීවන යාත්‍රාව නිසි ලෙස පදවන්නෝ සංසාර ගමනේ ගමනාන්තය කරා සුවසේ ළඟා වෙති.

**ඉහත ලිපියට අදාල, මා අත් දුටු සත්‍ය සිදුවීම මෙසේය.**

එදින ශනි දිනයකි. දෛනිකව අධි කාර්ය භාරයක යෙදෙන මා එම මොහොතේ මාගේ දැනුම, සිසු දරු දැරියන් පිරිසක් සමඟ බෙදා හදා ගනිමින් සිටියෙමි. මීටර් 25 ක් පමණ ඈතින් වූ ගේට්ටුව අසල සුදු පැහැති ආර්ය සිංහල ඇඳුමෙන් සැරසී සිටි නාඳුණන මැදිවියේ පැහැපත් පුද්ගලයෙක් විය. මොහොතකින් නිවසේ විදුලි සීනුව ද නාද විය. එහෙත් සිසු දරුවන් සමඟ යෙදී සිටි කාර්ය භාරයේ තීව්‍ර මොහොතකි. යෙදී සිටි කාර්යය නවතා ක්ෂණයකින් ගේට්ටු අසලට යාමට හැකි පසුබිමක මා නොසිටියෙන්, මා ඔහුගේ අවශ්‍යතාව සොයා බැලීම සඳහා මාගේ ස්වාමිපුරුෂයාණන් කාරුණිකව යොමු කළෙමි.

ගේට්ටුව අසලට ගොස් කරුණු විමසූ ඔහු මා වෙත සැලකර සිටියේ, කිසියම් ලිපියක් මා වෙත භාරදීම ඔහුගේ අපේක්ෂාව බවයි. ඔහුට ඇතුළු වීමට අවසර ලැබීමෙන් පසු මා දෙසට පැමිණෙන්නට විය. මොහොතක් වාඩි වී සිටින ලෙස ප්‍රකාශ කල මා, අසල වූ අසුනක් පෙන්නුම් කළෙමි. මාගේ ආරාධනයෙන් සතුටට පත් ඔහු හිස නමා ආචාර කොට එහි අසුන් ගත්හ. නැවුම් ප්‍රසන්න භාවයක් විනා විඩාපත් ගතියක් ඔහු තුල නොවීය. මා තවත් විනාඩි කීපයක් මාගේ කාර්ය භාරයේම යෙදී සිටියෙමි.

ඔහු දෙසින් සියුම් කෙඳිරිලි හඬක් මට ඇසුණි. කායික වශයෙන් මධ්‍යස්ථ පෞරුෂයක් හා සුදු ඇඳුමෙන් ඉතා පිරිසිදු බවක් පෙනුණෙන් මොහු රෝගී අයෙකු යැයි මා මොහොතකටවත් නොසිතුවෙමි. කෙසේ වුවද මා නිරතව සිටි කාර්යය මොහොතකට නවතා ඔහුට සමීප වුනෙමි. එක් අතක ලිපි ගොනුවකි. අනිත් අත ආයාසයෙන් මෙන් උදර ප්‍රදේශයට ආධාරකයක් කරගනිමින් යටහත් පහත්ව නැගී සිට ලිපියක් මා වෙතට දිගු කරන්නට විය. **අවස්ථාවේ හැටියට කරදරයක් වූයේ නම් සමාව අයැදිමින්** අතෙහි වූ ලිපි ගොනුව ද විවෘත කර මා දෙසට යොමු කළේය. එහි වුයේ පවුලක සමූහ ඡායාරූපයකි. එහි තිබූ විස්තර කෙරෙහි මාගේ ගැඹුරු අවධානය යොමු නොවුන ද, ඔහුගේ අවශ්‍යතාව **මුදල්** බව මා වහා අවබෝධ කරගතිමි. ලිපි ගොනුව ආපසු දී, ලිපිය රැගෙන නිවස තුලට ගිය මා ලිපිය පසෙකින් තබා මාගේ මුදල් පසුම්බිය විවෘත කළෙමි. ඒ අවස්ථාවේ දී එහි වූයේ රුපියල් පන්සියයේ නෝට්ටුවක් පමණි. එය ගෙනවිත් මා ඉතා සතුටින් ඔහු අත තැබුවෙමි. ලිපිය කියවීමට එම අවස්ථාවේ වැය කිරීමට කාලයක් ද මා සතු නොවුණි. මුදල් නෝට්ටුව දුටු පමණින් ඔහුගේ මුහුණේ ස්වභාවය වඩාත් ප්‍රසන්න විය. **ධර්මයටම නතු වූ, උගත්, විශාරද, වාග් ශෛලියකින්** පින් අනුමෝදන් කරවන්නට විය. ඒ සඳහා වැඩි කාලයක් නොගත් ඔහු ආපසු හැරුණි. මම ද මාගේ කාර්ය භාරය සඳහා නිරත වීමට අදහස් කළෙමි. එහෙත් නැවතත් පින් අනුමෝදන් කරවන හඬ මට ඇසුණි. ඔහු පිටව ගොස් නැත. අත තිබූ ලිපි ගොනුව තාප්පය මත තිබුණි. නිවස ඉදිරිපස සිට නිවසට ආධිපත්‍ය දරණ සියලු දෙවි දේවතාවුන්ට පින් අනුමෝදන් කල ඔහු ලිපි ගොනුව ද රැගෙන ගේට්ටුව දෙසට ගමන් කරන්නට වූයේ අනතුරුවය. **එහෙත් ප්‍රදේශයේ වෙනත් කිසිම නිවසකට ඔහු පිවිස නැත. ඉන් ඔබ්බට ඔහු දුටුවෙකු ද නැත.**

සන්ධ්‍යා භාගයේ ලිපිය කියවීම සඳහා අතට ගතිමි. ඉතා ගෞරවණීය ලෙස ආමන්ත්‍රණය කරමින් ලිපිනය ලියන ලද ලියුම් කවරයකි. එහි ඇතුලත වූයේ අත් අකුරින් ආමන්ත්‍රණය කරනු ලැබූ මුද්‍රිත ලිපියකි. කියවාගෙන යාමේදී මසිත සසළ වන්නට විය. ඔහුට අවශ්‍ය වී තිබුණේ, ආහාරය සඳහා සස්ටජන් පිටි ටින් එකක් ගැනීම සඳහා මුදල්ය. ඒ වන විට වෙළඳ පොළෙහි එය රුපියල් 480 /= කි. මසිතට අප්‍රමාණ සතුටක් දැනෙන්ට විය. ඇත්ත වශයෙන්ම මොහු රෝගියෙක් දෑ මා සිතිවිලි අතරේ අතරමං වීමි. **මුදල් පරිත්‍යාග කිරීමට පෙර ලිපිය කියවීමට ඉඩ ලැබුණේ නම් මාගේ පරිත්‍යාගය දෙගුණ වන්නටද ඉඩ තිබුණි. කෙසේ වුවද ප්‍රමාණවත් මුදලක් අවස්ථානුකූලව පරිත්‍යාග කිරීමට හැකිවීම පිළිබඳව මසිතට**

**ඇතිවන්නේ මහත් වූ සැනසුම් සුවයකි. මෙම සිද්ධිය සිහි වන සෑම වාරයකදීම මා සිතිවිලි අතරේ අතරමං වන්නේ මොහු යාචකයෙක් ද? රෝගියෙක් ද? නොඑසේ නම් කවරෙක් ද යන ප්‍රශ්ණ මාලාවත් සමගිනි.**

☸ ☸ ☸

## ▶ රචනා තරඟ

දරුවන් තුල අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කරවීමේ අරමුණෙන් ඉතා හරවත් කාලෝචිත මාතෘකා ඔස්සේ **දීප ව්‍යාප්ත** ගද්‍ය රචනා තරඟ පවත්වමින් ජයග්‍රාහී දරුවන් වෙත මුදල් චෙක් පත් සහ ප්‍රසාද ත්‍යාග ලබාදීමේ මීළඟ අරමුණ ද මල්ඵල ගැණිනි. **"ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු", "බුදු දහම සහ සදාචාර අධ්‍යාපනය", "භෞතික දියුණුව හා ගැටෙන අධ්‍යාත්මික සුවය"** ආදී මාතෘකා ඔස්සේ සිසු දරුවන්ගේ නිර්මාණ කුසලතාවන් පුබුදුවාලීමට ගත්තා වූ එම පියවර ද ඉතා සාර්ථක විය. යහපත් වූ සංකල්පනාවන් මත, මනා ආකල්පයන් ගොඩ නගා ගනිමින් ඉතා සාරවත් ලෙස ගද්‍ය රචනා ඉදිරිපත් කිරීමට සිසු දරුවන් විශාල සංඛ්‍යාවක් පෙළඹුණි.

ජයග්‍රහණය කිරීමේ අරමුණෙන් අදාල ගද්‍ය රචනයට සාරවත් කරුණු සොයා ගැනීම සඳහා ඇතැම් දරුවන් පුස්තකාල කරා පිය නැගූ අතර, ඇතැම් දරුවන් ගුරුවරුන්ගෙන් මෙන්ම, විහාරස්ථානයේ සංඝ පීතෘවරුන් ද බැහැදකිමින් තමාගේ ගද්‍ය රචනය ඉතා හරවත් ලෙස ඉදිරිපත් කිරීමට වෙර දරා ඇත. එම ගද්‍ය රචනා ස්වකීය නිර්මාණ බවට සහතික කරනු ලැබූ දහම් පාසල් වල මෙන්ම රජයේ පාසල්වල විදුහල්පතිවරුන් ද මෙම ක්‍රියාදාමය අගය කරන්නට විය. ඔවුන්ගේ අදහස වූයේ එම සිසුන් තරඟයෙන් ජයග්‍රහණය ලැබුව ද, නොලැබුව ද, දැරුවා වූ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙසින් ඒ වන විටම ඔවුන් තුල ගුණ දම් පෝෂණයක් හා ආකල්පමය සංවර්ධනයක් දිස්වන බවත්, මෙවැනි මාවතකට සිසු මනස යෙදවීම නිසා එතුලින්ම ඔවුන් ජීවිත ජයග්‍රහණයක් ලබා ඇති බවත් ය.

මෙම තරඟයෙන් ද ජයග්‍රාහකයින් දහතුන් දෙනෙකු තෝරා ගැණිනි. පළමු, දෙවන, හා තෙවන ස්ථාන හිමිකරගත් ජයග්‍රාහකයින් වෙත පිළිවෙලින් **රුපියල් 3000 /=, 2000/= සහ 1000/= වටිනාකමින් යුත් චෙක් පත්** ප්‍රදානය කල අතර ඉතිරි ජයග්‍රාහී සිසුන් 10 දෙනා වෙත ප්‍රසාද ත්‍යාග ප්‍රදානය කළෙමු. **දරිද්‍රතාවය මත උකටලීව නොසිට වීර්ය වැඩීම කෙතරම් ඵලදායී ද යන්න ඔවුනට අවබෝධ කරවීමට හැකිවීම අපගේ උත්සාහයේ සාර්ථක ඵලයක් විය.**

☸ ☸ ☸

## ▶ ග්‍රන්ථකරණය

සාර ධර්ම පිරිහී යන සමාජයක ගුණ දහම් රැකගැනීම සඳහා කළ යුතු කාර්යයන් බොහෝය. පුද්ගලයෙකුගේ දෛනික සදාචාර පැවැත්ම සඳහා ඉවහල් වන සාර ධර්ම පවා ඉතා සීඝ්‍රයෙන් සෝදා පාළුවකට ලක් වී ඇති මොහොතක,

එය රැකගැනීමට දරන්නා වූ වෙහෙස උඩුගම් බලා පිහිනීමකි. එහෙත් වගකිවයුත්තන්ගේ අවධානය ඒ සඳහා යොමු විය යුතුමය. තරුණ දූ පුතුන්ගේ හදවත් තුල උපදින නිර්මාණ කෞශල්‍යයන්, ධනාත්මක සුභවාදී චින්තනයන් හරහා යොමු කරවීම ප්‍රඥා සම්පන්න වැඩිහිටියන්ගේ යුතුකම වන්නේ ය. ඒ සඳහා ප්‍රායෝගීකරණය කළ හැකි ක්‍රමවේදයන් හඳුන්වාදීමට බෞද්ධ නායකත්වය ඉදිරිපත් වීම මාහැඟි සමාජ මෙහෙවරකි. ශ්‍රී ලංකාද්වීපය තුල සිටින ඉගෙනීමෙහි දක්ෂ ආර්ථික අපහසුතා ඇති දරුවනට ඵලදායී ශිෂ්‍යත්ව ක්‍රම ආරම්භ කිරීමට පුරෝගාමීව, කාලීන අනුශාසකත්වය ලබා දෙන **අති පූජණීය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ, එයට සමගාමීව ග්‍රන්ථකරණය හඳුන්වා දෙනු ලැබුවේ ද** ආදර්ශය තුලින්මය. තරුණ දූ පුතුනට උචිත ලෙස ඔවුන්ගේ රුචිකත්වයන්ට ගැලපෙන සේ "**තාරුණ්‍යය සහ බුදුදහම**" නමැති ග්‍රන්ථය රචනා කල උන්වහන්සේ, නූතනත්වය කරපින්නාගෙන නවීකරණය පසුපස අන්ධයින් මෙන් අවිචාරයෙන් දුවන තරුණ හදවත් තුලට සපයනු ලැබුවේ මාහැඟි තිරිංග පද්ධතියකි.


Stress Reduction for YOUTH through mindfulness and loving kindness MEDITATION

With the publication of "Stress reduction for youth through mindfulness and loving kindness meditation" Venerable Mirisse Dhammika Thero's publishing progress takes another stable step forward on the road to social progress & spiritual development.

Venerable Mirisse Dhammika Thero was born in Sri Lanka and ordained a Buddhist monk at the age of nine. After acquiring the traditional Buddhist education, he got his higher ordination in 1982. Then he pursued his higher education at the Colombo University and was graduated in 1986. He was appointed as a government graduate teacher by the Ministry of Education in 1988. He rendered his service while being attached to the tutorial staff of D. S. Senanayake College - Colombo 7, until he was chosen for a mission of spreading Buddhism to the international community. In 1995 he left Sri Lanka accepting the offering given by the Buddhist Vihara Society - Canada.

Being an asset to the foreigners too, he started meditation programs to spread Buddhism among the foreigners. While engaging in those religious activities, he pursued his higher education and successfully obtained the Master of Art in Education in 2000 at the Simon Fraser University, British Colombia in Canada, and now he is pursuing for his Ph.D.

In addition, the Sri Lanka-Canada Scholarship Foundation was established by him in 1998 for the benefit of Sri Lankan needy students who demonstrated academic excellence at the G.C.E. (O/L) Examination.

At present, as the Chief Incumbent of Sri Sudassanaramaya - Battaramulla, he conducts meditation classes in Sri Lanka too for residential, non-residential and visiting foreigners as well as for Sri Lankans.

He is widely known as a scholar monk of high quality in meritorious activities. He is one who does not get tired of doing what is right.

-K.S.N. Gooneetilleke

A Publication of Buddhist Cultural Centre Sri Lanka

B 845 Rs. 125.00 ISBN 955-8129-94-1

ග්‍රන්ථකරණයට මා සතු කුසලතාවක් තිබුණේදැයි මම නොදනිමි. එහෙත් අප වෙත නිරතුරුවම අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන උන්වහන්සේ විසින් රචිත "**Stress Reduction for Youth**" සහ "**Education for mindfulness**" යන ග්‍රන්ථයන්හි පිට කවරයේ පසුවදන සකස් කිරීම මා වෙත පැවරුණෙන්, එය භාග්‍යයක් කොට සලකමින් එම කාර්යය සාර්ථක ලෙස ඉටු කර දීමත් සමඟ ග්‍රන්ථකරණය කෙරෙහි මට ද ඇතිවූයේ මහත් රුචිකත්වයකි. කොළඹ ඩී.එස්. සේනානායක විදුහලේ අප හා එකම ආචාර්ය මණ්ඩලයේ සේවය කරමින් සිටියදීද උන්වහන්සේ පොත් ලිවීම සඳහා අපව යොමු කරවීමට උත්සාහගත් අවස්ථා බොහෝය. කුමන තේමාවක් යටතේ ග්‍රන්ථකරණයට පිවිසෙන්නේදැයි මා අවිනිශ්චිතව සිටි අවධියක, සමාජයේ **පියවරුන් පිළිබඳව ලියැවුන ග්‍රන්ථ** අල්ප බැවින්, ඒ සඳහා උත්සාහ ගන්නේ නම් එය කාලෝචිත ඵලදායී වෑයමක් බව පෙන්වා දුන් සේක.

යා යුතු මග හා කල යුතු දෑ පිළිබඳව නිරන්තරයෙන්ම අනුශාසකත්වය ලබා දුන් උන්වහන්සේ ආදර්ශයට ගනිමින්, මම ද ග්‍රන්ථකරණයට එළඹුනෙමි. අනතුරුව, මුළු ජීවිතකාලය පුරාම පංචශීල ප්‍රතිපත්තීන් ජීවිතයට ආභරණයක් කර ගනිමින්, සිසු දරුවන් දහස් ගණනකගේ ගුණ නුවණ පෑදූ, සමාජයට මාහැඟි මෙහෙවරක් ඉටුකර ස්වාභාවිකව ආයුක්ෂය මරණයකින් දැයෙන් සමුගත් **නිහතමානී කීර්තිමත් විදුහල්පතිවරයෙකු වූ විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාගේ ආදර්ශමත් චරිතාපදානය,** යහගුණ කැමති සමාජයකට තිළිණ කිරීම සඳහා "**මා පිය ගුණ සමර**" තුලින් එළි දැක්වූවෙමි. සෙනෙහබර පියෙකුගේ වියෝව දරාගත නොහැකි චිත්තසන්තාපයක් වුවද, ගලා හැලෙන කඳුළු ආයාසයෙන් මැඩපවත්වාගෙන රචනා කරන ලද මාගේ එම කුළුදුල් ග්‍රන්ථය **භයසියයක්** පමණ සියලුම ශිෂ්‍යත්වලාභීන් වෙත පරිත්‍යාග කලේ අපරිමිත කරුණාවෙනි. දෛනිකව ජීවිතය තුල පුහුණු කරගත හැකි සාරධර්ම මෙන්ම, සමාජයීය අභියෝග සාර්ථක ලෙස ජයගැනීමේ ක්‍රමවේදයන් ඇතුළත් සරල හා සත්‍ය වූ අත්දැකීම් රැසක් එම ග්‍රන්ථය තුලින් පාඨක සැමට ලබාදීමට හැකි වීම මා ලද ජීවිත ජයග්‍රහණයක් සේ දකිමි. පාඨක සැම වෙත මනා ගුණ දම් පෝෂණයකි. එවන් ශ්‍රේෂ්ඨ චරිතයක් මා පියාණන් සතු නොවන්නට මාගේ වෑයම ව්‍යාර්ථ වන්නට ඉඩ තිබුණි. **සමාජයට තිළිණ කිරීමට තරම් වටිනා ගුණ ධර්ම පද්ධතියක් අප වෙත දායාද කරමින් සදානුස්මරණීය ළබැඳියාවක් සිත්හි රැඳවූ පියතුමාණන්ගේ නමට මෙවන් පූජෝපහාරයක් සිදු කිරීමට මා දිරිමත් කල අනුශාසක හිමිපාණන් වෙත 2550 සම්බුද්ධ ජයන්තිය සැමරෙන වෙසක් පුර පසළොස්වක දින ප්‍රථම පිටපත පූජා කරනු ලැබුවේ හද පිරි සතුටකිනි.**

**4 The Island**
***Friday 29th September, 2006***



A book on moral virtues, 'Maa Piya Guna Samara' enclosing the biography of the late Wijayasena Kiriwattuduwa, written by Mrs. Seetha Goonetilleke' co-ordinating secretary of Sri Lanka-Canada Scholarship Foundation was launched recently. Mrs. Kiriwattuduwage Seetha Nandani Goonetilleke presents a copy of the book to the patron and advisor of SLCSF, Venerable Dr. Mirisse Dhammika Thero, at Siri Sudassanaramaya, Battaramulla.

"මාපිය ගුණ සමර" සංඝරත්නය වෙත පිදෙයි

"මා පිය ගුණ සමර" ග්‍රන්ථය 2550 සම්බුද්ධ ජයන්තිය සැමරුණ වෙසක් පෝදා දොරට වැඩි වගයි.



"සාධු දැක්ම" ග්‍රන්ථය, දඹදිව් තලයේ කුසිනාරාවේදී තථාගත බුදුරජාණන් වහන්සේ වෙත බැතිබරව පිදුන වගයි.

සම්බුදු දහම මුළු මහත් මානව සමාජයටම අමිල වූ දායාදයකි. එය ඉදිරි පරම්පරාවට උරුම කර දීම සඳහා එලෙසින්ම රැක ගැනීම වත්මන් සමාජයේ වගකීම මෙන්ම යුතුකම ද වන්නේය. එහි චිරස්ථිතිය පිණිස කල හැකි, කල යුතු යමක් වේ නම් අප්‍රමාදීව ඒ සඳහා පියවර ගත යුතුමය. දෙමාපියන් දෙනිකව නමදින බෝසත් දරුවන් තවමත් සමාජයේ දක්නට පුළුවන. දෙමාපියන්ගේ ආශීර්වාදය ද ඔවුන් වෙත ගලා එන්නේ නිතැතිනි. එහෙත් **දස මාසේ උරේ කත්වා .. .. .. වුද්ධිකාරෝ අලිංගිත්වා ..** .. .. යන ගාථා පාඨයන්ගේ අර්ථ රසය හඳුණන්නෝ අල්පය. ගිරවුන් මෙන් කටට හුරුවීම නිසා සජ්ඣායනා කරයි. දෙමාපියන් ද හිස පිරිමැද තෙරුවන් සරණ පතයි. එහෙත් කීවේ කුමක්දැයි බොහෝ දරුවන් මෙන්ම ඇතැම් දෙමාපියන් ද නොදනී. එලෙසින් මුඛ පරම්පරාවෙන් හෝ දීර්ඝ කාලයක් තිස්සේ මෙම සාරධර්ම ඉදිරියටම ගෙනෙමින් ආරක්ෂා කර ගත් අපගේ මුතුන් මිත්තන්ට මුළු මහත් බෞද්ධ ජනතාවගේ ගෞරවය හිමි විය යුතුමය. මෙම පාලි ගාථාවන්හි **අර්ථ රසය** සජ්ඣානාවේදී හදවතට දැනේ නම්, මෙම දෙමාපිය නමැදීම වඩාත් ඵලදායී වීමටත්, ලබන්නා වූ ආශීර්වාද වඩා තීව්‍ර වීමටත් එය හේතු වනු ඇත. මෙම අවශ්‍යතාව සපුරාලීම සඳහා "**සාධු**" යන වදනේ සිටම, වත්මන් සිසු දරුවන් **එදිනෙදා තෙරුවන් නමැදීමේදී**, හා මව් පිය නමැදීමේදී සජ්ඣායනා කරන පාලි ගාථා ධර්මයන්ගේ සරල අර්ථය **සිංහල** හා **ඉංග්‍රීසි** ද්වි භාෂාවන්ගෙන් සිසු හදවත් තුලට ආරෝපණය කරවීම සඳහා පියවරක් ගැනීම කාලෝචිත බව හැඟිණි. අනතුරුව ග්‍රන්ථකරණයේ දෙවන පියවරට පා තබමින් සිසු දරුවන් අතරේ බෙදා හැරීම සඳහා, **සාධු දැක්ම** - " The Excellent View" නමැති ග්‍රන්ථය රචනා කලෙමි. එහි ඵලදායී එක් කොටසක් මෙම ග්‍රන්ථයේ තුන් වන ඡේදයේ ද අන්තර්ගතය, මෙවන් වටිනා සාර ධර්ම ඉදිරි පරම්පරාව වෙත **අර්ථාන්විතව** දායාද කිරීම වත්මන් සමාජයේ වගකීමයි.

මුළු මහත් සමාජය තුල හැකි තාක් දුරට මෙම සාරධර්ම ව්‍යාප්ත කරවීමේ අරමුණෙන් අනතුරුව අවතීර්ණ වූයේ සුවිශේෂී ක්‍රියාදාමයකටය. සිසු දරුවන් වෙත තිළිණ කරනු ලැබූ ග්‍රන්ථයන් පරිශීලනයෙන් පසු සුරක්ෂිතව ගබඩා කර තැබීමෙන් එවන් අරමුණක් සාර්ථක නොවනු ඇත. මෙම අවස්ථාව, සිසු දරුවනට ද **පරිත්‍යාගශීලීත්වය පුහුණු කරවීමට** කදිම අවස්ථාවක් කර ගතිමු. පොතක සජීවීත්වය රඳා පවතිනුයේ පොත් රාක්කයක් මත නොවේ. අතින් අතට යමින්, කියවන පාඨක සංඛ්‍යාව මතය. ග්‍රන්ථ තිළිණ ලද සිසු දරුවන්ගේ සහ ඔවුනගේ සමීප ඥාති හිතවතුන්ගේ පරිශීලනයෙන් පසු, එම ග්‍රන්ථය තමා ඉගෙනුම ලබන පාසලේ පුස්තකාලය වෙත පරිත්‍යාග කරවීමට අප විසින් ගත්තා වූ ක්‍රියා මාර්ගය ද ඉතා සාර්ථක විය. **සිසු දරුවන් තුලින් තෘෂ්ණාව, මමත්වය, ආත්මාර්ථකාමීත්වය යම් පමණකින් හෝ තුනී කර, පරෝපකාරය සඳහා නම්‍යශීලී ආකල්පමය සංවර්ධනයක් ඇති කරලීමේ අරමුණෙන්, මෙලෙසින් චක්‍රාකාරව දැරුවා වූ වෑයම මල් ඵල ගැන් වී ඇති බව විදුහල්පතිවරුන්ගේ සහ පුස්තකාලයාධිපතින්ගෙන් ලැබුණා වූ ප්‍රශංසාත්මක ප්‍රතිචාර මගින්ම තහවුරු වන්නට විය.**

# ග්‍රන්ථ පරිත්‍යාගයන් වෙනුවෙන් විදුහල්පති ප්‍රතිචාර

605

D.M. Gunarathna
Principal:-..............................

**Sivali Central College**
Hidellana, Ratnapura.
T.P. / Fax :- 045-2228936 E-mail:-principal@sivali.net

Date ..........2007.05.16.........

සීතා ගුණතිලක මිය
ලේඛිකා (සම්බන්ධීකරණ)
ශ්‍රී ලංකා කැනඩා මිත්‍රත්ව පදනම
392/2 පෙරේරා මාවත
කොටුවේගොඩ
රත්නපුර.

ශිවලී මධ්‍ය විද්‍යාලයේ 12 ඒ ගණිත අංශයේ ඉගෙනුම ලබන තරංග සේනාල් ... පාසල් පුස්තකාලයක පරිහරණයට සුදුසු ඉතා වටිනා පොතක් වන ... සීතා රන්ජනී ගුණතිලක විසින් රචිත "මාපිය ගුණ සමර" නමැති පොත පුස්තකාලයට භාරදෙන ලදී.

එම පොත ඇතුළත් ... අංක 23122 ලෙස සටහන් පුස්තකාලයේ ලේඛනගත කර ඇත.

ස්තූතියි

පුස්තකාලයාධිපති

විදුහල්පති
D. M. GUNARATNA
PRINCIPAL
SIVALI M. M. V.
(National School)
HIDELLANA, RATNAPURA

---

615

විදුහල්පති,
බප/හෝවාද්දුව මධ්‍ය මහා විද්‍යාලය,
වැද්දුව.
2007.05.25.

සීතා ගුණතිලක මහත්මිය,
සම්බන්ධීකරණ ලේඛිකා,
ශ්‍රී ලංකා - කැනඩා මිත්‍රත්ව පදනම,
392/2, පෙරේරා මාවත,
කොටුවේගොඩ,
රත්නපුර.

මහත්මියණි,

"මා පිය ගුණ සමර" නමැති ග්‍රන්ථය පුස්තකාලයට පරිත්‍යාග කිරීම සම්බන්ධවයි.

12 B (ජීව විද්‍යා අංශයේ) ඉගෙනුම ලබන අදිති විදුමිණා ශිෂ්‍යාව විසින් 2007.05.12 වන දින මෙම පොත පුස්තකාලයට පරිත්‍යාග කරන ලදී. ඒ අනුව පුස්තකාලයේ පරිශීලන ලේඛන වල ඇතුලත් කර දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගෙන ඇත. සාරධර්ම වලින් පිරිපුන් අනාගත පරපුරක් බිහි කිරීම සඳහා මෙම පොත මහත් පිටුවහලක් වනු ඇත. ඒ පිළිබඳව සීතා රචනා කරන ලද මෙම කෘතිය සම්බන්ධව ඔබ තුමියට කෘතඥතාවය පළ කර සිටිමි.

විදුහල්පති,
බප/හෝවාද්දුව ම. ම. වි.


ජනාධිපති කාර්යාලය
ஜனாதிபதி அலுவலகம்
THE PRESIDENTIAL SECRETARIAT

CO6/2/11/III/2006

2006 ඔක්තෝබර් මස 04 වන දින.

◀ ග්‍රන්ථකරණයට දිරිමත් කළ ජනපති සුපැතුම්

## ▶ ආබාධිත සරණ සේවය

ව්‍යාප්ත වී ගෙන යන සහන සේවාවන්ගේ මීළඟ ඉලක්කය වූයේ **ආබාධිත අසරණ ජනතාවයි**. අත් පා වල ඇති වටිනාකම නිසි අයුරින් අවබෝධ වන්නේ අත් පා නැති වූ විටයි. අත් පා ඇත්තෝ ඒවා නරකට, නපුරට යොදන්නේ ද එහි අගය නොදන්නාකමින්ම ය. කර්මානුරූපීව ඇතැම්හු උපතින්ම අත් පා අහිමිව උපදී. ඇතැමුන්හට ජීවිතකාලය තුල දී, අඟ පසඟ අහිමි වී යයි. අංග විකලත්වයකින් තොරව මෙවන් බුද්ධෝත්පාද කාලයක මනුෂ්‍යත්වයක් ලැබීම කෙතරම් ශ්‍රේෂ්ඨ ද යන්න පළමුවන පරිච්ඡේදය තුලින් වඩාත් පැහැදිලිව දක්වා ඇත.

සම්පත් ඇත්තෝ සම්පත් නැත්තන්ට උදව් උපකාර කල යුතුමය. එම සම්පත් ගලනය ආර්ථික වශයෙන් මෙන්ම භෞතික, ශාරීරික හා අධ්‍යාත්මික වශයෙන් විය හැක. අත් පා ඇත්තෝ අත් පා නැත්තන්ට පිහිට නොවන්නේ නම් ඒ අත් පා වලින් ඇති ඵලය කුමක් ද? ඇස් කන් නැත්තන්ගේ දුක් වේදනාව ඇස් කන් ඇත්තන්ට නොදැනේ නම් ඒ අංගෝපාංගයන් ඇති ඵලය කුමක් ද? **ස්වභාව**

**ධර්මය විසින් යමෙක් වෙත යම් සම්පතක් උරුම කර දී ඇත්තේ එය හුදෙක් ස්වයං පරිභෝජනය සඳහාම නොවේ.** පොදු යහපත වෙනුවෙන් ද යොමු කල යුතුමය. **කුමන සම්පත් ලැබුවේ වුවද, සියල්ල ත්‍රි ලක්‍ෂණයට යටත්ය. අද ඇති දෙපා හෙට අහිමි විය හැක. අට ලෝ දහම කාහටත් පොදුය.** ඒ සියල්ල යථා පරිදි අවබෝධ කරගත් සිදුහත් කුමරා උප භෝග, පරිභෝග, භව භෝග ආදී **සියලු සැප සම්පත් වලින් ආඪ්‍යව සිටිය ද**, ඒ කාම භෝගී ජීවිතය තුල ලද හැකි සියලුම ලෞකික සැප අත්හැරදමා සමස්ථ ලෝක සත්වයා කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව සය අවුරුද්දක් පුරා කෙතරම් දුක් වින්දේද යන්න විචාර බුද්ධියකින් යුතුව සිදුහත් චරිතය දෙස නෙත් යොමු කරන්නෙකුට මනාව අවබෝධ වනු ඇත. එම ශ්‍රේෂ්ඨ ජීවිතය තුල ගැබ්ව ඇති උදාර ආදර්ශයන්ගෙන් බිඳක්වත් අප ලද මේ මිනිස් භවය තුලදී, අප තුල පුරුදු පුහුණු කරවීමට සිතක් පහළ නොවන්නේ නම් එය කෙතරම් අභාග්‍යයක් ද?

සියලු සම්පත් අතහැර දැමීමට තරම් පෘථග්ජන අප අධ්‍යාත්මික වශයෙන් ශක්තිමත් නැත. එහෙත් අවම වශයෙන් සම්පත් පරිභෝජනය කිසියම් සීමාවකට යටත් කොට, කරුණාව, දයාව, මෛත්‍රියෙන් යුතුව මොහොතට හෝ දුක් කඳුලකට සැනසුම් සුවයක් දිය හැකි නම් එතුළින් අප්‍රමාණ සැනසීමක් ලැබෙනු ඇත.

**තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති**
**යස්ස පතීතො සුමනො - විපාකං පටිසෙවති**

(ධම්ම පදය - බාල වග්ග)

යමක් කොට පසුතැවෙන්නට නොවේද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුක්තව විඳිය හැකි ද, එබඳු පුණ්‍ය කර්ම කිරීම යහපත්ය.

That deed is well - done after doing which there is no repentance and the consequences of which can be borne with satisfaction and pleasure.

ආබාධිත අසරණ ජනතාව කෙරෙහි අවධානය යොමු කරන සත් පුරුෂයින් මෙය අත්දකිනු ඇත. **ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුල ඇත්තේ ආශ්චර්යමත් සංසිද්ධීන්මය.**

සමාජ සත්කාරයන් අතරට **ආබාධිත සරණ සේවය ද** එක් කරමින් ආරම්භක පරිත්‍යාගය දියත් කළෙමු. අංශභාග රෝගයට ගොදුරුව දෙපා අප්‍රාණික වූ හෝ දෙපා අහිමි වූ හෝ ආර්ථික අපහසුතාවන්ගෙන් පීඩිත වැඩිහිටි කාන්තාවක් සඳහා **සියලුම අංගෝපාංගයන්ගෙන් යුත් රෝද පුටුවක්** මෙම පරිත්‍යාගය සඳහා වූයෙන්, සුදුස්සකු තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටියට එළඹුණෙමු. පුවත්පත් මගින් ඒ සඳහා ද විවෘතව ඉල්ලුම් පත් කැඳවූ අතර, දිවයිනේ සෑම දෙසකින්ම ලැබුණා වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව සිය ගණනකි. සියල්ලෙහිම ආර්ථික පසුබිම අදාල ග්‍රාම නිලධාරීන් මගින් සහතිකව තිබුණි. එහෙත් සත්‍යතාව වඩාත් තහවුරු කර ගැනීම සඳහා ප්‍රදේශයේ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ නිර්දේශය අපේක්‍ෂා

කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් ඉතාමත් සාර්ථක ලෙස මෙම **රෝද පුටුව** පරිත්‍යාගය සඳහා සුදුසු අයෙකු තෝරා ගතිමු. එහි ද සත්‍යතාව අවබෝධ කරගැනීම පිණිස **දරිද්‍රතාව හඹා ගියෙමු**. ඇය උපතින්ම අත් පා කොර වූ මැදිවියේ කාන්තාවකි. මුළු ජීවිත කාලයම අනුන්ට බරක් වෙමින්, ආර්ථික පීඩාවන් මැද, ජීවිත් වීම සඳහා ආවරණය වූ කාමරයක් පවා නොමැතිව කල් ගෙවූ ඇයට, අඩු තරමින් පොහොය දිනයටවත් පන්සලට යාමට නොහැකි බව ප්‍රකාශ කරන්නට වූයේ මහත් වූ සංවේග යෙනි. සංසාර සාගරයෙන් එගොඩ වීමට ඇති එකම මග ශ්‍රී සද්ධර්මය බව අවබෝධ වී තිබුණෙන් ඇයගේ මූලික අරමුණ වූයේ පන්සල් වෙත යාමයි.

මෙම පරිත්‍යාගය ද වඩාත් විධිමත් ලෙසින් සිදු කිරීමට සියලු පියවර ගත්තෙමු. **හෝමාගම** ප්‍රාදේශීය ලේකම්තුමාගේ උපදෙස් පරිදි **සිද්දමුල්ල** ග්‍රාම සේවා නිලධාරි මගින් අවශ්‍ය පසුබිම සකස් කරවීමෙන් අනතුරුව, පරිත්‍යාගය ලැබීමට සුදුසු බව නිර්දේශ කර තිබූ සිද්දමුල්ල ශ්‍රී සංඝාරාම පුරාණ විහාරාධිපති **කිරුළපනේ සෝමානන්ද අනුනායක හිමිපාණන්** සහ අප **ගෞරවණීය අනුශාසක ධූරංධර ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ** එම ස්ථානයට වැඩම කරවා සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ මෙම පරිත්‍යාගය සිදු කෙරිණි. ආබාධිත රොසලින් නෝනා වෙත රෝද පුටුවට අමතරව වියළි ආහාර ද්‍රව්‍ය මෙන්ම මුදල් ද පරිත්‍යාග කරමින් ලැබුවා වූ පුණ්‍ය සම්භාරය, **අභාවප්‍රාප්ත විශ්‍රාමලත් විදුහල්පතිනි ලෝරා පෙරේරා හෙට්ටිආරච්චි මැතිණිය වෙත** අනුමෝදන් කරවන්නට වූයේ, මෙම පරිත්‍යාගයේ පූර්ණ දායකත්වය එතුමියගේ දියණිය විසින්ම දැරූ හෙයිනි.

10 සිළුමිණ 2006 ජූලි මස

**රෝද පුටුවක් දෙන්න සූදානම්**

අංගභාග රෝගයට ගොදුරුව දෙපා අප්‍රාණික වූ හෝ දෙපා අහිමි වූ, ආර්ථික අපහසුතාවන්ගෙන් පීඩිත වැඩිහිටි කාන්තාවක් සඳහා සියලුම අංගෝපාංගයන්ගෙන් සමන්විත රෝද පුටුවක් පරිත්‍යාග කිරීමට ඇත. පවුලේ සියලුම තොරතුරු, ග්‍රාමසේවක මගින් සහතික කර ප්‍රදේශයේ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ නිර්දේශය ද ඇතිව ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම් - සීතා ගුණතිලක, ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනම, 392/2, පෙරේරා මාවත, කොටුවේගොඩ, රාජගිරිය යන ලිපිනයට යොමු කරන්න.

▲ **විවෘතව ඉල්ලුම්පත් කැඳවයි**

ලංකාදීප

**කොළොම්පුර**

2006 ඔක්තෝබර් මස 31 වැනිදා අඟහරුවාදා

**ශ්‍රී ලංකා-කැනඩා ශිෂ්‍යත්ව පදනමෙන් රෝද පුටුවක්**

▼ **පරිත්‍යාගයේ අරමුණ**

හෝමාගම, දියගම විදු විශ්‍රාමලත් විදුහල්පතිනි
ලෝරා පෙරේරා හෙට්ටිආරච්චි මැතිණියට
පිං පිණිස
රාජගිරිය, කොටුවේගොඩ පදිංචි
(ශ්‍රී ලංකා-කැනඩා ශිෂ්‍යත්ව පදනමේ සම්බන්ධීකාරක ලේකම්)
සීතා ගුණතිලක දියණිය විසින්
2006/10/09 දින,සිය 55 වන ජන්ම දිනයේදී
මෙම රෝද පුටුව පරිත්‍යාග කරන ලදී.

ආබාධිත රොසලින්නෝනා රෝද පුටුව මත වඩා හිඳුවමින් .. ..

සෙත් පිරිත් මධ්‍යයේ පරිත්‍යාගය සිදු කරමින් .. ..

මෙලෙසින් අසරණ වූ මවක් තමාගේ මව මෙන් දැකිය හැකි නම්, අසරණ වූ පියෙක් තමාගේ පියා මෙන් දැකිය හැකි නම් මුළු ලොවම සුවපත් නොවන්නේ ද? ගෞරවණීය ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනය හමුවේ මාගේ දෙනෙතින් ගලා හැලෙන්නට වූ කඳුළු මගින් සංකේතවත් වූයේ **දරිද්‍රතාව භඹා යමින් මා ලද තෘප්තියයි.** ඉතා හරවත් ලෙස ස්තුති පත්‍රයක් සහ පුණ්‍යානුමෝදනා පත්‍රයක් සකස් කර තිබූ පරිත්‍යාගලාභී කාන්තාව, සිය ඥාති මිණිපිරියක මගින් එය ප්‍රකාශයට පත් කරවමින් ඇයගේ කෘතඥතාව ද පළ කිරීමට අමතක නොකළාය. එහි භාෂා ශෛලිය මාහැඟිය. කවරෙකු විසින් සුදානම් කරන ලද්දක් දැයි විමසා බැලීමේදී එය ඇයගේ දැනුමෙන්ම සකස් කරන ලද්දක් බවට අප දැනුවත් විණි. මා අනතුරුව විමසා සිටියේ අබාධිත ඇය වසර කීයක පාසැල් අධ්‍යාපනය ලබා ඇති ද යන්නයි. ඇය ජීවිත කාලය පුරාවට වැස්සකටවත් පාසලකට ගොඩ වී නොමැති බව ඇසීමෙන් මා පුදුමයට පත්වීමි. ඇය දිරිය කාන්තාවකි. **උත්පත්තියෙන් නොලද දේ ගැන කම්පා නොවී කුඩා කල සිටම, කඩයෙන් හාල්, සීනි, තේ කොල ආදිය ඔතාගෙන එන පත්තර කෑබලි එක්කොට තබාගෙන වැඩිහිටි හිතවතුන්ගේ සහායෙන් අකුරු හඳුනාගත් බවත්, එදා පටන් ලැබෙන සෑම පත්තර කෑබැල්ලක්ම කියවූ බවත් ප්‍රකාශ කල ඇය, ඇඟිලි තුඩු අතරේ පෑන රැඳ වීමට හැකි වූවා නම් .. .. කියමින් දීර්ඝ සුසුමක් හෙළුවාය.** අනතුරුව ඇයගෙන් කාව්‍යමය ස්තුති පවා ගලා එන්නට විය. ඇයගේ කුසලතාවන් පිළිබඳව අපි මහත්සේ පැහැදුනෙමු. අනතුරුව ඇයගේ දෙවන ඉල්ලීමට ද යහපත් සේ ප්‍රතිචාර දක්වමින් සිය නිවසේ වහලය සාදා ගැනීම පිණිස ප්‍රමාණවත් දැව තොගයක් ද සපයා දෙමින් ධර්මය තුලින් සැනසුනෙමු.

**ලෞකික සැප සම්පත් පසු පස භඹා යමින්, සම්පත් විනාශ කරමින්, සුරංගනා ලොවක මිරිඟුව දකිමින්, ඔබ මොබ දුවමින් සතුට සොයන, අත් පා ඇති මිනිසුන්ගේ දෘෂ්ඨියට මෙවන් අසරණයින් හසු නොවන්නේ ඇයි? මා සිතිවිලි අතරේ අතරමං වීමි. ආබාධිත වුවද, අසාධාරණ ලෙස උපයන මුදල් මගින් සහනයක් ලැබීමට තරම් ඒ අහිංසක අසරණ ජනතාව අභාග්‍ය සම්පන්න වී නැත. ඔවුන් හසුවන්නේ පෙර පින් ඇති සත්පුරුෂ ජනතාවගේ අවධානයට පමණක් බව මටම ප්‍රත්‍යක්ෂ විණි.**

☸ ☸ ☸

## ▶ මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මෙත්තා කරුණා, මුදිතා, උපේක්ෂා යන උතුම් ගුණාංගයන්ගෙන් පිරි මව් පිය දෙපොළ මහා බ්‍රාහ්මයණට සම කර වදාරා ඇත. මව්පියනට ගරු කිරීම, සැලකීම හා ඔවුන් මිය පරලොව ගිය විට පිං පැමිණවීම, ආදී සාරධර්ම, ගිලිහී යමින් නවීකරණය වෙමින් පවතින සමාජයක මෙවන් සාර ධර්ම රැක ගැනීමට වෙර දැරීම පහසු කාර්යයක් නොවුවත් මෙම ශිෂ්‍යත්ව ක්‍රමය තුලින් එය යම්තාක් දුරට සාර්ථක වනු දැකීම ශ්‍රද්ධාවන්ත මිනිස් සමාජයේ සතුටට කරුණක් වී ඇත.

මව් පිය අගය හොඳින් හඳුනාන්නෝ ගුණ ගරුක දරුවන්මය. මුළු ජීවිත කාලය පුරාම දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ඇප කැප වී කටයුතු කරන ආදරණීය දෙමාපියන් මිය පරලොව ගියද, ඔවුන් හා ළබැඳි සෙනෙහස සදානුස්මරණීය වනු ඇත. ඔවුන්ගේ නාමයෙන් ඔවුන් සිහිපත් කිරීමේ අරමුණෙන් හැකි පමණින් පිං දහම්වල යෙදෙමින් ඔවුනට පිං පැමිණවීම බෞද්ධ ප්‍රතිපදාවයි.

**දෙ ගුරුන් විසින් තම - දරුවන්ට දෙන නොමද ධන නම්**
**වියතුන් සභා මැද - ඉන්ට ඉදිරිව සිල්ප දෙනුමැයි**

(ලෝකෝපකාරය - 10)

යම් මව් පිය දෙපොළක් දරුවෙකුට, උගත් සමූහයා මැද පසු නොබැස ඉදිරිව ඉන්නට මනාව ශිල්ප ශාස්ත්‍රය උගන්වා නම්, එයම විශේෂිත ධනය බව මෙයින් පැහැදිලි වේ. **එවන් ධනයක් උරුම වූ සත්පුරුෂ දරුවෙකුට, එම ධනය ආයෝජනය කරමින් තම දෙමාපියන්ගේ නාමයෙන්, සමාජ යහපත සඳහා කල නොහැක්කක් නැත.** යහපත් වූ අරමුණු අපමණය.

අයහපත් ආර්ථික පසුබිම උසස් අධ්‍යාපනයට අභියෝගයක් වීම නිසා අද ඉගෙනීමෙහි දස්කම් ඇති දිරිය දරුවන් විඳිනා දුක් සුළු පටු නොවේ. දහසකුත් එකක් දුක් කම්කටොළු මැද අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සමත්වන දරුවාට උසස් පෙළ විභාගය වඩාත් තීව්‍ර වූ ආර්ථිකමය අභියෝගයකි. එය ද කෙසේ හෝ දැඩි **ආර්ථික හා මානසික අභියෝග** හමුවේ දරාගත් දරුවා සරසවියට පා තබනා විට, කාලාන්තරයක් පුරා පැවති අයහපත් ආර්ථික හා මානසික පීඩාවන් **භෞතික හා සමාජයීය** ක්ෂේත්‍ර ඔස්සේ ද විහිදී යාමේ ප්‍රතිඵලයක් ලෙසින්, ඔවුන් වෙත එල්ල වී ඇත්තේ **දැවැන්ත ජීවිතාභියෝගයකි**. මෙය සත් පුරුෂයින්ගේ මනැසට හා නැණැසට කාලීනව ගෝචර නොවන්නේ නම් බොහෝ විට ඔවුන්ගේ ජීවිත ශෝචනීය ලෙස තීරණාත්මක වනු ඇත.

ශ්‍රී ලාංකික දූ දරුවන්ගේ නැණ පහන් දල්වමින්, සමාජයේ පීඩිත ජන ජීවිත වලට මහත් වූ ධෛර්යයක් ලබා දුන් විදුහල්පතිවරයෙකු වූ සාම විනිසුරු **විජයසේන කිරිවත්තුඩුව ගුරු පියාණන් අනුස්මරණය කිරීම පිණිස**, සිය දියණිය විසින් ලබා තිබූ පන්නරය ශක්තිමත් ලෙසින් පාදක වන්නට වූයේ මෙම අදියරේදීය. රුදුරු ආර්ථික අභියෝග මැදින් සරසවියට පා තබන දිරිය දරුවා, විශ්ව විද්‍යාල පළමු වසර තුල දී ආර්ථිකමය වශයෙන්, කබලෙන් ලිපට වැටෙයි. එම අදියරේදී ඔවුනට ආර්ථිකමය සවියක් ලබා දීම සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් ගොඩ නැගීම කාලෝචිත බව හැඟුණි. පවුලේ සාමාජිකයින් විසින් ශිෂ්‍යත්ව කීපයක් වාර්ෂිකව පරිත්‍යාග කිරීමේ උදාර අරමුණ ඇතිව **2006 දී විජයසේන කිරිවත්තුඩුව අනුස්මරණ ශිෂ්‍යත්ව ක්‍රමය** බිහි වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

යහපත් වූ එම අරමුණෙහි ඇති **උදාරත්වය** දළුලන්නට ගත වූයේ දින කිහිපයකි. හිතෛෂී සත්පුරුෂ දෙස් විදෙස්හි පරිත්‍යාගශීලි පින්වතුන් තම තමාගේ දෙමාපියන් අනුස්මරණය කිරීම සඳහා මෙම මාහැඟි ක්‍රමවේදය වටා එක් රොක් වන්නට විය. අනුග්‍රාහක භවතුන්ගේ සංඛ්‍යාවට අනුරූපව ශිෂ්‍යත්ව

සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් දිස් වන්නට විය. අනතුරුව, එම ව්‍යාපෘතිය ඉදිරියටම ගෙනයාම වඩාත් ඵලදායී බව හැඟී ගියෙන්, මෙම ක්‍රමවේදය සමස්ථ ලෝක වාසීන්ටම විවෘතව තබමින් **විජයසේන කිරිවත්තුඩුව අනුස්මරණ ශිෂ්‍යත්ව ක්‍රමය - "මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම"** නමින් ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයන්ට අනුබද්ධ **වෛද්‍ය විද්‍යාලයන්හි** අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ අඩු ආදායම් ලාභී පවුල් වල සිසු දරුවන් **17** දෙනෙකුට මසකට **රුපියල් 1000/=** බැගින් වූ ශිෂ්‍යත්ව ප්‍රදානය කරමින් ඇරඹි මෙම ශිෂ්‍යත්ව ක්‍රමය, වසර 3 ක් ඇතුලත දී සිසු දරු දැරියන් **69** දෙනෙකුට සහන සලසමින් ඵලදායී ලෙසින් දීප ව්‍යාප්ත වන්නට විය. ආරම්භයේදී විශ්ව විද්‍යාලයන්හි වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා පමණක් සීමා වී තිබූ මෙම ශිෂ්‍යත්ව **2008** වර්ෂයේදී වඩාත් පුළුල් වූ ක්ෂේත්‍රයක් තුල ව්‍යාප්ත වෙමින් **වෛද්‍ය, ඉංජිනේරු, විද්‍යා හා ගණිත** යන අංශයන් කරා විහිදී ඇත. හිතෛෂී පරිත්‍යාගශීලී ජනතාව, මෙලොව හැරදා ගිය සිය දෙමාපිය ඥාති මිත්‍රාදීන් ඵලදායී මෙන්ම ආදර්ශවත් අයුරින් සිහිපත් කරමින්, වත්මන් සමාජයේ දරිද්‍රතාවෙන් පෙළෙන දිරිය දරුවන් පිරිසකට, විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා මෙලෙසින් ආර්ථිකමය සවියක් ලබා දීමට ඉදිරිපත් වීම ශ්‍රේෂ්ඨ සමාජ මෙහෙවරක් මෙන්ම දෙලොවම යහපත පිණිස හේතුවන මාහැඟි පුණ්‍ය කර්මයකි.

## වෛද්‍ය සිසුන් සඳහා මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව ක්‍රමය ආරම්භ කරමින් .. ..

හේමාංගනී සමරක්කොඩි මැතිණිය විසින් පොල්තෙල් පහන දල්වනු ලැබූ පින්බර මොහොත

විජයසේන කිරිවත්තුඩුව පියාණන් අනුස්මරණය කිරීම සඳහා වූ ප්‍රථම ශිෂ්‍යත්වය සීතා ගුණතිලක මැතිණිය අතින් වෛද්‍ය සිසුවෙකු වෙත පිරි නැමුණ මොහොත

එස්.ඩබ්. අබේසුන්දර මැතිතුමා අනුස්මරණය කිරීම සඳහා වූ ශිෂ්‍යත්වය එම මැතිණියගේ පින්බර දෝතින් වෛද්‍ය සිසුවෙකු වෙත පිරි නැමුණ මොහොත

**විජයසේන කිරිවත්තුඩුව මැතිතුමා අනුස්මරණ කිරීම සඳහා වූ ශිෂ්‍යත්වයක්, සිය මුණුපුරු ක්‍රිෂාන් ගුණතිලක මහතා අතින් පිරිනැමුණ මොහොත**

16 2006 10 14

**2006 වසරේ ජයග්‍රාහී ශිෂ්‍යත්වලාභී වෛද්‍ය සිසු දරු දැරියෝ**

Daily Mirror Thursday June 28, 2007

# 22 medical students to get 'Parents Memorial Scholarships'

The Deceased Parents Memorial Scholarship Foundation, by stepping up to the 2nd memorable and victorious year, has selected another 22 medical students for the awards of 2007. These selections have been made by calling for applicants until June 15, from students who are economically disadvantaged but succeeded in entering the faculty of medicine and presently following 1st year undergraduate studies in universities. They have been selected from 7 universities, islandwide, irrespective of religion or ethnicity.

This series of scholarships, which was initiated by the Co-ordinating Secretary of the Sri Lanka — Canada Scholarship Foundation in 2006 to commemorate her father, Late Mr. Wijayasena Kiriwattuduwa, Principal and Justice of the Peace, has been so amplified with the generosity and assistance of well wishers that the number of scholarships has been increased this year granting a remarkable benefit to the needy university students.

Through this commendable opportunity, the deceased parents of the sponsors are remembered in a laudable manner while facilitating needy students to achieve their academic goals to flourish in society in future with moral virtues. By realizing the financial and spiritual values of these scholarships, the recipients declared at the inaugural award ceremony which was held at Battaramulla Siri Sudassanaramaya; presided by Dr Mirisse Dhammika Thero, that they too would follow this commendable path after becoming worthy citizens of Mother Lanka.

Out of the large number of applications received this year, 22 have been selected for these scholarships and they will be granted Rs. 1000 per month during the 1st year of their university studies for the period of 12 months continuously.

The letters with necessary instructions will be posted in due course to the selected students private addresses. For more details they may contact the Director and Co-ordinating Secretary, Mrs. Seetha Goonetilleke on telephone number: 0112877950.

**2007 ශිෂ්‍යත්ව සඳහා වෛද්‍ය සිසුන් 22 කු තෝරාගත් වගයි**

**2007 වසරේ ජයග්‍රාහී ශිෂ්‍යත්ව ලාභී වෛද්‍ය සිසු දරු දැරියන්**

අනාගත ලොවට යහපත් පුරවැසියන් බිහිකරලීමේ ක්‍රියාදාමයට නිරතුරුවම තම දායකත්වය **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම** තුලින් ලබා දෙමින් අනුග්‍රාහක භවතුන් භුක්ති විඳිනුයේ නිරාමිස ප්‍රීතියකි. ශිෂ්‍යත්වලාභී දරුවා ද මෙම ශිෂ්‍යත්ව ක්‍රමය තුලින් ලබනුයේ මාහැඟි ආදර්ශයකි. **සත්පුරුෂ පරිත්‍යාගශීලි සුපින්වතුන් විසින් සිදු කරනු ලබන මෙම සත් ක්‍රියාව දෙස විමර්ශනාත්මකව බලන බුද්ධිමත් සිසු දරුවා, තමා වෙත ලැබෙන්නා වූ ශිෂ්‍යාධාරය තුල ගැබ්ව ඇත්තේ ආර්ථිකමය වටිනාකම පමණක් නොවන බව වටහා ගනී.** අනාගත ලොව සුවඳවත් කරන මල් කැකුලකට දිය බිඳක් ඉසීමට පරිත්‍යාගශීලින් දරන්නා වූ මෙම ශ්‍රේෂ්ඨ වෑයම, සිසු දරුවන්ගේ හදවත් තුල සදාතනික මතක සටහනක් සනිටුහන් කරන අතර ආදර්ශයෙන්ම ඔවුන් වෙත ලබා දෙන්නා වූ අධ්‍යාත්මික ශක්තියකින් ද පරිපූර්ණය. සිසු දරුවන් තුලින් ආකල්පමය සංවර්ධනයක් නිරායාසයෙන්ම විනිවිද දැකිය හැකිය. ඔවුන් ද කෙදිනක හෝ තම දෙමාපියන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමට මෙවන් ඵලදායී ක්‍රියා මාර්ගයන්ට අවතීර්ණ වනු නොඅනුමානය.

DailyMirror Wednesday May 14, 2008 Event/Appr

# Parents' Memorial Scholarships Foundation expands its scope

The Parents' Memorial Scholarship Foundation, by stepping up to the third memorable and victorious year, has extended its programmes to reach three faculties of universities including all four streams: Medical, Engineering, Bio-science and Maths.

After listening to the requests of sponsors, the foundation decided to expand its scope thus opening opportunities for more students than the previous years. These scholarships are strictly for the economically disadvantaged students who, after securing qualifying marks at the GCE (A/L) Examination, have gained admission to follow studies in the above mentioned streams of studies at a university in Sri Lanka.

So far 39 medical students from seven universities island wide have been benefited from these scholarships. This series of scholarships were initiated in 2006, the first move made by Seetha Goonetilleke to commemorate her father, the late Wijayasena Kiriwattuduwa a former principal and justice of peace, under the direction of Dr. Mirisse Dhammika Thera, temporal and spiritual counsellor and the founder of the Sri Lanka-Canada scholarships. This programme has been amplified with the generosity and assurances of well wishers the result being that the number of scholarships are being increased yearly, thus facilitating more opportunities to needy university students in Sri Lanka. Through this commendable opportunity, the deceased parents of the sponsors are remembered in a laudable manner while facilitating needy students to flourish in their academic ventures.

Apart from providing financial assistance, the recipients are exposed to religious studies for character development and making them aware of the spiritual values that should be preserved and gifted to the next generation. Such values include paying tribute to parents, teachers and elders. So the recipients are strengthened not only financially for their academic development but morally and also spiritually. By seeing the actual results vividly, this foundation walks ahead providing worthy opportunities to deserving students to lead a successful life built upon the foundation of good manners and spiritual virtues.

**This programme has been amplified with the generosity and assurance of well wishers the result being that the number of scholarships is being increased year by year thus facilitating more opportunities with remarkable benefits for the needy university students in Sri Lanka.**

To reach this goal books such as 'Tharunya saha Budu Dahama,' 'Maa piya Guna Samara' and 'Saadhu Dekma' (The excellent View), containing moral virtues that can be practised in day to day life are awarded to students together with the certificates annually. After seeing the progress of this meritorious project, the sponsors also get an immense pleasure that cannot be gained through money. This foundation provides a worthy opportunity for everyone to achieve maximum benefits and adjust their lives successfully based on the 'Middle Path.'

Currently, applications are being called for these annual scholarships from students who are economically disadvantaged and who have succeeded in gaining admission to the faculty of medicine, engineering, and science (bio and physical).

**Self prepared applications should be sent to reach the foundation on or before 15th of June 2008 together with the following documents.**

1. A certified photocopy of the letter to prove that he/she has been selected to the relevant stream of studies at the university.
2. G.C.E (Advanced Level) -2007 Examination results certified by the principal.
3. A letter from the Grama Sevaka certifying the genuine situation of the family, including the number of family members , monthly income and the source of income, including 'Samurdhi' etc.
4. A testimonial from the chief of the religious institute of the village in which the applicant resides permanently.
5. The application should contain: Full Name, Address, Date of Birth, NIC number, telephone numbers of (self/relative's/neighbour's), GCE (O/L) Exam results and family details and setting out the reason for applying for these scholarships.

## All the applications should be sent to:

Mrs Seetha Goonetilleke, The Director, Parents' Memorial Scholarship Foundation, 362/2, Perera Mawatha, Kotuwegoda, Rajagiriya.

Selected applicants will be awarded Rs 1000/- per month during the first year of the university studies. For more details contact 011 2877969.

▲ අනුස්මරණ ශිෂ්‍යත්ව වෛද්‍ය පීඨයෙන් ඔබ්බට ව්‍යාප්ත වේ.

## “මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව” අයදුම්පත් ගැනීම දීර්ඝ කරයි

පොදු ජනතාව වඩාත් දැනුවත් කරමින්

2008 /06/20

ලංකාදීප

ලංකාදීප

2008 සැප්තැම්බර් මස 20 වැනිදා සෙනසුරාදා

## මාපිය අනුස්මරණ පදනමෙන් සරසවි සිසුන් 30 කට ශිෂ්‍යත්ව

A12 ■ Tributes/Events

Wednesday September 17, 2008 DailyMirror

# Scholarships for thirty University Students

The Parents Memorial Scholarship Foundation, accelerating to the 3rd successful year, has selected another 30 university students for the awards of 2008. These selections have been made by calling applications in public until July 15, from the students who are economically disadvantaged, but academically qualified to enter the universities. The number of scholarships has been increased by 50% over the previous years. So far 60 students of Medicine, Engineering, Science and Maths faculties, in nine universities island wide, irrespective of religion and ethnicity have been benefited under this project.

This series of scholarships initiated in 2006 under the guidance of Ven. Dr. Mirisse Dhammika Thera to commemorate the Principal Wijayasena Kiriwattu has now been amplified with the generosity and assurance of well wishers. It is a 'two in one' project that provides a commendable opportunity to remember their deceased parents and relatives in an impressive manner while facilitating a needy university student to achieve the academic and spiritual goals in their lives. Out of the large number of applications received the selected 30 students will be granted Rs. 1000 per month during the first year of their university studies.

The letters for the selected students with

necessary instructions are posted to their private addresses. For more details they may contact the Director Seetha Goonetilleke (Telephone 011 2877930)

The names of the selected students are as follows:

Hiranthi Padmathilaka - Kotugoda,
Sajimala Jayasekara Kalutara,
Suranga Pesanga - Rathgama,
Indunil Sampath Weerawila
Piyumi Madhusha - Kirama,
Thilini Piyumali Kalutara
Thanuja Kumari - Kelaniya,
Gamini Wijenayaka - Kiriella,
Isuru Asanka - Ampara,
Samith Priyankara - Medamulana,
Chamila Kumara - Julampitiya,
Chaminda Bandara - Ibbagamuwa,
Niluka Priyadarshani - Polonnaruwa,
Kasun Deshapriya - Makulpotha,

"This series of scholarships initiated in 2006 under the guidance of Ven. Dr. Mirisse Dhammika Thera to commemorate the Principal Wijayasena Kiriwattu has now been amplified with the generosity and assurance of well wishes. It is a 'two in one' project that provides a commendable opportunity to remember their deceased parents and relatives in an impressive manner while facilitating a needy university student to achieve the academic and spiritual goals in their lives. Out of the large number of applications received the selected 30 students will be granted Rs. 1000 per month during the first year..."

Dinusha Lakmal - Mawathagama,
Aravinda Madhusanka - Horana,
Vinithya Gunawardena - Galle,
Sanulanayaka - Badulla,
Indika Seneviratna - Padalangala,
Yadeesha Hasalanka - Dikkumbura,
Dhammika Sampath - GL/Nagoda,
Jagath Chandra - Nakkawatta,
Harshani Nadeeka - Wattegama,
Chandima Lakmini - Kahawatta,
Anjula Suraj - Giriulla,
Wasana Kawmadi - Getaheththa,
Lakshi Wathsala - Payagala,
Kasun Eranga - Kananpitiya,
Dinesh Lasantha - Urugamuwa,
Dilini Saumya - Galle

වෛද්‍ය, ඉංජිනේරු, ජීව විද්‍යා සහ භෞතික විද්‍යා ක්ෂේත්‍රයන් දක්වා මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව ව්‍යාප්ත වූ වගයි

## ශිෂ්‍යත්වලාභී වෛද්‍ය පීඨ සිසු දැරියකගේ - කෘතඥතාපූර්වක ප්‍රතිචාරය


M/ ... / ...

[redacted]

පොළොන්නරුව

2008 . 08 . 26

Page 01


[redacted]

Page 02



E/PP/817

[redacted]

2008.10.02.

Page 01



[redacted]

Page 02

ශිෂ්‍යත්වලාභී
ඉංජිනේරු
පීඨ සිසු
දරුවකුගේ
සහෘදතා
පූර්වක
ප්‍රතිචාර

**ශිෂ්‍යත්වලාභී විද්‍යා පීඨ සිසු දැරියකගේ - කෘතඥතාපූර්වක ප්‍රතිචාරය**



[redacted]

2008.10.27

Page 01



[redacted]

Page 02

**2008 වසරේ ජයග්‍රාහී ශිෂ්‍යත්ව ලාභී විශ්ව විද්‍යාල සිසු දරු දැරියන්**

මාසිකව ශිෂ්‍යාධාර මුදල ලද සැනෙකින් ඒ බව ශිෂ්‍යත්ව පදනම වෙත ලිඛිතව දන්වා එවන ශිෂ්‍යත්ව ලාභීන් ඒ සෑම ලිපියකම අනුග්‍රාහක භවතුන්ව ස්තුතිපූර්වකව සිහිපත් කරයි. මිය පරලොව ගිය දෙමාපිය ඥාති හිත මිත්‍රාදීනට නිර්වාන සුවය ප්‍රාර්ථනා කරනුයේ හදපත්ලෙන්ම නැගී එන සැනසුම් සුසුමක් තුලිනි. දරිද්‍රතාව හමුවේ අධ්‍යාපන මාවතේ අතරමං වී සිටි මෙම දරුවන් මෙම ශිෂ්‍යත්ව ක්‍රමය හරහා ලබන්නා වූ ආදර්ශ, ඔවුන්ගේ දෛනික ජීවිත වල සාර්ථකත්වයට විශාල වශයෙන් බලපා ඇත. ඔවුන් එතුලින් ලබා ඇති අධ්‍යාත්මික ශක්තිය ඉමහත්ය. මෙම අදියරේදී, කෘත ගුණ සැලකීම සහ එහි ශ්‍රේෂ්ඨත්වය ඔවුන්ගේ හදවත් තුල නිරායාසයෙන්ම පතිත වී ඇත. අසරණ වූ ශිෂ්‍යත්වලාභී දරුවකුගේ පිවිතුරු හදවතක් තුලින් උතුරා හැලෙන ඒ **අනුවේදනීය සැනසුම් සුසුමක** ඇති **සංවේදීත්වය** ඉතා ප්‍රබලය. දෙස් විදෙස්හි අනුග්‍රාහක භවතුන්ගේ ලෞකික මෙන්ම ලෝකෝත්තර දියුණුව සඳහා එය සෘජුවම එල්ල කරනුයේ ප්‍රබල ආලෝක කදම්භයකි. එමගින් ඔවුන්ගේ අධ්‍යාත්මික සහ මානසික සන්තුෂ්ඨිය වඩාත් දිදුලයි. සම්බුදු දහමේ පෙන්වා දෙන ආකාරයට අවසානයේදී ලෞකික සැප සම්පත් වලින් ඔබ්බට විහිදී යන මෙම සන්තුෂ්ඨිය ලෝකෝත්තර සැපතක් කරා යොමුවේ. සැනසීම ඇත්තේ එහි පමණි.

## මේ එක් සත්‍ය සිදුවීමකි.

විශ්ව විද්‍යාල පළමු වසර සිසුන් සඳහා වන මෙම මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමට ද, පුවත් පත් මගින් පොදුවේ මහජනතාව දැනුවත් කිරීම සාමාන්‍ය ක්‍රියා පිළිවෙලයි. එහෙත් එම පුවත් පත් පවා නොලැබී යන දරිද්‍රතාවේ පරතෙරටම ගිලී ඇති විරිය සිසු දරුවන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් අ.පො.ස උසස් පෙළ විභාගයෙන් **දිස්ත්‍රික්ක සහ දිවයින් කුසලතාවන් හිමි කර ගත්** දරුවන් සොයා **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව** සඳහා **ඉල්ලුම් කරන** ලෙස දැනුවත්

**කළෙමු.** කළුතර දිස්ත්‍රික් කුසලතාව ලබා ගනිමින් කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ වෛද්‍ය පීඨයට 2007 දී සුදුසුකම් ලැබ තිබූ දරිද්‍රතාවේ උපරිම පීඩා විඳිමින් සිටි දිරිය සිසු දරුවකු ඒ අතර විය. **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව** සඳහා ඉල්ලුම් කිරීමට ඔහුට අවස්ථාව ලබා දීමට උත්සාහ කළෙමු. සෘජුව සම්බන්ධ කර ගැනීමට දුරකථන පහසුකම් ඔහු සතුව නොවිණි. එහෙත් කෙසේ හෝ දැනුවත් කිරීමේ අදහසින් ඔහුගේ නිවස අසල නිවසකට මා දුරකථන පණිවිඩයක් ලබා දුන්නේ **2007 මැයි මස 14 වන දින රාත්‍රී 8.00** ට පමණය. මා විමසා සිටියේ අසල නිවසක පදිංචි සෞම්‍ය කුමාර නමැති සිසු දරුවාට පණිවිඩයක් දිය හැකි ද යන්නයි. දුරකථන පණිවිඩයට ප්‍රතිචාර දැක්වූයේ කාන්තාවකි.

**සෞම්‍ය කුමාර - සෞම්‍ය කුමාර** යනුවෙන් කලබලකාරී වේගවත් ස්වරූපයකින් දෙවරක්ම නම උච්චාරණය කළ ඇය, මා වෙත ලබා දුන් පිළිතුර සවන් ගැටෙනවාත් සමඟම මාගේ දෙපා අප්‍රාණික වුවා සේ දැණුනි.

**"සෞම්‍ය කුමාර මැරිලා - අද හත් දවසේ බණ පිංකම - දැන් හාමුදුරුවොත් වැඩලා - අපිත් මේ එහාට යන්නයි හදන්නේ"**

සිදුවූයේ කුමක් ද? මා සිතුවිලි අතරේ අතරමං වීමි. දරිද්‍රතාවේ පරතෙරටම ගොස් සිටි ඔහුගේ පවුල් පසුබිම වටා ගෙතුන සත්‍ය කථා පුවත මෙම ග්‍රන්ථයේ 6 වන පරිච්ඡේදයේ අවසානයේ ද එළි දක්වා ඇත. දිස්ත්‍රික් කුසලතාව ලබා වෛද්‍ය විද්‍යාලයට පිවිසි ඔහුට මේ සිදුවූයේ කුමක් ද? දෛවය ඔහුට මෙතරම් රුදුරු වූයේ ද? වෛද්‍ය විද්‍යාලයට පිවිසි ඔහුට එම අදියරේදී ද පිළිසරණට තිබුණේ සැතපුම් ගණනක් වුවත් ඇවිද යා හැකි පා දෙකත්, ආත්ම ශක්තියත්, පොදු ජනතා බස් රථයත් පමණි.

ඔහු ඉමලකන්ද, රැටියල යන දුෂ්කර ගම්මානයන් පසු කරමින් ගෝවින්න මංසන්දිය වෙත පැමිණෙන්ට වූයේ සුපුරුදු පරිදි පා ගමනින්මය. එහිදී බුලත්සිංහල සිට කොළඹ බලා ධාවනය වන බස් රථයකට ගොඩවන්නේ කොළඹ වෛද්‍ය විද්‍යාලය කරා නියමිත වේලාවට ළඟා වීමේ අදහසිනි. එහෙත් ගමනාරම්භයේදීම මගීන් පුරවා ගත් මෙම බස් රථ ඇතැම් දින වලදී අතරමග මගීන් සඳහා නොනවත්වාම ධාවනය වෙයි. පළමු වසරේදී වෛද්‍ය විද්‍යාලය තුල ඔවුනට නවාතැන් පහසුකම් නොතිබිණි. ඇතැම් සිසුන් මාසිකව කුලිය ගෙවමින් වෛද්‍ය විද්‍යාලය ආසන්නයේ පෞද්ගලික නිවෙස්වල නවාතැන් පහසුකම් සොයාගනී. **එහෙත් ඒ සඳහා ආර්ථිකමය ස්ථාවරයක් මොහු සතු නොවිණි.** මගීන් අධික වුවද, බස් රථය නතර කළේ නම් එයට අපහසුවෙන් හෝ ගොඩ වී, කාන්තා පක්ෂයට කෙසේ හෝ බස්රථය ඇතුලට යාමට ඉඩ සළසා තරුණ සිසු දරුවන් පාපුවරුවේ ගමන් කිරීම සුලභ දර්ශනයකි. එලෙසින් ගමන් කළ මෙම සිසු දරුවාගේ අවසාන ඉරණම මෙතරම් ඛේදජනක වූයේද? බස් රථය ධාවනය වූයේ යොදුන් කිහිපයක් පමණි. රියදුරු බස් රථය වඩාත් වම් පසට යොමු කළේ ඉදිරියෙන් පැමිණි බස් රථයකට ධාවනය සඳහා ඉඩ සැලසීමටයි. පාපුවරුවේ ගමන් කළ සිසුන් මාර්ගය අද්දර තිබූ විදුලි පහන් කණුවක

ගැටීම නිසා බස්රථයෙන් පිටතට ඇද වැටී තිබිණි. දෛවය එලෙසින් **තම තරුණ ජීවිත වලට සරදම් කරයි ද? .. .. ඔවුන් මොහොතකටවත් නොසිතන්නට ඇති.** එහෙත් අභාග්‍යයක මහත? දෙදෙනෙකුගේ ප්‍රාණය නිරුද්ධ වූයේ මහා මාර්ගය අද්දරමය. මෙම වෛද්‍ය විද්‍යාල සිසුවා, ජාතික රෝහලට ඇතුළු කළ ද, එම ජීවිතය ද බේරා ගත නොහැකි විය. මෙවන් රුදුරු ඉරණමකට තරුණ දීප්තිමත් සිසුවෙකු, අනාගත වෛද්‍යවරයෙකු මෙලෙසින් පාත්‍ර වේ යැයි සිතුවෝ කවුරුන් ද? පවුලේ එකම දරුවා මෙලෙසින් දිවියෙන් සමු ගනී යැයි අහිංසක දෙමාපියන් මොහොතකටවත් සිතුවේ ද?

**අචින්ති තම්පි භවති - චින්ති තම්පි විනස්සති**
**සිතූ දේ නොම වෙයි - නොසිතූ දෙයම වෙයි**
(බුදුරජාණන් වහන්සේ)

ශ්‍රී සද්ධර්මයේ සත්‍යතාව මනාව පැහැදිලිය. උපන් සෑම සත්වයෙකුටම මෙම ඉරණම පොදුය. මරණය නියත වූ ධර්මතාවකි. අප මේ රැඳී සිටින්නේ තාවකාලික නැවතුම් පොළකය. මෙය නිතර සිහි කළ යුතුමය. මරණය අපට අවශ්‍ය පරිදි අපට අවශ්‍ය වේලාවට සිදු නොවේ. උපත ද එසේමය. **අපට කළ හැක්කේ අප්‍රමාදව පින් රැස් කර ගනිමින් එයට සූදානමින් සිටීම පමණි.** එය විශ්වයේ තුලනාත්මක සර්ව සාධාරණ විනිශ්චය මත අප කරා පැමිණෙනු නියතය.

බණ නම් නිබොරුය මුනිවරයන්නේ
කය නම් නොතිරය අදහා ගන්නේ
පණ නම් තණ අග පිනි බිඳු වැන්නේ
පින නම් නොපමාවම කර ගන්නේ
(ලෝ වැඩ සඟරාව)

**The teaching of Buddha is never false. The body is unstable - no doubt about it. Life is like a dewdrop on the tip of a blade of grass. So merit should be collected without delay.**

**බුදුරජාණන් වහන්සේ අවසන් වරට ශ්‍රී මුඛයෙන් දේශනා කර වදාළේ සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බවයි. සසර දුකින් අත් මිදීම පිණිස අප්‍රමාදීව කුසල් සම්පාදනය කර ගත යුතු බවයි.**

**"හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදේථ"**

සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යයි. සසර දුකින් අත් මිදීම පිණිස අප්‍රමාදීව කුසල් සම්පාදනය කරන්න. (බුදුරජාණන්වහන්සේ)

බුදු දහමේ පෙන්වා දෙන අයුරින් මරණය **ආයුක්ෂය, කර්මක්ෂය උභයක්ෂය, උපච්ඡේදක** යනුවෙන් සිව් වැදෑරුම්ය. ආයුෂ අවසන් වීමෙන් මෙන්ම, කර්මය අවසන් වීමෙන් හෝ ආයුෂ සහ කර්මය දෙකම අවසන් වීමෙන්

හෝ එසේත් නැත්නම් ස්වභාවික විපත් හදිසි අනතුරු වැනි දේ මගින් මිනිසාගේ මරණය සිදුවන බව ධර්මයේ පෙන්වා දෙයි. උපතකට හේතුවන ආපෝ තෝජෝ, වායෝ, පඨවි, අවකාශ යන ධාතු 5 න් සැදුම්ලත් **පඤ්ච මහා භූතයෝ** ප්‍රාණය නිරුද්ධ වීමත් සමග ආපසු අවකාශයටම එක් වෙයි. මිනිසා විසින් රැස් කර ගන්නා ලද කුසල්, අකුසල් කරන කියන **යහපත් හා අයහපත්** දේ වලට සාපේක්ෂව ඊළඟ භවය නිර්මාණය වෙයි.

ඒ දිරිය දරුවාගේ කටුක දුක්බර මෙන්ම **උද්‍යෝගීමත් පාසැල් ජීවිතය** පිළිබඳව සමාජය දැනුවත් වූයේ ඔහුගේ අවසන් කටයුතු වලින් පසුවය. ජීවත්ව සිටින කාලය තුල දී **ඔවුන් හඹා යන්නෝ ඉතා සීමිතය.** නිවස අසලට වාහනයක් තබා පා පැදියක්වත් යා නොහැක. ගල් මුල් පඳුරු අතරෙන් වැටී තිබුණ අඩිපාරකි. එය ද රබර් වගා කල කඳු බෑවුමක විනා තැනිතලා බිමක නොවේ. මෙවැනි දරුවන්ගේ යථාර්ථවාදී පසුබිම නිසි ලෙස හඳුනාගනිමින් ඔවුන්ගේ යහපත වෙනුවෙන් කිසියම් ඵලදායී ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වීම සඳහා නිවැරදි වූ මගක් දැකීමට ද පෙර පින් තිබිය යුතුමය. **අස්ථිර වූ මෙම ජීවිත පවත්වා ගන්නා කාලය තුල තමාගේ මෙන්ම අනුන්ගේ සැප පිණිස ඵලදායී සේවයක් ඉටුකිරීමෙන් ලද හැකි මානසික තෘප්තිය අපමණය.** අවමංගල්‍ය කටයුතු අවසන් වුවද, වියෝ දුක හැකි පමණින් තුනී කිරීමේ අරමුණෙන් සෞම්‍ය කුමාර සිසු දරුවාගේ දෙමාපියන් සොයා ගියෙමු. කල යුතු දෑ, යා යුතු මග දැකිය නොහැකිව සුසුම්ලන ඒ හදවත්වලට ධර්මානුකූලව ශක්තිය ලබා දීමට ගත්තා වූ උත්සාහය යම් පමණක් දුරට හෝ සාර්ථක වීම පිළිබඳව අප සතුටු වීමු. රැගෙන ගිය ආහාර ද්‍රව්‍ය හා ඇඳුම් පැළඳුම් ද පරිත්‍යාග කරන්නට වූයේ තවදුරටත් ඔවුන් සුවපත් කිරීමේ අදහසිනි. අනතුරුව එම අකල් මරණයට පාත්‍ර වූ සිසු දරුවා වෙනුවෙන් සිදු කරනු ලබන ඉදිරි පුණ්‍ය කටයුතු සඳහා මුදලින් ද දායක වුවද, ඒ හදවත් තුල ඇත්තේ සදාකාලික වියෝ දුකකි.

**හඹා යා යුත්තේ** මෙවැන්නන් විනා කීර්ති ප්‍රශංසා ලාභ ප්‍රයෝජන නොවේ. එවිට ලද හැකි මානසික සතුට අති මහත්ය. එවන් සතුටක් ලබා ගත හැක්කේ අධ්‍යාත්මික ගුණ වගාව තුලිනි. මිනිස් දිවියක් ලැබුව ද ආයු කාලය ඉතා කෙටි බව නුවණින් දැකිය යුතුමය. එය සීඝ්‍රයෙන් වඩාත් කෙටි වී ගෙන යයි. හැකි සෑම අවස්ථාවකදීම **අප්‍රමාදීව** අන් අයට පිහිට වීමට සිතක් පහළ වන්නේ නම් එය මහත් සැනසීමකට හේතු වනු ඇත. හදවතට එකඟව වෙහෙස මහන්සි වී සාධාරණව උපයා ගන්නා දෙයකින් බිඳක් අන් අයගේ යහපත වෙනුවෙන් යොදවන විට එය පාරමිතාවක් සේ වැඩී යන අයුරුත්, එතුළින් මනසට ලැබෙන්නා වූ ශක්තියත්, උත්සාහගන්නා අයෙකුට අත් දැකිය හැකියි.

අද සමාජයේ මුදල් පසු පස, කීර්තිය, බලය හා ලාභ ප්‍රශංසා පසුපස අවිචාරයෙන් හඹා යන්නෝ බොහෝය. යා යුතු නිසි මග නොපෙනේ. ගමනාන්තයක් නැත. කොතෙක් ලැබුණ ද, කුමක් ලැබුණ ද සෑහීමකට පත් වන්නේ ද නැත. **තමාට මිනිස් ලොවේ උත්පත්තිය ලැබීමට වරප්‍රසාදය ලබාදෙමින් හදා වඩා ගත්**

**දෙමාපියන්ගේ නාමයෙන්වත්,** අසරණ වූ සිසු දරුවකුගේ නැණ නුවන පාදාලීමට දරන්නා වූ වෑයමකට සුළු හෝ දායකත්වයක් දීමට චේතනාවක් පහළ වන්නේ නැත. සියල්ලම මමායනයට යටපත් කරමින් තමාට පමණක් සීමා කරගනිමින් එක් රැස් කර ගැනීමටම වෙර දරයි. සියල්ල තමාගේ සුඛ විහරණය සඳහා ම යෙදුව ද සෑහීමක් නැත. සැනසීමක් නැත. නැති බවම කියා පාමින් දිවි ගෙවන **මොවුන් සතුව සත්‍යවශයෙන්ම කිසිවක් නැත. ඇත්තේ රික්තයක් පමණි. එහෙත් එය අවබෝධවනුයේ ජීවිතය අවසාන භාගයේදී උඩුකුරුව වැතිර සිටින සයනය මතදීය.** එදිනට ප්‍රමාද වී වැඩි බව අවබෝධ වුවද පිළිසරණක් නැත. තුන් ලෝකයම සැනසූ අප තිලෝගුරු සම්මා සම්බුදුරාජණන් වහන්සේ - පමාවූවෝ මලවුනට සමාන කර අනු දැන වදාළ සේක.

**අප්පමාදො අමත පදං - පමාදො මච්චුනො පදං**
**අප්පමත්තා න මීයන්ති - යෙපමත්තා යථා මතා**

(ධම්ම පදය - අප්පමාද වග්ග)

**Heedfulness leads to immortality. Heedlessness leads to death. The heedful are immortal. The heedless, though living, are like the dead.**

සත්පුරුෂ අනුග්‍රාහක භවතුන්, ගුණ දහමින් සපිරි සදාචාර සම්පන්න අනාගත පරපුරක් ලක් මෑණියන්ට උරුම කරදීමේ අරමුණෙන් ශ්‍රී ලාංකික අසරණ දිරිය දරුවෙකු වෙනුවෙන් පවත්නා ශිෂ්‍යත්වයක් සඳහා තම මූල්‍යමය පරිත්‍යාගය හද පිරි සතුටින් මුදාහැරි අවස්ථාවේ සිට ශිෂ්‍යත්වලාභී අසරණ දරුවන් අතට ක්‍රමානුකූලව පත්වන මොහොත දක්වා සිදු කරනු ලබන ක්‍රියාදාමයේදී අතර මැදියන් ද නැත්තේ නොවේ. සත්භාවයෙන් සිදු කරනු ලබන මෙවන් ක්‍රියාදාමයක අතර මැදියකු වීමට ද පෙර පින් තිබිය යුතුමය. ඔවුනට මෙම පරිත්‍යාගයට **අත ගසා, නෙත යොමා, සිත පුරා** පිං සිදු කරගැනීමට ද අවස්ථා උදාවන්නේ නිතැතිනි.

**මසකට රුපියල් 1000/= බැගින් අඛණ්ඩව වසරක් පුරා විශ්ව විද්‍යාලයීය සිසුන් සඳහා මුදල් පිරිනැමෙන මෙම මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීම පිණිස කාලීනව දැනුවත් නොවූ බව පවසමින් මැසිවිලි නගමින් සුසුම් හෙළන සමෘද්ධි ලාභී දිරිය දරුවන් අද විශ්ව විද්‍යාල තුල බොහෝය.** ප්‍රසිද්ධ ජන මාධ්‍යයනට සහ දිවයිනේ සියලුම විශ්ව විද්‍යාල වලට දැනුම් දෙනු ලබන මෙවැනි **දැන්වීම් ප්‍රකාශයට පත් කිරීම** පවා විශාල කුසල කර්මයකි. මෙම කුඩා දිවයිනෙහි පවතින්නා වූ රාජ්‍ය, පෞද්ගලික හා අනිකුත් ආයතන අතුරෙන් විශේෂයෙන්ම මාධ්‍ය, බැංකු සහ තැපැල් ක්ෂේත්‍රයන්හි නිරත වුවන්ට ද මේ සඳහා උදාවන අවස්ථා බොහෝය. ධර්මානුකූලව ජීවත් වන බුද්ධිමතුන් තමාගේ නිලයට, බලයට අදාල සේවය කුමක් වුවත් එතුළින් ලබා ගන්නේ වෘත්තීමය තෘප්තිය පමණක් නොවේ. තම වෘත්තිය හරහා ඔවුන් මහත් වූ අධ්‍යාත්මික සැනසීමක් ලබයි. ඒ සත්පුරුෂ ජනතාවයි. ඒ සඳහා අමතර කාලය, ධනය, ශ්‍රමය වැය වීමක් නැත. පවත්නා නීති රීති චක්‍රලේඛ ආදියට එරෙහි වීමක් නැත. ඔවුන්

හෘදය සාක්ෂියට එකඟව තම වෘත්තිය සමාජ සුභ සිද්ධිය පිණිසය යන හැඟුම් මාත්‍රය සිත්හි ධාරණය කර ගෙන **සේවා ලැදිව සේවයට කැප වෙමින් කලට වේලාවට තම සේවා යුතුකම් ඉටුකරමින්** එහි නිසි ඵල ලබමින් කුසල් රැස් කර ගනී. **එහෙත් මඳ දැනුමෙන් උඩඟුව අනවබෝධයෙන් සහ අන්ධානුකරණයෙන් කටයුතු කරන, පෙර පින් නැත්තෝ ද සමාජයේ නැත්තේ නොවේ.**

**අවංකව සිදු කරනු ලබන ඕනෑම සේවයක ප්‍රතිලාභය තමා කරා මෙන්ම, තම දරුවන් කරා පැමිණෙන්නේ ධර්මයේ සත්‍යතාව ලොවට හෙළි කරමිනි.** කිසියම් පුණ්‍ය කර්මයකට අත හිත යොමා එක් යහපත් වදනකින් හෝ දායකත්වය ලබා දීමට තරම්වත් පින් සිතිවිලි පහළ නොවන්නේ නම් කෙතරම් අභාග්‍යයක් ද? ඔවුන් මෙම සංසාර ගමනේ තව බොහෝ දුර යා යුත්තෝ වෙයි. **මෝහයෙන් අගතිගාමීව** තම සේවය පැහැර හරින ඇතැම් අන්ධබාල සේවකයින්ගේ සහ **මානයෙන් උදම්මව** අන් අයගේ සේවය වංචනික බවත් තමාගේ සේවය පමණක් අවංක බවත් කියා ගන්නා මානාධික සේවකයන්ගේ, අක්‍රමවත් ක්‍රියා කලාපයන් නිසා අසරණ සිසු දරුවෙකුගේ අධ්‍යාපනය වෙනුවෙන් පිරිනමන මෙවන් ශිෂ්‍යත්වයක් අහිමි වූයේ නම්, එහි විපාකය එම අත්තනෝමතික සේවකයින්ගේ දරුවන් කරා සෘජුවම එල්ල වනු ඇත. පොදුවේ සියලු දරුවන් කෙරෙහි කරුණා මෙත් සිතින් යුතුව තම වෘත්තීමය කාර්යයන්හි නිරතවන විට තම දරුවන්ගේ අභිවෘද්ධිය සැලසෙන්නේ නොසිතූ විරූ අයුරෙනි. එහෙත් එම ලෝක ධර්මතාවට එරෙහි වන්නෝ ස්වභාව ධර්මයෙන් දඬුවම් ලබයි. **කවරෙකු වුවද අස්වැන්න ලෙස නෙළා ගනුයේ තමා විසින්ම වපුරනු ලැබූ බීජ මිස වෙනත් දෙයක් නොවේ. තම තමාගේ නිල තල වලට අනුරූප වූ සේවය හරහා, මෙවැනි පුණ්‍යක්‍රියාවකට වචන මාත්‍රයකින් හෝ යහපත් වූ සිතිවිලි මාත්‍රයකින් හෝ දායක වීමට චේතනාවක් පහළ නොවන්නේ නම් ලැබුවා වූ මිනිස් භවයේ ඇති ඵලය කුමක් ද?**

අසරණ වූ දරුවකු තමාගේ දරුවා මෙන් සිතන්නට හැකි නම් එය කෙතරම් ශ්‍රේෂ්ඨ ද? මිනිස් මොළය තරම් උසස් නැති වුව ද, මෙයට සත්ව ලෝකයෙන් පවා මහඟු ආදර්ශ ලබා ගත හැක.

**එක් සිදුවීමක් මෙසේය.**

එය නිසසල පරිසරයක පිහිටි භාවනා මධ්‍යස්ථානයකි. අවට පරිසරය තුරු ලතාවන්ගෙන් පිරී පවතී. එබැවින් නිරතුරුවම වඳුරන් රෑන් වශයෙන් අවුත් නිදහසේ සැරි සරයි. ඇතැම් විට ඔවුන්ගේ හැසිරීම් භාවනා යෝගීනට තරමක් බාධා ඇති කරයි. දිනක් වඳුරු රෑන තමාගේ පැටවුන්ද කර පින්නාගෙන අවුත් පැටවුන් මුදා හැර සෙල්ලම් කරන්නට ඉඩ දී අතු උඩ වාඩි වී එකිනෙකාගේ සිරුරේ මැක්කන් අරින්නට විය. හදිසියේ එතනට පැමිණි දායක මහතෙකු දුටු වඳුරු දෙමාපියන් ක්ෂණයකින් පැටවකු ද රැගෙන වෙනතකට දුවන්නට වූහ. අනතුරුව එහි වූ අසිරිමත් සිදුවීම මිනිස් සමාජයට ලබා දුන්නේ මාහැඟි ආදර්ශයකි. ඈතට දිව ගිය වඳුරෝ තමා අත ඇති වඳුරු පැටවුන් මාරු කරගන්නට විය.

කොතරම් ශ්‍රේෂ්ඨ ද? අනතුරක සේයාව දුටු වඳුරු වැඳිරියන් තම දරුවා සොයා වෙහෙසුණේ නැත. අනතුරින් බේරීම සඳහා ළඟ සිටි කාගේ හෝ පැටවෙකු කර පින්නා ගෙන ආරක්ෂිත තැනකට පැනගත් ඔවුන් මෙසේ තම පැටවුන් මාරු කර ගත්තේය. උසස් මනසක් නොමැතිව උපන් සත්ව ලෝකයෙන් වුවද ලැබෙන්නා වූ යහපත් ආදර්ශ අද සමාජයට කොතරම් ගැලපේ ද?

**මාගේ** දරුවන්, **මාගේ** දේපල, **මාගේ** මුදලය, ආදී වශයෙන් සියල්ල **මමායනයට** යටත් කරමින් සුවිසල් මැදුරුවල වස්තුව රැස්කරමින්, ප්‍රභූන් ලෙසින් සමාජයේ විරාජමාන වීමට වෙර දැරුව ද ඇතැම් අවස්ථාවලදී තම සේවකයනට හිසි වැටුප් ගෙවා ගැනීමටවත් නොහැකි බව පවසමින් සුසුම්ලන හාම් පුතුන් ද, මහා පරිමාණයේ වෙළඳ ව්‍යාපාරයන්හි නිරත වුවද අහිංසක සිසු දරුවකු වෙනුවෙන් අත හිත යෙදවීමට තරම් වත් ප්‍රමාණවත් ආර්ථිකයක් නැතැයි පවසමින් සිදු වී ඇති පාඩු සහ බැංකු වලට ඇති ණය හුවා දක්වන ණයකරුවන් ද **අද සමාජයේ නැත්තේ නොවේ.** එවැනි අය දෙස වඩාත් අනුකම්පාවෙන් බැලිය යුතුමය. ඔවුනට තව බොහෝ දුරක් යා යුතුව ඇත. ඒ සඳහා ප්‍රමාණවත් **ඉන්ධන ගබඩා කර ගත යුතුමය.** මව් පියන්ගේ නාමයෙන්වත්, අනාගත ලොව භාර ගන්නා අසරණ දරුවෙකුට තබා, වත්මන් යාචකයෙකු දෙසවත් කරුණා මෛත්‍රියෙන් යුතුව දෙනෙත් යොමු කිරීමට තරම්වත් ප්‍රමාණවත් අධ්‍යාත්මික ශක්තියක් ඔවුන් සතුව නැත. **අඳුරේ යන්නෙකුට පහන් ආලෝකයක් ලබාදුන්න ද, පෙර පින් නමැති දහනයට අවශ්‍ය සාධක ක්ෂය වී නම් එය නිවී යයි. ඵල ලැබිය නොහැක්කේමය.**

තුන් ලොවම සැනසූ තථාගත බුදුපියාණන් වහන්සේ, සියලු සැප සම්පත් වලින් ආඪ්‍ය වූ රාජ්‍ය පෙළපතක උපත ලැබුවේ වුවද, සත්වයාගේ දුක අවබෝධ කරගැනීම සඳහා සියලු යස ඉසුරු, සැප සම්පත් පිරිවර, සිංහාසන පවා අත් හැරියේ ය. මිනිසත් බව ලැබූ අපට **හැකියාව තිබිය දී මනුෂ්‍යත්වයේ නාමයෙන් දුප්පත් දරුවකුගේ එක් දුක් කඳුළකට පිහිට වීමට තරම් වත් සිතක් පහළ නොවන්නේ නම් මොන තරම් අභාග්‍යයක් ද?**

**සච්චං භණෙන න කුජ්ඣෙය්‍ය - දජ්ජාප්පස්මිංපි යාචිතො**
**එතෙහිතීහි ඨානෙහි - ගච්ඡෙ දෙවාන සන්තිකෙ**
(ධම්ම පදය - ක්‍රෝධ වග්ග)

ඇත්ත ප්‍රකාශ කල යුතුයි. අන්හට නොකිපිය යුතුයි. අනිකෙකු යමක් ඉල්ලු කල ටිකක් වුව දිය යුතුයි. මේ තුන් කරුණින් කෙනෙකුට දේවත්වයට යා හැකි බව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත.

**Speak the truth; Do not give in to anger. To whom who asks give even from the little you have. These 3 steps would lead you towards celestial beings. (The Lord Buddha)**

උපන් මිනිසා සියලු වස්තුව එක් රැස් කිරීම් වසර කීයකට ද? මිනිසාගේම දූෂිත චේතනාවන්හි ප්‍රතිඵලයක් ලෙසින් අද මිනිසාගේ ජීවිත කාල සීමාව දින **25000** කට පමණ සීමා වී ඇත. මැදි වියට පැමිණි ඇත්තන්හට තව ඉතිරිව ඇත්තේ දින කීයද? එහෙත් තව තවත් රැස් කිරීමටම සිතයි. මේ කාටද? කුමකට දැයි මොහොතක් නොසිතයි. අවසානයේදී දොඩම් ගොඩ බදා ගත්තා සේය. **අනපේක්ෂිතව සියල්ල ගිලිහී යයි**. විශ්වයේ පවතින සෑම දෙයක්ම **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** නම් වූ ත්‍රි ලක්ෂණයට යටත්ය. එය පාලනය කරන්නේ ස්වභාව ධර්මයයි. තම තමා ගේ ධන බලය, පිරිස් බලය, කෙසේ වුවද, ස්වභාව ධර්මය ඒවාට සාපේක්ෂව තීන්දු නොදෙයි. **බොහෝ විට අවසාන කාලය සයනයක උඩුකුරුවය. තමාට ඇත්තේ සිහිවිලි පමණි. කල කී දේ සිහි වෙයි.** හිතවතුන් ඥාතීන් සයනය වටා සිටිය ද ඔවුන්ට කල හැක්කක් නොමැත. වෛද්‍යවරුන් කොපමණ උත්සාහ දැරුව ද උපන් සත්වයාගේ ඉරණම වලකාලිය නොහැක. මෙම මාරබන්ධනයෙන් ගැලවීමට නම් මෙම මිනිස් භවයේදී කළ යුතු දෑ බොහෝ ය. තමාට තමා පමණය. **සිහිවිලි අතරේ මං මුලාවී හිඳිනු විනා කිසිවකුගේ සරණක් නැත.** දුක පසුතැවීම සහ බිය මුළු හදම වෙළා ගෙන ඇත.

**තසිණාය පුරක්ඛතා පජා - පරිසප්පන්ති සසොව බන්ධිතො**
**සංයොජනසංගසත්තා - දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය**
(ධම්ම පදය - තණ්හා වග්ග)

**Folks engrossed in craving crawl about in fear like ensnared hare. Cought in the grip of fetters they come to grief continuously for a long time.**

"තණ්හාව විසින් පිරිවරන ලද ප්‍රජාවෝ මලපුඩුවෙන් බැඳුණු සාවා මෙන් හැපේ. හෙවත් බියෙන් ගැහේ. දස සංයෝජන වලින් හා රාගාදී සත් සංයෝගවලින් ද බැඳුණෝ කලක් යන තුරුම නැවත නැවතත් දුකටම පැමිණේ."

**පෙර පිං අනුව මිනිස් භවයක් ලැබුව ද දැන් යන්නේ කොයිබටද?**

විවිධාකාර භවයන් දස කෝටි හතලිස් අට දහස් හයසියයකට වැඩිය. තමාට වෙන්ව ඇති පුරප්පාඩුව කොහේ විය හැකි ද? උතුම් මිනිසත් භවය මා ගත කළේ කෙසේ ද? අහෝ !!! මා මෙලොවට බිහි කල දෙමාපියන්ගේ නාමයෙන් වත් .. .. **අසරණ දරුවකුගේ දෙනෙතින් රූරා හැලෙන ශෝකීය කඳුළකටවත් පිහිට වීමට මට සිතක් පහළ නොවූ හැටි ! එක් රාත්‍රියකට රුපියල් දහස් ගණන් විනාශ කල හැටි ! එදා යාචකයාට බැණ වැදුණ හැටි ! පිපාසයට දිය බිඳක් නොදුන් හැටි ! නිලය බලය ශක්තිය අයුතු ලෙස යොදා ගනිමින් අසරණ ජනතාව පීඩාවට පත් කල හැටි ! වැටුප් ලබමින් සේවය පැහැර හැරපු හැටි ! බීමත්ව බිරිය, දරුවන් තලා පෙළූ හැටි ! සත්වයින්ට වද හිංසා දුන් හැටි ! දුප්පතාගේ දුක නොපෙනුන හැටි ! සත්පුරුෂයින් යහගුණ පෙන්වා දෙද්දී ඉවත බලපු හැටි ! එදා සමනල ලොවක හිඳ රුපියල් සත පස්සේම හති දමමින් දුවපු හැටි ! .. .. .. .. .. .. .. .. .. ..**

**ජීවිතයේ කිසි දිනක නොදුටු වෛවර්ණ චිත්‍රපටයක් පුළුල් තිරයේ දෘශ්‍යමාන වෙයි.**

11

# මහණ දම් - යා යුතු මග

සංසාර ගමනේ අතරමංව සිටින ඔබ අප සැම යා යුතු මගක් ඇත. සියලුම භෞතික සම්පත්, ලෞකික සැප, තම දරු මුණුපුරන්, මෙන්ම තම හිස පවා දන්දෙමින් **තෘෂ්ණාව** ක්‍රමයෙන් බිඳ දමමින් සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් පුරා පෙරුම් දම් පුරමින් ආ ගමනක අභිලාෂී ඉලක්කය කරා ළඟා වූ තුන්ලෝකාග්‍ර වූ තථාගත සම්මා සම්බුදු පියාණන් වහන්සේ අපගේ එකම මාර්ගෝපදේශකයාණන් වහන්සේමය.

අතරමං වූවෙකුට මග සොයා ගැනීමට මාර්ග සැලැස්මක් අවශ්‍යමය. පෙර නොගිය මාර්ගයක ගමන් කරන්නෝ ද මෙම මාර්ග සැලැස්ම මැනවින් අධ්‍යයනය කරමින්, නිවැරදි මාර්ග ඔස්සේ ගමන් කර තම ගමනාන්තය කරා ළඟා වෙයි. අතරමං වූවෙකුට මග පෙන්වා දීම ඉතා යහපත් ක්‍රියාවකි. එහෙත් අද සමාජයේ අතරමං වූවෙකු, මාර්ගය විමසුවේ නම් ඔහු වඩාත් අපහසුතාවකට පත්වන ආකාරයට මග පෙන්වා දී, ඔහු සතු වස්තුව කඩා වඩා ගෙන ඔහු ගේ ජීවිත පවා විනාශ කර දැමූ අවස්ථා පිළිබඳව ද තොරතුරු නැත්තේ නොවේ. එබැවින් මාර්ග පිළිබඳව විමසීමේදී ද ඉතාමත් කල්පනාකාරී විය යුතුමය. යමෙකු විසින් මගක් පෙන්වා දුන්නේ වුව ද, ඒ දෙස විමර්ශනාත්මකව බලා එයට යොමු **වීම** හෝ **නොවීම** පුද්ගල චින්තනයට සාපේක්ෂවම විය යුතුයි. එසේ නොමැතිව ක්ෂණික ලාභ ප්‍රයෝජන ලබා ගැනීමේ අරමුණෙන් සුරඟන වදන් පසුපස ගියේ නම් සිදුවන්නේ ඇම ගිල ගත් මාළුවාට සිදු වූ දෙයමය.

නිදහස් චින්තනයට බුදු දහම විවෘතය. බුදු දහමේ පෙන්වා දෙන සදහම් මග තුල ගැබ්ව ඇත්තේ ගැඹුරු චින්තනයකි. එය විෂය වන්නේ ද ප්‍රඥාවන්තයිනට විනා අන්ධබාලයිනට නොවේ. ප්‍රඥාව ඇති ඕනෑම අයෙකුට මෙම ධර්ම මාවතට අවතීර්ණ විය හැකිය. **"පඤ්ඤවන්තො අයං ධම්මො නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස"** යනුවෙන් අංගුත්තර නිකායේ පෙන්වා දී ඇත්තේ මෙම අදහසයි.

ශ්‍රී සද්ධර්මය වූ කලී මැනවින් සකසනු ලැබූ මාර්ග සැලැස්මකි. ඉතා පැහැදිලි ලෙසින් අදියරෙන් අදියර ගමන් මග දිස්වෙයි. මිනිසා කෙරෙහි අපරිමිත

කරුණාවෙන් යුතුව සකස් කර ඇති මෙම සැලැස්මේ ඇත්තේ කදිම ආරම්භයකි. මනාව පෙන්නුම් කෙරෙන ගමන් මගකි. ගමනාන්තයේ දී මෙලොව පරලොව දෙකෙහිම යහපත දිස් වෙයි. මෙම ධර්මය **ස්වාක්ඛාත වන්නේ එම ලක්ෂණයන්** නිසාමය.

**ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ එහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති.**
**"Well expounded is the Dhamma by the Exalted One, directly visible, immediately effective, calling one to come & see, leading onwards, to be personally realized by the wise"**

සියලු ලෝ සතුන් සංසාර සාගරයෙන් එගොඩ කර වීමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව, අවබෝධඥානයෙන්ම දේශනා කර වදාළ මෙම ශ්‍රේෂ්ඨ ධර්මය, භයංකර වූ දීර්ඝ සංසාර ගමනක අතරමං වී සිටින අප කාගේත් යහපත පිණිසම පවතී. ලැබුවා වූ මිනිසත් බව වඩාත් හරවත් කෙරෙන **බහු ජන හිතාය - බහු ජන සුඛාය** යන ශ්‍රේෂ්ඨ බුදු වදනට අනුව යමෙක් ජීවිත කාලය පුරාම **තමාටත් අනුන්ටත් සතුට සැපත සලසමින්** මෙම ධර්ම මාර්ගයේ දිගින් දිගටම ගමන් කරන්නේ නම්, සතුට සැපත ඔහු සොයා එයි. ඒ ධර්මයේ **සන්දිට්ඨික ගුණයයි.** යමෙක් පිරිසිදු චේතනාවෙන් යුතුව කවරෙකුට හෝ උදව්වක් උපකාරයක් කලේ නම් එම මොහොතේ සිටම හිතට දැනෙන්නා වූ සතුට අපමණය. එම සතුටෙහි ගැබ්ව ඇත්තේ අසීමිත වටිනාකමකි. එම **වින්දනය, සැනසීම මුදලකට ලබා ගත හැකි ද?** ධර්ම මාර්ගයට ප්‍රවිෂ්ඨ වූ මොහොතේ සිටම ලෞකික වශයෙන්ම එහි ඵලය තමා කරා එයි.

ව්‍යවහාර ලෝකයේ මගින්, ගමන් බිමන් සඳහා අදාල කර ගන්නා වූ මාර්ග සැලැස්ම ඇතැම් අවස්ථා වල දී මාර්ග ව්‍යාපෘතීන් වලට අනුව වෙනස් වීම්වලට භාජනය වන අවස්ථා බොහෝය. නව මං මාවත් බිහි වීම නිසාත්, අතුරු මාර්ග සොයා ගැනීම් නිසාත් පවත්නා මාර්ග වසා දැමීම නිසාත්, තාක්ෂණයේ දියුණුව නිසාත් ගොඩබිම මෙන්ම මුහුදු හා ගුවන් මාර්ග පවා කලින් කලට වෙනස් වෙයි. **එහෙත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් මෙම ධර්ම මාර්ගය කිසි කලෙකවත් වෙනස් වීමකට, විකෘති වීමකට භාජනය නොවෙයි.** එය අකාලික වන්නේ එහෙයිනි. වසර දෙදහස් පන්සිය පනස් ගණනකට පෙරදී, අවබෝධඥානයෙන් දැක ලොවට හෙළි කළ මේ ධර්ම මාර්ගය කුමන ව්‍යවස්ථිත තත්වයන් මත හෝ අසත්‍ය බව තහවුරු කිරීමට සමත් ශාස්තෘවරයෙකු, විද්‍යාඥයෙකු මේ දක්වා ලොව පහළ වී නැත.

ධර්මය **ඒහි පස්සිකය.** කිසිවකු එක්වර පිළිගත යුතු නැත. එසේ පිළිගන්නා ලෙස කිසිවකු අණ දෙන්නේ ද නැත. පැමිණ බලන ලෙසට කාරුණික ආරාධනයකි. හොඳින් නිරීක්ෂණය කර බලා තමාට ගැලපේ නම් පිලිගත හැක. **ඇවිත් බලන්න** යනුවෙන් ධර්මය තුලම ගැබ් වූ මෙම ආරාධනය තුලින් පෙනී යන්නේ කුමක් ද? එහි බැලිය යුත්තක් ඇති බවයි. නොඑසේ නම් එවන්

ආරාධනයක් කල හැකි ද? විමසිලිමත්ව බලන විට සියලුම ධර්මතා තුල චතුරාර්ය සත්‍යය ගැබ්ව ඇති බව බුද්ධිමතෙකුට දැකිය හැකියි.

"අත්ථ දීපා විහරථ අත්ථ සරණා අනඤ්ඤ සරණා"

(අංගුත්තර නිකාය - අත්ථ දීප සූත්‍රය)

**තමා, තමාට පහනක් කොට සරණක් කොට වාසය කරන්න. අන් අයෙක් සරණක් කොට නොගන්න.**

තමාම, මෙම මාවතට පිවිස බැලිය යුතුය. එය ඒහි පස්සිකය. ඕනෑම කෙනෙකුට විවෘතව ආරාධනය කරන්න තරම් ශක්තියක් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය තුල අන්තර්ගතය.

මෙම ගමන් මාර්ගය, නිරතුරුවම සිත්හි රඳවා ගැනීමට සුදුසු වූත් සැක රහිත වූත් ගමන් මාර්ගයකි. එය ධර්මයේ ඇති **ඕපනයික ගුණයයි**. දවසේ ආරම්භයේ සිට නින්දට යන මොහොත දක්වාම කුමන කාර්යයක යෙදුණේ වුවද, මෙම මගෙහි ගමන් කළ හැකිය. එවිට නිරතවන සියලු කාර්යයන්හි **උද්යෝගී භාවය, ඵලදායීතාව, සහනදායී බව,** විද්‍යමාන වෙයි. සාර්ථකත්වය කරා ජීවිත ගෙනයන මෙම ගමන් මගෙහි අවසාන ඉලක්කය වී ඇත්තේ පරම රමණීය අමෘත මහා නිර්වාණයයි.

මෙය තම තමා විසින් වෙන වෙනම ගමන් කළ යුතු ගමන් මාර්ගයකි. ඒකාබද්ධව, කාණ්ඩ වශයෙන් යා හැකි ගමන් මගක් නොවේ. මෙවන් මගක් ඇති බවට යමෙක් දැනුවත් කළ හැකියි. එහෙත් යා යුත්තේ තනි තනිවමය. මෙය දෛනිකව ප්‍රායෝගීකරණය තුලින් ප්‍රවිෂ්ඨ විය හැකි ගමන් මාර්ගයකි. එය සිදුවිය යුත්තේ නිදහස් චින්තනය මතයි. සැමට විවෘතව ඇති මෙම ධර්ම මාර්ගයේ කිසිම ස්ථානයක බලපත්‍ර පරීක්‍ෂා කිරීමක්, බාධක පැනවීමක් නැත. බුද්ධියට ගෝචර වන්නේ නම් තමා විසින්ම ගමන ආරම්භ කළ හැකිය.

**තුම්හෙහි කිච්චං ආතප්පං - අක්ඛාතාරො තථාගතා**
**පටිපන්නා පමොක්ඛන්ති - ඣායිනො මාරබන්ධනා**

(ධම්ම පදය මග්ග වග්ග)

(ඔබ විසින්ම කෙලෙස් තවන වීර්යය කළ යුතුයි. බුදුවරු එයට මග කියන්නෝය. ඒ මගට බැස ධ්‍යාන වඩන්නෝ මාර බන්ධනයෙන් මිදෙන්නෝ ය.)

**You yourself should strive towards perfection. Buddhas are only revealers of the path. Those who enter the path & strive will be released from the bondage of Mara**

මෙම යා යුතු මග ගමන් කරන, පෙර පින් ඇත්තෝ අතර මගදී ගමනේ වේගය වැඩි කරයි. මග හොඳින් පෙනේ නම් රථය කාලීන තත්ව පරීක්‍ෂණයට යටත් නම්, රියදුරුහට තම කුසලතා හා සුපරීක්‍ෂාකාරීභාවය පිළිබඳව ආත්ම විශ්වාසයක් ඇත්තේ නම් ඔහු, අඩු කාල සීමාවක් තුල දී තම

ජීවිතයේ යථාර්ථය නොව පසක් කොට

**අති උතුම් වූ ශ්‍රී සද්ධර්මයේ සහනයේ බලයෙන් මෙම ධර්මද්වීපය ඒකාලෝක කිරීමේ**
**පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව**

**මුළු මහත් සමාජයටම හා සැබෑ ආදර්ශයක් දෙමින්**

ඔබ වහන්සේ හා සැලූවා වූ නිවැරදි නිර්මල මාවත ඔස්සේ
අධිෂ්ඨාන පූර්වකව ඉදිරියටම ගමන් කිරීම පිණිස
පින්වත් ඔබ වහන්සේට
නියත් ශක්තිය ,ධෛර්යය, වාසනාව හා නිරෝගී සුවය

**උතුම් ත්‍රිවිධ රත්නයේ මහානුභාව සම්පන්න ආශිර්වාද බලයෙන් උදාම වේවා! යි**
**ඉතසිතින් ආශිංසනය කරමින්**

මෙම උත්තරීතර සන්ධි ස්ථානය දක්වා පියමන් කිරීමේදී, සංසාර ගමනේ එක් නවාතැන් පොළක අප හමුව, වර්ෂ 2004 වූ අගෝස්තු මස 21 වන ශනි දින ශ්‍රී ලංකා -කැනඩා ශිෂ්‍යත්ව පදනමේ ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේදී රැස්ව සිටි බාල තරුණ මහළු සැමට උතුම් ශ්‍රී සද්ධර්මය පදනම් කරගත් අරුත් බර කාලීන දේශනයක් පවත්වා,
අවසානයේදී

අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධාපචායිනො
චත්තාරෝ ධම්මා වඩ්ඩන්ති - ආයු වණ්ණො සුඛං බලං

යන ගාථා පාඨයේ නිහි අදහස ඉතා සරලව සිසු හදවත් තුළට කාවද්දමින් ඔවුන්ගේ දිවි මග සරුසාරවීමට මහත් වූ දායකත්වයක් ලබා දුන් ඔබ වහන්සේට

මේ පින්බර මොහොතේ

ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම
ඉතාමත් නිහතමානීව
ගෞරව සම්ප්‍රයුක්තව

**සිය සුභාශිංසන පිරිනමයි.**
**මෙම භවයේදීම උතුම් නිර්වාණ ධර්මය අවබෝධ වේවා!!!**

----------

MRS. SEETHA GOONETILLEKE
Co-ordinating Secretary
Sri - Lanka - Canada Scholarship Foundation
392/2, Perera Mawatha,
Kotuwegoda : Rajagiriya.

නිර්වාණසුඛයෙන් සීතා ගුණතිලක මහත්මිය
සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනම

◀ **සුභාශිංසන -2**

**යා යුතු මගට පිවිසි**
**පුතුහට කුළුණුබර**
**මවගේ නමස්කාරය** ▶

# නිරාමිස ප්‍රීතියෙන් ඔබ්බට

## 12

බුදුන් වැඩ සිටි පුද බිමේ සුව පහස දැනෙනා විටදී හදකට
යොදුන් ගණනක් දුර ගියත් නැත කිසිදුවෙහෙසක් මිනිස් ගතකට
සඳුන් තවරා පුද කලත් මදි, පා පියුම් මත බුදු පියා හට
**පෙළින් පෙළ ගොනුකළේ මේ පොත මගේ බුදු සමිඳුන්ට පුදනට**

නිරාමිස සතුටකින් ඔබ්බට ලොවක් ඇත එය දිනා ගන්නේ
දිරායන මේ සිරුර පිළිබඳ යථා දැක්මක් ලබා ගන්නේ
කිරා ගන්නට කරපු කී දෙය මොහාත ටික ටික ළඟාවන්නේ
**විරා ගී, සිත ශක්තිමත් නම් නොමැත කිසි විට බිය දැනෙන්නේ**

පුරාලන පාරමී දම් බල දිවිය සරු කර තබනවාමයි
නිවාලන හද තුලින් තව තව කුසල් පිං රැස් කෙරෙනවාමයි
නිරාමිස සැනසුමක් ලබමින් දහම් මග පිය නගනවාමයි
**පුරා හද සැනසුමක් ඇති විට දොරටු නිවනේ ඇරෙනවාමයි**

දිනපතා බුදු සමිඳු නමදින දනන් යොමු වන්නේය දහමට
දුප්පතා වුව දහම් රසයෙන් පිබිදිලා එන්නේය කදිමට
බලවතා තම බලය යෙදුවොත් ධර්ම පථයෙන් වෙනත් පසකට
**ධනවතා වුව සියලු සම්පත් ගසා ගෙන යයි නොසිතූ විලසට**

තමා වෙත ශක්තිය ලබා දුන් දෙමා පිය නිති සිහි කරන්නට
පමා විය යුතු නොමැත සුදනෙනි, මගක් හෙළි වී තිබෙයි දක්නට
යොමා නෙත් හදවතින් දක්නා විටදී පරහට සරණ වන්නට
**මමායනයට බැරිය කිසිවක් යටත් කර ගෙන පොදි බඳින්නට**

පරම යුතුකම ලෙසට අනුනට පිහිට වන්නට නැඹුරු වේවා!
සරණ යන්නට බුදුන් දම් සඟ චේතනාවන් පහළ වේවා!
දරණ ආයුෂ බොහෝ කල් නැත ධර්මයෙන් සිත් පහන් වේවා!
**චරණ, යහපත් පාදකය කොට දැනුම ඒ මත ගොඩ නැගේවා!**

පැතුම් පතමින් වසර හය තුල දුකින් ගත කළ ගල්ලෙනේ දිත්
උතුම් පදවිය ලබා බුදු හිමි සතිය ගත කළ බෝමුලේ දිත්
දහම් හඬ තුන් ලොවට එක් කළ ඉසිපතන නම් පිංබිමේ දිත්
**බුදුන් හට පිදෙනවා මේ පොත සාධු ! හඬ දැනේ ඔබ හදේහිත්**

# ප්‍රාර්ථනා

ඉමිනා පුඤ්ඤ කම්මේන - මා මේ බාල සමාගමො
සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා

**By means of all these meritorious deeds;**
**May I never join with the foolish,**
**May I always join with the wise,**
**Until the time I attain Nibbana**

සිදු කරගනු ලැබූ මෙම පුණ්‍ය කර්මයේ හේතුවෙන් නිවන් දක්නා තෙක්
අසත්පුරුෂ ඇසුරක් නොවී සත්පුරුෂ සේවනයක්ම වේවා !

**මෙම ග්‍රන්ථයට තේමාවූ පරාර්ථ සේවය තුලින් මා ලද පාරිශුද්ධ වූ චිත්ත සන්තුෂ්ටිය, ශාන්ත සුවය මරණ මංචකයේදී සිතට දැනේවා !**

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ස්පර්ශයෙන් පුද ලද දඹදිව් තලයෙහි,
ප්‍රථම ධර්ම දේශනය පවත්වමින් සදහම් කිරණ තුන් ලොවටම විහිදුවාලන ලද
ඉසිපතන මිගදාය ඇතුළු පූජනීය ස්ථාන තුනක දී
ලොව්තුරා සම්බුදු පියාණන් වහන්සේට
බැති සිතින් පිදෙන
**මෙම ග්‍රන්ථය**
සම්පාදනය කිරීමෙන්, මුද්‍රණය කරවා බෙදාහැරීමෙන් පහළවන
උතුම් ධර්ම දානමය පින
සියලු දෙනාටම අනුමෝදන් කරමි. අනුමෝදන් වේවා !!!

සියලු දෙනාගේම සංසාර ගමන් සුවපත් කරගැනීමට මෙන්ම කෙටි කරගැනීමට
අප්‍රමාදව චතුරාර්ය සත්‍යය අවබෝධ වේවා !!!

අවසානයේ දී ප්‍රඥා කිරණ මගින් උතුරා යන ආලෝක ධාරාවන් හමුවේ,
ජාතියක් ජරාවක් දුකක් නැති අති සුන්දරවූත්,
**පරම රමණීයවූත්, නිර්වාන ධර්මයම අවබෝධ කරගැනීමට**
**මේ පින් හේතු වේවා ! වාසනා වේවා !!!**

භවග්ගුපාදාය අවීචි හෙට්ඨතෝ - එත්ථන්තරේ සත්ත කායූපපන්නා
රූපී අරූපීච අසඤ්ඤි සඤ්ඤිනෝ - දුක්ඛා පමුඤ්චන්තු ඵුසන්තු නිබ්බුතිං

**සියලුම සත්වයෝ නිවන් දකිත්වා !**

**සාධු ! සාධු !! සාධු !!!**

# ආශ්‍රිත ග්‍රන්ථ


- ධම්ම පදය
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ
- ලෝවැඩ සඟරාව
- සුභාෂිතය
- ගෙදර බුදුන් අම්මා
- බුදුන් සමග ගිය ගමනක්
- අංගුත්තර නිකාය
- චතුරාර්ය සත්‍ය - රේරුකානේ චන්දවිමල මහ නාහිමි
- පිළිසඳර - අග්ග මහා පණ්ඩිත තුඩාවේ අරියවංශ නාහිමි
- තාරුණ්‍යය සහ බුදු දහම - ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි
- ශබ්දාර්ථ රත්නාකරය - බෝරුගමුවේ ශ්‍රී රේවත හිමි
- බෞද්ධ රාජ්‍ය පාලන න්‍යායයන් සහ පරමාදර්ශයන් - බුද්ධංගල ආනන්ද හිමි
- Education for Mindfulness - Venerable Dr Mirisse Dhammika
- බෞද්ධ දර්ශනය - අත්තුඩාවේ සිරි රාහුල හිමි
- නොබියව ජීවත් වීමට - පිටිදුවේ සිරිධම්ම හිමි
- බුදු දහමයි ශ්‍රද්ධාවයි - බමුණුගම ශාන්ත විමල හිමි
- දිවි මගට දහම් මග - තලගල සුමනරතන හිමි
- Jathakamala
- School Dictionary
- Dictionary of The Pali Language - Robert Caesar Childers

# දරිද්‍රතාව හඹායයි

තරුණ ජීවිත, යහගුණ මත පිහිටුවමින් දැනුම ලබා දීමේ කාලීන අවශ්‍යතාව අවධාරණය කෙරෙන මෙම ග්‍රන්ථය ඒ සඳහා බෙහෙවින් උචිත ඉතා සරල හා ප්‍රායෝගික ප්‍රවේශයක් සකසා ඇත. අභියෝග හමුවේ කම්පිත ව අකර්මණ්‍ය වී ඇති තරුණ හදවත් ධර්මප්‍රබෝධයකින් යුතුව නගාසිටුවීමට අවශ්‍ය පසුබිම, සත්‍ය සිද්ධීන් හා අත්දැකීම් ඇසුරෙන් ඉතා රසවත් ව මෙන්ම අර්ථාන්විතව පෙළ ගැස්වීමට කතුවරිය දරා ඇති උත්සාහය ඉතා ප්‍රශංසනීය වේ.

අන්තර්ජාතික ශිෂ්‍යත්ව පදනමක ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම් ධූරයෙන් **1998** දී පිදුම් ලද **කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මහත්මිය**, ආර්ථික අභියෝග හමුවේ සුසුම්ලන ශ්‍රී ලාංකික දිරිය සිසු දරුවන් ගුණ නැණ බෙලෙන් යුත් පුරවැසියන් බවට පත් කිරීමේ ලා ඇප කැප වන ආදර්ශවත් ගුරුමාතාවකි. **විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව අනුස්මරණ ශිෂ්‍යත්ව** ක්‍රියාදාමයේ ද නිර්මාතෘ වූ එතුමිය අද දිවයින පුරා විශ්ව විද්‍යාල සිසුන් සඳහා විවෘත ව ඇති **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ** අධ්‍යක්ෂවරියයි. කොළඹ **7** ඩී.එස්. සේනානායක විදුහලේ සේවයෙන් විශ්‍රාමලත් එතුමිය වසර **36** ක අත්දැකීම් ඇති ප්‍රවීණ ඉංග්‍රීසි ගුරුමාතාවක් මෙන් ම, සිංහල බෞද්ධ ගද්‍ය හා පද්‍ය ග්‍රන්ථ වලි දැක්වීමේ ගෞරවය හිමි කරගත් පසිඳු ගත් කතුවරියකි.

දරිද්‍රතාවෙන් පෙළෙන දරුවන් වෙත ආර්ථික මෙන් ම අධ්‍යාත්මික පෝෂණයක් ලබා දෙමින්, පුද්ගලයෙකුගේ දිවි මග සරුකර ගැනීමට දෙමාපිය ගුරුවර හා කළණ මිතුරන්ගෙන් ලැබෙන්නා වූ ආශිර්වාදයේ තීව්‍රතාව උකහා ගැනීම සඳහා, තම චර්යාවන් සකස් කරගත යුතු ආකාරය බෞද්ධ පරමාදර්ශ ඔස්සේ විමර්ශනාත්මක ව එහෙත් සරල ව මෙම ග්‍රන්ථයෙන් ඉදිරිපත් කෙරෙයි.

**මව් පියන් අනුස්මරණය කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් සමාජයට හඳුන්වා දෙන** මෙම ග්‍රන්ථයෙහි ඇතැම් ස්ථානයන්හි දී ඉංග්‍රීසි බසින් කෙරෙන සරල ඉදිරිපත් කිරීම් මගින්, පාලි ගාථාවන් පිළිබඳව පාඨකයින්ට නිවැරදි ධර්මඥානය ලබා දීම සඳහා දරා ඇති උත්සාහය ද අගය කළ යුතු වේ.

හුදු සතුටක් විඳීමේ අවශ්‍යතාවෙන් ඔබ්බට විහිදී යන මෙම ග්‍රන්ථයේ අන්තර්ගතය පාඨක සැමගේ ධර්මප්‍රබෝධය සඳහා ප්‍රයෝජනවත් වේ. යහ ගුණැති මානව දයාවෙන් පිරිපුන් සමාජයක් බිහිකරලීම සඳහා මාහැඟි දායකත්වයක් ලබා දෙන මෙම කෘතිය ලෞකික ජීවිතයේ සතුට සොයන අයට ද අගනා සංග්‍රහයකි.

කාලීන සමාජයීය අවශ්‍යතාවන් සපුරාලන මෙවන් ග්‍රන්ථ තව තවත් රචනා කිරීමට එතුමියට ශක්තිය හා ධෛර්යය ලැබේවායි පතමි.

**එස්. විරිතමුල්ල**
**ලේකම්, තරුණ කටයුතු අමාත්‍යාංශය**

ISBN 978-955-50082-2-8

මිල රු. 360/=